# 2023

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

**උතුරු මැද පළාත් සභාව**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 13 වන ඡේදය ප්‍රකාරව ජාතික අය-වැය අධ්‍යක්ෂ ජනරාල් මඟින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

**මග පෙන්වීම**

ආර්.එම්.ඩබ්.එස්. සමරදිවාකර මයා,
ප්‍රධාන ලේකම් - උතුරු මැද පළාත.

යූ.එස්. අරුණරවී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - උතුරු මැද පළාත.

**අධීක්ෂණය හා මෙහෙයවීම**

ආර්.පී.කමිත්‍රා මිය,
අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - උතුරු මැද පළාත.

**නිර්මාණය, පරිගණක ගත කිරීම හා සැකසුම් සහාය,**

පී.කේ.ඩී.එන්. සඳමාලි
කළමනාකරණ සේවා නිලධාරී - පළාත් භාණ්ඩාගාරය,
උතුරු මැද පළාත.
පළාත් භාණ්ඩාගාර කාර්ය මණ්ඩලය
උතුරු මැද පළාත.

# අන්තර්ගතය


| | |
|---|---|
| **පරිච්ජේදය 01 - ආයතනික පැතිකඩ** | **01** |
| 1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම | 02-04 |
| 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 05 |
| 1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන් | 06 |
| 1.4 සංවිධාන සටහන | 07 |
| 1.5 සේවා ජාලය | 08-10 |
| 1.6 අරමුදල් ලැබෙන ප්‍රභවයන් | 11 |
| 1.7 විදේශ ආධාර ලැබෙන ව්‍යාපෘති | 11-12 |

| | |
|---|---|
| **පරිච්ජේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **13** |
| 2.1 පළාත් සභා පරිපාලනය | 14-21 |
| 2.2 මූල්‍ය කළමනාකරණය | 22-28 |
| 2.3 ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 29-32 |
| 2.4 වාරිමාර්ග හා ජල කළමනාකරණය | 33-35 |
| 2.5 කෘෂි/ධීවර කාර්මික සංවර්ධනය | 36-49 |
| 2.6 පශු සම්පත් සංවර්ධනය | 50-58 |
| 2.7 කර්මාන්ත සංවර්ධනය | 59-62 |
| 2.8 ක්‍රීඩා සංවර්ධනය | 63-64 |
| 2.9 ප්‍රාදේශීය සංවර්ධනය | 65-72 |
| 2.10 සමූපකාර සංවර්ධනය | 73-76 |
| 2.11 ප්‍රජා සංවර්ධනය | 77-85 |
| 2.12 සෞඛ්‍ය සේවා | 86-91 |
| 2.13 අධ්‍යාපන සේවා | 92-100 |
| 2.14 සංස්කෘතික සංවර්ධනය | 101-103 |
| 2.15 සමාජ ආරක්ෂණය | 104-115 |
| 2.16 වෙනත් පළාත් සභා ව්‍යවසායකයන් | 116-118 |
| 2.17 විශේෂ ජයග්‍රහණ | 119-120 |

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 121

3.1 මූල්‍ය තත්වය පිලිබඳ කාර්යසාධනය 122

3.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය 123-124

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 125

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා හෙළිදරව් කිරීම් 126-133

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 134-141

3.6 ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්යසාධනය 142-144

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 144

3.8 විගණකාධිපති වාර්තාව 145-172

පරිච්ඡේදය 04 – කාර්යසාධන දර්ශක 173

කාර්යසාධන දර්ශක 174-193

පරිච්ඡේදය 05 – තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධන 194

5.1 තිරසාර සංවර්ධන අරමුණු 195-224

5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධන 225-228

පරිච්ඡේදය 06 – මානව සම්පත් පැතිකඩ 229

6.1 සේවක සංඛ්‍යාව කළමනාකරණය 230-235

6.2 කාර්යසාධනය උදෙසා මානව සම්පත බලපා ඇති ආකාරය 236-244

6.3 මානව සම්පත් සංවර්ධනය 245-257

පරිච්ඡේදය 07 – අනුකූලතා වාර්තාව 258

අනුකූලතා වාර්තාව 259-265

# 01

පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

# 1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම

## උතුරු මැද පළාත් සභාව පිහිටුවීම

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1987 අංක 42 දරණ පළාත් සභා පනත යටතේ 1988 මැයි මස 12 වන දින උතුරු මැද පළාත් සභාව පිහිටුවන ලදී.**



**උතුරු මැද පළාත නියෝජනය කරනු ලබන පළාත් ධජය හා පළාත් පුෂ්පය**





1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය අනුව සමස්ත ශ්‍රී ලංකාව පළාත් නවයකට බෙදා වෙන් කරන ලද අතර, 1987 අංක 42 දරණ පළාත් සභා පනත යටතේ පිහිටුවන ලද උතුරු මැද පළාත් සභාවේ මංගල රැස්වීම් වාරය 1988 මැයි මස 12 වන දින පවත්වන ලදි.

දෙවන පළාත් සභාව 1993 ජූනි මස 14 වන දින ආරම්භ කල අතර එම පළාත් සභාව අඛණ්ඩව වසර 5 ක් පුරා පවත්වා 1998 ජූනි මස 14 වන දින විසුරුවා හරින ලදී.

ඉන් පසු 1999 මැයි මස 05 වන දින තෙවන පළාත් සභාව ආරම්භ කළ අතර එය 2004 ජූනි 05 වන දින විසුරුවා හරින ලදී.

සිව්වන පළාත් සභා වාරය 2004 අගෝස්තු මස 11 වන දින ආරම්භ කළ අතර එය 2008 ජූනි මස 09 වන දින දක්වා අඛණ්ඩව පැවතුණි.

පස්වන පළාත් සභා වාරය 2008 සැප්තැම්බර් මස 11 වන දින ආරම්භ කර එය 2012 ජූනි මස 27 වන දින විසුරුවා හරින ලදී.

ඉන් පසු ආරම්භ වූයේ උතුරු මැද පළාත් සභාවේ 6 වන පළාත් සභාව වන අතර එහි නිල කාලය 2012 ඔක්තෝබර් 02 දින ආරම්භ කර 2017.10.01 දිනෙන් අවසන් විය .

එතැන් සිට මේ දක්වා ව්‍යවස්ථානුකූලව පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් සභාවේ මුල්‍ය හා පරිපාලන කටයුතු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් සිදු කරනු ලබයි.

### උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර

ජනාධිපතිවරයාගේ නියෝජිතයා වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව පළාත් ආණ්ඩුකාරවරයා වෙත විධායක, මුල්‍ය හා පරිපාලන බලතල හිමි වී ඇත. එම බලතල ප්‍රකාරව 2020 මාර්තු 24 වන දින සිට මේ දක්වා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර ලෙස මහිපාල හේරත් මැතිතුමා කටයුතු කරයි.



**උතුරු මැද පළාත්**
**ආණ්ඩුකාරවර**
**ගරු මහීපාල හේරත් මැතිතුමා**

## බලය පැවරීම

රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව රාජ්‍ය පාලන ව්‍යුහය ස්තර තුනක් යටතේ නිර්මාණය කර ඇත. ඒ අනුව, පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යවස්ථාදායක, විධායක හා මූල්‍ය අධිකාරී බලතල වෙන් වෙන් වශයෙන් දක්වමින් බලය බෙදා හැරීමේ පාලන ව්‍යුහය ස්ථාපිත කර තිබේ. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය තුළ විශේෂිතව දක්වා ඇති ලැයිස්තු තුන හරහා රජය හා පළාත් සභාවලට අයත් විෂයන් වෙන් වශයෙන් දක්වා ඇත. එනම්,

- ✓ පළාත් ලැයිස්තුව (පළාත් සභා වලට බලය පැවරූ විෂයන්)
- ✓ සංවෘත ලැයිස්තුව (රජය සතු විෂයන්)
- ✓ සමගාමී ලැයිස්තුව (දෙපාර්ෂවයටම අයත් විෂයන්)




පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත්බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටලු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත. එහිදී අධ්‍යාපන, සෞඛ්‍ය, පළාත් පාලන, මාර්ග, කෘෂිකර්මය, වාරි මාර්ග, සමාජ සේවා, පුනරුත්ථාපන, ග්‍රාම සංවර්ධන සහ ක්‍රීඩා යනාදි වූ පුළුල් විෂය ක්ෂේත්‍රයන් රැසක් ඔස්සේ බලය හා වගකීම බෙදී යයි. පළාත් ලැයිස්තුව තුල පළාත් වලට ආදායම් එකතු කළ හැකි මූලාශ්‍ර අන්තර්ගත කර ඇත. පළාත් ලැයිස්තුවේ දැක්වෙන විෂයන් වලට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා වලට වගකීම පැවරෙන අතර, සමගාමී ලැයිස්තුවේ විෂයයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම බෙදා ගැනීමේ අවකාශය සලසා ඇත.




අනුරාධපුර හා පොළොන්නරුව යන ප්‍රධාන දිස්ත්‍රික්කයන්ගෙන් සමන්විත වූ උතුරු මැද පළාත තුල 1,401,812 වූ ජන ගහණයක් පදිංචි වී සිටින අතර, එම ජනතාවගේ සාමාජීය, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් ඔස්සේ ජන ජීවිතය සංවර්ධනය කරා ළඟා කිරීමේ ප්‍රධාන වගකීම පළාත් සභාව සතු වේ.

## ව්‍යවස්ථාපිත රාමුව

- **1987 අංක 42 දරණ පළාත් සභා පනත**
- **1988 අංක 37 දරණ පළාත් සභා පනත ( වැටුප් හා දීමනා ගෙවීම)**
- **1990 අංක 13 දරණ මුදල් ප්‍රඥප්තිය**
- **1990 අක 28 දරණ පළාත් සභා (සංශෝධන ) පනත**
- **1991 අංක 03 දරණ (වැටුප් හා වේතන ) ගෙවීමේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ 1992 අංක 04 දරණ (සංශෝධන) ප්‍රඥප්තිය**
- **1991 අංක 07 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**
- **2010 අංක 13 දරණ පළාත් සභා (සංශෝධන) පනත**
- **පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහය**
- **පළාත් සභා චක්‍රලේඛ හා අණපනත්**

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු



### දැක්ම (VISION)

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ජනතාවකගෙන් පිරිපුන් පළාතක් රටට දායාද කිරීම

### මෙහෙවර (MISSION)

සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ථ උපයෝජනයෙන්. පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායකවීම.



### අරමුණ (GOALS)

ප්‍රශස්ථ කළමනාකරණයක් තුළින් උතුරු මැද පළාත දිවයිනේ සමෘද්ධිමත්ම පළාත බවට පත් කිරිම



## 1.3 පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය සහ සාමය පවත්වාගෙන යාම
- පළාත් සභා පරිපාලනය
- මූල්‍ය කළමනාකරණය
- මානව සම්පත් කළමනාකරණය
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය
- වාරිමාර්ග සංවර්ධනය
- කෘෂිකර්ම සංවර්ධනය
- පශු සම්පත් සංවර්ධනය
- ක්‍රීඩා සංවර්ධනය
- සංස්කෘතික සංවර්ධනය
- ප්‍රාදේශීය සංවර්ධනය
- සමූපකාර සංවර්ධනය
- ප්‍රජා සංවර්ධනය
- රෝහල් සේවා සංවර්ධනය හා පවත්වාගෙන යාම
- මහජන සෞඛ්‍ය සේවා සංවර්ධනය හා පවත්වාගෙන යාම
- පොදු සෞඛ්‍ය සේවාවන් හා පෝෂණ කටයුතු
- දේශීය වෛද්‍ය සේවාවන්
- පර්යේෂණ හා සංවර්ධන
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය
- ග්‍රාම සංවර්ධනය
- ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා
- නිවාස සංවර්ධනය
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු
- පළාත් ආදායම් කටයුතු
- පළාත් පාලන කටයුතු
- සංස්කෘතික හා කලා කටයුතු සංවර්ධනය
- මුල් ළමාවිය සංවර්ධනය
- පරිවාස හා ළමාරක්ෂක සේවා සැපයීම
- ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය
- අධ්‍යාපන ප්‍රවේශය හා සහභාගීත්ව දියුණු කිරීම
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය
- සංවර්ධන සැලසුම්කරණය හා මෙහෙයවීම
- ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා පසුවිපරම් කටයුතු
- මාර්ග සංවර්ධනය
- තොරතුරු තාක්ෂණය



## 1.4 සංවිධාන සටහන


පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්
ආණ්ඩුකාරවර ලේකම්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු)
ආණ්ඩුකාරවර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
ප්‍රධාන ලේකම්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
පළාත් ආදායම් කොමසාරිස්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන අමාත්‍ය
ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
අමාත්‍ය 1
අමාත්‍යාංශ ලේකම්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
අමාත්‍ය මණ්ඩලය
අමාත්‍ය 2
අමාත්‍යාංශ ලේකම්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
අමාත්‍ය 3
අමාත්‍යාංශ ලේකම්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
අමාත්‍ය 4
අමාත්‍යාංශ ලේකම්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් සභාව
සභා ලේකම්

## 1.5 සේවා ජාලය

### 610 - ප්‍රධාන අමාත්‍ය, උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන,පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

<u>දෙපාර්තමේන්තු</u>

**611 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල - 02
- මහ නගර සභා - 02
- ප්‍රාදේශීය සභා - 25

**612 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

- කලාප අධ්‍යාපන කාර්යාල - 08
- කොට්ඨාස අධ්‍යාපන කාර්යාල - 30
- පාසල් - 810
- අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන - 01
- ගුරු සංවර්ධන මධ්‍යස්ථාන - 09
- පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන - 01
- කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථාන - 08

**613 - පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව**

<u>ව්‍යවස්ථාපිත ආයතන</u>

- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය
- පුස්තකාල සේවා මණ්ඩලය
- මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

---

### 620 - පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය

<u>දෙපාර්තමේන්තු</u>

**621 -පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

- නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාල - 01
- සේවා සංස්කරණ අභ්‍යාස ආයතන - 01
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල - 06
- කෘෂි උපදේශක කාර්යාල - 37
  (අනුරාධපුර -32 / පොළොන්නරුව- 5)

**622 -පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය -02
- සත්ව ගොවිපල - තිරප්පනේ - 01
- පශු වෛද්‍ය කාර්යාල - 29
- පශු වෛද්‍ය රෝහල - 01

## 630 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය

**දෙපාර්තමේන්තු**

### 631 පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල - 01
- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල - 02
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල - 30
- මූලික රෝහල් - 08
- ප්‍රාදේශීය රෝහල් - 41
- ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක - 38
- ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථානය - 02
- ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක - 02
- වාහන සේවා මධ්‍යස්ථාන - 01
- පළාත් සෞඛ්‍ය සේවා දොපාර්තමේන්තුවේ පුහුණු ඒකකය -01

### 632 - පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

- පළාත් රෝහල් - 01
- මූලික රෝහල් - 01
- ග්‍රාමීය රෝහල් - 07
- මධ්‍යම බෙහෙත් ශාලා - 30
- ආයුර්වේද මධ්‍යස්ථාන - 06
- තෙල්හිරියාලව ඖෂධ නිෂ්පාදනාගාරය - 01

### 633 - පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

- පරිවාස කාර්යාල - 06
- උපදේහන මධ්‍යස්ථාන - 01
- ළමා රැඳවුම් මධ්‍යස්ථාන - 02
- සහතික කළ පාසැල් (ගැහැණු) - 01
- භාර ගැනීමේ නිවාස - 01
- ළමා නිවාස - 14
- පෙර පාසල් - 01

### 634 - පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

- වැඩිහිටි නිවාස - 02
- විශේෂ පුහුණු පාසැල් - 04
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන - 01
- සංවර්ධන පුහුණු ආයතන - 01

## 640 - පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

**දෙපාර්තමේන්තු**

### 640-3-4 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 641 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

- සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල - 02
- සමිති - 731
- ඉන්ධන හල් - 19
- කෝප් සිටි (මිනි හා මෙයා කෝප් සිටි ඇතුලත්ව) - 138
- ග්‍රාමීය බැංකු - 175

### 642 - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

- ජේෂ කර්ම මධ්‍යස්ථාන - 41
- අලෙවි මධ්‍යස්ථාන - 04
- වඩු පාසල් - 10

### 643 - පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

<u>ව්‍යවස්ථාපිත ආයතන</u>

පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

---

## 650 - පළාත් වාරිමාර්ග, ඉඩම්, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

<u>දෙපාර්තමේන්තු</u>

### 651- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### 652 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### 653 - පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

- දිස්ත්‍රික් සංගම් - 02
- ප්‍රාදේශීය සංගම් - 29
- තිරසාර ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන - 29
- ග්‍රාම සංවර්ධන සමිති - 675
- ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගම් - 29

<u>ව්‍යවස්ථාපිත ආයතන</u>

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
විධායක ඉංජිනේරු කාර්යාල - 06

---

## පළාත් සභාවේ අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ස්වාධීන ආයතන හා කොමිෂන් සභා

### 600 - ආණ්ඩුකාරවර කාර්යාලය

### 601 - පළාත් සභා ලේකම් කාර්යාලය

### 602 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### 603 - සමූපකාර සේවක කොමිෂන් සභාව

### 660 - ප්‍රධාන ලේකම් කාර්යාලය

### 661 - පළාත් භාණ්ඩාගාරය

### 662 - පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### 663 - පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - 06
- තත්ත්ව පාලන පරීක්ෂණාගාර - 01

### 664 - පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

### 665 - පළාත් ආදායම දෙපාර්තමේන්තුව

## 1.6 උතුරු මැද පළාත් සභාව සඳහා අරමුදල් ලැබෙන ප්‍රභවයන්

- සාමූහික ප්‍රදාන
- පළාත් සභා සංවර්ධන ප්‍රදාන/උපමාන පාදක ප්‍රදාන
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන
- ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව
- ශ්‍රී ලංකා රජය/ ආසියානු සංවර්ධන බැංකු අරමුදල්
- ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව සහ ඔස්ට්‍රේලියානු අරමුදල්
- ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකු ආධාර
- වෙනත් ආදායම් හා වෙනත් ලැබීම්
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල් ආධාර හා ළමා අරමුදල් ආධාර
- රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලැබීම්
- රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ ලැබීම්
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල් ආධාර
- විශේෂ ප්‍රදාන
- විශේෂ නීති සේවා

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ක්‍රියාත්මක කාල වකවානුව | ප්‍රතිපාදන ලබා දෙන රට | ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන රු.මි./ඇ.ඩො. | | | ව්‍යාපෘතිය අයත්වන රේඛීය අමාත්‍යාංශය |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුළු මුදල | විදේශ අරමුදල් ප්‍රමාණය | දේශීය අරමුදල් ප්‍රමාණය | |
| 1 | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා අරමුදලේ නැගී එන කලාප වල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 2018 - 2023 | ජපානය | රු.මි. 3200 | රු.මි. 3200 | පළාත් මට්ටමින් වෙන් කර නැත. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. |
| 2 | පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුර නැගුම) | 2016-2024 | ආසියානු සංවර්ධන බැංකුව (ADB) *ශ්‍රී ලංකා රජය | රු.මි. 2300 | රු.මි.2001 | රු.මි. 299 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. |
| 3 | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2019-2023 | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | ඇ.ඩො.මි.60 | ඇ.ඩො.මි. 50 | ඇ.ඩො.මි 10 | සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය. |
| 4 | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 2016 - 2023 | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ ආයතනය (AFD) | යුරෝ මි. 62.4 | යුරෝ මි. 52.0 | යුරෝ.මි. 10.4 | නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය | 2017 - 2024 | හරිත දේශගුණික අරමුදල | රු.මි. 1832 | රු.මි. 1568.05 | රු.මි. 263.05 | මහවැලි,කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය. |
| 6 | කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය | 2016-2024 | ලෝක බැංකුව | රු.මි. 1717 | රු.මි. 1710 | රු.මි. 7.00 | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය. |
| 7 | දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය | 2019 - 2024 | ලෝක බැංකුව | ඇ.ඩො.මි.100 | ඇ.ඩො.මි. 85 | ඇ.ඩො.මි. 15 | කෘෂිකර්ම හා වැවිලි කාර්මාන්ත අමාත්‍යාංශය. |
| 8 | අනුරාධපුර උතුර - අදියර I ජල සම්පාදන ව්‍යාපෘතිය | 2013.03 - 2024 | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය,ශ්‍රී ලංකා රජය | රු.මි. 11,515 | ජපන් යෙන් මි. 5166 | රු.මි. 2789 | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය. |
| 9 | අනුරාධපුර උතුර - අදියර 11ජල සම්පාදන ව්‍යාපෘතිය | 2019 - 2025 | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය,ශ්‍රී ලංකා රජය | ජපන් යෙන් 27301 | ජපන් යෙන් 23137 | ජපන් යෙන් 4164 | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය |
| 10 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | 2018 - 2024 | චීන සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා රජය | රු.මි. 16166.28 | රු.මි. 15840.83 | රු.මි. 325.45 | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය |
| 11 | උතුරු මැද පළාත් මහ ඇල ව්‍යාපෘතිය | 2017 - 2023 | ආසියානු සංවර්ධන බැංකුව | රු.මි. 96000 | - | - | මහවැලි,සංවර්ධන අමාත්‍යාංශය. |
| 12 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති | 2019 - 2024 | ලෝක බැංකු (WB, EU, SL gov) | ඇ.ඩො.මි 100.65 | ඇ.ඩො.මි. 93.65 | ඇ.ඩො.මි 7.00 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය |
| 13 | අයි මාර්ග ව්‍යාපෘතිය | 2019 - 2024 | ආසියානු සංවර්ධන බැංකුව(ADB) | රු.මි. 10154 | - | - | මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 14 | මාර්ග සම්බන්ධතා සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතිය | 2020-2023 | ලෝක බැංකුව | රු.මි. 1483 | - | - | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 15 | අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | 2018-2024 | ලෝක බැංකුව | රු.මි. 1515 | රු.මි. 1515 | - | අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 16 | පළාත් පාලන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | 2020-2024 | UNDP | රු.මි. 177.4 | රු.මි. 177.4 | - | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. |

# 02

පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

## 2.1 පළාත් සභා පරිපාලනය

Provincial Administration



උතුරු මැද පළාත් සභා පරිපාලන කටයුතු පළාත් අමාත්‍යාංශ 5 මඟින් මෙන්ම, පළාත් ආණ්ඩුකාර කාර්යාලය, පළාත් සභා ලේකම් කාර්යාලය, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සමූපකාර සේවා කොමිෂන් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව,පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.

### 2.1.1 පළාත් සභා පරිපාලනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා පළාත් සභා පරිපාලනය වෙනුවෙන් රු.මි. 3,695.15 සමස්ථ ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි. 1,027.95ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මූලධන වියදම් සඳහා ද, රු.මි. 2,667.20 ක වු ප්‍රතිපාදන ප්‍රමාණයක් පුනරාවර්තන වියදම් සඳහා ද වෙන්කර ඇත. මෙහිදී 2023 වර්ෂය තුල සමස්ථ වියදම ලෙස රු.මි. 2,897.13 දරා ඇති අතර, එය මූලධන වියදම රු.මි. 645.30 ලෙස හා පුනරාවර්තන වියදම රු.මි. 2,251.82 ලෙස සකස් වී ඇත. 2022 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පළාත් සභා පරිපාලනය සඳහා වෙන්කරන ලද සමස්ත ප්‍රතිපාදනය රු.මි.319.99 ක ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර, සමස්ථ වියදමද රු.මි. 21.03 න් වැඩි වී ඇත.






## 2.1.2 පළාත් සභා පරිපාලනයට අදාල භෞතික ප්‍රගතිය

උතුරු මැද පළාත් සභාව තුල පළාත් සභා පරිපාලන කටයුතු සඳහා ආයතන 15ක් දායක වේ. එහිදී ව්‍යවස්ථාපිත කටයුතු , ආයතනික කටයුතු , මූල්‍ය නියාමනය , තිරසර සංවර්ධන අරමුණු පෙරදැරි කොට සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වය ඇතිව ජාතික ප්‍රතිපත්තියට අනුගතව හා විනිවිදභාවයෙන් යුතුව සාධාරණ ක්‍රමවේදයක් මඟින් අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව දායකවීමේ මෙහෙවර මුල් කර ගත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මඟින් පළාත් සභා පරිපාලනයට අදාලව මෙම වර්ෂය තුලදී ඉටු කරන ලද කාර්යයන් අතර, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් යොමු කරනු ලබන නිර්දේශ සියල්ල ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර අදාළ අනුමැතිය හා නිරීක්ෂණ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දීම, ඒ යටතේ සේවකයින් බඳවා ගැනීම , අනියම් සේවකයින් ස්ථිර කිරීම , උසස්කිරීම්, අන්තර් පළාත් ස්ථාන මාරුවීම් , විශ්‍රාම ගැන්වීම් ,කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් වැනි කරුණු සම්බන්ධයෙන් මසකට තුන් වරක් පැවැත්වෙන කොමිෂන් සභා තීරණ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හා නිරීක්ෂණ නැවත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම්දීම වැනි කාර්යයන් ඇතුලත් වේ.

තවද ප්‍රාදේශීය සභාවල අරමුදලෙන් වියදම් දැරීමට හා මුද්දර බදු /උසාවි දඩ මුදල් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබා දිම සිදු කරන අතර, මාර්ග ප්‍රකාශයට පත්කිරීම/මාර්ග නම් කිරීම ආදිය මෙන්ම පළාත් අමාත්‍යාංශ වලට අදාළ ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුවේ නිරීක්ෂණ සියල්ල ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර අවශ්‍ය අනුමැතිය / නිරීක්ෂණ ලබාදීමට කටයුතු සිදු කර ඇත.

මධ්‍යම රජයේ චක්‍රලේඛ විධිවිධාන පළාතට අදාළ කර ගැනීම,සෞඛ්‍ය සේවයේ නිලධාරීන් වෙත අදාළ විධිමත් පත්වීම් ලිපි ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම ඇතුලු කටයුතු මෙන්ම පළාත් සභාව තුල විවිධ දීමනා ගෙවීම සහ පළාත් සභා අධිකාරි වල අදාළ කාර්යයන් වන අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් ආදිය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම/පත්කිරීම වැනි කටයුතු ද ඉටුකර ඇත.

බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම , පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන වල ප්‍රඥප්ති අනුමත කිරීම හා සංශෝධනය , අමාත්‍ය මණ්ඩල තීරණ සඳහා අනුමැතිය ලබාදීම, මධ්‍යම රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත පළාත් රාජ්‍ය සේවයට අනුකූල කරගැනීම, දිවයිනෙන් බැහැරවීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් අවසරය ලබා දීම වැනි පළාත් සභාවේ ප්‍රධාන කාර්ය භාරයන් රැසක් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මඟින් ඉටු කරනු ලබයි.

### කාර්ය මණ්ඩල කළමනාකරණය

පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල කළමනාකරණය, සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව

සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව දායක වීමේ මෙහෙවර ප්‍රමුඛ කරගනිමින් කටයුතු කරුණු ලබන උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභව මඟින්, 2023 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කරන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග සියල්ලම පවත්වන ලද අතර, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අඩුපාඩු රහිතව ඉදිරිපත් කරන ලද සියළුම සේවය ස්ථිර කිරීම්, උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම් ආදිය සිදු කර ඇත. එහිදී පරිවාස කාලයේ සේවය ස්ථිර කිරීම් 265 ක්ද, විශ්‍රාම ගැන්වීම් 95ක්ද උසස්වීම් 523 ක්ද වර්ෂය තුල සිදු කර ඇත. තවද උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට නිලධාරීන් 154 ක් අන්තර්ග්‍රහණය කර ඇත. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නව බඳවා ගැනීම් 52 ක් සිදු කර ඇත. බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අදාළ නිලධාරීන් කැඳවා දැනුවත් කර, ඒවායේ සංශෝධන සිදුකර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. එලෙස ඉදිරිපත් කරන ලද සංශෝධන පත්‍රිකා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර නැවත අදාළ ආයතන වෙත යොමු කර ඇත.විනය නියෝගවලට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් අදාළ පියවර ගෙන කටයුතු සිදුකර ඇත.ලැබී ඇති මානව හිමිකම් පැමිණිලි හා නඩු සම්බන්ධයෙන් අදාළ වාර්තා ලබා දී ඇත.සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ප්‍රතිඵල සනාථ කිරීම සිදුකර ඇත.සෞඛ්‍ය සේවයේ තනතුරු (PL කාණ්ඩයේ පත්වීම් හැර) සඳහා උතුරු මැද පළාත වෙත පත්වීම් ලද නිලධාරීන් වෙත උතුරු මැද පළාතට වර්තා කළ දිනම විධිමත් පත් වීම් ලබා දීමට කටයුතු සිදු කර ඇත.උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පවතින තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන අතර, ඉදිරිපත් කරන සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම්, උසස් කිරීම් ආදිය හැකි උපරිම අයුරින් කඩිනමින් ඉටු කිරීමට අපේක්ෂා කරයි. පවතින කාර්යාලයේ ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම, මානව සම්පත ප්‍රමාණවත් නොවීම හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවී ඇත. එබැවින් එම අඩුපාඩු නිවැරදි කර ගනිමින් වඩාත් ඵලදායි ලෙස 2024 වසර තුළ රාජ්‍ය සේවකයින්ගේ කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන අතර, ඉදිරි දැක්ම යටතේ 2024 වර්ෂයේ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ සියළුම ආයතනික කටයුතු විධිමත්ව ඉටු කිරීම, ඉල්ලීම් ඉදිරිපත් කරන ලද සියළුම බඳවා ගැනීම් සිදු කිරීම, නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි කලට පැවැත්වීම කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු සියළුම කරුණු වලට අදාළ තීරණ නිසි කළට ලබා දීම අපේක්ෂා කරනු ලබයි.

### පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

බලය බෙදා හැරීම හා ප්‍රාදේශීයව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවය ශක්තිමත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය මානව සම්පත් විභවතාවයන් විවර කිරීම කෙරෙහි අවශ්‍ය මනා පුහුණුව හා තාක්ෂණික දැනුමින් සන්නද්ධ කිරීමේ වගකීම පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකය වෙත පැවරී ඇත. ඒ අනුව මෙම වර්ෂය තුල 1765 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 38 ක්‍රියාත්මක කර ඇති අතර, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ මානව හැකියා, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම,

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් තුළින් පළාතේ ජනතාවගේ ජන දිවිය නංවාලීමට දායක වීම, සමාජ දැනුවත්භාවය තුළින් ආකල්ප වර්ධනය හා සාරවත් සමාජයක් ගොඩනැගීම, මානව ගරුත්වයෙන් සලකන නිසි පිළිගැනීමක් ලබාදෙන, මනා විනයක් හා ශික්ෂණයක් සහිත කාර්යක්ෂමතාවයකින් යුත් ආයතන ව්‍යුහයක් නිර්මාණය කිරීම,රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණුවේ සිට අඛණ්ඩ අධ්‍යාපනය හා අදාළ පුහුණු ලබාදීම තුලින් රාජ්‍ය නිලධාරියාගේ වගකීම, වගවීම, සමානාත්මතාව හා සංවේදී බව වැනි යහපාලන ලක්ෂණ ගොඩනැගීම, පුහුණුකරුවන් පුහුණු කිරීම තුළින් පළාතේ මානව සම්පත සංවර්ධනයට දායක වීමට අවශ්‍ය සම්පත්දායකයින් ජාතික මට්ටමින් බිහිකිරීම. යන ඉදිරි අරමුණු ළඟා කර ගැනීමට අපේක්ෂිතය.

## ආදායම් ඉහළ නැංවීම

“ප්‍රශස්ත ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්” යන දැක්ම යටතේ "සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."මෙහෙවර කර ගනිමින් කටයුතු කරනු ලබන පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පළාතේ ප්‍රශස්ත බදු රැස් කරන්නා වශයෙන් නවතම පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කරමින් හා නිලධාරීන් පුහුණු කිරීම මඟින් බදු හා ගාස්තු රැස්කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර පළාතේ සංවර්ධනයට විශාල දායකත්වයක් දරනු ලබයි. 2023 වර්ෂයේ රැස්කරන ලද තොරතුරු වලට අනුව සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 151.73 % ක් වේ. තවද 2018 සිට 2023 දක්වා වර්ෂවල ආදායම් ඉපයීමේ වර්ධනයක් වර්ධනයක් පෙන්නුම් කරන අතර, ආදායම් රැස් කිරීම සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම, පුරප්පාඩුව පැවති තක්සේරුකරු තනතුරු සම්පූර්ණ කිරීම හා නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමත්, දේපළ තක්සේරු කිරීම සඳහා නිවැරදි ක්‍රමවේද අනුගමනය කිරීම මගින් ඇතිවූ දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වාර්ෂික ආදායම් වර්ධනයට හේතුපාදක විය.




## පළාත් සැලසුම් හා මෙහෙයුම් ක්‍රියාවලිය

ඵලදායී පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක් යන දැක්ම මුල් කරගනිමින් “පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය , ප්‍රගති පාලනය හා ඇගයීම , අංග සම්පූර්ණ දත්ත පද්ධතිය අධ්‍යයන හා පර්යේෂණ, විදේශ ව්‍යාපෘති අධීක්ෂණය, පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන්, විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත්

කිරීමට අඛණ්ඩව දායකවීම" යන මෙහෙවර යටතේ කටයුතු කරනු ලබන පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ සිට වර්ෂය අවසානයේ ප්‍රගතිය සමාලෝචනය දක්වාම පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ වගකීම ඉටු කරනු ලබයි.

## තිරසාර සංවර්ධන අරමුණු කරා මෙහෙයවීම

පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වීමේ භාරදූර වගකීම ඉටු කරන ආයතනයක් ලෙස කටයුතු කරමින් 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කරන ලදී. ඒ යටතේ පළාත් හා මධ්‍යම රජයේ රාජ්‍ය නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. එපමණක් ද නොව පළාතේ සංවර්ධන සැලසුම් සකස් කිරිමේදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරවීමටත්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි පළාත් මට්ටමෙන් ජාතික මට්ටමට සැළකිය යුතු දායකත්වයක් ලබා දීමටත් හැකි වන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.




## පළාත් සංවර්ධන සැලැස්ම සැකසීම, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කිරීම

2023 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය. මේ යටතේ විවිධ මට්ටම් වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හීදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට 2023 වසරේදී කටයුතු කරන ලදී. ඒ අනුව, 2023 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පැවැත්වීම, (උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින්), දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම (අනුරාධපුර 04, පොළොන්නරුව 03) හා සංවර්ධන නිලධාරීන් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 01ක් පැවැත්වීම මගින් පළාත් සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ක්‍රමානුකූල ක්‍රමවේදයක් තුළ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. එහිදි අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

## විදේශාධාර ව්‍යාපෘතීන්හි දායකත්වය

උතුරු මැද පළාත ආර්ථික හා සාමාජීය වශයෙන් සංවර්ධන කිරීම උදෙසා දේශීය මූලාශ්‍ර මඟින් මෙන්ම විදේශීය මූලාශ්‍ර මඟින්ද විශාල දායකත්වයක් සිදු කරනු ලබයි. පළාතේ සංවර්ධනය උදෙසා මෙම විදේශ ව්‍යාපෘතින්හි දායකත්වය අපේක්ෂිත මට්ටමින් ලබා ගැනීමටත් ප්‍රතිලාභ අත් කර ගැනීමටත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවීම, සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය සිදු කිරීම හරහා අවශ්‍ය මඟ පෙන්වීම සිදුකරයි. 2023 වර්ෂය තුළදි රට තුළ පැවති විවිධ ආර්ථික දුෂ්කරතා මත විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විවිධ ගැටළුකාරි තත්ත්වයන් මතු වුවද විදේශ ව්‍යාපෘති මෙහෙයුම් කිරීම සිදුවිය. ඒ තුළින් තව දුරටත් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන ලදි.

## උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කිරිම

උතුරු මැද පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මඟින් තම දැක්ම හා මෙහෙවර අනුව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා 2023 වර්ෂය තුළ ක්‍රියාත්මන කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් කරමින් උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කරන ලදී.

## පළාත් සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණය භාවිතය

- **වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.**

උතුරු මැද පළාත් සැලසුම් ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් යාවත්කාලීනව පවත්වාගෙන යන වෙබ් අඩවි 34 න් 28 ක් Joomla CMS (Content Management System) වෙනුවට WordPress CMS (Content Management System) හට මාරු කර වෙබ් අඩවි සියල්ලෙහි යාවත්කාලීන කිරීම් කටයුතු සිදු කරමින් ආයතන වල සිටින නවක නිලධාරීන් හට වෙබ් අඩවි යාවත්කාලීන කිරීම පිළිබඳව නිරතුරුවම ඔවුන් හා සම්බන්ධ වී ප්‍රායෝගික පුහුණු හා අවශ්‍ය දැනුම ලබා දී එම වෙබ් අඩවි සියල්ලම යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදි. තවද, ඒ ඒ ආයතනයට අදාළව වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට පත් කර ඇති නිළධාරියා වෙන් වෙන් වශයෙන් දැනුවත් කර ගැටළු නිරාකරණය කර දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.

පළාත තුළ සිටින උපාධිධාරීන් ලියාපදිංචිය ද වෙබ් අඩවියටම සම්බන්ධ කර සියළු උපාධිධාරීන් ලියා පදිංචිය මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ සිදු කරනු ලබයි. අවුරුද්ද තුළ ලියාපදිංචි වූ 2000 කට අධික උපාධිධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යනු ලබයි. 2023 වර්ෂය පුරාවට වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා නවක නිලධාරීන් දැනුවත් කර වෙබ් අඩවියේ ගුණාත්මක භාවය ඉහළ නංවන ලදි. මෙම දැනුවත් කිරිම් අතරතුර විවිධ දැනුම් මට්ටම්වල සිටින නිළධාරීන් සඳහා අවශ්‍ය ෆොටෝෂොප් (photoshop) හා ග්‍රැපික් නිර්මාණකරණය (Graphic Design) දැනුමද ලබා දෙන ලදි.




### පද්ධති පරිපාලනය හා වෙනත් පද්ධති සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම

උතුරු මැද පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුළ ඇති සියළුම පරිගණක හා උපාංගවල දෝෂ නිවැරදි කිරිමත්, අන්තර්ජාල පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ගැටළු නිරාකරණය කිරීමත්, පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ඇති අන්තර්ජාල පද්ධතිය හා දුරකථන පද්ධතිය සම්බන්ධ(සේවාදායක කාමර) Server Room එක සහ (මාරු කාමර) Switcher Rooms පහක ක්‍රියාකාරීත්වය රැක ගැනීමත් සිදු කරන ලදි. පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට බාධාවකින් තොරව තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහාය ලබා දීම ඇතුළු පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් පළාත් තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යභාරය ඉටු කරමින් අදාල කාර්යසාධනය වෙත ළඟාවී ඇත.

- ✓ පළාත් රාජ්‍ය සේවයේ සියළුම ආයතනවල පරිගණක ජාලගත කිරීම
- ✓ තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම
- ✓ (සංවෘත පරිපථ රූපවාහිනිය) CCTV කැමරා පද්ධති සම්බන්ධ දෝෂ නිරාකරණය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාම
- ✓ ඇඟිලි සලකුණු යන්ත්‍ර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වා ගැනීම හා මාස් පතා ඇඟිලි සලකුණු වාර්තා ලබාදීම
- ✓ පරිපාලන ගොඩනැගිල්ල අභ්‍යන්තරය පමණක් අවරණය වන පරිදි ස්ථාපිත පොදු අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය ( Public Address System) සම්බන්ධ කටයුතු

### මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම

මේ වනවිට උතුරු මැද පළාතේ රාජ්‍ය ආයතනවල දත්ත ගබඩා පවත්වාගෙන යාම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී සංවර්ධන සැලසුම් සඳහා තීරණ ගැනීම සඳහා හා තොරතුරු දැන ගැනීම සඳහා අවශ්‍ය වන අත්‍යාවශ්‍ය දත්ත පවත්වාගෙන යාම සඳහා පළාත් පුහුණු ඒකකය සඳහා (පුහුණු කළමනාකරණ පද්ධතිය) Training Management System, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා (ආදායම් කළමනාකරණ පද්ධතිය) Revenue Management System, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා (විභාග ප්‍රතිඵල නිකුත්

කිරීමේ තොරතුරු පද්ධතිය) Examination Results Release Information System, පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා (සංවර්ධන සැලසුම් අධීක්ෂණ පද්ධතිය) Development Plan Monitoring System, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා (කෘෂිකර්ම සැලසුම් අධීක්ෂණ පද්ධතිය) Agriculture Plan Monitoring System, ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා (කාර්යමණ්ඩල තොරතුරු කළමනාකරණ පද්ධතිය) Carder information Management System, ලෙස මෘදුකාංග පද්ධති හයක් නිර්මාණය කර යාවත්කාලීනව පවත්වාගෙන යයි.

## පළාත් සංවර්ධනය උදෙසා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හා සංඛ්‍යාලේඛන ඒකකයේ දායකත්වය

උතුරු මැද පළාත අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වේ. කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් මහ නගර සභා දෙකක් ඇතුළු පළාත් පාලන ආයතන 27 ක් ඇත. එමෙන්ම, ග්‍රාම නිලධාරී තුලාන් 988 ක් ඇත. පළාතේ වර්තමාන ජනගහනය 1,536,064 පමණ වන අතර ජනගහන ඝනත්වය 145 ක් පමණ වේ. පළාතේ පාසල් 808 ක් ඇත. එමෙන්ම වැව්, වන ගහණය, මාර්ග පද්ධතිය, ආදායම් බල ප්‍රදේශ, රෝහල්, ආයුර්වේද මධ්‍යස්ථාන, සංචාරක ආකර්ශණ ස්ථාන, ආගමික සිද්ධස්ථාන, ඓතිහාසික ස්ථාන ඇතුළු බොහෝ දෑ පිළිබඳ භූගෝලීය තොරතුරු සිතියම්ගත කිරීම සියළු සංවර්ධන කටයුතු කෙරෙහි මහත් සේ ප්‍රයෝජනවත් වේ.

මෙම සියළු කරුණු පිළිබඳ පැහැදිළිව හඳුනා ගැනීම සඳහා සිතියම් සකස් කිරීම භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් සිදුකරණ ලදී. GIS තාක්ෂණය සමඟ බැඳී සිටිමින් මහජනතාවට හිතකර පරිසරයක් ඇති කිරීම හා අපගේ පළාත සඳහා තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා අදාළ කළමනාකරණ තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන විශ්වාසනීයවූත් යාවත්කාලීනවූත් දත්ත හා තොරතුරු ලබා දීම සිදු කරන ලදී. විශ්ලේෂණය හා අර්ථ නිරූපණය කිරීම සඳහා සිතියම් වඩා නිවැරදිව භාවිත කිරීම මෙහිදී සිදු කරන ලදි.

## සංඛ්‍යා ලේඛන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම

පළාතේ සියළු සංඛ්‍යාලේඛන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යමින් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු නිවැරදිව සහ කඩිනම්ව ලබා ගැනීමට අවස්ථාව සලසා දීම සංඛ්‍යා ලේඛණ අංශය මඟින් සිදු කරන අතර, එහිදී පහත දත්ත පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදු කරයි.

- පළාත් කෘෂිකාර්මික දත්ත පද්ධතිය.
- පළාත් සෞඛ්‍ය සේවා දත්ත පද්ධතිය.
- පළාත් අධ්‍යාපන කටයුතු පිළිබඳ දත්ත පද්ධතිය.
- පළාත් කර්මාන්ත, වෙළඳ හා සේවා පිළිබඳ දත්ත පද්ධතිය.
- රැකියා විරහිත උපාධිධාරීන් ලියාපදිංචි කිරීම පිළිබඳ දත්ත පද්ධතිය.

## ඉංජිනේරුමය කාර්යය

උතුරු මැද පළාතේ සියලු අමාත්‍යාංශ හා අනෙකුත් ආයතනවලට අයත් ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතුවලට අදාළ ඉංජිනේරුමය කාර්යයන් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන අතර, මෙම වර්ෂයේදී ආයතන 06 ක ව්‍යාපෘති 474ක් හා මධ්‍යම රජයේ ව්‍යාපෘති 12 ඉංජිනේරුමය කාර්යයන් තුලදී ඉටු හා මධ්‍යම රජයේ ව්‍යාපෘති 12 ඉංජිනේරුමය කාර්යයන් තුලදී ඉටු කර ඇත.

# 2.2 මූල්‍ය කළමනාකරණය

Financial Management



උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය කළමනාකරණයේ වගකීම පළාත් භාණ්ඩාගාරය හා පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අතර පළාත් සභා අරමුදලේ කටයුතු පවත්වා ගැනීම සඳහා වූ නීති රීති සහ ප්‍රතිපත්ති සකස් කිරීම, භාරකාරීත්වය දැරීම, අරමුදල් වියදම් දැරීම සහ ඒ සම්බන්ධ සියලු දෑ පිළිබඳ කටයුතු කිරීම තුලින් සාර්ථක මූල්‍ය පාලනයක් ඇති කිරීම වගකීම වේ. රාජ්‍ය මූල්‍ය පිළිබඳ තීරණ ගැනීම පිණිස මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන පළාත් සභා ආදායම්, වියදම්, අත්තිකාරම් ගිණුම් සහ තැම්පත් ගිණුම් ඇතුලු මූල්‍ය කටයුතු වාර්තා කිරීමේ මධ්‍යගත ආයතනය වශයෙන් පළාත් භාණ්ඩාගාරය මූල්‍ය කළමනාකරණය සඳහා දායක වේ.

## 2.2.1 මූල්‍ය කළමනාකරණයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය තුලදී මූල්‍ය කළමනාකරණයට අදාලව රු.මි. 1655.08 සමස්ථ ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, එය පිළිවෙලින් රු.මි. 71.43 ප්‍රතිපාදනයක් මූලධන වියදම් සඳහාත්, රු.මි. 1583.65 වූ ප්‍රතිපාදනයක් පුනරාවර්තන වියදම් සඳහාත් වෙන් කර ඇත. මෙහිදී, සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා වලට අමතරව අය-වැය සහය සේවා සඳහා මූල්‍ය කළමනාකරණය යටතේ අරමුදල් වෙන් කරන ලද අතර, සමාලෝචිත වර්ෂයේ, ගුරු හිඟ වැටුප් ගෙවීම සඳහා පුනරාවර්තන වියදම් යටතේ ද විශේෂ ව්‍යාපෘති හා සංවර්ධන සහයන් සඳහා මූලධන වියදම් යටතේ ද අරමුදල් වෙන් කිරීම සිදුකරන ලදී.

සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කළමනාකරණය සඳහා වූ තත්‍ය වියදම රු.මි. 417.08 වන අතර,

එය පූර්ව වර්ෂයේ මූල්‍ය කළමනාකරණය සඳහා වූ වියදම වන රු.මි. 397.30 සමඟ සැසඳීමේදී රු.මි. 19.78 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුල මූලධන වියදම් සඳහා සමස්ත ප්‍රතිපාදන වෙන් කිරීම් ප්‍රමාණය රු.මි. 6,354.50 වන අතර, පුනරාවර්තන වියදම් සඳහා සමස්ථ ප්‍රතිපාදන වෙන් කිරිම රු.මි. 30,734 කි.




## 2.2.2 මූල්‍ය කළමනාකරණයට අදාල භෞතික ප්‍රගතිය

ප්‍රශස්ථ මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක් යන දැක්ම මුල් කරගනිමින්, සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වා ගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් යුක්ත ව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම මෙහෙවර ප්‍රමුඛ කරගනිමින් කටයුතු කරනු ලබයි.

**මුදල් ප්‍රකාශ පිළියෙල කිරීම හා ප්‍රතිපාදන වෙන් කිරීම** - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උපලේඛණයේ 1 වන ලැයිස්තුවේ, පළාත් සභා වලට පැවරී ඇති විෂයන් වලට අදාළව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 25 වන වගන්තියේ සඳහන් කර ඇති නියමයන්ට අනුව 2023 වර්ෂයේ දී පළාත් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා දීමේ අරමුණින් වාර්ෂික මුදල් ප්‍රකාශය පිළියෙල කරන ලද අතර එමඟින් එක් එක් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම සිදු කරන ලදී.එසේ වෙන් කරන ලද ප්‍රතිපාදනයන් පළාත් මූල්‍ය රීති 29,30 යටතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කරන ලද ඉල්ලීම් අනුව මූලධන ස්වභාවයේ ප්‍රතිපාදන මාරු පත්‍ර 15 ක් හා පුනරාවර්ථන ස්වභාවයේ ප්‍රතිපාදන මාරු පත්‍ර 81 ක්ද වශයෙන් සමස්ථ

මාරු පත්‍ර 96 ක් අනුමත කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද පළාත් සභා අරමුදල සඳහා 2023 වර්ෂයේ දී විවිධ පාර්ශවයන් විසින් එනම් මහා භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා විදේශ ආධාර ලබා දෙනු ලබන ආයතන විසින් ලබා දෙනු ලැබූ ප්‍රතිපාදන වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන සලසා දෙනු ලැබූ අතර පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සිදු කරන ලද ඉල්ලීම් අනුව ශීර්ෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීම් ද සිදු කර දෙන ලදී. ඒ යටතේ පරිපූරක ප්‍රතිපාදන පත්‍රිකා 41 ක් සඳහා පළාත් මූල්‍ය රීති 27.1 වගන්තිය සහ 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 වන වගන්තියට ඉක්බිතිව එකතුකොට ඇති 27 (අ) නව වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. එසේම තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය අනුව පළාත් සංවර්ධනයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු නවයක් හඳුනාගෙන, එම අරමුණු වසර 2030 වන විට ළඟා කර ගැනීම සඳහා 2023 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී අවධානය යොමු කරන ලදී. තවද වාර්ෂික මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම,විසර්ජන ප්‍රඥප්තිය පිළියෙල කිරීම,පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ කටයුතු ,අයවැය කළමනාකරණය සහ පාලනය,ප්‍රතිපාදන මාරු කිරීම,සේවක සංඛ්‍යා තොරතුරු තබා ගැනීම හා පාලනය,අයවැය දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය,ඇස්තමේන්තු ලබා ගැනීම හා පරීක්ෂාව,අයවැය හා සැලසුම් කමිටු,පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් තීරණය කිරීම හා ප්‍රතිපාදන සැලසීම,අයවැය සාකච්ඡා,වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම,අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කිරීම,ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතා හා සැලසුම් තොරතුරු තබා ගැනීම,අතිරික්ත වියදම් හා අත්තිකාරම් ගිණුම් වල සීමා ඉක්මවීම් ද අවම සීමා වලට ලගා නොවීම් පිළිබඳ කටයුතු කිරීම,අයවැය සීමා ඉක්මවීම් හා සීමාවලට ලගා නොවීම සඳහා අනාවැකි ලබා ගැනීම,අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය ,පළාත් සභා සැලසුම්, අරමුණු, ඉලක්ක හා කාර්ය සාධන ලබා ගැනීම හා පවත්වා ගැනීම, අයවැය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඒ කාර්යයන් වේ.

2023 වර්ෂයේ දී පළාත් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීමේ අරමුණින් සකස් කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති අතර එම මුදල් ප්‍රකාශයේ පිටපත් සෑම ආයතනයක් සඳහාම ලබා දී ඇත.

## මුදල් හා ආදායම් කටයුතු

පළාත් සභා මූල්‍ය රීති අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යයනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, පළාත් සභා ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට ප්‍රඥප්ති සකස් කිරීම, භාණ්ඩාගාර චක්‍රලේඛ නිකුත් කිරීම , හා අමාත්‍යමණ්ඩල ප්‍රසම්පාදන කටයුතු වැනි කාර්යන් ප්‍රමුඛ කර ගත් මුදල් දෙපාර්තමේන්තුව ද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය, ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යයන් ප්‍රධාන කර ගත් ආදායම් දෙපාර්තුමේන්තුව ද මේ යටතේද සිදු වේ .

ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය, ආදායම් ප්‍රගති කටයුතු, ආදායම් වාර්තා පිළියෙල කිරීම, ආදායම් දත්ත තබා ගැනීම හා විශ්ලේෂණය, ආදායම් එකතු කිරීම, ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම, හිඟ ආදායම් ගිණුම්, මූල්‍ය රීති පැනවීම හා සංශෝධනය, මූල්‍ය අධීක්ෂණය,අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කටයුතු, පළාත් සභා දේපල පරිපාලනය,විගණකාධිපති වාර්ථා සඳහා පිළිතුරු සැකසීම හා ඊට අදාල පසු විපරම් කිරීම මෙහි ප්‍රධාන කාර්යයන් අතර වේ. තවද 2023 වර්ෂය තුලදී නව චක්‍රලේඛ 12 නිකුත් කිරීමට කටයුතු කළ අතර, එතුලින් පළාත තුල රාජ්‍ය මූල්‍ය පාලනය විධිමත් කිරීමට කටයුතු කරන ලදී.

<u>මුදල් දෙපාර්තමේන්තුව මඟින් පසුගිය වසර 05 ක මූලධන වත්කම් වාර්තාකරණය උතුරු -මැද පළාත</u>

| සංකේතය | විස්තරය | 2019.12.31 දිනට | 2020.12.31 දිනට | 2021.12.31 දිනට | 2022.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|---|---|---|
| 2101 | වාහන | 1,901,696,386.34 | 1,857,351,468.74 | 1,852,791,668.74 | 1,846,555,659.00 | 2,568,100,117.00 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,410,494,315.97 | 1,676,669,327.76 | 2,088,624,607.22 | 2,288,024,260.00 | 2,610,677,040.00 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 161,804,652.91 | 193,843,892.96 | 287,005,332.41 | 307,101,728.00 | 367,474,517.00 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 6,797,712,299.76 | 6,862,561,425.89 | 6,881,936,501.17 | 6,888,803,394.00 | 6,890,137,532.00 |
| 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 13,464,879,105.62 | 13,511,079,105.62 | 13,531,079,105.62 | 13,976,142,606.00 | 13,976,142,606.00 |
| | එකතුව | **23,736,586,760.60** | **24,101,505,220.97** | **24,641,437,215.16** | **25,306,627,647.00** | **26,412,531,812.00** |

**2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පළාත් පාලන ආයතන වලට උසාවි දඩ හා මුද්දර ගාස්තු නිදහස් කිරීම**

| විස්තරය | උසාවි දඩ | මුද්දර ගාස්තු | එකතුව |
|---|---|---|---|
| 2023.01.01 දිනට ආරම්භක ශේෂය | 126,989,664.31 | 41,674,723.19 | 168,664,387.50 |
| 2023 වර්ෂය තුල ලැබීම් | 368,453,754.92 | 63,497,661.00 | 431,951,415.92 |
| 2023 වර්ෂය තුල ගෙවීම් | 267,631,807.37 | 85,630,353.00 | 353,262,160.37 |
| 2023.12.31 දිනට ශේෂය | 227,811,611.86 | 19,542,031.19 | 247,353,643.05 |

## ගිණුම් හා ගෙවීම් ක්‍රියාවලිය

පළාත් සභා අරමුදල කළමනාකරණය හා අරමුදල් භාරය පවත්වාගෙන යාම, පළාත් අරමුදලේ ගිණුම් තැබීම මෙන්ම නියමිත හා අදාළ පොත් හා ගිණුම් පවත්වා ගැනීම,අග්‍රිම නිකුත් කිරීම, පාලනය හා අධීක්ෂණය, මාසික භාණ්ඩාගාර ගිණුම් වාර්තා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කිරීම හා පාලන කටයුතු, සේප්පුවල අනු යතුරු තබා ගැනීම,පළාත් සභාවේ සියලුම ගිණුම් පරිපාලනය සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම,පළාත් සභා අරමුදල් කළමනාකරණය හා අධීක්ෂණය,විදේශාධාර ගිණුම් තැබීම,අග්‍රිම සීමා නියම කිරීම හා සංශෝධනය, ගිණුම් ප්‍රසිද්ධ කිරීම, ගිණුම් වාර්තා පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමද ගිණුම් හා ගෙවීම් අංශ අධික්ෂණය යටතේ සිදුවේ.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියට අනුව පිහිටුවා ඇති පළාත් සභා අරමුදලට පාළාත් සභාව වෙත බලය පැවරි ඇති ප්‍රභවයන්ගෙන් එකතුවන සියලුම ආදායම්, මධ්‍යම රජය විසින් එකතු කර ප්‍රේෂණය කරනු ලබන බදු ආදායම් ශ්‍රි ලංකා ආණ්ඩුවෙන් පළාත් සභාවට ලබා දෙන ලද සියලුම ප්‍රදාන, ශ්‍රි ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියලුම ණය මුදල් සහ පළාත් සභාවට ලැබෙන සියලු ලැබීම් සහ පළාත් සභා ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීම් සහ වෙනත් ගෙවීම් කළමනාකරණය කිරීම සිදු කරයි.

එමෙන්ම, පළාත් සභා අරමුදල සම්බන්ධව අවශ්‍ය නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම, පළාත තුළ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත වරින් වර චක්‍රලේඛ නිකුත් කිරීම, උපදෙස් හා නියෝග නිකුත් කිරිම, වියදම් හා ආදායම් පිළිබඳ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම ආදී කටයුතු ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි. එමෙන්ම, 2023 වර්ෂය සඳහා සම්මත කරන ලද විසර්ජන ප්‍රඥප්තිය මගින් වෙන් කර දෙනු ලැබූ ප්‍රතිපාදන සහ පරිපූරක ප්‍රතිපාදන වලට අනුකූලව භාණ්ඩාගාරය වෙත වාර්තා කරනු ලැබූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී.

## අග්‍රිම නිකුත් කිරීම හා අරමුදල් රැස් කිරීම

2023 වර්ෂය තුල දී උතුරුමැද පළාත් සභාව සඳහා රුපියල් මිලියන 32,153 ට ආසන්න අරමුදල් රැස්කිරීමක් සිදු කර ගිණුම් ගත කරන ලද අතර රුපියල් මිලියන 30,415 ක වියදමක් දැරීම සඳහා අවශ්‍ය අග්‍රිම නිදහස් කරමින් හා ඒ හා සමාන වියදම් දැරීමත් නිවැරදිව ගිණුම් ගත කරන ලදි.එලෙසම පළාතේ ඒකීය ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඉන් පළාත් සභාවේ සියලුම ගිණුම් අංශ වල නිලධාරීන් පුහුණු කරන ලදි. ඒ අනුව පළාත තුල ඒකීය වූ විධිමත් ගිණුම්කරන ක්‍රමයක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වසර තුල හැකි විය.

## බැංකු ගිණුම් කටයුතු

උතුරු මැද පළාත තුල පවත්නා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සතු නිල බැංකු ගිණුම් 82 කට අදාලව පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් වෙනුවෙන් සකස් කරනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් පිළිබිඹු කරනු ලබන

මෙහෙයුම් හා පරිපාලන දෝෂ හඳුනාගෙන එම දෝෂ නිවැරදි කිරීමට උපදෙස් ලබා දීම මගින් පළාත තුල මූල්‍ය කටයුතු වඩාත් විනිවිධ භාවයකින් පවත්වාගෙන යාමට අවකාශ 2023 වර්ෂය තුලදී සලසා දෙන ලදි.

## පොදු තැන්පත් ගිණුම් කටයුතු

එලෙසම උතුරු මැද පළාතේ පවත්නා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 30 ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ක් ද මගින් පොදු තැන්පත් ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර එම ගිණුම් වල පවත්නා වර්ෂ 02 කට වඩා වැඩි ශේෂ නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කරමින් එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය සහයන් ලබා දීමෙන් පොදු තැන්පත් ශේෂ නිරවුල් කිරීමට සහය වීම පළාත් භාණ්ඩාගාරය විසින් සිදු කරන ලදි.

## අග්‍රිම ගිණුම් කටයුතු

තවද 2023 වර්ෂය ආරම්භයේ දී දීර්ඝ කාලයක සිට නිරවුල් නොවූ අග්‍රිම ශේෂ ආයතන 06 ක් සතුව පැවති අතර එම වර්ෂය තුල ආයතන 03ක එම නිරවුල් නොවූ ශේෂ නිරවුල් කර පළාත තුල අග්‍රිම ශේෂ ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයන ලදි.

## මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ඒ අනුව 2023 වර්ෂයේදී මෙම කාර්යභාර්ය ඉටු කිරීමේදී පළාත් භාණ්ඩාගාර මූල්‍ය කළමණාකරණ අධීක්ෂණ විෂය පථයට වැය ශීර්ෂ 30 ක්ද, පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 31 ක්ද, වාණිජ අත්තිකාරම් ගිණුම් 06 ක්ද, ඇතුලත් වන අතර පළාත් පාලන ආයතන 27 ක් ද, ප්‍රඥප්ති මගින් පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතන 06 ක් ද, හදිසි අවස්ථා අරමුදල් ගිණුම ද ඇතුලත්ව අරමුදල් ගිණුම් 6 ක මූල්‍ය අධීක්ෂණ කටයුතු මෙහෙයවීම හා ඒ සඳහා ගිණුම්මය උපදෙස් ලබාදීම සිදු කරන ලදී.

## පරිපාලන හා ගිණුම් කටයුතු

පළාත් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යනු ලබන මුදල් හා ආදායම්, ගිණුම් හා ගෙවීම් මෙන්ම අයවැය දෙපාර්තමේන්තු තුන සඳහා වන ආයතන හා පරිපාලන කටයුතු හා එම දෙපාර්තමේන්තු වල පරිපාලනයට අදාල ගිණුම් කටයුතු ඉටු කිරීම සඳහා වන වියදම් ශීර්ෂයෙහි සියලුම මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු මෙම අංශ මගින් ඉටු කරනු ලබන අතර ප්‍රාදේශිය පාලනයට අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල 29 ප්‍රතිපාදන බෙදා හැරිම, අක්මුදල් නිකුත් කිරිම, අදායම් වියදම් ගිණුම් ගත කිරීම හා ශීර්ෂයට අදාල අවසන් ගිණුම් පිළියෙල කිරිමත්, අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාමත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) යටතට ගැනෙන ආදායම් විෂයන් 9 කට ආදායම් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා වාර්ථා කිරීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ගේ අධීක්ෂණය යටතේ ඉටු කරන ලදි. ඒ අනුව 2023 වර්ෂයේදී පළාත් භාණ්ඩාගාරය වෙනුවෙන් වාර්ෂික ගිණුම් පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම හා ප්‍රාදේශිය පාලනයට අදාල අක්මුදල් නිදහස් කිරීමත්, ආදායම් ගිණුම් තැබීමත් සිදු කර ඇත. එලෙසම පළාත් සභාවේ සියලුම වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු වලට අදාල ක්ෂය සංචිත අරමුදල පවත්වාගෙන යාමත් පළාත් සභාව වෙත මධ්‍යම රජයේ ආදායමෙන් මාරු කරනු ලබන මුද්දර ආදායම්, උසාවි දඩ මුදල් හා වාහන බලපත්‍ර ආදායම් රැස් කිරීමත් ගිණුම් ගත කිරීමත් සිදු කරන ලද අතර පළාත්

සභාවේ සියලුම සේවකයන්ට අදාල වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කර ප්‍රේෂණය කිරීම සිදු කරන ලදි.එලෙසම පළාත් පාලන ආයතන සඳහා මාරු කරනු ලබන උසාවි දඩ හා මුද්දර ගාස්තු යන ආදායම් පළාත් පාලන ආයතන 34 වෙත නිදහස් කිරීම ද 2023 වර්ෂය තුල දී පළාත් භාණ්ඩාගාරය විසින් ඉටුකරන ලදි.

## විගණන හා විමර්ශන කටයුතු

2023 වර්ෂය තුල වාර්ෂික විගණන සැලැස්ම අනුව විගණන හා විමර්ශන වාර්තා 244 ක් නිකුත් කර ඇත. එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ පරීක්ෂණ 21 ක්, පාසැල් පෝෂණ ආහාර වැඩසටහන් පරීක්ෂණ 10 ක් හා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පෙත්සම් මත විශේෂිත විමර්ශන කටයුතු 33 ක් සිදු කරන ලදි. විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 24 ම පැවැත්වීම තුළින් අපේක්ෂිත ඉලක්කයම ළඟා කර ගැනීමට 2023 වර්ෂයේ දී හැකිවිය. 2023 වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක 1273 පරීක්ෂාවට ලක් කළ යුතුව ඇත. ඉහත ආයතන වල පවතින අවදානම් තත්ත්වයන් හඳුනාගෙන වාර්ෂික විගණන සැලැස්ම සකස් කරනු ලබන අතර, එම සැලැස්ම තුළ පරික්ෂාවට ලක් කළ යුතු දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රමුඛතාවයකට අනුව පෙළගස්වා තෝරාගත් ආයතන 244 ක් 2023 වර්ෂයේදී විගණනයට ලක් කර ඊට අදාළ වාර්තා නිකුත් කර අභ්‍යන්තර පාලන හා පද්ධති ක්‍රමයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී විගණන වාර්තා නිකුත් කිරීම, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා පෙත්සම් මත විශේෂ විමර්ශන සිදු කිරීමේ ඉහළ වර්ධනයක් සිදුවී ඇත. 2023 වර්ෂයේදී මීට පෙර වර්ෂවල සිදු නොකළ පාසැල් පෝෂණ ආහාර වැඩසටහන් 10 ක් ද විගණනයට ලක් කළේය.තවද 2024 වර්ෂයේ ළඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් ලෙස පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල සියළුම පරිපාලන ඒකක පරික්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම හා එම ආයතන වල පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පරීක්ෂා කර, එහි පවතින දුර්වලතාවයන් මගහරවාලීමට අවශ්‍ය උපදේශන හා මාර්ගෝපදේශන සේවා ලබා දීම,පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම, පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන වල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීම සිදු දැක්විය හැක. ආර්ථික අර්බුදකාරී තත්වයන් හමුවේ වුව ද 2023 වර්ෂය වෙනුවෙන් අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය වාර්තාකරණයේ දී හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පවතින සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ප්‍රශස්ථ ආකාරයට උපයෝජනය කිරීම මඟින් සාර්ථක ප්‍රතිඵල ලඟා කර ගැනිමට හැකිවිය.

## 2.3 ඉඩම් පරිපාලනය හා සංවර්ධනය

**Land Administration & Development**



පළාත් සභාවේ ආදායම් රැස් කරන්නන් අතර ප්‍රමුඛ ස්ථානයෙහිලා සිටින පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන ඉඩමක හිමිකම ලබාදීමේ කාර්යය සඳහා නිරන්තරව කැපවී සිටීන අතර එහි අධීක්ෂණය හා නියාමනය පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් සිදුකරයි.

පළාත් සභා පරිපාලනය යටතේ ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 හි ජීවත්වන මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දෙන අතර රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව සිදුකරමින් රජයේ ඉඩම් බැහැර කිරීම, අධීක්ෂණය, සංවර්ධනය හා සංරක්ෂණය යන කාර්යයන් ඉටු කිරීම සිදුකරනු ලැබේ.



## 2.3.1 ඉඩම් පරිපාලනය හා සංවර්ධනයට අදාල මුල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේදී ඉඩම් පරිපාලනය හා සංවර්ධනය වෙනුවෙන් රු.මි 95.56 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, එය රු.මි 7.50 වු මුලධන වියදමකින් හා රු.මි 88.06 වු පුනරාවර්තන වියදමකින් සමන්විත වේ. තවද 2022 වසර සඳහා ඉඩම් පරිපාලනය හා සංවර්ධනය වෙනුවෙන් රු.මි 90.42ක සමස්ථ ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එය සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සමඟ සැසඳීමේදි රු.මි 5.14 වැඩි වීමක් පෙන්නුම් කරයි.

සමාලෝචිත වර්ෂයේ ඉඩම් පරිපාලනය හා සංවර්ධනය සඳහා වු වියදම රු.මි 85.06 වන අතර, . එම වියදම පූර්ව වර්ෂය හා සැසඳීමේදී රු.මි 3.24 කින් වර්ධනය වී ඇත.







## 2.2.2 මුල්‍ය කළමනාකරණයට අදාල භෞතික ප්‍රගතිය

පළාත් ඉඩම් කොමසාරිස්ගේ මගපෙන්වීම හා මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පළාත් සභා පරිපාලනයට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක් තුල ඉඩම් රාජකාරි කටයුතු සිදුකරනු ලබයි. ඉඩම් බෙදා දීම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ශ්‍රී ලාංකික, අඩු ආදායම් ලාභී , ගොවි පන්තියට ප්‍රමබත්වයක් ලැබෙන පරිදි නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික, නේවාසික, කාර්මික, වාණිජමය අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම්ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් සහ ආයතන වලට ඉඩම් ලබාදීම සිදු කරයි. ඒ අනුව දෙපාර්තමේන්තුව පහත දක්වා ඇති කාර්යයන් යටතේ 2023 වර්ෂයේ ක්‍රියාකාරකම් සිදුකර කර ඇත.

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම.
- ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ධාරිතා සංවර්ධනය වැඩසටහන් පැවැත්වීම.

- රජයේ ඉඩම් වලින් බදු ආදායම රැස්කිරීම විධිමත් කිරීම.
- ආයෝජන කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කරමින් පූර්ණ උපයෝජනයක් සහතික කර ගැනීම සඳහා විවිධ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරකම් අඛණ්ඩව අනුගමනය කර ඇත. රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීමෙන්, ඉඩම් ගැටළු විසඳීමට නීතිමය සහ තාක්ෂණික සහාය දෙපාර්තමේන්තුව විසින් ලබාදීමෙන් රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය සඳහා දිරිගැන්වීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

ඒ අනුව සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් ඉඩම් කච්චේරි 389 ක් පවත්වා ඇති අතර එය ඉලක්ක කල ප්‍රමාණයෙන් 69%ක ප්‍රගතියකි. මෙම ඉඩම් කච්චේරි සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් ගණන 11501කි.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් නව බදුදීම් ප්‍රමාණාත්මකව ඉහළ යාම, ඉඩම් වල තක්සේරු වටිනාකම ඉහල යාම හා බදු එකතු කිරීම විධිමත් කිරීම මෙසේ බදු ආදායම වැඩිවීම සඳහා බලපෑ හේතු වන අතර ඒ අනුව 2023 වසරේදී බදු ආදායම 139%කින් වැඩිවීමක් පෙන්වා ඇත.

## මුහුණ දීමට සිදුවූ අභියෝග

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට අදාලව විවිධ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේ සැළසුම් කර තිබුණද මූලධන ප්‍රතිපාදන නොලැබීම මත ඉලක්ක කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 හි ඉඩම් රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් යොදවා ඇතත් තනතුරු 11 ක පුරප්පාඩු පවතී. ඒ අනුව රාජකාරී ආවරණය කරමින් කටයුතු කරගෙන යාමේ අභියෝගය පවතී.

## ඉදිරි වර්ෂ වල ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු

➢ පුද්ගලයන් වෙත හා අනෙකුත් ආයතනවල අවශ්‍යතාවලට බැහැර කිරීම සඳහා පවතින රජයේ ඉඩම් හඳුනාගැනීම යටතේ ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම හා රජයේ ඉඩම් භුක්ති විඳින අනවසරකරුවන් වෙත ඉඩම් අයිතිය නියාදනය කිරීම සඳහා පවතින නීති රෙගුලාසි අනුව කඩිනමින් කටයුතු කිරීම.

➢ රජයේ ඉඩම් තොරතුරු පිළිබඳව දත්ත බැංකුවක් සකස් කිරීම.

➢ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ දීමනාපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන අතර ඉඩම් කච්චේරි පැවැත්වීමේ ක්‍රියාවලියද මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

➢ ඉඩම් බදු ආදායම් ඉපයීම කාර්යක්ෂම කිරීම සඳහා සියළු බදු කරුවන්ගේ දත්ත රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට (e-slims) ඇතුල් කිරීම

➢ රජයේ ඉඩම්වල පවතින රජයේ දෙපාර්තමේන්තු හා වෙනත් රජයේ ආයතන, ත්‍රිවිධ හමුදාවට අයත් ආයතන, බෞද්ධ විහාරස්ථාන හා අනෙකුත් ආගමික ස්ථාන ආදිය සඳහා ඉඩම් පවරාදීම කඩිනම් කිරීම.

➢ අනුග්‍රාහක පදනමින් කෘෂිකාර්මික, වාණිජ හා කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීම මඟින් පළාතේ ආර්ථික සංවර්ධනය උදෙසා දායක වීම.

➢ බදු ආදායම රැස්කිරීම විධිමත් කිරීම සඳහා බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නියමිත පරිදි බදු ගෙවීමේ වැදගත්කම පහදාදීම හා බදුකරුවන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම මඟින් දැනට පවතින හිඟ බදු ආදායම එක්රැස් කිරීමටත් බදු ගෙවීම පැහැර හරින්නන් සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමටත් කටයුතු කිරීම.

➢ රජයේ ඉඩම්වල පවතින ගල්,බොරළු කැණීම් කිරීමෙන් පසු අත්හරින ලද ස්ථාන වැනි ඌන භාවිත ඉඩම් ඵලදායී ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට හැකි අයුරින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම.

උදා :කාබනික වගා ව්‍යාපෘති ,කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති ,සූර්ය බල පද්ධති වැනි ව්‍යාපෘති සඳහා බදු අයකිරීමේ පදනමින් ඉඩම් බැහැර කිරීම.

➢ රජයේ ඉඩම් වල වටිනාකම ඉහළ නැංවීම සඳහා එකී ඉඩම් ඵලදායීව සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් මහජනතාවට අවශ්‍ය භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම.

➢ දැනටමත් බැහැර කර ඇති සංවර්ධනය කර නොමැති රජයේ ඉඩම් (දීර්ඝකාලීන බදු බලපත්‍ර ,දීමනාපත්‍ර ,ඉඩම් සංවර්ධන ආඥා පනතින් ලබාදුන් බලපත්‍ර) නැවත රජයට ලබා ගැනීමට හෝ සුදුසුකම් සහිත ආයෝජකයින් වෙත ලබාදීම හෝ මඟින් එම ඉඩම් සංවර්ධන කාර්යයට දායක කර ගැනීම සඳහා සුදුසු ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම.

➢ රජයේ ගොඩනැගිලි) උදා :පාසල් , රෝහල, විවිධ රාජ්‍ය ආයතන හා රජයේ ආයතන වෙත ලබාදී ඇති ඉඩම් ඵලදායී ව්‍යාපෘති සඳහා යෙදවීමට හැකිවන පරිදි සුදුසු ක්‍රමවේදයක් සැකසීම.

උදා : රජයේ ගොඩනැගිලි වල පියසි මත සූර්ය කෝෂ ස්ථාපනය කර සූර්ය ශක්තියෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා සුදුසු ආයතන වෙත බදු දීමට කටයුතු කිරීම.

➢ රජයේ ඉඩම් නීතිය ඉතා සංකීර්ණ ස්වභාවයක් ගෙන ඇති බැවින් ඒ පිළිබඳව රජයේ නිලධාරීන් මෙන්ම පොදු මහජනතාව නිරන්තරයෙන්ම දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම.

## 2.4 වාරි මාර්ග හා ජල කළමනාකරණය

Irrigation & Water Management



කෘෂිකාර්මික පළාතක් වන උතුරු මැද පළාත මගින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයෙන් ඉහළ දායකත්වයක් ලබාදීම අරමුණු කර ගනිමින් පළාත් සභා විෂය පථයට අයත් සුළු වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය හා නඩත්තු කිරීමේ වගකීම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර එහි කටයුතු අධීක්ෂණය හා නියාමනය පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි.

එහිදී ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පවතින පළාත් වාරිමාර්ග පද්ධති වැව් තුන්දහස් දෙසිය විසි හයක (3226) ගොවිබිම් අක්කර එක්ලක්ෂ තිස්නව දහසකට (139,000) ආසන්න ප්‍රමාණයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය හා බැදේ

### 2.4.1 වාරිමාර්ග හා ජල කළමනාකරණයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා වාරිමාර්ග හා ජල කළමනාකරණය වෙනුවෙන් රු.මි. 747.79 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි. 330.29 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි 417.50ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව වාරිමාර්ග හා ජල කළමනාකරණයට අදාලව වෙන් කරන ලද රු.මි. 406.86 වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේදී එය රු.මි 340.93 ක වැඩි වීමකි.

එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි. 337.12 වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි. 115.84 පුනරාවර්තන වියදමකින්ද, රු.මි. 221.27 මූලධන වියදමකින්ද සමන්විත වේ. මෙම වියදමද පූර්ව වර්ෂය හා සැසඳීමේදී රු.මි. 231.57 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.




2023 වර්ෂය සඳහා වාරි මාර්ග හා ජල කළමනාකරණය සඳහා වෙන් කරන ලද සමස්ථ වියදමෙන් 66% ප්‍රමාණයක් මූලධන වියදම් සඳහාද 34% ප්‍රමාණයක් පුනරාවර්තන වියදම් සඳහාද වෙන් කර ඇත.



## 2.4.2 වාරිමාර්ග හා ජල කළමනාකරණයට අදාල භෞතික ප්‍රගතිය

අතීත උරුමයන් ආරක්ෂා කර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හි ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීමේ මෙහෙවර මුල් කරගනිමින් "ප්‍රශස්ථ වාරි කළමනාකරණයක්, සෞභාග්‍යවත් ගොවි ප්‍රජාවක්" යන දැක්ම යටතේ කටයුතු කරනු ලබන වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වාරි පද්ධති පුනරුත්තාපනය කිරීම,වාරි පද්ධති නඩත්තු කිරීම, වාරි පද්ධතිවල අවශ්‍ය අංග අලුතින් ඉදිකිරීම, ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම, ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම, පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම,අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම යන ප්‍රධාන කාර්යය භාරයන් ඉටු කරයි.

ඒ අනුව සමාලෝචන වර්ෂය තුලදී ප්‍රතිපාදන වෙන් කිරීමේ දී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ රුපියල් මිලියන 247 සහ සාමූහික ප්‍රදාන (BG) යටතේ රුපියල් මිලියන 235ක් වශයෙන් රුපියල් මිලියන 482 ක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත වෙන් කර දෙන ලදි. එම ප්‍රතිපාදන යොදවා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ නව ව්‍යාපෘති 8ක්, අඛණ්ඩ ව්‍යාපෘති 1ක් සහ අතැති බිල් ගෙවීම් 18 ක් ද සාමූහික ප්‍රදාන (BG) යටතේ නව වැඩ 122ක් (වැව් බැඳිපුර පිපෙන සියපත් ශ්‍රමදාන වැඩසටහනට ඇතුලත් වැව් 100 ද ඇතුළුව) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව මෙම ව්‍යාපෘති වල මූලික විමර්ශන වාර්තා සකස් කර ඇස්තමේන්තු කටයුතු ද සිදු කරන ලදි.

නමුත් වියදම් පාලනය පිළිබඳ අයවැය චක්‍රලේඛ 02/2023 හා 2023.02.02 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සැලසුම් කල පරිදි අඛණ්ඩ ව්‍යාපෘති හැර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට නොහැකි විය.

කෙසේ නමුත් 2023 වසරේ 3වන කාර්තුවේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 20ක් ද සාමූහික ප්‍රදාන යටතේ රු.මි.41.5ක්ද හිමිවිය. ඒ වන විට පැවති කාලගුණත්වය, මහ කන්නයේ ගොවිතැන් ආරම්භ කර තිබීම සහ වසරේ ඉතිරි වී තිබූ කාලය යන කරුණු සැලකිල්ලට ගනිමින් මේ යටතේ අතවශ්‍ය නඩත්තු කටයුතු 33ක් පමණක් සිදුකිරිමට හැකිවිය.

2024 වසර තුල නව ව්‍යාපෘති හා අඛණ්ඩ ව්‍යාපෘති සියල්ලෙහිම 100% ක භෞතික ප්‍රගතියක් ලගා කර ගැනීමට අපේක්ෂා කරන අතර ගොවි ජනතාව වෙත වඩාත් ඵලදායි සේවයක් මෙමගින් සැලසීමට අපේක්ෂා කරනු ලැබේ.

## 2.5 කෘෂි/ධීවර කාර්මික සංවර්ධනය

Agriculture Development




උතුරු මැද පළාත කෘෂිකර්මාන්තය තුලින් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන අතර එහි කටයුතු අධීක්ෂණය හා නියාමනය පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සිදුවේ. වත්මන් ආර්ථික හා සමාජයීය අර්බුදකාරී වාතාවරණය තුළ පළාතේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු සුවිශාල වගකීමකි.

මෙහිදී, නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය පළාත තුල ප්‍රචලිත කිරීම, ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය, ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීම, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය, වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය, කෘෂි කාර්මික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන අතර, පළාතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයන් මෙහෙයවීම හා අධීක්ෂණය, ඔවුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, පසු විපරම් කටයුතු හා ඔවුන්ගේ කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම, මිරිදිය ධීවර විෂයට අදාළව ධීවර නිෂ්පාදිත වර්ධන වැඩසටහන් මෙහෙයුම් හා අධීක්ෂණය වැනි ධීවර කර්මාන්තයට අදාල ක්‍රියාවලිය කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සිදුකෙරේ.



### 2.5.1 කෘෂි කාර්මික සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය කෘෂි කාර්මික සංවර්ධනය වෙනුවෙන් රු.මි. 1520.87 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි. 264.15 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි. 1,256.72ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මි. 648.80 වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේදී එය රු.මි. 607.92 ක වැඩි වීමකි. එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි. 1,401.71 ක සත්‍ය වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි. 207.09 පුනරාවර්තන වියදමකින්ද, රු.මි. 1,194.61 මූලධන වියදමකින්ද සමන්විත වේ. මෙම වියදමද පූර්ව වර්ෂය හා සැසඳීමේදී රු.මි. 912.65 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.







තවද කෘෂි තාක්ෂණ කටයුතු ඉහළ නැංවීම හා ප්‍රවර්ධනය සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තු මුදලින් හා සත්‍ය වියදම තුල ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහාද මුදලක් වෙන් කරනු ලබයි. එහිදී සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත මුදලින් රු.මි 43 ක මුදලක් මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද අතර, ඒ සඳහා එම වර්ෂය තුල රු.මි 19.38 සත්‍ය මූලධන වියදමක් දරණ ලදී.

.






## 2.5.2 කෘෂි කාර්මික සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ මුලු බිම් ප්‍රමාණය වර්ග කිලෝමිටර 65,610 කි. එයින් වර්ග කිලෝමීටර 10,472 ක භූමි ප්‍රමාණයක් උතුරු මැද පළාතට අයත් වේ. අනෙකුත් පළාත් සමග සංසන්දනය කිරිමේ දි අභ්‍යන්තර ජලාශ සහිත වැඩිම භූමි ප්‍රමාණයක් අයත් වන්නේ ද උතුරු මැද පළාතටයි.එයට කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වැව් 2777 වැඩි ප්‍රමාණයක් අයත් වේ. (දත්ත මුලාශ්‍ර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

ඒ අනුව ඉහල කෘෂිකාර්මික විභවයක් සහිත උතුරු මැද පළාතේ නිෂ්පාදනය කරනු ලබන බෝග අතර වී වගාව ප්‍රධාන වේ. මධ්‍යය හා සුළු වාරි යටතේ යල කන්නය තුල හෙක්ටයාර 35,000කට ආසන්න බිම් ප්‍රමාණයක්ද මහ කන්නයේදි හෙක්ටයාර 70,000කට ආසන්න බිම් ප්‍රමාණයකද අස්වද්දනු ලබයි.

එමෙන්ම උතුරු මැද පළාත අතිරේක ආහාර බෝග නිෂ්පාදනයටද ඉහළ දායකත්වයක් ලබාදෙනු ලබයි. බඩඉරිඟු, උඳු, මුං, කව්පි, කුරක්කන්, තල හා මිරිස් වැනි බෝග 13 අස්වැන්න ඉහළ දැමීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්. ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික හා ජීවන තත්ත්වය ඉහළ දැමීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර දේශිය අවශ්‍යතාවයෙන් 60% වැඩි එළවළු නිෂ්පාදනයක්ද සඳහාද දායකත්වයක් ලබාදෙනු ලබයි.

පර්යේෂණ ආයතන මගින් සොයා ගන්නා ලද නව බීජ ප්‍රභේද මෙන්ම නව තාක්ෂණය ගොවීන් අතරට ගෙන යාම මෙන්ම ඒ සඳහා ආදර්ශන ක්‍රියාත්මක කිරිම හා නිරන්තර ක්ෂේත්‍ර අධීක්ෂණය කරමින් අදාල පර්යේෂණ ආයතන සඳහා සහාය දැක්වීම හා ගොවින්ගේ කෘෂිකාර්මික ගැටළු පර්යේෂණ ආයතන වෙත ඉදිරිපත් කරමින් විභව අස්වැන්න කරා ගමන් කිරිමට දායකත්වයක් ලබාදිම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වේ.

මෙයට අමතරව ලොකු ළූණු බීජ නිෂ්පාදනය සඳහා මව් බල්බ වසන්තීකරණයට පහසුකම් ලබා දීම මගින් බීජ නිෂ්පාදනය ඉහළ දමමින් බීජ ආනයනය අඩු කිරීම තුල විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා දායකත්වය ලබාදෙනු ලබයි.

එමෙන්ම ගොවි කාන්තා ව්‍යයසායකත්වය වැඩි කිරීමේ අරමුණ ඇතිව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, හෙළ බොජුන් වැඩසටහන, ආහාර තාක්ෂණික වැඩසටහන් මඟින් විවිධ නිෂ්පාදන මුලික කරගනිමින් කෘෂි ව්‍යවසායයින් බිහිකිරිම සඳහා දායකත්වය ලබාදේ. උදාහරණ ලෙස සහල් පිටි නිෂ්පාදන වැඩසටහන්, ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන, පළතුරු ආශ්‍රිත නිෂ්පාදන, මෙන්ම මල් වගාව මගින් ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දී ඇත. තවද තරුණ ගොවීන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මඟින් පවුලේ පෝෂණය, ආර්ථිකය මෙන්ම පවුලේ සහයෝගිතාව වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබූ අතර ගෙවතු නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථාව සලසා දීම සඳහා “පාරිභෝගික සෞඛ්‍ය ගොවියාගේ වත්කම” යන ආදර්ශ පාඨය මුල් කර ගනිමින් “farm market” සංකල්පය තුලින් කෘෂි රසායන අවම කාබනික නිෂ්පාදන පාරිභෝගික ජනතාවට ලබා දීම සඳහා මෙම වසරේදී ද කටයුතු කර තිබේ.

ඉහත කරුණු වලට අමතරව පළතුරු වගා වපසරිය වැඩි කිරිම සඳහාත් , දැනට තිබෙන වගාවන්හි ඵලදායිතාව ඉහළ දැමීමටත් නිෂ්පාදන සඳහා ගුණත්වය සහතික කිරිම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ( GAP ) සහතිකය ලබා දීම සඳහාත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. (උදා: කප්පාදු වැඩසටහන්, රෝග හා පළිබෝධ පාලන වැඩසටහන් හඳුන්වා දිය හැක.)
නිෂ්පාදන පිරිවැය අවම කිරිමටත් පොහොර කළමනාකරණය ඉහල දැමීමටත් නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ දැම්මත් මූලික කරගනිමින් වගාබිම් තුල පාංශු පරීක්ෂා සිදුකර අවශ්‍යය පොහොර නිර්දේශ ලබාදිමට කටයුතු කර ඇත.

උතුරු මැද පළාත තුළ වෙසෙන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැන වන අතර ඔවුන්ගේ හදවතට සමීප වෙමින් නව තාක්ෂණික දැනුම ලබා දීමටත් ක්ෂේත්‍ර අධීක්ෂණයත් හා පුහුණු වැඩසටහන් මඟින් ගොවි ජනතාවට අවශ්‍ය සහාය නිරතුරුව ලබා දීමටත් සම්පත් කාර්යක්ෂමව හා තිරසර ලෙස යොදා ගැනිමට ගොවින් නැඹුරු කරවිමත් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිරන්තරයෙන් සිදුකරනු ලබයි. එමෙන්ම පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල මූල්‍ය සහාය ලබා ගනිමින් උතුරු මැද පළාත් ගොවි ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනභිභවනීය සේවයක් අද මෙන්ම හෙටත් සිදු කරනු ලබයි.
ඉහත කාර්යභාරය මත පිහිටා තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරිම ආයතනයේ දැක්ම වන අතර නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාවය හා පරිසර හිතකාමි කෘෂිකර්මාන්තය වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියලුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිද භාවයෙන් යුතුව සංවර්ධනය කිරිම මෙහෙවර වේ.

වී වගාවේ නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැන්වීම අරමුණ කර ගනිමින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර.වී වගාවට අදාල තාක්ෂණ පැකේජයන් අනුගමනය කරමින් , සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙට්රික් ටොන් 4 සිට (අක්කර බුසල් 80 ) හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 5.3 (අක්කර බුසල් 105 ) දක්වා ඉහළ නැංවීමට හැකියාව ලැබීම ලද ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිය.










පලුගස්වැව
කෘෂිකර්ම
උපදේශක
කොට්ඨාශය-
ඵලදායිතාවය
ඉහල නැංවීමේ
යාය වැඩසටහන







ඵලදායිතාවය ඉහල නැංවීමේ යාය වැඩසටහන් 100 ක්-2023 වර්ෂය තුල සාර්ථකව ක්‍රියාත්මක කළ අතර එමගින් නව තාක්ෂණය ගොවීන් වෙත ගෙනයෑමට හැකියාව ලැබිණි. මෙමගින් අක්කරයකින් ලබාගත් අස්වැන්න අක්කරයට බුසල් 115 දක්වා වැඩිකර ගැනිමට හැකි විය.




2023 වර්ෂයේ යල කන්නය සඳහා මුලාා ප්‍රතිපාදන නොමැති වුවද වී වගාවේ ඉලක්ක කල බිම් ප්‍රමාණයෙන් 70% ක ප්‍රගතියක් ලඟාකර ගැනීමට හැකිවිම .එමෙන්ම යල කන්නයේ වී නිෂ්පාදනයෙන් 26% ක දායකත්වයක් ජාතික නිෂ්පාදනයට ලබාදීමට හැකිවිය.




## බිත්තර වී සැපයුම

**2023** මහ කන්නයේ වී වගා වපසරිය හෙක්ටයාර 70,000 කට ආසන්න වන අතර ඒ සඳහා අවශ්‍යය බිත්තර වී නිෂ්පාදනය යල කන්නයේ සිදුකරනු ලබයි. ඒ අනුව මහ කන්නය සඳහා වු බිත්තර වී අවශ්‍යතාවයෙන් 5% පමණ ප්‍රමණයක් නිෂ්පාදනය කර ගොවින් අතර හුවමාරු කරගැනීමට හැකිවිය.







බිත්තර වී නිෂ්පාදනය තුලින් ඉහළ ආදායමක් ලබාගැනීමට හැකිවන අතර එය ගොවිජනතාවගේ ජීවන තත්වය ඉහළ දැමීමට උපකාරි වේ.2023-24 මහකන්නයේ බීජ වී නිෂ්පාදනයේ බුසල් 8778 ක සාම්පල් ලබාගෙන තත්ත්ව පරීක්ෂණ සදහා යොමුකර ඇත.එය පසුගිය වසරට සාපේක්ෂව ඉහළ අගයක් වේ.

| වැඩසටහන | බීජ වර්ගය | ලේබල් යෙදූ ප්‍රමාණය (බුසල්) |
|---|---|---|
| බීජ වී නිෂ්පාදන යාය වැඩසටහන | Bg 374 | 240 |
| | Bg 360 | 172 |
| | Bg 352 | 110 |
| | Bg 375 | 178 |
| | Bg 409 | 170 |

**මුළු බිත්තර වී නිෂ්පාදනය බුසල් 870 වන අතර මුළු ආදායම රුපියල් මිලියන 2.88 වේ. ශුද්ධ ලාභය රුපියල් මිලියන 1.3 පමණ විය**

හොරොව්පොතාන කෘෂි උපදේශක කොට්ඨාශයේ එම්.කුමාරවංශ මහතා අක්කර 15 භූමි ප්‍රමාණයක බිත්තර වී නිෂ්පාදනය කර අස්වැන්න ලෙස බුසල් 1200 ලබාගත් අතර ඉන් බුසල් 870 ක් බිත්තර වී ලෙස ලියාපදිංචි කරගත හැකිවිය.



හොරොව්පොතාන -බිත්තර වී නිෂ්පාදනය

## අධිසණත්ව ක්‍රමයට වගා කිරීම

අධිගනත්ව ක්‍රමයට බඩඉරිඟු වගා කිරිම හා යාන්ත්‍රිකරණය මගින් ඒකක නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමටත් සාමාන්‍ය වගාවට සාපේක්ෂව ඉහළ අස්වැන්නක් හා ඉහළ ආදියමක් ලබාගැනීමට හැකිවීම





**අධිගනත්ව බඩඉරිඟු වගාව -කැකිරාව**

| ක්‍රියාකාරකම | දළ වියදම (රුපියල්) |
|---|---|
| මූලික බිම් සැකසීම | 18,500.00 |
| බීජ සඳහා | 24,500.00 |
| ශ්‍රමය | 31,500.00 |
| රසායනික පොහොර සඳහා | 52,000.00 |
| වල් මර්ධනය හා අනෙකුත් නඩත්තු | 22,250.00 |
| කෘමිනාශක | 9,200.00 |
| මුළු වියදම | 157,950.00 |

මෙහිදි ලබාගත් මුළු අස්වැන්න කිලෝග්‍රෑම් 1800 වු අතර ඒකක නිෂ්පාදන පිරිවැය රුපියල් 87.00 පමණ වී ඇත.ඒකකයක විකුණුම් මිළ රුපියල් 145.00 වු අතර මුළු ආදායම රුපියල් 261,000.00 විය.මිරිස් වගාව සඳහා තාක්ෂණික පැකේජ හා $MICH_1$ දෙමුහුම් බීජ භාවිතා කර සිදුකල අක්කර 1/4 වගාවෙන් ලක්ෂ 25 ක ආදායමක් ලබාගැනිමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දායකත්වය ලබාදෙන ලදි.එමෙන්ම ආරක්ෂිත ගෘහ හා කෘමි ආරක්ෂිත දැල් භාවිතා කර බෝග වගා කිරිම තුලින් ඉහළ ආදායමක් ලබාගැනිමට හැකිවිම විශේෂ ජයග්‍රහනයක් ලෙස දැක්විය හැකිය.

අතිරේක බෝග වගාවේ ප්‍රධාන කන්න දෙකට අමතරව අතරමැදි කන්නයේ වගාව තුලින් අමතර ආදායමක් ලබාගැනිමට ගොවින්ට හැකිවු අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය හා උපදේශනය ලබාදිමට හැකවිය.නැගම්පහ කෘෂි උපදේශක කොටසේ අතරමැදි කන්නයේ මුං වගාව සාර්ථකව සිදුකල අතර MI-6 ප්‍රබේදයෙන් අක්කර 40 ක බිම් ප්‍රමානයක් සඳහා ගොවින් 100 දෙනෙකු සහභාගි විමෙන් සාමාන්‍ය අස්වැන්න අක්කරයට කිලෝග්‍රෑම් 525 ක් ලබාගන්නා ලදි.එහිදි කිලෝග්‍රෑම් එකක් රුපියල් 975.00 වු සාමාන්‍ය මිළට අළවි වු අතර රුපියල් මිලියන 20 පමණ ආදායමක් ගොවින් අතර බෙදි යන ලදි.











නෑගම්පහ -අතරමැදි කන්නයේ මුං වගාව

## කෘමි ආරක්ෂිත දැල් භාවිතය

පළතුරු වගා ඵලදායිතාව ඉහළ නැන්වීම අරමුණු කර ගනිමින් කෘමි ආරක්ෂිත දැල් භාවිතා කර කොමඩු වගා කිරිම තුලින් ඉහළ අස්වැන්නක් ලබාගැනිමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහනයක් ලෙස දැක්විය හැක. තන්තිරිමලේ කෘෂිකර්ම බල ප්‍රදේශයේ අක්කර ¼ බිම් ප්‍රමාණයක කොමඩු වගාකර රු. 1,102,500.00 ක ආදායමක් උපයාගන්නා ලදි. පළමු වාරයේදී තාක්ෂණික පැකේජය භාවිතා කර කොමඩු වගා කිරීම සඳහා ගොවි මහතාට මූලික නිෂ්පාදන වියදම ලෙස රු. 231,400.00 ක මුදලක් දැරීමට සිදු විය. (කොමඩු 1 Kg සඳහා නිෂ්පාදන වියදම - රු. 35.00 ) නමුත් දෙවන වර වගා කිරීමේදි මුලික වියදම ඉතා අඩු විය. එහිදී මූලික නිෂ්පාදන වියදම ලෙස දැරීමට සිදු වූයේ රු. 63,000.00 ක මුදලක් පමණි. (කොමඩු 1 Kg සඳහා නිෂ්පාදන වියදම - රු. 9.00) මෙම කෘමි ආරක්ෂිත දැල තුළ කොමඩු වගාව අඛණ්ඩව වාර 4-5 ක් පමණ සිදු කිරීමට හැකිය. පසුව බෝග මාරුවකට යොමු විමෙන් අඛන්ඩව එම භූමිය වගා කටයුතු සඳහා යොදාගත හැකිය.





## යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)

දේශිය හා විදේශිය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් GAP (යහපත් කෘෂිකාර්මික පිළිවෙත්) සහතික ලත් ගොවිපොළ 100 සඳහා 50% ගොවි දායකත්වය යටතේ එලාවරණ ලබාදීම මෙන්ම නැගම්පහ සහ ආඩියාගල පළතුරු ගම්මාන දෙකක්ද, කපුගොල්ලෑවේ සහල් ගම්මාන දෙකක්ද ඇතිකල අතර , ගොවින්ගේ දැනුම හා කුසලතා සංවර්ධනය සඳහා ක්ෂේත්‍ර චාරිකා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එළවළු වගාවේ කෘමි පළිබෝධ පාලනයට කහ බල්බ පද්ධති යොදා ගැනීම තුල සෞඛ්‍යාරක්ෂිත කෘෂි නිෂ්පාදන ප්‍රචලිත කිරිම හා කෘෂි රසායන භාවිතය අවම කිරිමටත් හැකිවීම ලද ජයග්‍රහනයක් ලෙස දැක්විය හැක. එමෙන්ම ගොවින්ගේ සංවිධාන ශක්තිය හා ක්ෂය ශක්තිය ඉහළ දැමීම අරමුණු කර ගනිමින් කෘෂි සමුපකාර සමිති පිහිටුවන ලදි.




කෘෂි සංචාරක (Agro tourism) ප්‍රවර්ධනය සඳහා හිරිවඩුන්න ප්‍රදේශයේ පාරම්පරික නිවාස 13ක විදේශ ආකර්ෂණයට සුදුසු පරිදි එම ගෙවතු වල භූමි අලංකරය සඳහා අවශ්‍ය මුල්‍යය හා තාක්ෂණික සහය ලබාදෙමින් විදේශ විනිමය රටතුලට ගෙන ඒම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ දිරි ගන්වමින් නව ව්‍යවසායකයින් බිහිකිරිම සඳහා සිදුකල විවිධ වැඩසටහන් සාර්ථක වු අතර ,අමු මිරිස් පවුඩර් නිෂ්පාදනය,මෙන්ම ඇතැම් පිරිසක් විදේශ වෙළඳ පොළ කරා ගොස් තිබිමද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහනයකි.

.








## කෘෂිකාර්මික සංවර්ධනයේදී ලද අභියෝග හා ළගාකරගැනීමට අපේක්ෂිත අරමුණු

රටේ පැවති ආර්ථික පසුබෑම තුල සැලසුම් කල නිෂ්පාදන හා අනෙකුත් පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය මුල්‍ය පහසුකම් නිසිකලට නොලැබීම තුල යල කන්නයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට බාධා ඇතිවීමය.

නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හා කෘෂිකාර්මික නිෂ්පාදන වල වෙළඳ පොළ මිළ උච්ඡාවචනය තුල ගොවින් වගා කටයුතු වලින් බැහැර වීමය.

- වී වගාවේ ඵලදායිතාව හෙක්ටයාරයට මෙ.ටොන් 4.00 දක්වා ඉහළ දැමීම.
- සහතික ලත් බිත්තර වී නිෂ්පාදනය බුසල් 32,000 දක්වා ඉහල දැමීම.
- නව වී ප්‍රබේද ව්‍යාප්ත කිරිම හා ස්වයං බීජ නිෂ්පාදනය බුසල් 15,000 දක්වා නිෂ්පාදනය කිරිම.
- වැඩි අස්වනු යාය වැඩසටහන හා අධිසනත්වය යටතේ බඩ ඉරිඟු අස්වැන්න මෙ.ටො. 780 දක්වා ඉහළ දැමීම.
- අමු මිරිස් නිෂ්පාදනය මෙ.ටොන් 1250 දක්වා ඉහළ දැමීම.
- ගැප් බී (GAP-B) සහතික ලත් ගොවීන් 100 ක් හා (GAP-A) සහතික ලත් ගොවිපොළ සංඛ්‍යාව12 ක් දක්වා ඉහළ දැමිම.
- ජල කාර්යක්ෂමතාව ඉහල දැමීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති සංඛ්‍යාව හා කෘෂි වගාළිං සඳහා සූර්ය පැනල භාවිතය ඉහළ දැමීම.
- අතරමැදි කන්නයක් සඳහා යොමු වෙමින් අතිරේක ආහාර බෝග නිෂ්පාදනය ඉහල දැමීම හා මුං වගාව මෙ.ටොන් 370 දක්වා ඉහළ දැමීම.
- අතිරේක බෝග බීජ නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා අවශ්‍යය ලියාපදිංචි බීජ ලබාදීම.
- බී ළූණු වගා වපසරිය ඉහළ දැමීම සඳහා මව් බල්බ කි.ග්‍රෑම් 33,000 වසන්තීකරණය කිරිම.
- එළවළු වගාවේ ගුණාත්මය ඉහළ දැමීම සඳහා IPM හා IPNS ආදර්ශන ක්‍රියාත්මක කිරිම.
- පළිබෝධනාශක පනතට අනුව පළිබෝධනාශක අළවිසැල් නියාමනය කිරිම.
- නිළධාරින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම
- ආරක්ෂිත ශෘහ තුල එළවළු නිෂ්පාදනය සහ නව තාක්ෂණය ප්‍රවර්ධනය

## ධීවර කර්මාන්ත සංවර්ධනය

ධීවර කර්මාන්තයේ මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත බවට පත්කිරීම,ධීවර හා විසිතුරු කර්මාන්තයේ නියැලෙන පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම,ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම, දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ අරමුණු කර ගනිමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම වැනි දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු මුල්කර ගනිමින් කෘෂිකර්ම අමාත්‍යාංශය කටයුතු කරන අතර, එහිදී පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතය ඉහල නැංවීමේ අරමුණින් 2023 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වැව් 45ක් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 3,829,770 ක් මුදාහැරීම සිදුකර ඇති අතර මෙහිදී ප්‍රධාන වශයෙන්ම තිලාපියා ,කැට් හා කාෆ් වර්ගයේ ඇඟිල්ලන් මුදාහැරීම සිදුවී ඇත. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතයේ සුළු පසුබෑමක් පෙන්නුම් කල ද ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ ක්‍රමවේදය ඉදිරි වර්ෂයන්හි නිෂ්පාදිත වර්ධනය කෙරෙහි සෘජු දායකත්වයක් සපයනු ඇත.




මත්ස්‍ය ඇඟිල්ලන් බහාලීම හා ජලාශ වෙත මුදාහැරීමට යෝග්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ගණනයට ලක් කිරීම.

### පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථා 10ක් සංවර්ධනය කිරීම.

වැව් හා ජලාශ ඉතා විශාල සංඛ්‍යාවකින් සමන්විත වන උතුරු මැද පළාත මිරිදිය ධීවර නිෂ්පාදනය කෙරෙහි ඉතා විශිෂ්ට වූ හිතකර පාරිසරික විභවතාවයකින් සමන්විත පළාතකි. දැනට සමස්ත දිවයිනේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයට 30% ක් පමණ වූ දායකත්වයක් සැපයුව ද තව දුරටත් ඉතා ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් අත්කර ගැනීමේ හැකියාව පළාත සතුව ඇත . ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ ක්‍රියාවලිය ඉහල නිෂ්පාදන මට්ටමක් කරා අතිශයින් ම වැදගත් කාර්යභාරයක් සිදුකරයි .පළාත සතු වැව් හා ජලාශවලින් දැනට මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීමේ කටයුතු සිදුකිරීමේ හැකියාව පවතිනුයේ ඉතා සුළු ජලාශ ප්‍රමාණයක පමණි . ප්‍රමාණවත් පරිදි මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් නිෂ්පාදනය තුළින් තවත් ජලාශ රැසකට ප්‍රතිලාභ අත්කර දීමේ හැකියාව ජනනය වේ.

2023 වසරේදී පෞද්ගලික මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන ලද්දේ මෙම ගැටළුවට පිළියමක් ලෙසිනි .මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කරගත් අතර ,අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම , පලාගල ,විලච්චිය හා රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලත් ,පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අභිජනන මධ්‍යස්ථාන 02ක් සහ වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශයන්හිත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන එක බැගින් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී.

මෙම අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය මඟින් ඉතා පහසුවෙන් පළාතට අවශ්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව මෙන්ම එම ව්‍යවසායකයන් මඟින් ග්‍රාමීය සේවා නියුක්ති අවස්ථා පුළුල් වීම හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම ද අපේක්ෂිතය. 2023 වසරේදී සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලද අභිජනන මධ්‍යස්ථාන අතරින් දිඹුලාගල හා පලාගල ව්‍යවසායකයන් දෙදෙනෙකුගේ ඉඩම් වසරේ අවසන් කාල පරිච්ඡේදය තුළ දී පළාතට ලැබුණ අධික වර්ෂාවෙන් යටවීම හේතුවෙන් සාර්ථක කර ගැනීමේ හැකියාවක් නොලැබුණි.

## ධීවර කාර්මිකයින් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම.

ආර්ථික අපහසුතා මැද ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර කාර්මිකයනට ආර්ථික ශක්තියක් වෙමින් ඔවුනගෙන් තෝරාගත් නිෂ්පාදකයන් 200 ක් සඳහා ධීවර ඔරු සහ දැල් 50% ප්‍රතිලාභී දායකත්වය මත ලබා දීම සිදුකර ඇත.

## විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් 26ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 23ක් ද ,දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 17ක් ,මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 03ක් සහ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 06ක් හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 49ක් ද ලෙස පළාතේවිසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 75ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.මෙහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා කුරුළු දැල් 20ක් ,සෙවන දැල් 30ක් සහ වටදැල් 84ක් ද ,පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා කුරුළු දැල් 80 ක් ,සෙවන දැල් 45ක් සහ වටදැල් 266ක් ද ,ලෙස උපකරණ ලබා දෙමින් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් ප්‍රවර්ධනය සඳහා පියවර ගන්නා ලදී.



ධීවර උපකරණ බෙදා දීම



විසිතුරු මත්ස්‍ය වගා
උපකරණ බෙදාදීම

නිෂ්පාදනය කරනු ලබන විසිතුරු මසුන් වර්ග කිහිපයක්



## මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය අංශයේ ඉදිරි වැඩසටහන්

උතුරු මැද පළාත තුළ මිරිදිය මෙන්ම විසිතුරු මත්ස්‍ය කර්මාන්තයන් වැඩි දියුණු කර ආර්ථිකයට විශාල දායකත්වයක් දැක්වීම උදෙසා , උතුරුමැද පළාත් ළමා මෙන්ම, වැඩිහිටි ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම මෙන්ම ආර්ථික සංවර්ධනයට දායක වන මිරිදය මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් තෝරාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීමේ ව්‍යාපෘතිය. (මේ සඳහා 2024 වර්ෂයේදී පළාත් නිෂ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි.23ක් වැය කිරීමට අපේක්ෂිතය.), අපනයන ආර්ථිකයට අත්වැලක් වෙමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වඩාත් ගුණාත්මක බවින් යුත් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනයක් කරා යොමු වීමට විසිතුරු මත්ස්‍ය වගා කරුවන් වෙත ආනයනික මවු සතුන් ලබා දීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.10කි),පළාතේ ජලාශ සඳහා මුදාහැරීමට පහසුවෙන් මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.(වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.10කි.),කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.5කි.),නව තාක්ෂණික දැනුම ලබා දී විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් වගාකරුවන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (වැය කිරීමට අපේක්ෂිත මුදල රු.මි.5කි.) ඉදිරි වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

## 2.6 පශු සම්පත් සංවර්ධනය

Livestock Development



උතුරු මැද පළාත පශු සම්පත් අංශයෙන් සංවර්ධන කිරීමේ වගකීම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අතර එම කටයුතු අධීක්ෂණය හා නියාමන කාර්යය පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබේ.

“ නිරෝගී හා ඵලදායී පශු සම්පතක්, ඉසුරුමත් ප්‍රජාවක් ” යන ඉදිරි දැක්ම හා “ පශු සම්පත්, සත්ව නිෂ්පාදන හා එහි ඵලදායිතාවය, වෙළඳපොල සහ ඒ ආශ්‍රිත පරිසර ආරක්ෂාව සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම ” යන මෙවර මුල් කරගනිමින් කටයුතු තරනු ලබන පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින්,සත්ත්ව අභිජනනය, සත්ව සෞඛ්‍ය හා සත්ව පාලන ව්‍යාප්ති  සේවාව පවත්වාගෙන  යාම මෙන්ම සත්ත්ව සෞඛ්‍ය සේවය යටතේ රෝග මර්ධන කටයුතු හා ප්‍රතිකාර කටයුතු ඉටු කිරීම, කෘතිම  සිංචන ප්‍රවර්ධනය ප්‍රධාන කොට සත්ව අභිජනනය මඟින් උසස් ආරයේ කිරි ගවයින් බෝ කර ගැනිම හා වැස්සි පැටවුන් රැක බලා ගැනිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක  කිරීම, නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහල නැංවිම පිණිස සත්ව පාලන ව්‍යාප්ති සේවා පවත්වා ගෙන යාම, කිරි ගොවිපල සංවර්ධනය, එළු ගොවිපල සංවර්ධනය, නිදැලි කුකුළු ව්‍යාපෘති, අගය එකතු කිරිම, ගොවි පුහුණු හා  ධාරිතා සංවර්ධන කටයුතු ඉටු කරනු ලැබේ.

### 2.6.1 පශු සම්පත් සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා පශු සම්පත් සංවර්ධනය වෙනුවෙන් රු.මි. 401.95 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි.250.10 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.151.85 මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව මේ සඳහා වෙන් කරන ලද රු.මි 319.46 ක් වු ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසදීමේදී එය රු.මි 82.49 ක වැඩි වීමකි.එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි 296.69

ක සත්‍ය වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි. 227.07 ක පුනරාවර්තන වියදමකින්ද, රු.මි.69.61 ක මූලධන වියදමකින්ද සමන්විත වේ. මෙම වියදමද පූර්ව වර්ෂය හා සැසදීමේදී රු.මි. 49.02 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.







## 2.6.2 පශු සම්පත් සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

ප්‍රශස්ත සත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම තුලින් සත්ව සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම, ආරය උසස් කිරීම මඟින් නිෂ්පාදන ධාරිතා වර්ධනය කර ගැනීම, සහ තාක්ෂණ ප්‍රචාරණය මගින් උචිත නිෂ්පාදන ක්‍රමවේද ප්‍රචලිත කිරීම වූ ප්‍රධාන උපාය මාර්ගයන් ළඟා කර ගැනීමට පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි.2023 වර්ෂයේදී රටෙහි පැවති තත්වය මත **විශේෂ** ප්‍රධාන ව්‍යාපෘති 04ක්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 05ක් පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 04ක්, රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 04ක් සිදු කර ඇත.

### කාබනික පොහොර (කොම්පෝස්ට්) නිෂ්පාදනය

රටෙහි පවතින රසායනික පොහොර හිඟය මඟ හරවා ගැනීමේ අරමුණින් එයට විකල්පයක් ලෙස සත්ත්ව අපද්‍රව්‍ය හා ශාක කොටස් යොද ගනිමින් ගොවිපල තුල කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදි. ප්‍රදේශයේ ගොවිජනතාව අතර, කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම, අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය කර පහසු මිලට අලෙවි කිරීම මෙම ව්‍යාපෘතියේ සෙසු අරමුණු විය.

## සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉටු කළ කාර්යයන්



කාබනික පොහොර ඒකකය සඳහා තෙකලා විදුලිය ලබා ගැනිම



කාබනික පොහොර ඒකකය සඳහා ආවරණයක් ඉදිකිරිම



පැරණි කුකුළු නිවාස අළුත් වැඩියාව



කුකුල් අභිජනන ඒකකය වටා විදූලි අලිවැටක් ඉදිකිරිම



ආහාර හා පශු ඖෂධ ලබා දිම



කුකුළු පැටවුන් බෙදාදිම

,







අභිජනන සතුන් සඳහා අවශ්‍ය කුකුළු නිවාස 03 ක් ඉදිකිරිම





තිරප්පනේ ගොවිපලේ තාරා අභිජනන හා වටු අභිජනන ඒකකයන් ඉදිකිරිම



පෙරපාසල් දරුවන්ගේ මන්දපෝෂණය දුරලිම සඳහා ගම් කිකිළි පැටවුන් ලබා දිම

මධ්‍ය කාලින සංවර්ධන සැලැස්මෙහි අන්තර්ගත ආකාරයට සත්ත්‍ව නිෂ්පාදනය හා ඵලදායීතාව ඉහළ නැංවීම ප්‍රධාන කාර්යයක් වන අතර, එහිදී කිරි නිෂ්පාදනය සංවර්ධනය, මස් නිෂ්පාදනය සංවර්ධනය හා බිත්තර නිෂ්පාදනය සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන ලද වැඩසටහන් මඟින් අදාල ඉලක්කයන් පෙර වර්ෂයන්ට සාපේක්ෂව සාර්ථක ලෙස සපුරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී හැකිවී ඇත.

### කිරි නිෂ්පාදන සංවර්ධනය

2023 වර්ෂයේ උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 63 දක්වා වැඩිකිරිම අපගේ ඉලක්කය වි තිබුණි. එහිදී, ලීටර් මිලියන 68.96 ක ප්‍රගතියක් ලබා ගැනිමට අපට හැකිවිය. එම ඉලක්ක සපුරාලීම සඳහා වාණිජ මට්ටමේ සහ කුඩා පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය,සත්ත්ව පෝෂණ සම්පත් වැඩි දියුණු කිරීම, වසංගත රෝග මර්ධනය, කෘතිම

සිංචන ප්‍රවර්ධනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ක්ෂේත්‍රයේ ජංගම සායන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදි. තවද උතුරු මැද පළාතේ කිරිගොවිපළ 15,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර සත්ත්ව සංවර්ධන උපදේශකවරයකු විසින් ගොවිපල 200ක් සංවර්ධනය කල යුතුව ඇත. පසුගිය වසර කිහිපයක කිරි නිෂ්පාදනය වැඩිවීම හා කිරි නිෂ්පාදනය වැඩිවීම සඳහා සෘජුවම දායකවූ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වූ වැඩ සටහන්වල ප්‍රගතියද දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛණ වලට අනුව පහත පරිදි වේ.













## බිත්තර නිෂ්පාදනය

බිත්තර නිෂ්පාදනය මිලියන 55 දක්වා වැඩිකිරීම අපගේ ඉලක්කය විය. ඒ සඳහා නිදැළි කුකුළු පාලනය ගොවීන් අතර ප්‍රචලිත කිරීම මුල්කරගෙන මෙම ව්‍යාපෘතිය වෙනත් ආයතන මගින් උතුරු මැද පළාත තුල ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා මාසයක් වයසැති කිකිළි පැටවුන් ප්‍රතිලාභින් වෙත තිරප්පනේ සත්ත්ව ගොවිපලින් ලබා දී ඇත. මූලිකව මාසයක් වයසැති කිකිළි පැටවුන් 15 බැගින් ප්‍රතිලාභීන් වෙත ලබා දී නිදැලි කුකුලු පාලනය සඳහා ඔවුන් යොමු කරගන්නා අතර, පසුකාලිනව මොවුන් දීර්ඝ කාලීනව කුකුළු

පාලනයට යොමු වීම තුලින් ඉහල බිත්තර නිෂ්පාදන අගයක් ලබා ගැනිමට හැකියාවක් ලැබෙනු ඇත. මීට අමතරව පවුලේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරා ගැනිමට හා නීරෝගී දරු පරම්පරාවක් බිහිකිරිමට හැකියාව ලැබෙනු ඇත. ලෝක ආහාර සංවිධානය මඟින් ගෙවත්තෙන් පන්තිකාමරයට වැඩසටහන යටතේ මාසයක් වයසැති කිකිළි පැටවන් 11,550ක් ගොවිපවුල් 266කට ලබා දි ඇත.***2021 වසරේ උතුරු මැද පළාතේ බිත්තර නිෂ්පාදනය මිලියන 136.66 ක් වූ අතර 2022 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 46.10 දක්වා අඩුවිය. සත්ත්ව ආහාර වල මිල අධික වු බැවින්, වැලිකන්ද ප්‍රදේශයේ මහා පරිමාණ බිත්තර ගොවිපල වැසි ගොස් ඇති බැවින් 2022 වසරේ බිත්තර නිෂ්පාදනය අඩුවිය. මෙම තත්ත්වය 2023 වර්ෂය සඳහාද බලපා ඇත.

### මස් නිෂ්පාදනය

එළු ගොවිපල සංවර්ධනය, තුලින් අභිජනන සතුන් සඳහා වන ඉල්ලුම හා මස් සඳහා වෙළඳපොළ ඉල්ලුම සැපයීමට හැකිවනු ඇත. එළු පාලනය සඳහා කාන්තා දායකත්වය පහසුවෙන් ලබාගත හැකි බැවින්, කාන්තාවන්ද සත්ත්ව පාලනයට යොමු කරගැනිමට හැකියාව ලැබී ඇත.





සූකර ගොවිපල සංවර්ධනය ම.නු.ප

| වර්ෂය | ගව මස් මෙ.ටො | එළු මස් මෙ.ටො | ඌරු මස් මෙ.ටො | කුකුළු මස් මෙ.ටො |
|---|---|---|---|---|
| 2015 | 7,845.80 | 179.00 | 107.15 | 4,430.79 |
| 2016 | 1,559.3 | 41.78 | 79.39 | 6,093.00 |
| 2017 | 1,819.44 | 17.54 | 199.26 | 10,160.81 |
| 2018 | 2,130.55 | 22.94 | 76.40 | 7,925.90 |
| 2019 | 1,930.14 | 31.24 | 117.86 | 15,573.76 |
| 2020 | 1,583.25 | 32.61 | 155.37 | 3,820.97 |
| 2021 | 2,053.18 | 75.99 | 232.71 | 9,199.89 |
| 2022 | 2,042.84 | 45.24 | 457.76 | 13,067.26 |
| 2023 | 2,339.06 | 39.24 | 422.18 | 13,418.09 |

උතුරු මැද පළාතේ මස් නිෂ්පාදනය(දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛණ අනුව)

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වැඩ සටහන්

### ගොවිපල සඳහා තාක්ෂණික දායකත්වය ලබාදීම (ජංගම සායන)

පශු වෛද්‍ය කොට්ඨාෂ 29 තුල ජංගම සායන 575ක් පවත්වා ඇත. මේ යටතේ ගොවිපල ලියාපදිංචිය, සතුන් ගේ කන් සළකුණු කිරිම, සත්ත්ව ප්‍රතිකාර සේවාව, සත්ත්ව අභිජනනය, සත්ත්ව පෝෂණය, සතුන් එන්නත් කිරිම, උපදේශණ සේවාව සත්ත්ව ගොවිපල් වෙත ගොස් සිදුකරන ලදි.



ගොවිපල් ලියාපදිංචිය

### එළ හා මී ගව සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම

මේ යටතේ වසංගත රෝග නිවාරණය සඳහා සතුන් එන්නත්කිරිම සිදු කරන ලදි. සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ ආවරණය වන පරිදි සතුන් 77,770 ක් කුර හා මුඛ රෝග පාලනය සඳහා එන්නත් කරන ලදි. කාලගාත්‍රා රෝගපාලනය සඳහා සතුන් 17,094,රක්තුකශ්‍රාවය සඳහා 46,002 සතුන් එන්නත් කරන ලදී.2023 වර්ෂය තුල සතුන් සඳහා ප්‍රතිකාර කිරිම් 113,825 වාර්තා වන අතර, සත්ත්ව අභිජනන වැඩ සටහන යටතේ සතුන් සඳහා 25,006 වු කෘතිම සිංචන ප්‍රමාණයක්ද, සතුන් 5,030ක ගැබ් පරික්ෂාවන්ද, සිදු කර ඇති අතර, පැටව් උපත් සංඛ්‍යාව 5,346 කි.

### රාජ්‍ය ආයතන ධාරිතා සංවර්ධනය (ගොවි පුහුණුව හා නිලධාරි පුහුණුව)

#### ගොවි පුහුණුව

සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ගොවින් 9002 ක් සඳහා නව තාක්ෂණික දැනුම ලබා දිම අරමුණින් ප්‍රයෝගික හා න්‍යාත්මක පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

#### නිලධාරි පුහුණුව

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරින් සඳහා පුහුණුව ලබා දෙන ලදි. නව තාක්ෂණික දැනුම ලබා දිම, දැනුම යාවත්කාලින කිරිම මෙහි අරමුණ විය. රටෙහි පවතින ආර්ථික බිඳවැටිම හමුවේ කිරි නිෂ්පාදනය වැඩි කිරිමේ අරමුණින් කිරිගොවිපල් සඳහා සංවර්ධන සැලසුම් සකස්කිරිම සම්බන්ධව ඒ සඳහා අවශ්‍යය මඟ පෙන්වීමට අදාලව දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිලධාරින් හා සත්ත්ව සංවර්ධන උපදේශකවරු සඳහා පුහුණුව ලබා දී ඇත.

### තිරප්පනේ සත්ත්ව අභිජනන ගොවිපල හා ප්‍රායෝගික පුහුණු මධ්‍යස්ථානය

උතුරු මැද පළාතේ ගොවි ජනතාවට සත්ත්ව පාලනය සම්බන්ධව අවශ්‍ය නවින තාක්ෂණය, ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව,අභිජනන සතුන්,රෝපන ද්‍රව්‍ය සැපයිම, මෙහි ප්‍රධාන අරමුණ වන අතර ප්‍රධාන කාර්යයන් ලෙස මී ගව අභිජනන ඒකකය , එළු අභිජනන ඒකකය, කුකුළු ඒකකය,තෘණ සංවර්ධන ඒකකය,හාවුන් පාලන

ඒකකය,කාබනික පොහොර නිෂ්පාදන ඒකකය, බිත්තර රක්වනාගාරය,තාරා අභිජනන ඒකකය,වටු අභිජනන ඒකකය, කිරි නිෂ්පාදනාගාරය යනාදි වශයෙන් දැක්විය හැක.

## අළුතින් සංවර්ධනය කිරිමට යෝජිත ක්‍රියාකාරකම්

- ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබා දෙන ආයතනයක් ලෙසට පුළුල් කිරිම - NVQ -4 පාඨමාලා පැවැත්විම/ විදේශීය රැකියා සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සංවර්ධනය සපිරි ශ්‍රමිකයන් බිහිකිරිම
- කළුකුම් අභිජනන ඒකකයක් ස්ථාපිත කිරිම

## බිත්තර රක්වනාගාරය ස්ථාපිත කිරිම

කුකුළු පාලනය පහසු සත්ත්ව පාලන කර්මාන්තයක් වුවද වර්තමානයේ පවතින කුකුළු පැටවුන් මිලදි ගැනිමේ අපහසුතාවය, ආහාර හා පශු ඖෂධවල මිල ඉහල යෑම වැනි හේතූන් නිසා මෙම ව්‍යාපාරය බිඳ වැටි ඇත. මෙම හේතුව නිසා කුකුළු මස් හා බිත්තර ඉහල අගයක පවතින බැවින් ජනතාවට අඩු මුදලකට ලබා ගැනීමට හැකියාව ඇති ප්‍රෝටින අවශ්‍යතාවය පවා ලබා ගැනිමට අපහසු වි ඇත. මෙයට පිළියමක් ලෙස ගෘහස්ථ කුකුළු පාලනය ව්‍යාප්ත කිරිමේ අරමුණින් බිත්තර රක්වනාගාරය ස්ථාපිත කර ඇත.





එමෙන්ම තිරප්පනේ ගොවිපලට අදාලව සෝලා පද්ධතිය ස්ථාපිත කිරිම හා අතුරු මාර්ග සංවර්ධනය සිදු කර ඇත.







## ආයතනික සමාලෝචනය

මෙම වර්ෂය තුල ආයතනය ලබා ඇති විශේෂ ජයග්‍රහනය ලෙස උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ලංකාවේ අනෙකුත් පළාත් හා සැසදිමේදි දෙවැනි ස්ථානය බවට පත්ව ඇත. ජාතික කිරි නිෂ්පාදනයෙන් 17% දායකත්වය අප විසින් ලබා දි ඇත. මෙම සාර්ථකත්වය ලඟාකර ගැනිමේදි පහත සඳහන් අභියෝග වලට මුහුණ දිමට සිදුවිය.

- කිරි ගව පාලනයේදි සතුන්ගේ පෝෂණ අවශ්‍යතාවය ඉටුකිරිමට ප්‍රමාණවත් තෘණ බිම් නොමැති කම හා වියළි කාලයේ සතුන්ගේ පෝෂණ අවශ්‍යතා ඉටු කිරිමට නොහැකි විම.
- උසස් ආරයේ සතුන්ගේ හිඟකම.
- වර්තමානයේ කිරි අලෙවිය සඳහා ඇති ගැටළු සහ අගය එකතු කල නිෂ්පාදන වල වෙළඳ පොල තරඟකාරිත්වයට මුහුණදිමේදි ඇතිවන ගැටළු.
- වරින් වර ප්‍රදේශයේ පැතිර යන සතුන්ගේ වසංගත රෝග තත්ත්වයන්.

- පාරිසරික ගැටළු
- අවිධිමත් ගව ප්‍රවාහනය
- පුහුණු නිලධාරින් ගේ හිඟකම සහ ක්ෂේත්‍ර කටයුතු වල නිරතවීමට ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමේදී සිදුවන අපහසුතා.
- රටෙහි පවතින ආර්ථික බිඳවැටීම
- ගව සාන්ද්‍ර ආහාර වල මිල අධික වීම හා ආහාර හිඟවීම

## 2023 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

රටේ පැවති ආර්ථික තත්ත්වය හමුවේ සංවර්ධන ව්‍යාපෘති අනුමත නොවීම, සුළු පරිමාණ කිරි නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්ගේ කිරි නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකිවීම නිසා සුළු පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ කර්මාන්ත වැසියෑම. (මුදවපු කිරි , යෝගට්, අයිස්ක්‍රීම්) බිත්තර නිෂ්පාදකයින්ගේ බිත්තර අලෙවි කිරීමට නොහැකිවීම හා අඩු මුදලකට බිත්තර අලෙවි කිරීමට සිදුවීම, සාන්ද්‍ර ආහාර වල මිල ඉහළ යාම හා වෙළඳපළේ සාන්ද්‍ර ආහාර නොමැතිවීම නිසා කුකුළු පාලනයෙන් ගොවින් ඉවත්වීම, ඉන්ධන අර්බුදය හමුවේ ජනතාව ඒකරාශි කළ නොහැකි බැවින් ,පුහුණු වැඩ සටහන්, ක්ෂේත්‍ර ආදර්ශණ පැවැත්වීම සිමා සහිත වීම, ආර්ථික අපහසුතා හේතුවෙන් සතුන් අලෙවි කිරීමට ගොවින් පෙළඹීම වැනි ගැටළුද, **දුෂ්කරතා ලෙස** ගොවීන් හමුවීමේ දුෂ්කරතාවය, සත්ත්ව පාලනයට අවශ්‍ය යන්ත්‍ර උපකරණ ආහාර /ඖෂධ මිලදී ගැනිමට වෙළඳ පොළේ නොමැතිවීම හා මිල අධික වීම, ප්‍රවාහන පහසුකම් නොමැතිවීම දැක්විය හැක.

එහිදී , ප්‍රතිපාදන රහිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, Zoom තාක්ෂණය මඟින් පශු වෛද්‍ය නිලධාරින් හා සත්ත්ව සංවර්ධන උපදේශකවරු සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම හා අදාල උපදෙස් ලබාදිම, සාන්ද්‍ර ආහාර වෙනුවට විකල්ප ආහාර භාවිතයට ගොවින් යොමු කිරිම, 2023 වර්ෂයේ සාර්ථක කර ගැනිමට නොහැකි වූ ව්‍යාපෘති 2024 සංවර්ධන සැලැස්මට අතුලත් කිරිම යන ක්‍රියාකාරකම් මගින් එම ගැටළු විසඳා ගැනීමට කටයුතු කරන ලදී.

### මෙම අභියෝග හමුවේ ඉදිරි වර්ෂවල ලඟා කර ගැනිමට අපේක්ෂිත ඉලක්ක සමහරක් පහත පරිදි වේ.

| උප සංරචක | 2024 | 2025 | 2026 |
|---|---|---|---|
| කිරි නිෂ්පාදනය සංවර්ධනය (ලිටර් මිලියන) | 73.00 | 77.00 | 80.00 |
| එළු මස් නිෂ්පාදනය සංවර්ධනය(මෙ.ටො) | 37.50 | 39.00 | 40.50 |
| බිත්තර නිෂ්පාදනය සංවර්ධනය(මිලියන) | 50 | 60 | 65 |
| පශු මහජන සෞඛ්‍ය | 1,000 | 1,000 | 1,000 |
| ආයතනික ධාරිතා සංවර්ධනය | 4,500 | 5,000 | 5,500 |

## ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

2022 වර්ෂයේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 61.92 ක් වූ බැවින්, එය 2026 වර්ෂය වන විට ලීටර් මිලියන 80.00 දක්වා වැඩිකිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වී ඇත. මස් නිෂ්පාදනය යටතේ අප රටේ පවතින සංස්කෘතික කරුණු පදනම් කරගෙන ගව මස් නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා අප දෙපාර්තමේන්තුව කටයුතු සිදු නොකරන අතර ගව මස් නිෂ්පාදනය ක්‍රමවත්ව හා විධිමත්ව සිදුකිරීමට කටයුතු කිරීම , එළු , සූකර,කුකුළු මස් ප්‍රවර්ධනය සඳහා කටයුතු සිදුකිරීම හා සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම පෙරදැඩි කරගෙන ගොවින් සඳහා පුහුණු වැඩ සටහන්, ක්ෂේත්‍ර චාරිකා, ක්ෂේත්‍ර දින පැවැත්වීම. තව දුරටත් තරුණ ප්‍රජාව හා කාන්තාවන් සත්ත්ව පාලනයට යොමු කිරීම සඳහා සත්ත්ව පාලන ප්‍රදර්ශන පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් සිදුකිරීමට කටයුතු කිරීම සෙසු අරමුණු වේ. මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අනිවාර්යයෙන් මෙම දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරි හිඟය ප්‍රවාහන පහසුකම් නොමැතිවීමේ ගැටළු නිරාකරණය කර ගැනීමට ප්‍රධාන වශයෙන් කටයුතු සිදුකල යුතුය.

## 2.7 කර්මාන්ත සංවර්ධනය

Industrial Development



කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ පේෂ කර්මාන්ත කටයුතු හා කුඩා කර්මාන්ත කටයුතු වෙනුවෙන් පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට ද, කර්මාන්ත කටයුතු වෙනුවෙන් සමූපකාර අමාත්‍යාංශය යටතේ ඇති කර්මාන්ත සංවර්ධන අධිකාරියට ද වර්ෂය තුල ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී.

උතුරු මැද පළාත තුළ අපතේ යන ශ්‍රමය ඵලදායීව යොදවා ගනිමින් නිර්මාණශීලීව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරලීම, ස්වයං රැකියා අවස්ථා උදා කරලීම, දැනට ක්ෂේත්‍රයේ සිටින කණ්ඩායම් වල තාක්ෂණික සහ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරිම, නව ස්වයං රැකියා අවස්ථා සඳහා ඔවුන්ව යොමු කිරිමට අවශ්‍ය මූලික පදනම සැකසීම සමාජීය සංවර්ධනය ඇති කරලීම සහ ඊට අවශ්‍ය සේවා සැපයීමේ වගකීම උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති අතර එහි කටයුතු අධීක්ෂණය සහ නියාමනය පළාත් සමූපකාර අමාත්‍යාංශය මඟින් ඉටුකරනු ලැබේ.

එමගින්, හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත යන අංශ 03 යටතේ ජාතික නිෂ්පාදනයට දායකත්වය සපයන අතර පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා එමඟින් පිටිවහලක් සැපයේ. ඒ සඳහා, ග්‍රාමීය මට්ටමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 41ක් සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 10ක් පළාත පුරා ස්ථාපනය කර ඇත.

## 2.7.1 කර්මාන්ත සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා කර්මාන්ත සංවර්ධනය වෙනුවෙන් රු.මි. 156.83 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි.106.85 ක පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.49.98 මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව මේ සඳහා වෙන් කරන ලද රු.මි 131.07 ක් වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසදීමේදී එය රු.මි 25.76 ක වැඩි වීමකි.

එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි 114.49 ක සමස්ථ සත්‍ය වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි. 94.55 ක පුනරාවර්තන වියදමකින්ද, රු.මි.19.94 ක මූලධන වියදමකින්ද සමන්විත වේ. මෙම වියදමද පූර්ව වර්ෂය හා සැසදීමේදී රු.මි. 20.64 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2023.12.31 දිනට වූ සමස්ථ සත්‍ය වියදම රු.මි. 31,679.28 වන අතර, එයින් කර්මාන්ත සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මි. 114.49 වූ සමසථ සත්‍ය වියදම සැලකීමේදී එයින් 17% ක ප්‍රමාණයක් මූලධන වියදම් සඳහාද, 83% ක ප්‍රමාණයක් පුනරාවර්තන වියදම් සඳහා ද වෙන් වේ.







## 2.7.2 කර්මාන්ත සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳ පොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා , පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම යන මෙහෙවර ප්‍රමුඛ කර ගත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් හස්ත කර්මාන්ත සහ වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් මෙන්ම ජේෂ කර්මාන්ත ය සඳහාද නව

තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කරමින් සංවර්ධන කටයුතු සිදු කරන අතර, ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීමත් ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායක පුහුණු හා මූල්‍ය පහසුකම්, තාක්ෂණික උපකරණ ලබාදීම හා සුළුපරිමාණ කර්මාන්තකරුවන් සඳහා සහනපොලි අනුපාතයක් යටතේ ණය ලබාදීම වැනි කටයුතු ඉටු කරමින් උතුරු මැද පළාතේ කර්මාන්ත සංවර්ධන සඳහා ප්‍රමුඛ කාර්යයක් ඉටු කරයි.

2021 වර්ෂයේ දී ලද ප්‍රතිපාදන මත සංවර්ධන ව්‍යාපෘති රාශියක් ඉටු කිරීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි වුව ද 2022 වර්ෂය තුල සහ 2023 වර්ෂයන් තුල දී සිදු වූ ආර්ථික සහ දේශපාලන අර්බුද හමුවේ සංවර්ධන ව්‍යාපෘති කිසිවක් සිදු කිරීමට නොහැකි විය. සංවර්ධන සැලැස්ම හරහා ව්‍යාපෘති සකස් කර තිබුනද එම කිසිදු ව්‍යාපෘතියක් සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් නොලැබුනි.ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීමට ලැබුනු උපදෙස් අනුව මෙම ව්‍යාපෘති සිදු කිරීමට ප්‍රතිපාදන මුදල් නොලැබුනි.

සැලසුම් කරන ලද සංවර්ධන යෝජනාවලට අදාලව මුදිතාගම පේෂකර්ම මධ්‍යස්ථානයේ වැසිකිලියක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය එම මධ්‍යස්ථානය භාර පේෂ උපදේශිකාවගේ ඉල්ලීම පරිදි අවලංගු කරන ලදී.

සංවර්ධන සැලැස්ම මුලින් අනුමත කිරීමට අදාලව මෙම දෙපාර්තමේන්තුව වෙත රු.මි.26ක මුදලක් වෙන් වී තිබුන ද රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාලව එම ප්‍රතිපාදන මුදල් 25%ක ප්‍රමාණයකට සීමා කිරීමට සිදු විය. ඒ අනුව හුරුළුනිකවැව පේෂකර්ම මධ්‍යස්ථානයේ භූගත නළ ළිඳ සඳහා යන්ත්‍රෝපකරණ මිලට ගැනිම, මානේරුව පේෂකර්ම මධ්‍යස්ථානයේ භූගත නළ ළිඳ සඳහා යන්ත්‍රෝපකරණ මිලට ගැනිම, රඹෑව පේෂකර්ම මධ්‍යස්ථානයේ වැට ඉදි කිරිම, නව ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණක් නැවත වතාවක් සංවර්ධන සැලැස්ම සංශෝධනය කරන ලදි.එසේ සිදු කලද මෙම කිසිදු ව්‍යාපෘතියක් සඳහා මුදල් ප්‍රතිපාදන නොලැබුනි.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුවද නොච්චියාගම අමු නූල් වර්ණගැන්වීමේ මධ්‍යස්ථානය සඳහා තාක්ෂණික යන්ත්‍ර මිලදී ගැනීමේ ව්‍යාපෘතිය 2023 වසර තුල ආරම්භ කිරීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි විය.2021 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශය මඟින් අප දෙපාර්තමේන්තුවට ලැබුණු ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

2021,2022 වර්ෂයන්වල රට තුල පැවති දේශපාලන සහ ආර්ථික පසුබෑම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම වර්ෂය තුලදි එය ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදී.

මෙම ආයතනය විසින් ආරම්භයේ පටන් කරගෙන එන ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයන් සඳහා ණය ලබාදීම යටතේ මෙම වර්ෂයේ පුද්ගලයන් 74 දෙනෙකු සඳහා රු.7,250,000/- නිකුත් කරන ලදී. මෙම වසර තුල ණය ගෙවීම අතපසු කරන ලද ණයගැතියන්ගේ ණය ප්‍රමාද ගාස්තු ලෙස රු.570,270.96 මුදලක් අය වූ අතර සුළු පරිමාණ ණය පොලී ලෙස රු.1,480,249.05

ක මුදලක් අයකර ගැනීමට හැකියාවක් ලැබී ඇත. තවද, මෙම වර්ෂයේදී සුළුපරිමාණ කර්මාන්තකරුවන් 74 දෙනෙකු සඳහා ණයලබාදීමට හැකි වීම 2022 වර්ෂයට සාපේක්ෂව ණය ලබාදීමේ හැකියාව වැඩි කර ගැනීමට අපට හැකියාවක් ලැබුණ අතර පෙර වසර වල ණය ලබාදීමේ සීමාව වූ රු.100,000/- 2023 වර්ෂය තුල රු.200,000/- දක්වා ඉහළ නැංවීමට සමත් වීම අප ලද ජයග්‍රහණයකි. මේ සඳහා ආයතනයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද අනියම් පදනම මත සේවයේ යෙදී සිටින කාර්යය මණ්ඩලය ලබාදුන් සේවාවන් හා උනන්දුව මත ඉහත සඳහන් ඉලක්කවලට ළඟාවීමට හැකිවූ අතර, දැනට අධිකාරියේ පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති දැනට අනියම් පදනම මත සේවය කරනු ලබන කාර්යය මණ්ඩලයේ ස්ථිර කර ඔවුන් දිරිගැන්වීම පළාතේ විසිරි සිටින කර්මාන්තකරුවන්හට මීට වඩා ඉහළ සේවාවන් කිරීමට හැකියාවක් පවති.

# 2.8 ක්‍රීඩා සංවර්ධනය

Sports Development



1987 අංක 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තියෙන් පැවරි ඇති බලතල ප්‍රකාරව උතුරුමැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හදුනාගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීමේ වගකීම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතුවන අතර මේ වන විට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු,සමූපකාර වෙළද හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කර ඇත. එහි කටයුතු අධීක්ෂණය හා නියාමනය පළාත් සමූපකාර අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබේ.

## 2.8.1 ක්‍රීඩා සංවර්ධනය සඳහා වූ මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් රු.මි. 136.99 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි.117.49 ක පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.19.50 මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව මේ සඳහා වෙන් කරන ලද රු.මි. 111.92 ක් වූ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේ දී එය රු.මි. 25.07 ක ඉහළ යාමකි. එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි. 101.15 ක සමස්ත සත්‍ය වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි 99.65 ක පුනරාවර්තන වියදමකින්ද, රු.මි.1.49 ක මූලධන වියදමකින්ද සමන්විත වේ. මෙම වියදමද පූර්ව වර්ෂය හා සැසඳීමේ දී රු.මි. 10.84 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ.






## 2.8.2 ක්‍රීඩා සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

ජාතික මහා ක්‍රීඩා උළෙලේදී පදක්කම් වැඩි සංඛ්‍යාවක් දිනා ගැනීමට උත්සාහ කිරීම වැදගත්ම අරමුණක් වන අතර එම කාර්ය සාධනය කර ගැනීම සඳහා,

- ක්‍රීඩා පුහුණු සංවර්ධනය
- හඳුනාගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම හා සංවර්ධනය කිරීම
- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය
- ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම
- ආයතනික ධාරිතා සංවර්ධනය

යන අවශ්‍යතාවන් සපුරා ගත යුතුය. 2020 හා 2021 වර්ෂවලදී පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ජාතික මහා ක්‍රීඩා උළෙල පැවැත්වීමට නොහැකි වීම මත ජාතික වශයෙන් ලද ජයග්‍රහණ ප්‍රමාණය සීමා විය.

පෙර වර්ෂවලට සාපේක්ෂව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් අත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීමේදී 2023 වර්ෂයේදී සැලසුම් කරන ලද පරිදි කාර්යසාධනය ඉහල නැංවීමෙහි ලා දෙන ලද දායකත්වය ඉතා අඩු අගයකි. එමෙන්ම 2022 වර්ෂයේදී රටේ පැවති දැඩි ආර්ථික අර්බුදය හේතුවෙන්, මුදල් පාලනය පිළිබඳව කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛයන්හි සීමා හේතුවෙන් වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ සැලසුම් කරන ලද ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම වාර්ෂික කාර්යසාධනයේ සමස්ත ප්‍රතිඵලය මත සෘණාත්මක බලපෑමක් ඇති කිරීමට ප්‍රධාන හේතුවක් බව පෙන්වා දිය හැක.

ඉහත තත්ත්වය යටතේ 2023 වසරේදීද දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කරන ලද ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර 2022 වසරට අදාලව පවත්වා අවසන් කිරීමට නියමිතව තිබූ 47 වන ජාතික මහා ක්‍රීඩා තරඟාවලිය පවත්වන ලද්දේ 2023 වසරේ අගෝස්තු මාසයේදීය. එසේම 2023 වසරේ ප්‍රාදේශීය මට්ටමේ සිට ඉහළට කිසිදු තරඟයක් පවත්වා නොමැති අතර, එම තරඟ සහ ඒ ආශ්‍රිතව සිදු කළ යුතු සේවා ජාලය සහ පහසුකම් සැපයීම අපගේ ප්‍රධාන මෙහයුම් ක්‍රියාවලිය වුවත් එම මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ක්‍රියාවලිය හෝ ඉටු කිරීමට 2023 වසරේදී පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවට නොහැකි විය.



## 2.9 ප්‍රාදේශීය සංවර්ධනය

Regional Development



ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ පළාත් පාලන සේවා, සංස්කෘතික, සංචාරක කටයුතු, ග්‍රාමීය විදුලිය ව්‍යාපෘති සඳහා ප්‍රධාන අමාත්‍යාංශයට ද, පරිසර කටයුතු ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට ද, ප්‍රවාහන ව්‍යාපෘතිය වෙනුවෙන් සමූපකාර අමාත්‍යාංශයට ද, මාර්ග සංවර්ධනය, නිවාස කටයුතු ව්‍යාපෘතිය වෙනුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශයට ද වර්ෂය තුළ ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී.

### 2.9.1 ප්‍රාදේශීය සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් රු. මි. 1,196.11 ක සමස්ථ ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි 624.07 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.572.04 ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මි 933.79 වු ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේදී එය රු.මි 262.32 ක වැඩි වීමකි. සමාලෝචිත වර්ෂය තුල දරණ ලද සමස්ථ වියදම රු.මි 325.39 වන අතර එය රු.මි 274.38 වු පුනරාවර්තන වියදමකින්ද, රු.මි.51.01 වු මූලධන වියදමකින්ද සමන්විත වේ. එය 2022 වර්ෂයේ සමස්ථ වියදම සමඟ සැසඳීමේදී රු.මි 448.06 ක අඩු වීමකි.







## 2.9.2 ප්‍රාදේශීය සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

### පළාත් පාලන මාර්ග සංවර්ධනය

මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත අති විශාල කාර්යභාරයක් පැවරී ඇත. ඒ අනුව උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ඇති පළාත් පාලන ආයතන 27 තුළ හඳුනාගන්නා ලද මාර්ග සංවර්ධනය කිරීමේ වගකීම පළාත් පාලන ආයතන සතු වේ. ඒ අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශ මට්ටමින් හඳුනා ගන්නා ලද මාර්ග ජනතාවට පහසු වන ආකාරයෙන් හා ජනතාවගේ එදිනෙදා කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට හැකි වන අයුරින් බොරළු දමා සංවර්ධනය කිරීම, කුට්ටිගල් ඇල්ලීම, කොන්ක්‍රීට් කිරීම, තාර ඇතිරීම හා කාපට් කිරීම් ඔස්සේ ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට පසුගිය වසර වල කටයුතු කර ඇත.

එමෙන්ම මේ වන විට පළාත් පාලන ආයතන වලට අයත් සියළුම මාර්ග ගැසට් මගින් ප්‍රකාශ කර ඇති අතර පළාත් පාලන ආයතන සතුව පවතින සංවර්ධනය විය යුතු වඩාත් ප්‍රමුඛ මාර්ග හඳුනාගෙන පළාත් සභා සහ ප්‍රාදේශීය සභා අරමුදල්, උසාවි දඩ සහ මුද්දර ගාස්තු, විදේශාධාර යන අරමුදල් මූලාශ්‍ර පාදක කර ගනිමින් සංවර්ධන කටයුතු කර ඇත.

### ප්‍රජා මූල ජල පහසුකම් සංවර්ධනය

උතුරු මැද පළාත තුළ ජීවත් වන බොහෝ පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ගොවිතැනයි. වර්තමානයේ බොහෝ ආර්ථික අපහසුතා මැද ජීවත්වන මෙම ජනතාවට බීමට සුදුසු ජලය නොමැතිකම හා පිරිසිදු පානීය ජල මූලාශ්‍ර හිඟකම ප්‍රධානතම ගැටළුවක්ව පවතී. පවතින කාලගුණික හා දේශගුණික විපර්යාස මත කලට වැසි නොලැබීම නිසා ජලය සුරැකිය යුතු සම්පතක් බවට පත්ව ඇත.
බීමට සුදුසු ජලය නොමැතිකමින් පීඩා විඳින ජනතාව පිළිකා , වකුගඩු යන ප්‍රධාන රෝග වලට ගොදුරු වී සිටින අතර, කුඩා ළමුන් සඳහා ද මෙම රෝග ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් මේ වන විට දක්නට ඇති බැවින් පානීය ජලය ලබාදීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු

කිරීමට පළාත් පාලන අයතන මේ වන විටත් කටයුතු කරගෙන යනු ලැබේ.

සැමට පිරිසිදු පානීය ජලය සැපයීම ඕනෑම රජයක වගකීම වන අතර, දැනටමත් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන බොහෝ ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලය හා එක්ව ප්‍රජා ජල ව්‍යාපෘති යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සිට සියළුම ජනතාව ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අතර ජල ව්‍යාපෘති හරහා ජලය ලබාදෙන නල මාර්ග දීර්ඝ කිරීම, ජල පෙරන පද්ධති සවිකිරීම, ජල මූලාශ්‍ර නොමැති ස්ථාන සඳහා බීමට සුදුසු ජලය ලබාදීමට ටැංකි ස්ථාපනය කිරීම, ජල පිරිපහදු කරන ස්ථාන ඉදිකීරිම වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.

2022 වසරේ සිට ඉදිරි වසර 03ක් සඳහා පළාත් පාලන ආයතනයක් සඳහාම එහි නඩත්තු කටයුතු පළාත් පාලන ආයතන මට්ටමින් අදාළ අරමුදල මඟින් සිදු කරන අතර පළාතේ දිය උල්පත් හඳුනාගෙන ඒ ඒ ගම්මානයට අයත් වන්නේ කුමන ව්‍යාපෘතියද යන්න, ජනයාගේ පානීය ජලය අවශ්‍යතාවය සපුරාදිම සඳහා වඩාත් යෝග්‍යතම ක්‍රමවේදය හඳුනාගැනීම ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ අධික්ෂණ යටතේ ලබා ගැනීමක් සිදුකරයි. මෙය ශක්‍යතා අධ්‍යනයක් මඟින් ඉදිරි වසර 03 සඳහා ව්‍යාපෘති පෙළ ගැස්වීමක් සෑම වසරක් පාසාම සිදුකරනු ලබන අතර, එහිදි ප්‍රතිපාදන ප්‍රමාණය මත ප්‍රජා ජල පහසුකම් සංවර්ධන සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි.

2023 වර්ෂයේ ප්‍රජා මූල ජල ව්‍යාපෘති 5ක් සඳහා රු. මිලියන 3.8ක් වෙන් කර තිබුණු අතර වර්ෂය අවසානයේ ව්‍යාපෘති වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන්වීම නිසා සහ ව්‍යාපෘති ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, වර්ෂය අවසානයේ පැවති අධික වර්ෂාව සහිත දේශගුණික තත්ත්වය වැනි හේතු නිසා අනුමත වූ සියළු ව්‍යාපෘතිවල වැඩකොටස් අවසන් කිරීමට නොහැකි විය.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කෙටිකාලීන හා දීර්ඝ කාලීන සැලසුම් සකස් කරමින් සියළු පළාත් පාලන ආයතනයන්ගේ සිය පළාතට අයත් ජනයාගේ සෞඛ්‍යවත් ජීවන තත්ත්වයක් නගා සිටුවීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවක් ලෙස මඟපෙන්වීම සිදුකරනු ලබයි.

ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කුඩා කළ සිටම ජනයා හුරු පුරුදු කරවීම සඳහා පාසල් මට්ටමේ සිට නාගරික මට්ටමේ ජනයා දක්වා විවිධ වැඩසටහන් මඟින් සුපිරිසිදු රටක් බිහිකිරීම මුලික අරමුණ වේ. ඒ අනුව අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනාගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීමට ජනතාව පෙළ ගැස්සවීම අපද්‍රව්‍ය කළමනාකරණයේ පළමු පියවර ලෙස කටයුතු කරමින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ කසල කළමනාකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් නිරන්තරයෙන් පවත්වා, ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

ඒ ඔස්සේ කාබනික පොහොර භාවිතා කරමින් කෘෂි වගා වැඩසටහන්, ගෙවතු වගා වැඩසටහන්, ශ්‍රමදාන, රුක් රෝපණ වැඩසටහන් වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති ගණනාවක් පළාත් පාලන

ආයතන මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු සිදු කර ඇත.

පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන ආකාරයෙන් කසල අංගන ඉදිකිරීම මේ වන විටත් ක්‍රියාත්මකව පවතින අතර , එම කසල අංගන හා පිළිසරු මධ්‍යස්ථාන ආශ්‍රිතව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, කසළ වෙන්කිරීමට අවශ්‍ය කමත් පුළුල් කිරීම හා ඒ ආශ්‍රිතව පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුලින් සේවයේ යෙදී සිටින සේවකයින්ගෙන් උපරිම සේවයක් ලබාගැනීම හා ඔවුන්ගේ සෞඛ්‍ය පහසුකම් ආරක්ෂාකාරීව පවත්වාගෙන යාමට ද කටයුතු කර ඇත. ඒ අනුව සුරක්ෂිත පරිසර පද්ධතියක් තුල ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීමේ කොටසක් අපහට ද පැවරී ඇති හෙයින් තිරසාර පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීමට ද අපගේ දායකත්වය ලබාදෙන්නෙමු.

## පොදු ප්‍රාදේශීය සංවර්ධන සේවා

ජනතාවට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු වැසිකිළි පද්ධති ඉදිකිරීම, පොදු ළිං ඉදිකිරීම වැනි පොදුවේ භාවිතා කරනු ලබන පහසුකම් සංවර්ධනය කිරීම, පුස්තකාල පහසුකම්, සති පොළවල් සංවර්ධනය කිරීම, පොදු වෙළඳ සංකීර්ණ තුළ පවතින අඩුපාඩු සකස් කිරීම හා ජනතාවගේ මානසික හා කායික සුවතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් උද්‍යාන සංවර්ධනය, ඇවිදින මංතීරු ඉදිකිරීම වැනි කටයුතු සඳහා දායකත්වය ලබාදී ඇත. එසේම පූර්ව ළමා අධ්‍යාපනය උදෙසා පළාත් පාලන ආයතන යටතේ පවත්වාගෙන යන පෙර පාසල් සඳහා මෙන්ම බල ප්‍රදේශයේ පවතින වෙනත් පෙර පාසල් ආශ්‍රිතව පවතින අඩුපාඩු සකස් කිරීම සඳහාද ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

උතුරු මැද පළාතේ මගී ප්‍රවාහන නියාමන ආයතනය වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික ධාවකයින්ගේ දායකත්වය මත ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව රට තුල ක්‍රියාත්මක සංවර්ධන ක්‍රියාවලියට ගැලපෙන අයුරින්, සම්පූර්ණයෙන් ඒකාබද්ධ හා නියාමනය වූ ප්‍රවාහන ජාලයක් ගොඩනැගීම සඳහා සැලසුම් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පාලනය කරමින් , උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ලියාපදිංචි බස්රථ සහ අන්තර් පළාත් බස්රථ නියාමනය කිරීම ප්‍රධාන ලෙස සිදුකරනු ලබයි.

## පොදු මගී ප්‍රවාහන සේවය

අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙක තුළ පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා ඉටුකරලීම සඳහා පෞද්ගලික බස් රථ නියාමනය හා ලංකා ගමනාගමන මණ්ඩලය සමග ඒකාබද්ධ කාලසටහන් ක්‍රියාත්මක කරමින් පොදු මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා ජාතික ප්‍රතිපත්තියකට අනුගත වෙමින් හා 2030 තිරසර සංවර්ධන අරමුණුද පළාත් රාජ්‍ය සේවාවේ අරමුණු ද ඉටුකරලමින් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබාදීමට කටයුතු කිරීමට 2023 වර්ෂය තුළ සමත් වී ඇත. විශේෂයෙන් 2023 වර්ෂයේ පළාත් සංවර්ධන ප්‍රදාන හෝ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා ප්‍රතිපාදන නොමැති වුව ද උතුරු මැද පළාතේ බස්නැවතුම්පළ 20 ක ප්‍රමාණයක් කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් ජනතාවගේ

සෞඛ්‍යාරක්ෂාව හා සුරක්ෂිතභාවය ආරක්ෂාවන පරිදි පිරිසිදු හා අලංකරණයෙන් යුතු බස්නැවතුම්පළවල් බවට පත් කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන්කල යුතුය. එසේම ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා බොහෝමයක් ඉටුකර දීමට හැකි විය.

එමෙන්ම , 2023 වර්ෂයේ අවසන් කාර්තුවේ කාර්ය මණ්ඩලයේ සාමූහික ප්‍රයත්නයක් ලෙස රුපියල් මිලියන හතලිස් පහක් (රු.මි. 45) ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීමට හැකිවීම ආයතනය ලද විශේෂ ජයග්‍රහනයක් ලෙස දැක්විය හැක

## ඉදිරි ප්‍රවාහන සංවර්ධන අරමුණු

මෙහිදී මගී ප්‍රවාහනයට අමතරව සංවර්ධනය කරා වේගවත් ලෙස ගමන් කිරීමට පොදු මගීන් උදෙසා අවශ්‍ය සේවා හඳුනාගෙන විවිධ ප්‍රවාහන අවශ්‍යතාවයන් ඔස්සේ සේවාවන් සැපයීමට ක්‍රියාත්මක වෙමින් පවතී. එනම්,

- රටේ අනාගතය භාරගන්නට සැරසෙන අනාගත පරපුර සඳහා ප්‍රශස්ථ සුවපහසු ප්‍රවාහනයක් ලබාදීමේ අරමුණින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුග්‍රහය යටතේ ක්‍රමානුකූල ප්‍රවාහන සේවාවක් පාසැල් වෙත සැපයීමට කටයුතු සිදු කර ඇත. පාසල් දරුවන් සඳහා සහනදායි ශාස්තු ක්‍රමයක් අනුගමනය කිරීම තුලින් ඕනෑම ආර්ථික මට්ටමක පාසල් සිසුන්ට ඔවුන්ගේ අධ්‍යාන කටයුතු නිසියාකාරව සිදුකිරීමට හැකි වන පරිදි මෙම සිසුසැරි බස්රථ සේවාව ක්‍රියාත්මක වන අතර, ඉදිරියේදීද මෙම සේවාව නිසිපරිදි ලබාදීමට කටයුතු සැලසුම්කර ඇත.
- අතිශය දුෂ්කර ගම්මානවල සිට විවිධ අවශ්‍යතාවයන් සඳහා නගර කරා පැමිණෙන මගී ජනතාවගේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය පොදු මගී ප්‍රවාහනය වන අතර, දුෂ්කර මාර්ග සඳහා ද බස්රථ ධාවනය ආරම්භ කිරීම තුලින් දුෂ්කර ග්‍රාමීය ජනතාවට මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ටද ප්‍රවාහන පහසුව සැපයීම අරමුණු වේ. එනම් ගමෙන් නගරය වෙත පැමිණෙන සියලුම මගී ජනතාවට පොදු මගී ප්‍රවාහන සේවාව භාවිතා කිරීමට හැකි වන පරිදි මෙම සේවාව ඉදිරියේදී පුළුල් කිරීමට අපේක්ෂිතය.
- මීට අමතරව උතුරු මැද පළාත් තුළ විසිරී තිබෙන ත්‍රී රෝද රථ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ලියාපදිංචි කර විධිමත් පරිපාලනය හා නියාමනය කිරීම තුළින් ත්‍රී රෝද රථ වලින් සිදුවන අක්‍රමිකතා හා සමාජ විරෝදී ක්‍රියා අවම මට්ටමකට පත්කිරීමට මේ වන විට හැකිවී ඇති අතර, ඉදිරියේදී එම තත්ත්වය මුළුමනින්ම පාලනය කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.
- එසේම පෞද්ගලික වෑන් රථ මගින් සිදු කරන පාසල් ළමුන් ප්‍රවාහනය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට පියවර ගෙන ඇත.

2023 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන නොලැබුණද මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති මගින් 100%ක සාපේක්ෂ ඵලදායිතාවයක් ළඟාකර ගැනීමට හැකිවී ඇත. එම සාර්ථකත්වය ලඟාකරගැනීම සඳහා විෂයභාර අමාත්‍යාංශ ලේකම්තුමන්,

ප්‍රධාන ලේකම්තුමන් හා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ මඟපෙන්වීම ද ගරු සභාපතිතුමන් ඇතුළු ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ නිවැරදි තීරණ ක්‍රියාත්මක කරමින් සාමාන්‍යාධිකාරී තුමාගේ සහ කාර්ය මණ්ඩලයේ නොමසුරු උත්සාහයෙන් හා කැපවීමෙන් ආයතන ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සියල්ලම ක්‍රියාත්මක කර අපේක්ෂිත අරමුණු සහ ඉලක්ක කරා ලඟා වීමට හැක්වීම සතුටුදායක තත්ත්වයකි.

එසේම , මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය ආරම්භ කර වසර 24 ක කාලයක් ගතවී ඇති අතර එහිදී පොදු ප්‍රවාහනයේ ගැටළු හඳුනා ගැනීම සිදුකරන ලද අතර ඒ ඔස්සේ පෞද්ගලික බස්රථ මඟින් පොදු මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සමග කෙසේ වෙනස් විය යුතුද යන්න හඳුනා ගැනීමෙන් අනතුරුව ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුවී ඇති නව තාක්ෂණික වෙනස්වීම් සමග පොදු මගී ප්‍රවාහන සේවාව නව මානයකට රැගෙන යාම මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ අපේක්ෂිතය ඉදිරි දැක්ම වේ.

## මාර්ග සංවර්ධනය

ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක් යන දැක්ම යටතේ ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත උතුරු මැද පළාත තුළ වූ සී හා ඩී ශ්‍රේණියට අයත් පළාත් මාර්ග නියාමනය කිරිම සඳහා වූ ව්‍යවස්ථාමය බලතල හිමි වී ඇත. ඒ අනුව එම මාර්ගයන් හි පුනරුත්ථාපනය එහි වූ යටිතල පහසුකම් සංවර්ධනය, නඩත්තුව ඇතුළු නියාමනයන් අධිකාරිය මඟින් සිදු කරනු ලබයි.

පළාත තුළ සී හා ඩී ශ්‍රේණියට අයත් මාර්ග කිලෝමීටර් 1947.32ක් පවතින අතර, මේ අතුරින් කිලෝමීටර් 1438.19ක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ද කිලෝමීටර් 509.13 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ද ව්‍යාප්තව ඇත. පසුගිය කාල පරිච්ඡේදය තුළ පළාත් මූලධන සහ බාහිර ප්‍රතිපාදන මඟින් එම මාර්ග වලින් සැලකිය යුතු ප්‍රමාණයක් කාපට් අතුරා නවීකරණය කර ඇති අතර, ප්‍රතිශතයක් ලෙස එය 54.6% වේ. තාර යෙදූ අනෙකුත් මාර්ගයන් ද කිලෝමීටර් 623ක් (32%) පමණ පවතින අතර, ඉන් සමහරක් මේ වන විට ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක පවතී.

එසේම බොරළු සහිත මාර්ගයන් ද කිලෝමීටර් 233 ක් පමණ පවතී. එසේ පවතින මාර්ගයන් ගමනා ගමනයට යෝග්‍ය අයුරින් පුනරුත්ථාපනය හෝ නඩත්තු කර පවත්වා ගැනීම ආයතනයේ මූලික අභිප්‍රාය වේ. එසේම රථ වාහන ආරක්ෂාවට බලපාන අත්‍යවශයෙන්ම හඳුනාගත් පාලම් ඇතුළු නිර්මිතයන් පිළිසකර කිරිමටත්, හඳුනාගත් ස්ථානයන්හි මාර්ග සංඥා පුවරු ස්ථාපිත කිරීමටත්, පදික මාරු සහ මාර්ග සලකුණු කිරීම් සිදු කිරීමටත් අපේක්ෂා කරයි.

එසේම මාර්ග රක්ෂිතයන් නියාමනය සම්බන්ධයෙන් ප්‍රඥප්තිය තුළ පවතින දුර්වලතාවයන් හේතු කොටගෙන අනවසර ඉදිකිරීම් සහ අත්පත් කර ගැනීම් සඳහා නෛතික ක්‍රියා මාර්ග ගැනීමේ ගැටළුකාරී තත්ත්වයක් පවතින අතර, ඒ අනුව ඊට අදාල නීතිමය පසුබිම ශක්තිමත් කිරිමට ඉදිරියේදී බලාපොරොත්තු වේ.







2023 වසර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ,

- කටුකැලියාව මහිලා මාවත මැකඩම් ක්‍රමයට සංවර්ධනය කිරීම (0+000 – 1+600)- භෞතික ප්‍රගතිය 33%
- හබරන සහකාර පොලිස් අධිකාරි කාර්යාලය අසල සිට සිනමන් ලොජ් හෝටලය දක්වා මාර්ගය මැකඩම් ක්‍රමයට සංවර්ධනය කිරීම (0+000 – 1+620) භෞතික ප්‍රගතිය 55%
- අනුරාධපුර මහ රෝහලේ අභ්‍යන්තර මාර්ගය කැට ගල් අල්ලා සංවර්ධනය කිරීම (0+000 – 0+140) භෞතික ප්‍රගතිය 100% යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.



අනුරාධපුර මහ රෝහලේ අභ්‍යන්තර මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම



කටුකැලියාව මහිලා මාවත



හබරණ සහකාර පොලිස් අධිකාරි කාර්යාලය අසල සිට සිනමන් ලොජ් හෝටලය දක්වා මාර්ගය

## මාර්ග නඩත්තු

2023 මාර්ග නඩත්තු වැය විෂය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාලව කොට්ඨාස 04 කද පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාලව කොට්ඨාස 02කද රු.මි. 86.96 වියදමින් කි.මී 165.64 දුර ප්‍රමාණයක් නඩත්තු කරන ලදී. එහිදී ,මාර්ග පෘෂ්ඨයේ සහ දෙපස පවතින කඩතොළු විධිමත් අයුරින් සැකසීම,. මාර්ගය දෙපස කැලය සහ ගස් අතු රිකිලි කැපීම, ක්ෂය වී ඇති මාර්ග උරහිස (Shoulders), බොරළු අතුරා නැවත පිළිසකර කිරීම,මාර්ගය දෙපස උස් සහිත කොටස් යන්ත්‍රානුසාරයෙන් (Clearing high side) සැකසීම, කාණු පවිත්‍ර කිරීම/ කැපීම/ ජල ප්‍රවාහන පද්ධති පිළිසකර කිරීම, කැඩී බිඳී ඇති නිර්මිතයන් පිළිසකර කිරිම, මාර්ග සළකුණු කිරීම් සහ සංඥා පුවරු සවි කිරීම සිදු කරන ලදී.

තවද දේශගුණ විපර්යාසයන්ට අනුහුරු වීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ වාරි ජලය කාර්යක්ෂමව බෙදාහැරීම සඳහා වූ කොන්ක්‍රීට් කානු පද්ධතියක් ස්ථාපිත කිරීමද, බෝ මළුව (ජය ශ්‍රී මහා බෝධිය විහාරගෙය) පිවිසුම් මාර්ගය ආසන්නයේ රථ ගාල ඉදිකිරිම මඟින් රථගාලේ ධාරිතාවය වැඩි කිරිමට කටයුතු කිරීමද , සුරක්ෂිතභාවය ඇති කිරිම සඳහා සරණ ළමා නිවාසයේ තාප්පය නැවත ඉදිකිරීමද, සිදු කරන ලදී.


මාර්ග පෘෂ්ඨය සැකසීම (Chip sealing Patching) ඇතිරිම


ප්‍රිමික්ස් ප්‍රිමික්ස් ඇතිරිම


ගස් හා අතු කැපීම (Tree & Branch Cutting)


අනුරාධපුර බෝ මළුව පන්සලට පිවිසුම් මාර්ගය ආසන්නයේ රථගාල ඉදි කිරීම


දිවුල්ගස්කඩ කුඩාවැව යටිගං අතෙහි ඇලවේළි ප්‍රතිසංස්කරණය


නෙළුම්වැව යටිගං අතෙහි ඇලවේළි ප්‍රතිසංස්කරණය

# 2.10 සමූපකාර සංවර්ධනය

## Development of Co-Operatives



තිරසාර සමූපකාර ව්‍යවසායක් සෞභාග්‍යමත් සමාජයක් යන දැක්ම යටතේ උතුරු මැද පළාතේ ජනතාව වෙත සමූපකාර දර්ශනය පදනම් කරගත් ව්‍යාවසාය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා සානුබල සැපයීම පළාත් සභාව පිළිගත් සමූපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම ආරක්ෂා වන ආකාරයට පළාත තුල ලියාපදිංචි සමූපකාර සමිති සංවිධාන සංවර්ධන කාර්ය සඳහා දායක කර ගැනීම. සමාජයේ පොදු ආර්ථික සමාජීය සංස්කෘතික අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම සඳහා යොදා ගත හැකි හොදම විකල්පය ලෙස සමූපකාර ව්‍යාවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම. පළාතේ සමූපකාර සමිති සතු ග්‍රාමීය බැංකු ශාඛා ජාලය විධිමත් කර ජනතාව වඩාත් සිත් ගන්නා සුළු ආකාරයට, විනිවිද භාවයකින් යුක්තව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයකින් දිරි ගැන්වීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂා කරන අතර පළාතේ සමූපකාර ව්‍යවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට හා විශ්වාසනීය බව තහවුරු කිරීමට මෙමඟින් බලාපොරොත්තු වේ.

### 2.10.1 සමූපකාර සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේදී සමූපකාර සංවර්ධනය වෙනුවෙන් රු.මි. 110.73 ක සමස්ථ ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි 103.23 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.7.5 ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව සමූපකාර සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මිලියන 110.24 වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සැසදීමේදී එය වර්ධනය වී ඇත්තේ 0.45% පමණ වූ අගයකිනි. 2023 වර්ෂය තුල සමස්ථ සත්‍ය වියදම රු. මි 95.65 ක් වන අතර, පූර්ව වර්ෂයේ වියදම සමඟ සැසදීමේදී රු.මි 8.24 ක අඩු වීමකි. එමෙන්ම 2023 වර්ෂයේදී රු.මි 325.43 ක සත්‍ය වියදමක් මේ සඳහා යොදවා ඇති අතර, එය රු.මි 274.38 පුනරාවර්තන වියදමකින්ද, රු.මි. 51.01 මූලධන වියදමකින් ද සමන්විත වේ.







## 2.10.2 සමුපකාර සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම, සියලු පාර්ශවකරුවන්ගේ මනා සහාගීත්වයෙන් විනිවිද භාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට හා ප්‍රතිපත්තිවලට මුල් තැන දෙමින් සංවර්ධනය කිරීම යන මෙහෙවර මුල් කර ගනිමින් කටයුතු කරනු ලබන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්, උතුරු මැද පළාතේ ඇති ලියාපදිංචි සමුපකාර සමිතිවල නියාමන කටයුතු සිදු කරන අතර ලියාපදිංචි සමිති 731 ක් හා සාමාජිකයින් 331183 ක් නියාමනය මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යවස්ථාපිත කාර්යයන් මෙන්ම සමුපකාර සමිතිවල කළමනාකරණය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත නොවන කාර්යයන්ද සිදු කරනු ලැබේ.මෙම නියාමන කටයුතු කිරීම සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් 107 ක් හා සමුපකාර සේවකයන් 1319 ක් සමුපකාර සමිතිවල කටයුතු සිදු කරනු ලබයි. 2023 වර්ෂය තුල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස රු මිලියන 6 ක් හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන වශයෙන් රු මිලියන 1.5 ක ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවට වෙන් වුවද 2023 වර්ෂයේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත අනුමත නොවූ අතර ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු මිලියන 1.5 න් රු මිලියන 0.645 අනුමත කල අතර එමගින් රු මිලියන 0.606 ක් වැයකර Desktop පරිගණක 03 ක් හා UPS 03 ක් මිලදී ගැනීමට හැකි විය. පවත්නා ආර්ථික අර්බුද තත්ත්වය සාර්ථකව කළමනාකරණය කර ගනිමින් 2023 වර්ෂයේ අපගේ සමුපකාර කෝප් සිටි සංඛ්‍යාව 72 ක දක්වාද ග්‍රාමීය බැංකු සංඛ්‍යාව 175 දක්වාද වැඩිකර ගැනීමට හැකි වීම අප ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිය.

2023 වර්ෂයේ පැවති උද්ධමනය හමුවේද සමුපකාර සමිති විවෘත වෙළඳපල සමඟ තරඟකාරීව කටයුතු කරමින් උද්ධමනය හමුවේ පීඩනයට පත් වූ පාරිභෝගික ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ

සහනදායී මිල ගණන් යටතේ සැපයීමත්,රජයේ අනුමත කළ මිල ගණන් යටතේ කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම සඳහා මැදිහත් වීමත් සමිති සේවක හා සාමාජිකයින්ගේ ආර්ථික,සමාජ සුභසාධන හා අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමට කටයුතු කිරීමට හැකිවීම පෙර වර්ෂ වලට සාපේක්ෂව අප ලද ජයග්‍රහණයකි. 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ උතුරු හා උතුරුමැද පළාත්වල වෙසෙන ණයගැති භාවයෙන් පෙළෙන ජනතාව සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය සැපයීමේ චක්‍රීය ණය වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ සමුපකාර සාමාජිකයන් වෙත 2022 වර්ෂයේදී ද සාමාජිකයින් 1525 ක් සඳහා මිලියන 69.16 ණය මුදල් නිකුත් කල අතර 2023 වර්ෂයේදී සාමාජිකයින් 1530 ක් වෙත මිලියන 67.38 ක ණය නිකුත් කිරීමේ හැකියාව ලැබුණි.

මෙම වර්ෂය අප දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක වසරක් වූ අතර අනෙකුත් තරඟකාරී ව්‍යවසායකයින්ගේ අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් තරඟකාරී දේශීය වෙළඳපල ජය ගැනීමට සමුපකාර සේවකයින් දිරි ගැන්වීම,සමුපකාර සමිති අධීක්ෂණය නියාමනය කිරීම මෙන්ම ලියාපදිංචි කර ඇති සමුපකාර සමිතිවල විගණන කටයුතු කිරීම, සමුපකාර සමිති ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව ආරවුල් විභාග කර තීන්දු ලබාදීම සහ ඉදිරිපත් වී ඇති අභියාචනා විභාග කර තීන්දු ලබාදීම වැනි කටයුතු පෙර වර්ෂ වලට වඩා උද්යෝගීව කිරීමට හැකි වීම මෙම වර්ෂයේ අප ලද ජයග්‍රහණයකි.






විවෘත කරන ලද සී/ස එප්පාවල වි.සේ.ස සමිතියට අයත් ඉහලහල්මිල්ලවැව කෝප් සිටිය

## ඉදිරි දැක්ම

උතුරු මැද පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ලාභදායීත්වය 50% ඉක්මවා යෑමට නිසි වැඩපිළිවෙලක් සකස් කර පවත්නා කෝප් සිටි ජාලය හා ග්‍රාමීය බැංකු තවදුරටත් ආකර්ෂණීය හා කාර්යක්ෂම ලෙස පුළුල් කිරීම , නිෂ්පාදන සමුපකාර සමිති වැඩිකිරීම සහ කාන්තා සහභාගීත්වය වැඩිකිරීම තුලින් කාන්තා ව්‍යවසායකයින් බිහි කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම වේ.

## මුහුණ දීමට සිදුවූ අභියෝග හා ලඟාකර ගැනීමට අපේක්ෂිත අනාගත අරමුණු

පැවති ආර්ථික අර්බුද තත්ත්වය යටතේ සැලසුම් කරන ලද සංවර්ධන ව්‍යාපෘති අනුමත නොවූ අතර අපේක්ෂිත ප්‍රතිඵල මෙමඟින් ලබා ගැනීමට නොහැකි වීම මෙම දෙපාර්තමේන්තුව මුහුණ දුන් විශාල අභියෝගයකි. තවද ආර්ථික අර්බුදයේ අයහපත් බලපෑම හේතුවෙන් විවෘත වෙළඳපල සමඟ තරඟකිරීමට තරම් සමුපකාර සමිති වල පාරිභෝගික අංශයේ මූල්‍ය තත්වය යහපත් නොවීම,සමුපකාර කේෂත්‍රය තුල දැනුම, හැකියාව හා පුහුණුව සහිත මානව සම්පතේ හිඟකම මෙන්ම සමුපකාර වෙළඳ අංශය තුල නවීන තොරතුරු තාක්ෂණය භාවිතය මන්දගාමී වීම වැනි අභියෝග වලට මුහුණ දුන් නමුත් අපගේ කෝප්සිටි ජාලය මඟින් ආර්ථික දුෂ්කරතාවන් සහ පීඩාවන් ජය ගැනීම සඳහා පාරිභෝගික ජනතාවට සහන මිලට භාණ්ඩ හා සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

ආර්ථික අර්බුදයෙන් කෙමෙන් කෙමෙන් ගොඩ එමින් සිටින අවස්ථාවක ග්‍රාමීය නිෂ්පාදන ප්‍රධාන කරගත් ආදායම් මාර්ගවල වලට අවදානය යොමු කරමින් සමුපකාර ව්‍යාපාරය තාක්ෂණයේ දියුණුවකට පරිවර්තනය කර ආර්ථිකයට වැදගත් කාර්යයක් ඉටුකරන කේෂත්‍රයක් බවට පත් කිරීමත් සමුපකාර වෙළඳ ජාලය මඟින් මහජනතාවට සහන මිලට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය හිඟයකින් තොරව අඛණ්ඩව සැපයීම සඳහා සහය දැක්වීම, සමුපකාර සමිති වල ලාභදායීත්වය 50% කින් වැඩි කිරීමට බලාපොරොත්තු වේ. සමුපකාර සේවක කොමිෂන් සභාව ලෙස ක්‍රියාත්මක වීමේදී සමිති අභ්‍යයන්තරව සුදුසුකම් සහිත නිළධාරින් සේවකයින් සීමිත සංඛ්‍යාවක් සිටීම, භාහිර බඳවා ගැනීමේදී සමුපකාර ක්ෂේත්‍රයේ වැටුප් තලයන් අවම අගයක් ගන්නා බැවින් ඉදිරිපත් වීමේ අවශ්‍යතා සීමා වීම හා කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කිරීමට ඇතැම් සමිතිවල සභාපතිවරු මැලියාවක් දැක්වීම අභියෝග ලෙස පවතින අතර, ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක් ඇති කිරීම, යහපත් සේව්‍ය සේවක සබඳතාවක් හා ගුණාත්මක සේව්‍ය සේවක සබඳතාවක් ඇති කිරීම, ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට පත්වීම, සමුපකාර සේවක පත්කිරීම්, උසස් කිරීම්, සේවා ස්ථිරත්වය ලබා දීම,සමුපකාර සේවක පුහුණු පැවැත්වීම,සමුපකාර අභියාචනා සලකා බැලීම අරමුණු අතර වේ.

# 2.11 ප්‍රජා සංවර්ධනය

**Community Development**



සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රජා සත්කාරක සේවා වෙනුවෙන් පළාත් ආණ්ඩුකාර කාර්යාලයට ද, ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් ප්‍රධාන අමාත්‍යාංශයට ද, යෞවන කටයුතු වෙනුවෙන් සමුපකාර අමාත්‍යාංශයට ද, කාන්තා කටයුතු වෙනුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශයට ද වර්ෂය තුල ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. “උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතන ගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතා වලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයකින් යුක්තව සංවර්ධනය කිරීම.

## 2.11.1 ප්‍රජා සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයදී සමුපකාර සංවර්ධනය වෙනුවෙන් රු.මි.126.31 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි 60.81 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.65.50 ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව ප්‍රජා සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මි. 77.85 වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සැසඳීමේදී එය රු.මි 48.46 කින් වැඩි වී ඇත. සමාලෝචිත වර්ෂය තුල සමස්ථ සත්‍ය වියදම රු.මි. 58.21 ක් වන අතර, එය රු.මි. 57.21 පුනරාවර්තන වියදමකින්ද, රු.මි. 0.9 මූලධන වියදමකින්ද සමන්විත වේ.









## 2.11.2 ප්‍රජා සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

උතුරු මැද පළාත් සභාව තුල පළාත් සභා පරිපාලන කටයුතු සඳහා ආයතන 15ක් දායක වේ. එහිදී ව්‍යවස්ථාපිත කටයුතු , ආයතනික කටයුතු , මූල්‍ය නියාමනය , තිරසර සංවර්ධන අරමුණු පෙරදැරි කොට සෞභාග්‍යයේ දැක්මට අනුකූලව සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වය ඇතිව ජාතික ප්‍රතිපත්තියට අනුගතව හා විනිවිදභාවයෙන් යුතුව සාධාරණ ක්‍රමවේදයක් මඟින් අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව දායකවීමේ මෙහෙරව මුල් කර ගත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මඟින්, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි උතුරු මැද පළාතේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. පොදු පහසුකම් සංවර්ධනය, ආගමික සිද්ධස්ථාන සංවර්ධනය, ස්වයං රැකියා සංවර්ධනය , කෘෂි උපකරණ ලබාදීම, වගා ළිං ඉදිකිරීම , අඩු ආදායම්ලාභීන් සඳහා සෙවිලි තහඩු ලබාදීම හා වැසිකිළි ආධාර ලබාදීම , සමිති/ ස්වේච්ඡා සංවිධාන සඳහා පුටු ලබාදීම , ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැනි සංවර්ධන කටයුතු රාශියක් ඉටු කර ඇත. තවද මේ සඳහා පරිපූරක ප්‍රතිපාදන සලසා දෙනු ලැබුවේ වර්ෂ අවසානයේදී වීම නිසා , ඉතාම කෙටි කලක් තුල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කරන ලදී. තවද 2023 වර්ෂයේ පැවති මූල්‍ය අර්බුධකාරි තත්ත්වය හේතුවෙන් ලබාදුන් ප්‍රතිපාදන වලින් 6%ක් පමණ ප්‍රමාණයක් කපා හැරීම සිදු කරන ලදි. නමුත් 2023 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම දුෂ්කර කාර්යයක් වූ නමුදු සමස්ථ ප්‍රතිපාදන ඉතාමත් අරපිරිමැසුම්දායක ලෙස අත්‍යවශ්‍ය වියදම් සඳහා පමණක් උපයෝගී කර ගනිමින් නිවැරදි මූල්‍ය කළමනාකරණයක් ප්‍රජා සංවර්ධන කටයුතු ඉටු කිරීමට හැකි සෑම විටම උත්සහයන් දරන ලදී.



ආගමික සිද්ධස්ථාන හා දහම් පාසල් හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය



පාසල් සංවර්ධනය



කෘෂිකර්ම අංශය නගාසිටුවීම




විදේශ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පොදු පහසුකම් සංවර්ධනය



ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම




සෞඛ්‍ය අංශය නඟාසිටුවීම

## රන් මාවත රැකියා වෙළඳපොල

ගරු ආණ්ඩුකාරතුමාගේ සංකල්පයක් අනුව ප්‍රධාන ලේකම්තුමාගේ මඟපෙන්වීම රන් මාවත රැකියා පොළ වැඩසටහන 2022 වර්ෂයේ ක්‍රියාත්මක විය. මේ සඳහා 2023.12.31 වන විට 4000 පමණ පිරිසක් ලියාපදිංචි වී ඇත.උතුරු මැද පළාත තුළ වසරකට 31000 ක පමණ සිසුන් පිරිසක් අධ්‍යාපනය අවසන් කරන අතර ඉන් වෘත්තීය පුහුණුව සඳහා යොමු වන පිරිස 2,200 ක් පමණ වේ . කිසිදු වෘත්තීය පුහුණුවක් නොලබා ශ්‍රම වෙළඳපොළට වාර්ෂිකව 28,800 ක පමණ තරුණ පිරිසක් එකතු වේ.මෙය පළාතක් මෙන් ම රටක් වශයෙන් ගත්ත ද බරපතල ගැටළුවකි.විදේශ සේවා නියුක්ති කාර්යාංශ දත්ත අනුව පෙනී යන්නේ විවිධ වෘත්තීය හැකියාවන් ඇති පිරිස් සඳහා දේශීය මෙන් ම විදේශීය වෙළඳපොළේ විශාල ඉල්ලුමක් ඇති බවයි.

මෙම වැඩසටහන තුළින් දැනටමත් වෘත්තීය නිපුණතා ඇති පුද්ගලයන් සෘජුවම විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යොමු කරන අතර වෘත්තීය පුහුණුව නොමැති පිරිස් වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කර පුහුණුව අවසානයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශ රැකියා සඳහා යොමු කිරීම අරමුණ වී ඇත.මෙම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර 2023 වර්ෂයේ දි පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

- ✓ සුරැකුම් සහයක පාඨමාලාව.
- ✓ ව්‍යවසාය කේන්ද්‍රය.
- ✓ විදෙස් ගත වන තරුණ තරුණියින් සඳහා භාෂා පුහුණුව ලබා දීම.

- සුරැකුම් සහයක පාඨමාලාව - විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා මෙම පළාත් සභාව එක්ව ක්‍රියාත්මක කරනු ලබන සුරැකුම් සහයක පාඨමාලාව විජයපුර පළාත් සෞඛ්‍ය සේවා පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වෙන අතර සම්පත්දායකයින් ලෙස සෞඛ්‍ය හා සුභ සාධක ක්ෂේත්‍රවල ප්‍රවීණයන් යොදාගනු ලබයි. මෙහි මෙහෙයවීම් කටයුතු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ඉටුකරනු ලබයි. මෙම පාඨමාලාවේ කාලසීමාව වැඩ කරන දින 45 ක් වන අතර පාඨමාලා ගාස්තු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිර්ණායකයන්ට යටත්ව අයකිරීම සිදු කරනු ලබයි. I වන අදියර යටතේ පුහුණුලාභීන් 99 දෙනෙකු ද, II වන අදියර යටතේ පුහුණුලාභීන් 53 දෙනෙකු ද පුහුණුව ලබා NVQ-3 සහතික පත්‍ර

ලබා ඇත. මෙහි III වන අදියර යටතේ ප්‍රතිලාභීන් 71 දෙනෙක් පුහුණුව ලබා ඇත.

- ව්‍යවසාය කේන්ද්‍රය - (ව්‍යාපාර උපදේශන සේවා නිලධාරීන් පුහුණු කිරීම) මෙම ව්‍යාපෘතියට අදාළ ව්‍යාපාර උපදේශන වැඩසටහන් 02 ක් ප්‍රවාහන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැත් වූ අතර ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් 24 දෙනෙකු පුහුණු වීම් ලැබූහ.
- විදෙස් ගත වන තරුණ තරුණියන් සඳහා භාෂා පුහුණුව ලබා දීම. මේ යටතේ ඉංග්‍රිසි භාෂා පුහුණු වැඩසටහනක් 2023.05.22 වන දින ආරම්භ කළ අතර මෙම පාඨමාලාව 2023.07.25 දින අවසන් විය.මේ සඳහා සිසුන් 25 දෙනෙකු සහභාගී වූ අතර ඔවුන් සඳහා සහතික පත් පිරිනැමීම 2023.7.31වන ගරු ආණ්ඩුකාර තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.මෙම පාඨමාලාව සඳහා සම්පත් දායකත්වය ලබා දුන් ගුරු භවතුන් වෙනුවෙන් ද ප්‍රශංසා ලිපි ප්‍රදානය ද එදිනම සිදු විය.






## කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්

ග්‍රාම සංවර්ධන නිලධාරීන් විසින් 2023 වර්ෂයේදීද කොට්ඨාෂ මට්ටමින් විවිධ වැඩසටහන් සකස් කර තිබුණු අතර, එහිදී දැනට ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුළ පවතින සමිති නිලවරණ කටයුතු පැවැත්වීමට කටයුතු කරන ලදී.බිම් මට්ටමේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා කොට්ඨාශයේ වෙසෙන සම්පත් දායකයින් මෙන්ම වෙනත් ඒ පිළිබඳ හසල දැනුමක් ඇති සම්පත් දායකයින් යොදා ගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබුණි.

ග්‍රාමීය නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා මෙන්ම ඇතැම් ව්‍යවසායකයින් සඳහා හොඳ වෙළඳපොලක් ඇති කිරීමේ අරමුණින් ව්‍යවසායකත්ව අලෙවි පොල පැවැත්වීමට කටයුතු කරන ලදී. එහිදී ඇතැම් නිෂ්පාදන ජාත්‍යන්තර මට්ටමේ වෙළඳපොල කරා රැගෙන යාමේ මහැඟි අවස්ථාවන් ද ඇතැම් කොට්ඨාශවල ව්‍යවසායකයින් අත්පත් කර ගෙන තිබීම ඉතා ප්‍රශංසනීය තත්වයකි.






**සබන් නිෂ්පාදන පුහුණු වැඩසටහන**

සබන් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම එක් අවස්ථාවක් ලෙසට දැක්විය හැකිය. මෙකී වැඩසටහන ඉතා ජනප්‍රිය වැඩසටහනක් වූවා සේම බොහෝ පිරිස් තම කුඩා ව්‍යාපාරයක් ලෙසට ද මෙය සිදු කරන ලදී.



ග්‍රාම සංවර්ධන සමිතිවල නිලවරණ පවත්වා අවසන් කිරීම

## දේශීය ආහාර තුළින් නව දිවියක්

විශේෂයෙන්ම 2023 වර්ෂයේ ආරම්භයත් සනිටුහන් කරමින් 2022 වර්ෂයේ අවසන් භාගයේ නිමකරන ලද දේශීය ආහාර තාක්ෂණික වැඩසටහනට අදාලව පවත්වන ලද ප්‍රදර්ශනය 2023 වර්ෂයේ ජනවාරි මාසයේ පැවැත්වීම නව වසරේ නවමු අත්දැකීම් සමුදායක් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට එක් කිරීමක් වැනිය. ඒ ඔස්සේ යමින් උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් මැතිතුමා සහ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් යුතුව දේශීය ආහාර තුළින් නව දිවියක් යන සංකල්පය ඔස්සේ යමින් වැඩසටහනක ආරම්භය සිදු කරන ලදී. ඔවුන්ගේ ඇතැම් නිෂ්පාදන ඉතා ඉහළ මට්ටමක තිබීම සහ ඇතැම් නිෂ්පාදන සඳහා ඉතා ඉහළ වෙළඳපොලක් නිර්මාණය වීම වැඩසටහනේ සාර්ථකත්වය ප්‍රදර්ශනය වන අවස්ථාවකි.

## ග්‍රාමීය මට්ටමේ කුඩා ව්‍යාපාර හා ගෙවතු වගා නිර්මාණය

ග්‍රාමීය මට්ටමින් කුඩා ව්‍යාපාර බිහිකරලීමටද සමත් වී ඇති සංඛ්‍යාවන් බොහෝය. දැහැමි නිවහන සංකල්පය ඔස්සේ යමින් සරුගෙවත්ත නිර්මාණය කිරීම සඳහා 2021 වර්ෂයේ පැවති ව්‍යාපෘතිය 2023 දක්වා අඛණ්ඩව ඇතැම් කොට්ඨාශවල ක්‍රියාත්මක වීම විශේෂත්වයකි. වස විසෙන් තොරව කාබනික පොහොර යොදා ගනිමින් තම ගෙවතු නිර්මාණය කර ගැනිමට ග්‍රාමීය ප්‍රජාව සමත් වීම ප්‍රශංසනීය කරුණකි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් ලෙසට ලබා දුන් නිර්ණායක ඔස්සේ යමින් වර්තමානයේ දී පවා ඔවුන්ගේ ගෙවතු සාරවත් කරගෙන තිබීම දෙපාර්තමේන්තුවක් ලෙසට අප විසින් ළඟා කර ගත් එක් සංවර්ධන ඉලක්කයක් ලෙසට ද දැක්විය හැකිය. රටේ පැවති උග්‍ර ආර්ථික අර්බුදයට අභියෝග කරමින් ඇතැම් කොට්ඨාශවල සරු ගෙවත්ත සාර්ථකව පවත්වාගෙන යාම සතුටට කරුණක් වන අතර. මෙහි ගෙවතු ඉතා සාර්ථක අන්දමින් සිදු කරමින් පැවතීම තම ආර්ථික තත්ත්වය පමණක් නොව තම පවුල තුල සමඟිය, සතුට, සහජීවනය රැකගැනීමටද ඉවහල්වන විශේෂ කරුණක් සේ සැලකිය හැකිය.



## තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 26ක ක්‍රියාත්මක වන මෙකී තිරසර හා සංවර්ධන හා ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන අතුරින් මධ්‍යස්ථාන 05ක් තෘතීය හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී NVQ LEVEL 04 TAILOR පාඨමාලාව ක්‍රියාත්මක වේ.2023 වර්ෂය සඳහා තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවලට සිසුන් 335 දෙනෙකු බඳවා ගන්නා ලද අතර එයින් 259 දෙනෙකු විභාගය සඳහා ඉල්ලුම් කරන ලදී. එයින් 239 දෙනෙකු විභාගය සඳහා පෙනී සිටින ලද අතර 230 දෙනෙකු විභාගය සමත් වීම විශේෂ කරුණකි. එය ප්‍රතිශතයක් ලෙස 96%කි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස ඉතා දුෂ්කර ප්‍රදේශවල පවත්වනු ලබන මෙකී තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල සිසුන්ගේ පැමිණීම මෙන්ම සමත් වීම ද අගය කළ යුතු දෙයකි.

## පුස්තකාල වැඩසටහන

මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව යාවත්කාලින වූ තවත් එක් ව්‍යාපෘතියක් ලෙසට පුස්තකාල වැඩසටහන දැක්විය හැකිය. පුස්තකාල 50ක් සඳහා 2021 වර්ෂයේ දී ලබා දෙන ලද පොත් 100ක කට්ටලය 2023 වර්ෂය වන විටද යාවත්කාලීන වී තිබීම සහ පුස්තකාල පාඨක සමාජ තුළින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබීම පැසසුමට කරුණකි. බොහෝ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පාඨක සමාජ ඒකරාශී වීමෙන් දැනුම මිනුම තරඟ, චිත්‍ර හා රචනා තරඟ, මෙන්ම විවිධ සමාජීය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වී තිබීම ඉතා ප්‍රශංසනීය කරුණකි. ග්‍රාමීය ප්‍රජාවගේ සංවර්ධනීය කටයුතු උදෙසා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් ලෙසට කාර්යසාධනය යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීමට කටයුතු කිරීම ප්‍රශංසනීය මට්ටමකි.








## ණය විධිමත් කිරීම, ගිණුම් පරීක්ෂාව හා ගිණුම් පුහුණු වැඩසටහන්

ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ හදවත වනුයේ ග්‍රාම සංවර්ධන සමිති අරමුදලයි. එය යාවත්කාලීන කිරීමට ග්‍රාම සංවර්ධන නිලධාරීන් මෙන්ම ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගේද නොමසුරු දායකත්වය ලබා දීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන්ම R -18 ගිණුම් ක්‍රමය හඳුන්වා දීමත් සමඟම එතෙක් විවිධ අයුරින් විවිධ ලේඛනවල සකස් කරන ලද අතර එය එකම ලේඛනයකට ගෙන පහසු ආකාරයෙන් සකස් කර ගන්නා ආකාරය පුහුණු වැඩසටහන් මඟින් උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී. ඒ කෙසේ වුවද සමිතිවල පවත්නා ගිණුම් සම්බන්ධයෙන් නිරන්තර අවදානයෙන් කටයුතු කිරීම ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ

ප්‍රධානතම වගකීම් වේ. ඒ අනුව සමිති ගිණුම් පරීක්ෂාව ඔවුන්ගේ නිරන්තර අධීක්ෂණය යටතේ සිදු වන්නකි.










### ග්‍රාමීය නිෂ්පාදන ව්‍යවසායකත්ව අලෙවි පොළ පැවැත්වීම







### මැහුම් නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම

මැහුම් පාඨමාලාව අවසන් කරන ලද ආධුනික සිසුන්ගේ නිර්මාණ කළ එළි දැක්වීම සිදු කරන ලද අතර එය ඔවුන් අනාගත අභිවෘද්ධිය පිණිස හේතු වනවා සේම නව ව්‍යවසායකයින් බිහිකරවීමට ද හේතුවක් වනු ඇත.






### දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- මැහුම් මධ්‍යස්ථාන සිසුන් සඳහා **Online Business** (මාර්ගගත ව්‍යාපාර) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- ගැටුම් නිරාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- බුලත් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් කුඩා ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන
- ළමා සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීම
- කෘෂි ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන ව්‍යවසායකයින් සඳහා **6.5%** පොළි අනුපාතය යටතේ ණය ලබාදීමේ වැඩසටහන දැනුවත් කිරීම (රජරට සංවර්ධන බැංකුව)

- මීරිගම ග්‍රාම සමිතියට ප්‍රජා විශෝධණය හා සමතකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම
- වනිතා සංවර්ධන නිලධාරිතුමිය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා හිංසනය පිළිබඳ දැනුවත් කිරීම
- දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරි විසින් නිරෝගි දිවියකට මඟ පිළිබඳ දැනුවත් කිරීම
- ලීෂ්මනයිසිස් රෝග ව්‍යාප්තිය වලක්වා ගැනීමේ අරමුණින් දුෂ්කර ගම්මානවල ප්‍රජාව දැනුවත් කිරීම.
- කුඩා ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- ළමා අපචාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- මැහුම් පාඨමාලා සිසුන් සඳහා පිරිවැයකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- බිම්මල් වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- සංවර්ධන නිලධාරීන් සඳහා **HR Auditing** සහ **Social Auditing** පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු කිරීම.

## අපේක්ෂිත අරමුණු හා ඉලක්ක.

තෝරා ගන්නා ලද කොට්ඨාශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම,තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම,ලීෂ්මනයිසිස් රෝගය මෙන්ම සර්ප දෂ්ඨන හා අනතුරු සඳහා ප්‍රථමාධාර ලබාදීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම,ජල පිරිපහදු පද්ධති ස්ථාපිත කිරීම (RO පද්ධති),දේශීය ආහාර පුරුදු සහ ග්‍රාමීය සංස්කෘතික අංග සුරක්ෂිත කිරීම සඳහා තෝරාගත් කොට්ඨාසවල ගම්දොර අභියස වැඩසටහන ක්‍රියාත්මක කිරීම,තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල පුහුණුවන්නන්ට අවශ්‍ය රෙදිපිළි සහ අමුද්‍රව්‍ය සැපයීම,දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම

➢ මෙහිදී තෝරා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම යටතේ තෝරා ගන්නා ලද ගම්මානවල මාර්ග සංවර්ධනය, (පළාත් සභාවෙන් සහ ප්‍රාදේශිය සභාව මගින් නඩත්තු නොවන ) ප්‍රජා ශාලා ප්‍රතිසංස්කරණය කිරීම, කෘෂි මාර්ග අළුත්වැඩියා කිරීම, බෝක්කු අළුත්වැඩියා කිරීම සිදු කිරිමට අපේක්ෂා කෙරේ.

➢ වර්තමානයේ දී උතුරු මැද පළාත තුළ දක්නට ලැබෙන ගැටළු අතුරින් ස්වභාවිකව සිදු වන විපත් ප්‍රමුඛව පෙනෙන්නට තිබෙන්නකි. බොහෝ විට මෙකී ගැටළු සඳහා තාවකාලික ක්‍රමෝපායන් භාවිතා කෙරේ. මේ සම්බන්ධයෙන් යම්තාක් දුරකට හෝ විසඳුමක් ලබා දීමේ අරමුණින් යුතුව ආරම්භ කිරීමට යෝජිතව තිබූ ස්වභාවික විපත් අඩු කර ගැනිම සඳහා කටයුතු කිරීමේ ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. මෙහි දී මෑත කාලයේ දී ව්‍යසනයක්ව පවතින ලිෂ්මනයිසිස් රෝගය වළක්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම , සර්ප දෂ්ඨනය සඳහා ප්‍රථමාධාර , ස්වභාවික විපත්වලින් සිදුවන බලපෑම අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදිය දැක්විය හැකිය.

➢ ලංකාව තුළ වකුගඩු රෝගය ව්‍යාප්ත වීමේ ප්‍රතිශතයේ වැඩි වීමක් දක්නට ලැබේ. පිරිසිදු ජලය භාවිතා නොකිරීම මෙයට ප්‍රධානතම හේතුව වේ. උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මෙකී තත්වය

බහුලව දක්නට ලැබෙන්නකි. මෙකී කරුණු සැලකිල්ලට භාජනය කරමින් පිරිසිදු ජලය ලබා දීමේ අරමුණින් යුතුව ජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරිමට යෝජිතව ඇත. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02ක ජල පිරිපහදු පද්ධති ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

- දේශිය ආහාර පුරුදු සහ ග්‍රාමීය සංස්කෘතික අංග සුරක්ෂිත කිරිම සඳහා තෝරා ගත් කොට්ඨාශවල ගම්දොර අභියස වැඩසටහන පැවැත්වීමට අපේක්ෂා කෙරේ. ගමක පෝෂණය හා සෞඛ්‍ය පදනම් කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් දේශිය සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂිතය. වස විසෙන් තොරව දේශීය ආහාර රටාවකට හුරු කරවීමේ අදිටනින් යුතුව ආරම්භ කිරිමට අපේක්ෂිත මෙකී වැඩසටහන් සියල්ලක්ම සමීප කරනුයේ ග්‍රාමීය ප්‍රජාව තුළටය.
- මත් උවදුරෙන් පළාතේ ග්‍රාමීය ප්‍රජාව මුදවා ගැනීමේ අරමුණින් 2023 වර්ෂයේ දී ද ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ මෙකී වැඩසටහන සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසාවෙන් 2024 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණ පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දිළිඳු පවුල් පුනරුත්ථාපනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තෝරා ගත් එක් ගමක් විශේෂ ව්‍යාපෘති වැඩසටහනකින් මතින් තොර ගමක් බවට පත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබේ.
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතුරින් තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල පවත්වා ගෙන යනු ලබන සය මාසික මැහුම් පාඨමාලාව සුවිශේෂී වේ. ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලබන මෙකී වැඩසටහන සඳහා සහභාගි වන්නේ අඩු ආදායම්ලාභී සිසුන් වීමම විශේෂත්වයකි. මොවුන් සඳහා පාඨමාලාව සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කර කාර්යක් වී ඇති අතර 2024 වර්ෂයේ ප්‍රතිපාදන මත අමුද්‍රව්‍ය ලබා දීමට යෝජිතව ඇත
- එමෙන්ම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල සිසුන්ගේ කුසලතා එළි දැක්වීම සඳහා නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
- 2024 වර්ෂයේ දි ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් ලෙසට ග්‍රාමීය ප්‍රජාව තුළට සමීප කිරීමට අපේක්ෂා කරන ලද ඉහත සංවර්ධන ව්‍යාපෘතීන් සියල්ලක්ම මුදල් ප්‍රතිපාදන සීමා කිරීම නිසාවෙන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීමට සිදුව ඇති බව කිව යුතු කරුණකි වේ. තවද දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් සහ සමිති නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම ද සිදු කිරීමට අපේක්ෂිතය.

එමෙන්ම පළාත් සභා සංවර්ධන ප්‍රදාන (PCDG) යටතේ රු.මි.05ක ප්‍රතිපාදන සීමාව යටතේ දෙපාර්තමේන්තුව සඳහා කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ මිලදී ගැනීම සහ කාර්යාල ගොඩනැඟිලි පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.12 සෞඛ්‍ය සේවා

Health Service



මධ්‍යම රජයට සමගාමීව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීම මත පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව එක්ව, පළාතේ සියළු රෝහල් සඳහා පහසුකම් සැපයිම කළමනාකරණය, අධීක්ෂණය හා සම්බන්ධීකරණය සිදුකරන ලදී.

පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 2ක් (අනුරාධපුර/පොළොන්නරුව), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 30ක්, මූලික රෝහල් 9ක්, ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය ) 1ක්, බී ශ්‍රේණිය 12ක් හා සී ශ්‍රේණිය 28ක්, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක 38ක්, ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන 2ක්, ක්ෂය රෝග හා ස්වසන රෝග මර්ධන මධ්‍යස්ථාන 2ක්, වාහන සේවා මධ්‍යස්ථාන 1ක් හා සෞඛ්‍ය පුහුනු මධ්‍යස්ථාන 1ක් වශයෙන් ආයතන 127කින් සේවා සැපයීම සිදුකරනු ලබන අතර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලට අයත් රෝහල් 9ක්, මධ්‍යම බෙහෙත් ශාලා 30ක්, ආයුර්වේද මධ්‍යස්ථාන 6ක් හා ඖෂධ නිෂ්පාදනාගාරයක් පවතී. පළාත් ආයුර්වේද කොමසාරිස් ප්‍රමුඛ සේවක මණ්ඩලය 475 කි.

## 2.12.1 සෞඛ්‍ය සේවා සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සභා පළාත් සභා විෂය පථය තුල උතුරු මැද පළාතේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගැනීම සඳහා, රු.මි 8729.17 වූ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර, එම ප්‍රතිපාදන ප්‍රමාණය රෝහල් සේවාවන්,මහජන සෞඛ්‍ය සේවාවන්, පොදු සෞඛ්‍ය සේවාවන් සඳහා මෙන්ම දේශීය වෛද්‍ය සේවාවන් සඳහා ලෙස විවිධ විෂය කාණ්ඩයන් යටතේ වෙන් කරන ලදී.

එහිදී රෝහල් සේවාවන් සඳහා රු.මි. 5,772.95 ක ප්‍රතිපාදනයනක්ද, මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා රු.මි. 1,650.27 ක්ද, පොදු සෞඛ්‍ය සේවාවන් රු.මිලියන 691.22 ක්ද මෙන්ම දේශීය වෛද්‍ය සේවාවන් සඳහා රු.මි. 614.73 ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, සමස්ථයක් ලෙස රු.මි. 1,819.28 ක ප්‍රතිපාදනයක් මූලධන වියදම් සඳහා ද, රු.මි. 6,909.90 පුනරාවර්තන වියදම් සඳහාද වේ.

උතුරු මැද පළාත් සභා අය වැය තුල වෙන්වන දෙවන වැඩිම ප්රතිපාදන ප්‍රමාණය සෞඛ්‍ය සේවා සඳහා වෙන් කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුල වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 2022 වර්ෂය තුල වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මි. 7,742.18 සමඟ සැසඳීමේදී රු.මි. 986.99 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ.

2023 වර්ෂය තුල සෞඛ්‍ය සේවා සඳහා වූ සමස්ථ සත්‍ය වියදම රු.මි. 8,258.95 වන අතර, එය රු.මි. 1,387.52 වන මූලධන වියදමකින් හා රු.මි. 6,871.42 වූ පුනරාවර්තන වියදමකින් සමන්විත වේ. එහිදී රෝහල් සේවාවන් සඳහා රු.මි. 5,489.49 ක වියදමක් ද, මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා රු.මි 1,585.45 ක වියදමක්ද , පොදු සෞඛ්‍ය සේවාවන් සඳහා වූ රු.මි. 626.43 ක වියදමක්ද , දේශීය වෛද්‍ය සේවාවන් සඳහා රු.මි. 557.58 වූ වියදමක්ද මේ තුල අන්තර්ගත වන අතර, පෙර වර්ෂය සමඟ මෙම වියදම සැදීමේදී එය රු.මි. 836.53 ක් ඉහළ යාමක් පෙන්නුම් කෙරේ.






## 2.12.2 සෞඛ්‍ය සේවා සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

නීරෝගිමත් ජනතාවක් සමෘධිමත් පළාතක් යන දැක්ම මුල් කරගත් උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මඟින් මහජනතාවට වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බොගස්වැව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ආරම්භ කිරීම හා සිංහපුර ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය නැවත ස්ථානගත කර ආරම්භ කිරීම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාමල්පුර ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ආරම්භ කිරීම සහ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන කිහිපයක් අළුතෙන් ආරම්භ කිරීම සිදු කර ඇත.

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ ඒකකය මඟින් සෞඛ්‍ය සේවා පද්ධතිය ඩිජිටල් කරණය සිදු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒ යටතේ උතුරු මැද පළාතේ රෝහල් වල සෞඛ්‍ය තොරතුරු කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 233ක් සාර්ථකව ක්‍රියාත්මක සිදු කළ අතර ඒ යටතේ ගොඩනැගිලි පුනරුත්තාපනය, ගොඩනැගිලි අළුත් වැඩියා කටයුතු විදුලි සැපයුම් පද්ධති වැඩිදියුණු කිරීම, රෝහල් මායිම් නිරවුල් කිරීම, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ලබාදීම, නිල නිවාස ඉදි කිරීම්,ජල සැපයුම් සහසුකම් සංවර්ධනය, සන්නිවේදන පහසුකම් වැඩිදියුණු කිරීම්, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල ඉදිකිරීම්, සායන මධ්‍යස්ථාන ඉදි කිරීම්, නිලධාරීන්ගේ දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධන කටයුතු, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම්,ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම් සිදුකර ඇත.

පළාත් සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය මගින් මහජනතාවට වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා මානව සම්පත් සංවර්ධනය යටතේ මහජන සෞඛ්‍ය හෙද සේවාව සඳහා නිලධාරීන් 244ක් පුහුණු කර ඇති අතර, මුරකරුවන් 74ක් පුහුණු කරන ලදි.

සුව සබුද්ධික දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මඟින් සෑම සිකුරාදාවක්ම Learning Day ලෙස නම් කර පැය 2ක දේශනයක් Zoom තාක්ෂණය මඟින් පවත්වාගෙන යන ලදි.

පළාත් සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය හා විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සුරැකුම් සහයක පුහුණු වැඩසටහන ආරම්භ කර පවත්වාගෙන ගිය අතර එමඟින් 123 දෙනෙකු පුහුණු කර සහතික පත් ප්‍රදානය කර ඇත.



## දේශීය වෛද්‍ය සේවය

"සෞභ්‍ය දහමට අනුකූල වූ නිරෝගිමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්" ගොඩනැංවීමට ක්‍රියාත්මක වනු ලබන දේශීය වෛද්‍ය සේවයට අදාළව 2023 වසරේ සියළු සංවර්ධන ව්‍යාපෘති වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ලබාගැනීමට හා ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති තුළින් ද ආයතනයේ ඵලදායීතාව ඉහල ගොස් ඇති බව දක්නට ලැබුණි. එහිදී,පළාත් ආයුර්වේද රෝහලේ ගෙවන වාට්ටුව අළුත්වැඩියා කිරීම, අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරයේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම, ගල්නෑව ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලාව වටා වැටක් ඉදි කිරීම, මින්නේරිය මූලික ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය අළුත්වැඩියා කිරීම,තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහලේ වාට්ටු අංක 01 ආශ්‍රිතව අපද්‍රව්‍ය ගලා යන පද්ධතිය අළුත්වැඩියා කිරීම, කැකිරාව ඔළුකරඳ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම, තෙල්හිරියාව පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම, තෙල්හිරියාව පළාත් ඖෂධ නිෂ්පාදනගාරය ආසන්නයේ ඇති නඳුන් උයන ඔසු උයන වටා වැටක් ඉදි කර ගැනීම, සිරිපුර ග්‍රාමීය ආයුර්වේද රෝහලේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම,අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම,මින්නේරිය රෝහලේ මුළුතැන්ගෙයි වහලය අළුත්වැඩියා කිරිම,2023 වසරේදී රුපියල් මිලියන 12 ක පමණ රෝහල් හා වෛද්‍ය උපකරණ මිලදීගැනීම වැනි කාර්යයන් ඉටු කර ගැනීමට හැකි විය. තවද මින්නේරිය පංචකර්ම මධ්‍යස්ථානයේ විදේශිකයන් හා දේශීය ජනතාවගේ ප්‍රතිකාර සඳහා විවෘත කිරීමෙන් රාජ්‍ය ආදායම් සඳහා යම් දායකත්වයක් සැපයීමට හැකි වීමත්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් විසින් පළාත තුල බෝ වන හා බෝ නොවන රෝග නිවාරණය සඳහා වැඩසටහන් රාශියක් පැවැත්වීමට කටයුතු කිරීමත් දැක්විය හැකිය . එමෙන්ම උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝගී සත්කාර සේවයත්, ප්‍රජා සෞඛ්‍ය සේවයේත් සංඛ්‍යාලේඛන හා කාර්ය සාධන දර්ශක අගයන් තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ ලබාගැනීමට වෙබ් අඩවිය හරහා දත්ත එකතු කිරීමේ ක්‍රමවේදයක් නැතහොත් වැඩසටහනක් 2022 වසර තුර ආරම්භ කිරීමට අප හට හැකියාව ලැබුණි. එය 2023 වසරේදීද උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගනිමින් වෙනත් පළාත්වලට වඩා ඉක්මන් හා පහසු සංඛ්‍යාලේඛන ඇගයුම් ක්‍රියාවලියක් තිබීම අප සතු ශක්තියක් ලෙස සැලකිය හැක. 2022 වසර හා සංසංධනාත්මකව සලකා බැලීමේදී 2023 වසරේදී බාහිර අංශයේ මෙන්ම නේවාසික රෝගීන්ගේද විශාල වර්ධනයක් දක්නට ලැබේ.රෝහල් වල මෙන්ම මධ්‍යම බෙහෙත් ශාලා වලද මෙම වර්ධනය එකසේම දක්නට ලැබේ. සියලු රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා වල සමස්ථ කාර්ය මණ්ඩලයේ මෙන්ම අප ආයතනයේ සියලුම සේවක ප්‍රජාවගේ කාර්යක්ෂම ශ්‍රම දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙස මෙම වර්ධනය ළඟා කර ගත හැකි විය.

කොවිඩ් - 19 වසංගතයත් සමඟ ශ්‍රී ලංකීය සමාජය තුල ආයුර්වේද හා දේශීය ප්‍රතිකාර

ක්‍රමයන් පිළිබඳ ජනතාවගේ දැඩි අවධානයක් හා කැමැත්තක් වර්ධනය වී ඇති බව අපගේ බාහිරාංශ රෝගී සංඛ්‍යාලේඛන විශ්ලේෂණයේ දී හඳුනාගත හැකිවිය. එමෙන්ම ආර්ථික අර්බුදය හේතුවෙන් බටහිර ඖෂධ වල හිඟයත්, අධික මිලත් හේතුවෙන් ආයුර්වේද ප්‍රතිකාර සඳහා ජනතාවගේ වැඩි නැඹුරුවක් දක්නට ලැබුණි. මෙම සාමාජීය හා ආර්ථික තත්ත්වය අප ආයතනයට ලැබුණු සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි වන අතර, කාර්යය මණ්ඩල නිලධාරීන්ගෙන් බහුතරයක් මෙම පළාතේ ස්ථිර පදිංචිකරුවන් නොවන බැවින් ආර්ථික අර්බුදයත් සමග ඇතිවූ ඉන්ධන අර්බුදය නිසා සේවය වාර්ථා කිරීමත්, ජංගම සේවාවන්, සායන හා ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමත් වැනි කටයුතු කැපවීමකින් යුතුව උපරිම ප්‍රයෝජන ලබාගැනීමේ ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වීම දුර්වලතාවක් ලෙස දැක්විය හැකිය.



මින්නේරිය පංචකර්ම මධ්‍යස්ථානය



Web URL -



රෝග නිවාරණ වැඩ සටහන්

## ආයතනය විසින් මුහුණ දීමට සිදුවූ අභියෝග

රෝහල් වැඩි දියුණු කළද ඒවායේ සේවක සංඛ්‍යාව ඉහළ නංවා නොමැති අතර,හඳුනාගත් කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව අවධානය යොමු කල යුතුවේ. 2022 හා 2023 වර්ෂ වලදී රටේ පැවති මූල්‍ය අර්බුදය හමුවේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම, උපකරණ ආනයනය සීමා කිරීම හේතුවෙන් රෝගී සත්කාරක සේවා කටයුතු වලට බාධාවීම් සිදු වීම, උතුරු මැද පළාත් සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය වෙත පුහුණුලාභීන් ප්‍රවාහනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම හා මෙම කණ්ඩායම් සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා ආදිය සිදු කිරීමටද විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. නව පත්වීම් ලද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් හට ක්ෂේත්‍ර රාජකාරි සිදුකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක අවශ්‍යතාවය හා වාහන වැඩි ප්‍රමාණයක් අළුත්වැඩියා කටයුතු සඳහා යෙදවීම වැනි කරුණු අඛණ්ඩ සේවා සැපයීම් හා අධීක්ෂණ කටයුතු සඳහා බලපානු ලැබේ.

## ආයතනය විසින් ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු

මාතෘ පෝෂණ තත්වය වැඩිදියුණු කිරීමට ප්‍රමුඛතාවය ලබාදෙමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයන්හි ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම,සෞඛ්‍ය තොරතුරු කළමණාකරන ඒකකය මගින්,විවිධ තොරතුරු අවශ්‍යතා සඳහා සෞඛ්‍ය ආයතනවල හා රෝහල්වල සෞඛ්‍ය තොරතුරු කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු සැළසුම් කිරීම,සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,පළාත් සෞඛ්‍ය වෙබ් අඩවිය නිර්මාණය යාවත්කාලීන කර පවත්වා ගැනීම,පළාත් සෞඛ්‍ය කාර්යාල සඳහා ලේඛණ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කිරීමට අපේක්ෂිතය. පළාත වෙත ලබාදෙන ප්‍රතිපාදන මගින් වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම හා ඒ තුලින් පළාත තුළ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම,පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය මගින් උතුරු මැද පළාත තුළ සෞඛ්‍ය ආයතන වල කසල කළමනාකරණ කටයුතු විධිමත් පරිදි පවත්වා ගැනීම සඳහා වැඩසටහන් පැවැත්වීම හා ඉදිරි වසරේදී සියළු රෝහල් සඳහා පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කිරීම මෙන්ම වාර්ෂික පුහුණු සැලැස්මේ අන්තර්ගත පුහුණු වැඩසටහන් වලට අමතරව උතුරු මැද පළාත් සභාව හා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම වැනි කාර්යයන් ඉටු කිරීමට සැළසුම් කර ඇත. තවද අමාත්‍යාංශය මගින් සායනික අපද්‍රව්‍ය , ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය අවම කිරීම හා කළමනාකරණය හා ශක්තිමත් කිරීම සඳහා අන්තර් පාර්ශවීය සහයෝගය ලබා දීම,අප ජලය ජල මූලාශ්‍ර වෙත එකතුවීම පාලනය කිරීම සඳහා ප්‍රජාව බල ගැන්වීම,දැනට වැඩ ආරම්භ කර ඇති මින්නේරිය ආයුර්වේද පංච කර්ම මධ්‍යස්ථානය දෙස් විදෙස් සංචාරකයන්ට ආකර්ශනය දිනා ගැනීම සඳහා යෝජනා හා නිර්දේශයන් ලබා ගැනීමට පත් කර ඇති කමිටුවේ යෝජනා අනුව ඉදිරියේදී මෙය ආදායම් උත්පාදක ව්‍යාපෘති වශයෙන් දියුණු කිරීම, මන්ද පෝෂණය අවම කිරීම සඳහා දියත් කර ඇති පෝෂණ සැලැස්ම වඩා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් පාර්ශවීය සහයෝගය ලබා ගැනීම සහ දෙපාර්තමේන්තුමය මැදිහත්වීම ඉහළ නැන්වීම වැනි කාරණා අරමුණු කෙරේ.






## 2.13 අධ්‍යාපන සේවා

**Education Service**



2023 වර්ෂයේදී පළාත් සභාව විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ හැකි විය. උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් ඒ යටතේ ක්‍රියාත්මක කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල මෙන්ම සමස්ථ පාසල් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය මඟින් ගුණාත්මක අධ්‍යාපනයක් කරා උතුරු මැද පළාත ගෙනයාම මුඛ්‍ය පරමාර්ථය විය.

මෙලෙස පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත උතුරු මැද පළාත අධ්‍යාපන කලාප 08 කින් යුක්ත වේ. මින් කලාප 05 අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් අතර අධ්‍යාපන කලාප 03 පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වේ.








## 2.13.1 අධ්‍යාපන සේවාවයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සහා පළාත් සභා විෂය පථය තුල උතුරු මැද පළාතේ දරුවන්ගේ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ඉහළ නංවාලීම සඳහා වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 17,466.13 කි. එම සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය,

- ප්‍රාථමික අධ්‍යාපනය,
- ද්විතීයික අධ්‍යාපනය
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්ව දියණු කිරීම
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා යන විෂය කාණ්ඩයන් යටතේ වෙන් කර ලබා දෙන ලදී.




- 2023 වර්ෂයේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 6,794.10 ද, මුලධන වියදම් සඳහා රු.මි. 104,88 ද වශයෙන් රු.මි. 6,898.98 වු සමස්ථ ප්‍රතිපාදන වෙන්කරන ලදී. 2023 වර්යේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වු සමස්ථ සත්‍ය වියදම රු.මි. 6,283.46 වන අතර, එය රු.මි 96,37 වු මූලධන වියදමකින්ද, රු.මිලියන 6,187.08 වු පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.
- 2023 වර්ෂයේ ද්විතීයික අධ්‍යාපනය සඳහා පුනරාවර්තන වියදම රු.මි.

9,757.90 ද, මූලධන වියදම රු.මි. 593.04 ද ලෙස රු.මි. 10,350.94 ක සමස්ථ ප්‍රතිපාදන වෙන්කරන ලදී. 2023 වර්ෂයේ ද්විතියික අධ්‍යාපනය සඳහා වූ සමස්ථවියදම රු.මි. 10,068.76 වන අතර, එය රු.මි. 404.33 වූ මූලධන වියදමකින්ද, රු.මි. 9,664.43 වූ පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.

- 2023 වර්ෂයේ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම වෙනුවෙන් පුනරාවර්තන වියදම් රු.මි. 48.06 ද, මූලධන වියදම් සඳහා රු.මි. 13.50 ද ලෙස සමස්ථ ප්‍රතිපාදන රු.මි. 61.56 වෙන්කරන ලදී. 2023 වර්ෂයේ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම සඳහා වූ සමස්ථ වියදම රු.මි. 61.56 වන අතර, එය රු.මි. 11.07 වූ මූලධන වියදමකින්ද, රු.මි. 44.80 වූ පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.
- 2023 වර්ෂයේ අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා වෙනුවෙන් පුනරාවර්තන වියදම් රු.මි. 103.33 ද, මූලධන වියදම් සඳහා රු.මි. 51.30 ද ලෙස සමස්ථ ප්‍රතිපාදන රු.මි. 154.63 වෙන්කරන ලදී. 2023 වර්ෂයේ අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා සඳහා වූ සමස්ථ සත්‍ය වියදම රු.මි. 89.18 වන අතර,එය රු.මි. 3.03 වූ මූලධන වියදමකින්ද, රු.මි. 86.15 වූ පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.

උතුරු මැද පළාත්සභා අය වැය තුල වෙන්වන වැඩිම වියදම් ප්‍රමාණය වෙන් කරනු ලබන්නේ අධ්‍යාපන සේවාව සඳහා වන අතර, 2023 වර්ෂයේ සමස්ථ වියදමෙන් 34% ප්‍රමාණය මේ සඳහා වෙන් කර ඇත.




සමාලෝචිත වර්ෂය තුල අධ්‍යාපන සේවා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 17,466.13 ක් වන අතර, එය 2022 වර්ෂය තුල වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මි.

15,797.79 සමඟ සැසඳීමේදී රු.මි. 1,668.34 ක ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. සමස්ථ සත්‍ය වියදමද පෙර වර්ෂය සමඟ සැසඳීමේදී රු.මි. 1,006.77 ක ඉහළ වාර්තා කරයි.







## 2.12.2 අධ්‍යාපන සේවාවට අදාල භෞතික ප්‍රගතිය

2023 වර්ෂය සූදානම් සහිතව, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ ගෝලීය තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම අභිප්‍රාය කොට ගෙන සාර්ථක ආරම්භයක් ඇති කළද, 2022 වර්ෂයේ පැවැති පශ්චාත් වසංගත තත්ත්වය හේතු කොට ඇතිකල බලපෑම් තුලින් මෙම වර්ෂය කෙරෙහිද ඇතිකළ අහිතකර ප්‍රතිඵලයක් වූයේ පාසල් අධ්‍යයන වාර දීර්ඝ වීමයි. මේ හේතු කොට අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග දෙකක් එකම වසර තුල පැවැත්වීම අභියෝගාත්මක තත්ත්වයක් ඇති කරන ලදී. එබැවින් ද්විතියික අධ්‍යාපනය ලබන සිසු දරුවන් වෙත මෙම තත්වය තරමක් දුරට අවාසි සහගත බලපෑම් එල්ල කරනු ලැබුවේ වසර තුල පැවති නිවාඩු දිනයන්ද ක්‍රියාත්මක වීමේදී ඔවුන් ගේ අධ්‍යයන කාල සීමා අඩු වීම වැනි තත්ත්වයන් උද්ගතවූ බැවිනි. මෙම තත්ත්වයන් 2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතියේ ඌණ සාධනය කෙරෙහිද බලපෑම් එල්ල කරන ලදි.

එසේ නමුදු ප්‍රාථමික අධ්‍යාපන අංශය තුල යම් කැපී පෙනෙන වර්ධනයක් ඇතිකරවීමට මෙම වසර තුල හැකියාව ලැබිණ. ඒ අනුව මෙවර පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව සමාජය තුල යම් කතිකාවක් ඇති කළද පළාත තුළ ඉහළ ප්‍රතිඵල පෙන්නුම් කිරීම කැපීපෙනෙන ලක්ෂණයක් විය. තවද මෙවර ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල අනුව වාර්ෂික ඉලක්කය සපුරා ගැනීමේ කාර්යය සාධනය 96% කි.

2022 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල අනුව ගණිතය විෂයය සමත් ප්‍රතිශතය 68.5%කි. එම ඉලක්කය සාධනය කර ගැනීම 100% කින් සපුරා ගැනීමට නොහැකි වුවද, 2022 වර්ෂයට සාපේක්ෂව 1% ක වර්ධනයක් අත්පත්කර ගෙන ඇත. මෙම ජයග්‍රහණ ලබා ගැනීම සඳහා කලාප හා පළාත් ඒකාබද්ධව සැලසුම් කළ ක්‍රියාකාරකම් ඒ අයුරින්ම සිදුකළ නොහැකි වූ නමුත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

උසස් පෙළ විද්‍යා විෂයය ධාරාව හා තාක්ෂණවේදය විෂයයධාරාව සහභාගිත්ව අනුපාතය උතුරු මැද පළාත තුළ 24% ක අගයක් ගනී. ඉලක්කය සාධනය කර ගැනීම 75% කි. මෙම අංශයේ කාර්ය සාධනය අත්පත් කර ගැනීම සඳහා , විද්‍යාව , ගණිතය, තොරතුරු තාක්ෂණය විෂයය ඉලක්ක කරගත් ගුරු/ සිසු වැඩසටහන්, අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන්, උසස් පෙළ විද්‍යාව විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/ සිසු වැඩසටහන්, උසස් පෙළ තාක්ෂණවේදය විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු / සිසු වැඩසටහන් 2023 වර්ෂය සඳහා හඳුනාගෙන තිබිණි. ඒ යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම්, පැවැති තත්ත්වය යටතේ ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි වුවත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

එසේම වසර තුළ පැවති විවිධ විෂය සමගාමී තරඟ සඳහා සහභාගී වීම තුලින් සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීමට පළාතේ දරුවන් සමත් විය. එමෙන්ම පළාතේ ගුරුවරුන්ගේ ගැටළුවක්ව පැවති, සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් පැවති ගැටළුව නිරාකරණය කර ගනිමින් සේවය ස්ථිර නොකළ ගුරුවරුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර ඇති අතර සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් පැවති විගණන විමසුම් අවසන් කර ගැනීමට හැකි විය. 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ගුරුවරුන්ගේ උසස්වීම් සම්බන්ධයෙන් පැවති ගැටළු නිරාකරණය කරගනිමින් ඒවා අවසන් කරන ලද අතර මෙම ක්‍රියාදාමය තුල ආයතන අංශය වෙත ලැබෙන විගණන විමසුම් අවම කර ගැනීමට හැකියාව ලැබිණි. 2023 වර්ෂය තුල ලැබුණු අත්දැකීම් උපයෝගී කරගෙන 2024 වර්ෂය තුල කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ ඒකායන අරමුණ වේ.



## අ.පො.ස සාමාන්‍යපෙළ ප්‍රතිඵල විශ්ලේශණය 2022 (2023)සියලුම විෂයන් සඳහා "A" සාමාර්ථ ලැබූ සිසුන් ප්‍රමාණය කලාප අනුව පෙලගැස්ම

| අනු | කලාපය | පෙනී සිටි | | | A9 | | | A9 % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී % | පුරුෂ% | එකතුව % |
| 1 | අනුරාධපුර | 2506 | 2512 | 5018 | 81 | 68 | 149 | 3.23 | 2.71 | 2.97 |
| 2 | දිඹුලාගල | 915 | 855 | 1770 | 5 | 3 | 8 | 0.55 | 0.35 | 0.45 |
| 3 | ගලෙන්බිඳුනුවැව | 923 | 845 | 1768 | 9 | 3 | 12 | 0.98 | 0.36 | 0.68 |
| 4 | හිඟුරක්ගොඩ | 1370 | 1443 | 2813 | 22 | 8 | 30 | 1.61 | 0.55 | 1.07 |
| 5 | කැබිතිගොල්ලෑව | 1134 | 1116 | 2250 | 19 | 5 | 24 | 1.68 | 0.45 | 1.07 |
| 6 | කැකිරාව | 1467 | 1450 | 2917 | 30 | 9 | 39 | 2.04 | 0.62 | 1.34 |
| 7 | පොළොන්නරුව | 1040 | 1033 | 2073 | 33 | 30 | 63 | 3.17 | 2.90 | 3.04 |
| 8 | තඹුත්තේගම | 1364 | 1320 | 2684 | 16 | 3 | 19 | 1.17 | 0.23 | 0.71 |
| උතුරු මැද පළාත | | 10719 | 10574 | 21293 | 215 | 129 | 344 | 2.01 | 1.22 | 1.62 |

## සමාලෝචිත වර්ෂය තුල සපුරාගන්නා ලද ඉලක්කයන්

| කාර්යය සාධන ඉලක්කය | 2023 සඳහා ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|
| ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100ට වැඩි ප්‍රතිශතය ඉහළ නැංවීම | 75% | 61% |
| අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය | 75% | 75.12% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 92% | 90.33% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් විද්‍යාව විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 67% | 64.03% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රිසි විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 100% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ගණිතය විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 70% | 68.47% |
| අ.පො.ස.(උසස් පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 68% | 63.30% |
| අ.පො.ස.(උ/පෙළ)විද්‍යාව හා තාක්ෂණවේදය විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීම | 35% | 32% |
| අ.පො.ස.(උ/පෙළ)වාණිජ විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීම | 35% | 17% |
| අ.පො.ස.(උ/පෙළ)කලා විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය අඩු කිරීම | 35% | 51% |
| අ.පො.ස.උසස් පෙළ ජීව විද්‍යා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 45% | 42.45% |
| අ.පො.ස.උසස් පෙළ භෞතිය විද්‍යා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 45% | 52.64% |
| අ.පො.ස.උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 55.85% |
| අ.පො.ස.උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 65.65% |
| අ.පො.ස.උසස් වාණිජ විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 70% | 71.15% |
| අ.පො.ස.උසස් පෙළ කලා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 75% | 70.59% |

*** අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා අ.පො.ස.(සා.පෙළ) 2022(2023) ප්‍රතිඵල විශ්ලේෂණ සලකා ඇත.

**** අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සඳහා අ.පො.ස.(උ.පෙළ) 2022(2023) ප්‍රතිඵල විශ්ලේෂණ සලකා ඇත.

## ඉලක්ක සපුරාගැනීමේ දී ඇති වූ අභියෝග

ගෝලීය වසංගත තත්වයේ පසු බලපෑම් හමුවේ පාසල් දීර්ඝ කාලයක් වසා තැබීම නිසා දරුවන්ගේ ඉගෙනුම් ඵල සාක්ෂාත් කර ගැනිම අභියෝගයට ලක් විම,රටතුල උද්ගතවූ ආර්ථික අර්බුදය හමුවේ සිදුවූ අධික වැය සහ මිල විචලන තත්වයන්,ප්‍රායෝගිකව ක්‍රියාකාරකම් පාදකව සංකල්ප සාධනය කළ යුතු විෂයයන් සඳහා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද අනුගමනය කිරීමේ දුෂ්කරතාවය,ප්‍රාථමික අවධියේ සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම ඵලදායී නොවීම,මාර්ගගත වැඩසටහන් සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙහි ගැටළු සහිත ගුරුභවතුන්,සංඥා පහසුකම්වල දුර්වලතා, සිසුන් සඳහා උපකරණවල හිඟය, දෙපාර්තමේන්තු හා කලාප මට්ටමින් ද මාර්ගගත ඉගැන්වීම් සඳහා අවශ්‍ය උපකරණවල හිඟතාවය, විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම නොගැලපීම, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හරහා ලබා දෙන වෘත්තීය පුහුණුව මාර්ගගතව ලබා දීමේ නොහැකියාව වැනි විවිධ ප්‍රායෝගික ගැටලු රැසකට මුහුණ දීමට සිදුවිය.

## අනාගත අරමුණු

2023 වර්ෂයේ දී මෙතෙක් පැවති කොවිඩ් වසංගත තත්ත්වයේ අවධානම අවම වීමත් සමගම දුරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතයෙන් පාසල්වල අධ්‍යාපන කටයුතු කිරීම සඳහා දිරි ගැන්වීම වෙනුවට සජීවි පංති කාමර අත්දැකීම් සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේද සැලසුම් කර තිබේ. එසේ නොවන අවස්ථා වලදී වෙනත් මාර්ගගත ක්‍රම භාවිතා කළ හැකි උපකරණ භාවිතයෙන් අධ්‍යයන කටයුතු කිරීමට පහසු වන ලෙස පාඩම් මාලාවන් සිසුන්ට සමීප කිරීමට ඊ -තක්සලාව හා ගුරු ගෙදර වැඩ සටහන් සඳහා සිසුන් යොමු කිරීම සිදුකෙරේ.

එසේම 2022, අතපසු වූ විෂයය කරුණු සිසුවාට ලඟා කර වීම සඳහා අනාවරණ පරීක්ෂණ මගින් සිසුන් අනාවරණය කරගෙන ඒ අනුව ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සැලසුම් කර ඇත.

අධ්‍යාපන සංවර්ධනයේදී තිරසර සංවර්ධන ගෝලීය අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගනිමින්, ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය සඳහා යොමු කිරීම, සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම, අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම, අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන්කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදි වශයෙන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරිම, සියලු ම තරුණයින්

හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම, තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම, ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම,වැඩි දුෂ්කරතාවයන් සහිත පාසල් වල ගුරු පුහුණුව සඳහා අධ්‍යාපන විශේෂඥ සේවා මත සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම යනාදි වශයෙන් ක්‍රියාත්මක කිරීම අරමුණු කර ඇත.

අධ්‍යාපන සැලසුම්කරණය මගින් සිසුන්ගේ සමාජ-ආර්ථික පසුබිම නොසලකා සියලු සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම තුලින් ඉගෙන ගන්නන් අතර විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය සහ ගැටළු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම අරමුණු කරයි. අධ්‍යාපන ක්‍රියාවලියේදී, ශීඝ්‍රයෙන් පරිණාමය වන වර්තමාන ලෝකයේ නව අභියෝගවලට අනුවර්තනය වීමේ සහ නව්‍යකරණය කිරීමේ හැකියාව ප්‍රමුඛ වේ. අධ්‍යාපන සැලසුම්කරණයේ අරමුණ වන්නේ මෙම අත්‍යවශ්‍ය කුසලතා ඇති කිරීම, සංකීර්ණ ගැටළු විසඳීමට සහ දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය මෙවලම් සමඟ සිසුන් , ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සන්නද්ධ කිරීමයි.

මෙහිදී අංශය තුල පවත්නා තත්ත්වය අනුව ශක්තීන් මනා ලෙස මගපෙන්වීමක් සහිත උපදේශනාත්මක නායකත්වයන්,සේවය සඳහා කැප වූ ආයතන කාර්යය මණ්ඩලය, 16000 පමණ වූ ගුරුභවතුන්, 920 පමණ වූ විදුහල්පතිවරුන්, මනා කැපවීමක් සහිත අධ්‍යාපන පරිපාලන සේවා නිළධාරීන්, ඉහළ අපේක්ෂණ සහිත පාසල් ප්‍රජාව දැක්විය හැකි වන අතර, දුර්වලතාවයන් ලෙස අධ්‍යාපන පරිපාලන සේවා නිළධාරි හිඟය, ගුරු හිඟය, ගුරු උපදේශක හිඟය, තාක්ෂණ උපකරණයන්ගේ හිඟතාවය, ප්‍රවාහන පහසුකම් හිඟය, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වන වැඩසටහන් වල පවත්නා දුර්වලතා.ස්ථාවර වත්කම් හඟතාවයන් හා යටිතල පහසුකම්හි පවත්නා දුර්වලතා දැක්විය හැකිය. මෙහිදී අවස්ථාවන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන අමාත්‍යාංශය, දුරස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය මගින් ලබා දෙන සහය හා මාර්ගෝපදේශකත්වය, පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබා දෙන සහය හා මාර්ගෝපදේශකත්වය, රාජ්‍ය නොවන සංවිධානවල සහාය, විවිධ මූල්‍ය ප්‍රභේද යටතේ ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන, උතුරු මැද පළාත තුල පවත්නා බාහිර අධ්‍යාපන ආයතන, වෘත්තීය මාර්ගෝපදේශන ආයතන හා විශ්ව විද්‍යාල වලින් ලැබෙන සහයෝගය දැක්විය හැකි වන අතර, අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් පහසුකම් වැඩි අගනගරයට හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යාමට වැඩි කැමැත්තක් දැක්වීම, විද්‍යා උපාධිධාරීන් ගුරු සේවයට ඇතුලත් වීම අඩු වීම, උසස් පෙළ සිසුන් පාසල්

පද්ධතිය ක්‍රමයෙන් ප්‍රතික්ෂේප කරමින් පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳ වැඩි වශයෙන් විශ්වාස කිරීම, පාසල් ප්‍රජාවගේ සෘණාත්මක ආකල්ප,ගුරු තුලනය කිරීම් සඳහා ඇති බාධා, 2023 හා පෙර වසර වල අධ්‍යයන හා අනධ්‍යයන බඳවා ගැනීම් සිදු නොකළ හෙයින් කාර්ය මණ්ඩල ඌණතාවයන් ඇතිවීම යනාදී කරුණු තර්ජන ලෙස දැක්විය හැකිය.

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති.

| අනු අංක ය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් / සහභාගීත්වය |
|---|---|---|---|---|---|
| | | ඉලක් කය | ලඟා වීම | | |
| 01 | 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය. | 61% | 62% | 10 | 53,703 |
| 02 | අ.පො.ස.- සා/පෙළ සිංහල සමත් ප්‍රතිශතය | 87% | 76% | 5 | 40650 පාසල් 40 |
| 03 | අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | 73% | 76% | 8 | 11,597 |
| 04 | උසස් පෙළ විද්‍යාව හා තාක්ෂණවේදය විෂයය ධාරාවේ සහභාගිත්ව අනුපාතය | 34% | 50% | 5 | 897 |
| 05 | උසස් පෙළ වාණිජ විෂයය ධාරාවේ සහභාගිත්ව අනුපාතය | 22% | 35% | 3 | 1,427 |
| 06 | උසස් පෙළ කලා විෂයය ධාරාවේ සහභාගීත්ව අනුපාතය | 42% | 25% | 4 | 67,303 |
| 07 | 13න් වසරක අඛණ්ඩ අධ්‍යාපනය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ගණන | 35 | 20 | 4 | 400 |
| 08 | පාසල් හැරයන්නන් සඳහා පවත්වන ලද දිගුකාලීන හා කෙටිකාලීන පාඨමාලා සංඛ්‍යාව. | 18 | 17 | 01 | 1230 |
| 09 | විශේෂ අධ්‍යාපන සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා සිදුකරන ලද ගුරු සිසු වැඩසටහන් ගණන | 31 | 13 | 07 | 65825 |
| 10 | උදෑසන පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක පාසල් ගණන. | 416 | 416 | 01 | 696 |
| 11 | සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් සිදුකරන ලද පාසල් ගණන. | 813 | 813 | 03 | 1916 |
| 12 | ශිෂ්‍ය උපදේශණය ඉහළ නැංවීම සඳහා සිදු කරන ලද වැඩසටහන් ගණන | 60 | 60 | 04 | 1277 |
| 13 | සියළු විෂයයන් සඳහා ගුරුභවතුන්ගේ නිපුණතා සංවර්ධනය | 35 | 44 | 11 | 8224 |
| 14 | සියළුම විෂයයන් සඳහා පවත්වන ලද සිසු පුහුණු සංඛ්‍යාව | 300 | 477 | 05 | 63913 |
| 15 | ලබා දුන් ප්‍රශ්න පත්‍ර ගණන | 570 | 570 | 02 | 307214 |
| 16 | SEQI අගය 70ට වැඩි පාසල් ගණන | 817 | 813 | 05 | 2004 |
| 17 | පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල් සංඛ්‍යාව | 817 | 810 | 06 | 1218 |

## 2.14 සංස්කෘතික සංවර්ධනය

Cultural Development



සෞභාග්‍යමත් පළාතක් බිහි වීමට නම් පළාතේ ජනතාවගේ මානසික සංවර්ධනය ඇති කල යුතුමය. ඒ සඳහා කලාව මහඟු මෙහෙයක් ඉටු කරයි. ඒ තුලින් ජනතාවගේ සිත් සතන් තුල ඊර්ෂ්‍යාව, වෛරය, ද්වේෂය වැනි අගතිගාමී සිතුවිලි ප්‍රහීනව ගොස් අධ්‍යාත්මික වර්ධනයක් ඇති වී සමාජය වඩාත් යහපත් කිරීම සඳහා අවස්ථාව සැලසේ.

ඒ සඳහා පළාතක් වශයෙන් දරුවන්ගේ දහම් අධ්‍යාපනය ඉහළ නැංවීම, උසස් කලානිර්මාණ බිහි කිරීම, උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම, අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය, කලාකරුවන්ගේ කුසලතා නංවාලීමේ වගකීම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර ඒ යටතේ පළාතේ පන්සල් 1,662ක්, කෝවිල් 42ක්, මුස්ලිම් පල්ලි 1980ක්, කතෝලික දේවස්ථාන 47ක්, පිරිවෙන් 57ක් හා දහම් පාසල් 978 ක් පවතින අතර නර්තන කලායතන 137ක්, සංගීත කලායතන 10ක් හා නාට්‍ය කලායතන 12ක් ද ලියාපදිංචිය ලබා ඇත.

විවිධ ජන මාධ්‍ය ඔස්සේ ක්‍රියාත්මක වන විජාතික සංස්කෘතික වැඩ සටහන් නිසා අපේ රටේ කාලාන්තරයක් තිස්සේ පැවැති සිරිත් විරිත් ආචාර ධර්ම, පාරම්පරික කලා සම්ප්‍රදායන් රැසක් ක්‍රමයෙන් සමාජයෙන් ඈත් වී යන පසුබිමක ඉදිරියේදී අපේ උරුමය සමාජයෙන් තුරන් වීමට නොදී රැකගැනීම අපගේ අරමුණයි.

## 2.14.1 සංස්කෘතික සංවර්ධනයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය තුල සංස්කෘතික සංවර්ධනය වෙනුවෙන් රු.මි. 52.42 ක සමස්ත ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි. 36.91 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.15.50 ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව සංස්කෘතික සංවර්ධනය සඳහා වෙන් කරන ලද රු.මි. 38.35 වූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේදී එය රු.මි. 14.07 ක ඉහළයාමකි. මෙම වර්ෂය තුල සමස්ථ සත්‍ය වියදම රු.මි. 37.36 වන අතර, එය රු.මි. 8.15 වූ මූලධන වියදමකින්ද, රු.මි. 29.21 වූ පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.







## 2.14.2 සංස්කෘතික සංවර්ධනයට අදාල භෞතික ප්‍රගතිය

සංස්කෘතිය යනු සමාජ ප්‍රගමනයට හේතුවන්නා වූ සහ සමාජ යහපැවැත්ම රඳවා ගැනීමට ඉවහල්වන්න වූ මෙවලමකි. විරාගත සම්ප්‍රදායන් හා සමාජය තුල පවත්නා වූ අභිමතයන් හා විශ්වාසයන් මෙන්ම හර පද්ධතීන් ගොඩනැගෙනුයේ එම සමාජය තුල පවත්නා සංකෘතිය පදනම් කරගෙනය. සංස්කෘතිය වූ කලි එම හර පද්ධතීන්ගේ අරටුව ලෙස හැදින්විය හැකිය. එම අරටුව පවත්වාගෙන යාම හා එහි ස්ථාවරත්වය රඳවා ගැනීම සඳහා අවශ්‍යවන්නා වූ මෙහෙවර ඉටුකිරීම සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීමකි.

අපේ රටේ කාලාන්තරයක් තිස්සේ පැවැති සිරිත් විරිත් ආචාර ධර්ම, පාරම්පරික කලා සම්ප්‍රදායන් රැසක් ක්‍රමයෙන් සමාජයෙන් ඈත් වී යන තත්ත්වයක් උද්ගත වී ඇති අතර, විවිධ ජන මාධ්‍යයන් ඔස්සේ ක්‍රියාත්මක වන විජාතික සංස්කෘතික වැඩ සටහන් නිසා ඉහත කී සංස්කෘතික ලක්ෂණ දක්නට නොලැබීම හේතුවෙන් කාලයක් ගත වන විට අපේ උරුමය අපේ සමාජය තුළ ඉතිරි නොවනු ඇත.

සෞභාග්‍යමත් පළාතක් බිහි වීමට නම් පළාතේ ජනතාවගේ මානසික සංවර්ධනය ඇති කල යුතුය. ඒ සඳහා කලාව මහඟු මෙහෙයක් ඉටු කරයි. එහිදී දැහැමි කලාකාමී අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියළු පාර්ශව කරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා, නිර්මාණකරණය හා රස වින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය සහ කලා කරුවන්ගේ කුසලතා ඔප් නැංවීම යන මෙහෙවර මුල් කර ගනිමින් කටයුතු කරනු ලබන පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පළාත් සභාව පිහිටුවූ දා සිට මේ වනතුරු එම කටයුත්ත වගකීමෙන් යුතුව ඉටුකරනු ලබයි. ලෝකයේ විවිධ සංස්කෘතීන් සමග ගැටෙමින් හා නව තාක්ෂණය සමග බද්ධ වෙමින් අපගේ සංස්කෘතිකමය උරුමයන් ලෝකය වෙත ගෙනයාම සඳහා විවිධ වූ උපාය මාර්ගයන් මත පදනම්ව පසුගිය වසර වලදී මෙන්ම 2023 වර්ෂයේ ද මහඟු කාර්ය භාරය ඉටු කර ඇත.

එහිදී රටේ පවතින ආර්ථික හා සාමාජීය පසුබිම මත බොහෝ සැලසුම් හකුලා ගැනීමට සිදුවූ නමුදු පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ලද රු.මි.1.5 මඟින් නේපත්‍යාගාර සංවර්ධනය සහ වේදිකා පසු ආවරණය සකස් කිරීමද මුල්‍ය පිරිවැයකින් තොරව හා සමාජීය පසුබිමට බාධාවක් නොවන අයුරින් තවත් කාර්ය භාරයන් රැසක් ඉටු කිරීමටද හැකියාව ලැබී ඇත. ඒ අනුව පැවති තත්වයන් හමුවේ සංස්කෘතික දායාදයන් රැකගනිමින් ඉදිරියට යාම සඳහා සිදු කරන ලද කාර්යයන් ලෙස, නර්තන හා සංගීත කලායතන හා අනෙකුත් කලායතන පවත්වාගෙන යාම සඳහා එම ශිල්පීන් දිරිගැන්වීම, පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව සතු සංගීත හා නර්තන පුහුණු වැඩසටහන් වර්ෂය පුරා අඛණ්ඩව පවත්වාගෙන යාම , උතුරු මැද කළා උළෙල උත්කර්ෂවත් ලෙස පැවැත්වීම, ඉදිරි කාර්යන් සඳහා පහසුවන අයුරින් දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම, ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය හා සංරක්ෂණය සඳහා පොරොත්තු ලේඛන සකස් කිරීම,පැවති සියලුම තත්වයන්ට මුහුණ දෙමින් වාර්ෂිකව අනුරාධපුර දළදා පෙරහැර පැවැත්වීම,ඉදිරි වර්ෂයන් සඳහා අදාළ වන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම දැක්විය හැකිය.







# 2.15 සමාජ ආරක්ෂණය

## Social Protection



සමාජ විරෝධි ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකිමින් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම මෙන්ම පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹු භාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්,අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම යන අරමුණු මුල් කර පළාත තුල සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මෙන්ම පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

### 2.15.1 සමාජ ආරක්ෂණයට අදාල මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය තුල සමාජ ආරක්ෂණය වෙනුවෙන් රු.මි. 944.20 ක සමස්ථ ප්‍රතිපාදනයක් වෙන්වූ අතර එයින් රු.මි. 837.53 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි.106.66 ක් මූලධන වියදම් සඳහා ද වේ. 2022 වර්ෂයට අදාලව සමාජ ආරක්ෂණය සඳහා වෙන් කරන ලද රු.මි. 750.27 වු සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සමාලෝචිත වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සැසඳීමේදී එය රු.මි. 193.93 ක ඉහළ යාමකි. මෙම වර්ෂය තුල සමස්ථ සත්‍ය වියදම රු.මි. 723.05 වන අතර, එය රු.මි. 9.77 වු මූලධන වියදමකින්ද, රු.මි. 713.28 වු පුනරාවර්තන වියදමකින්ද සමන්විත වේ.






## 2.14.2 සමාජ ආරක්ෂණයට අදාල භෞතික ප්‍රගතිය

සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක් ලබාදීමේ දැක්ම ඇතිව පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹු භාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීමේ මෙහෙවර ප්‍රමුඛ කාර්ය බවට පත්කර ගත් උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යයන් ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 130 ක් පමණ සේවයේ යොදවා ඇත. මීට අමතරව, සාලියපුර වැඩිහිටි නිවාසය, බුල්නෑව විශ්‍රාමික වැඩිහිටි නිවාසය, වකුගඩු රුධිර කාන්දුකරණ රෝගීන් සඳහා වූ සුවෝදය මධ්‍යස්ථානය, ඔලුකරද මධ්‍යස්ථානය සහ ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානය මෙම දෙපාර්තමේන්තුවේ ඍජු විෂය පථයට අයත් වේ.සාලියපුර වැඩිහිටි නිවාසය වැඩිහිටියන් 300 කට ආසන්න පිරිසකට නවාතැන් සපයන ශ්‍රී ලංකාවේ විශාලතම රජයේ වැඩිහිටි සත්කාර මධ්‍යස්ථානයයි. මෙම වැඩිහිටි නිවාසයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 60 දෙනෙකු සේවය කර ඇත. ඊට අමතරව වැඩිහිටියන් 09 දෙනෙකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකු බුල්නෑව වැඩිහිටි නිවාසයේ සිටී. අඩු ආදායම්ලාභීන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන් සහ කාන්තා මූලික පවුල් ඇතුළු සමාජීය වශයෙන් ආන්තික කණ්ඩායම්වලට දෙපාර්තමේන්තුව මගින් විවිධ සේවාවන් සපයනු ලැබේ. මෙම සමාජ කණ්ඩායම් සවිබල ගැන්වීම සහ ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම, උපකරණ බෙදා හැරීම සහ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ආගන්තුක සත්කාර සේවා,මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, ලබා දෙනු ලබන මූල්‍යාධාරයන් මහජන ආධාර, රෝග ආධාර, නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර, සහ නිවුන් දරුවන් සඳහා ආධාර, ශල්‍යකර්ම ආධාර, ශිෂ්‍යාධාර, සහ පූර්ණ ආබාධිත ආධාර යනාදී වශයෙන් වර්ග කරයි. එමඟින් අවශ්‍යතා පවතින කණ්ඩායම් සඳහා සහන සැලසීම සිදුකරයි. 2023 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් අඩු ආදායම්ලාභී පවුල් ඒකක 38,668ක් සඳහා රුපියල් මිලියන 296.5ක් වූ මූල්‍යාධාර, රෝදපුටු, ත්‍රිරෝද රථ, අත් අල්ලා ගැනීම්, ක්ලච්, වෝකර්, වෝකින් ස්ටික්, වතුර මෙට්ට සහ හුළං මෙට්ට උපකරණ බෙදා හරින ලදී. 2023 වර්ෂයේ දී රුපියල් මිලියන 3.62 ක්වූ උපකරණ 188 ක් බෙදා දී ඇත. රුධිර කාන්දුකරණ රෝගීන් 160 කට පමණ, ආහාර සහ ගමන් වියදම් සඳහා රුපියල් මිලියන 8.39 ක් ද පශ්චාත් වකුගඩු බද්ධ කිරීමේ ප්‍රතිකාර සඳහා රුපියල් මිලියන 1.36 ක් ද වැය කර ඇති අතර දිනකට රුධිර කාන්දුකරණ රෝගීන් 20 දෙනෙකුට පමණ පහසුකම් සපයන සුවෝදය මධ්‍යස්ථානය නඩත්තු කිරීමට අමතරව රුපියල් මිලියන 5.77 ක් ද වැය කර ඇත. තවද, විශේෂ වැඩසටහන් ලෙස මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

පැවැත්වීම, උපදේශනය, කාන්තා මූලික පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම, වැඩිහිටියන් සඳහා විනෝදාස්වාද වැඩසටහන් සහ වෙනත් සමාජ සත්කාරක වැඩසටහන් මගින් අදාළ පවුල් ශක්තිමත් කිරීමේ වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර ඇත. 2023 වසරේ ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන PSDG වෙන් කර නොමැති අතර, CBG යටතේ, වැඩිහිටි නිවාස සඳහා ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 1.0ක් වැය කර ඇත. ඊට අමතරව රාජ්‍ය නොවන සංවිධාන මගින් පාලනය වන දෙපාර්තමේන්තු යටතේ ආබාධිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණු ආයතන 05 ක් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුව විසින් යථායෝග්‍යාධාර ලෙස මූල්‍ය ආධාර සපයයි. මෙම දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි එම ආයතන ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් මගින් ලබා දී ඇති අතර, උපකරණ පහසුකම් ද ලබා දී ඇත. 2023 වර්ෂයේදී යථායෝග්‍යාධාර ලෙස රු. මිලියන 9.32 ක වැය කර ඇත. පවතින පුරප්පාඩු 43ක් හේතුවෙන් සේවක හිඟය ප්‍රධාන අභියෝගයක් වන අතර සුබසාධන කටයුතු සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශක්තියයි. විශේෂයෙන්, මෙම සියලු සේවාවන් බොහෝ විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා දෙන අතර දෙපාර්තමේන්තුව සෑම විටම උතුරු මැද පළාතේ අවශ්‍ය ප්‍රජාවන් සඳහා කාර්යක්ෂමව, ඵලදායි ලෙස සහ පුළුල් ලෙස සේවාවන් ලබා දීමට ප්‍රචාරක කටයුතු කරයි.

## නීතිගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක්

ළමා පරපුර යනු රටක ඉදිරි සංවර්ධන කාර්යයේ හා සමාජීය අභිවෘද්ධියේ මූලික සාධකයක් ලෙස හැඳින්විය හැකිය. එබැවින් ළමා පරපුර හා බැඳුණු යහපත් හෝ අහයපත් යම් කිසි ක්‍රියාදාමයක් වෙතොත් ඒ පිළිබඳව අවධානය යොමු කිරීම වැඩිහිටි අප කාගේත් යුතුකමකි. පිළිගත් සාරධර්ම, සිරිත් විරිත් හා සම්මතයන් අනුවත්, පනවාගත් නීතිරීති අනුවත් කටයුතු කිරීම සියලු සමාජයන්හී අපේක්ෂාවයි. අපේක්ෂාවන් සපිරුණු සමාජයක ජීවත්වීම පුද්ගල පැතුමයි. සමාජයේ පුද්ගලයන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයත් එක් එක් පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වයත් සමාජයම කෙරෙහි සෘජුව මෙන්ම පෞද්ගලික බලපෑමක්ද ඇති කරයි. එබැවින්, ක්‍රියාකාරකම්වල කළමනාකරණයක් පැවැතීම අවශ්‍ය වේ. එම නිසා සමස්ථ සමාජයෙහි වගකිව යුත්තෝ එම තත්වයන් කළමනාකරණය කරනු ලබන්නෝ වෙති.

## ආගමික වැඩසටහන් පැවැත්වීම.

පරිවාස හා ළමා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන හා අධීක්ෂණය වන උතුරු මැද පළාත තුළ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථාන 16 ක් වන අතර මේවායේ රැකවරණ ලබන දරු දැරියන් සංඛ්‍යාව 435 ක් පමණ වේ. දරුවකු හැදී වැඩීමට උචිත

පරිසරය වනුයේ තමා ජීවත්වන ගෘහාශ්‍රිත පරිසරය වුවද වර්තමානය වන විට පවුල් පරිසරය තුළ සිදු වන්නා වූ නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් හා සමාජයේ ඇතැම් පුද්ගලයන් වෙතින් දරුවන්ට සිදුවන යම් යම් අකටයුතුකම් හා අසාධාරණයන් හේතුවෙන් අනාථ, අත්හල හා අසරණ දරුවන් ලෙස ආයතනගත වන්නට සිදුවී ඇත. එවිට ඔහුන් හැදී වැඩෙන පරිසරය මෙන්ම ළමා කාලයද ගෙවීයන්නේ ළමා නිවාස තුලය. මෙලෙස ආයතනගතව හැදී වැඩෙන දරුවන් තුළ පවත්නා මානසික බිඳවැටීම්, මුරණ්ඩු ගති පැවතුම්, ප්‍රචණ්ඩකාරී බව, නොමනා හැසිරීම් රටාවන් හා හුදකලා බව ආදිය ඔවුන් තම ගෘහාශ්‍රිත ජීවිතය තුළ දී මුහුණ දුන් ගැටලු හා ජීවත් වූ සමාජ වට වටපිටාවෙන් ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන සිදු වූ සිදුවීම්ය. එම නිසා දරුවන් තුළ කායික හා මානසික පීඩනය අවම කිරීම අරමුණු කර ගනිමින් දරුවන් තුළ දයාව, කරුණාව, මෛත්‍රිය ඇති කිරීම හා සමාජය තුළ ජීවත් වන විටදී අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත්වීම වැනි යහපත් ගුණාංග ඇති කිරීමේ අවශ්‍යතාවය නිරතුරුව පවතී. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල හැදී වැඩෙන දරු දැරියන් යහපත් දරුවන් ලෙස සමාජගත කිරීම දෙපාර්තමේන්තුව සතු ප්‍රමුඛ කාර්යයකි.





යෙහෙළි උපදේශ න සේවා

ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් දාන සීල භාවනා වැඩසටහන් සෑම පොහෝ දිනකම ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ පවත්වන ලදී.

### අධ්‍යාපන හා විනෝද චාරිකා සංවිධානය

දරුවා යනු නිරන්තර කුතුහලය මෙන්ම යම් යම් දේ පිළිබඳව ගවේෂණය කරමින්, සතුටින් හා සැහැල්ලුවෙන් සිටීමට කැමත්තක් දක්වන පිරිසකි. මවගේ හා පියාගේ ආදරය හා රැකවරණය මෙන්ම පවුලේ සෙසු සමාජිකයන්ගේ රැකවරණය ලබන දරුවාගේ සිට විවිධ කරුණු කාරණා හේතුකොටගෙන නිවාස ගත වන දරුවාද මෙබඳු අයෙකි. පවුල තුල හැදී වැඩෙන දරුවාට විනෝදය හා අධ්‍යයනය සඳහා යාම පහසු කාර්යයක් උවත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගත වන දරුවාට එය එක්තරා අභියෝගකි.

කුමන කාරණාවක් නිසා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හැදී වැඩෙන්නට සිදු වූවත්, ජීවිතය ප්‍රීතිමත් ලෙස ගත කිරීමට දරුවාට ඇති අයිතිය ලබාදිය යුතුය. කෙදිනක හෝ සමාජ ගත වන තුරු දරුවාගේ නිවස ළමා සංවර්ධන මධ්‍යස්ථානය වන බැවින්, සමාන්‍ය ජීවිතයේදී දරුවකු ලබන අත්දැකීම් දරුවාට ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම දෙපාර්තමේන්තුවක් ලෙස අපගේ ප්‍රමුඛ කාර්යන් අතර වේ.

අනුව, ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හී දරු දැරියන්ගේ මානසික තෘප්තිය ඉහළ නැංවීම සහ අධ්‍යාපනික දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් අධ්‍යාපන චාරිකා සංවිධානය කරන ලදි.





උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සියළුම ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි සියළු දරුවන් දෙදින අධ්‍යාපන චාරිකාවක් රැගෙන යන ලදී



## දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

නිවාසගත දරුවන්ගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් සහ පෝෂණීය ආහාර වේලක් සකස් කිරීම පිළිබඳව දරුවන් දැනුවත් කිරීමට රජයේ වෛද්‍ය නිලධාරින් නිවාස වෙත පැමිණ පවත්වන ලදී.එමෙන්ම නීරෝගීකම පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිවාසගත දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.







## පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

සෑම පරිවාස කාර්යාලයක් මගින් තම අධිකරණ කලාප තුල පිහිටි තෝරාගත් පාසල්හි දරු දැරියන් ළමා අපයෝජන, මෙන්ම දරු දැරියන්ගේ පෝෂණය පවත්වා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.





## හැකියා ප්‍රදර්ශන වැඩසටහන් පැවැත්වීම.

දෙමාපිය රැකවරණය අහිමි වූ විට දරුවන් තුළ ඇතිවන ව්‍යාකූල මානසික මට්ටම මෙන්ම නව යොවුන් වියේදී ඇතිවන ප්‍රචණ්ඩකාරීත්වය, නොමනා හැසිරීම් තත්ත්වයන් එක්තරා දුරකට සමනය කළ හැකි සාර්ථක මාර්ගයක් ලෙස කලාව හඳුන්වා දිය හැකිය. එමෙන්ම කලා හැකියාවන් වර්ධනය කර ගැනීම අධ්‍යාපනයේද එක්තරා අංගයකිප් සඳහා අවස්ථාව ලබා දීමෙන් එය ඇයගේ හෝ ඔහුගේ කායික හා මානසික සමතුලිතතාව පවත්වා ගැනීමට මහඟු අත් අත්වැලක් වේ. නිවාසගත දරුවන් අධ්‍යාපන මෙන්ම විවිධ කලා කුසලතාවයන්ගෙන් ද යුක්ත දරුවන් බව විවිධ අවස්ථාවලදී තහවුරු කර ඇත. ඔවුන්ගේ හැකියාවන් සඳහා වේදිකාවක් තනා දීම අපගේ යුතුකමකි. ඒ අනුව, ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හී දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් 2023 වර්ෂයේදී සෑම ජාතික හා ප්‍රධාන ආගමික උත්සව මුල්කරගනිමින් විවිධ වැඩසටහන් පැවැත්විණි. මෙහිදී එම දරුවන් දැක්වූ නිර්මාණශීලී දක්ෂතාවයන් ඔවුන්ගේ ආත්ම ශක්තිය හා ආත්ම අභිමානය සංවර්ධනය සඳහා හේතු වූ බව කිව යුතුය.

- 2023 ලෝක ළමා දින සැමරුමට සමගාමීව උතුරු මැද පළාත් උත්සවය ඉතාම උත්කර්ෂවත් අයුරින් පළාත් ආණ්ඩුකාරවර ලේකම්තුමා සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් මඩාටුගම තරුණසේවා සභාවේ දී පවත්වන ලදි.









## නිවාසගත දරුවන් උසස් අධ්‍යාපනයට සහ වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම.

1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ අඥා පනතේ (35 වන වගන්තිය) අනුව භාරය හා ආරක්ෂාව, පාලනය කළ නොහැකි හා ළමා වරදකරුවන් යන කාණ්ඩයන් ,අධ්‍යාපනයේ පසුගාමී දරුවන් සහතික කළ පාසල් වලට අධිකරණ නියෝග මත සෘජුව යොමු කරනු ලබයි. ඒ අනුව, නිවාසගත දරුවන්හට මැහුම් පාඨමාලා, පරිගණක පාඨමාලා, රූපලාවන්‍ය පාඨමාලා පැවැත්වීම තුලින් වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම, ජාතික මට්ටමේ වෘත්තීය පුහුණු ආයතන වෙත දරුවන් යොමු කිරීම මඟින් දරුවන් සමාජගත කිරීම සිදු කරනු ලබයි.





ළමාරක්ෂක අරමුදල ක්‍රියාත්මක කිරීම.

උතුරු මැද පළාත් සභාව විසින් පළාත තුළ කායික, මානසික සහ සදාචාරාත්මක වර්ධනය අවශ්‍ය මූලික පහසුකම් නොමැති දරුවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සඳහා මුදලක් සහ වෙනත් අයුරින් ආධාර සැපයීමට මෙම අරමුදල පිහිටුවා ඇත. 1995 සැප්තැම්බර් මස 19 වන දින නිකුත් කරන ලද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද අංක 01 දරණ ප්‍රඥප්තිය මඟින් අරමුදල ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, වර්තමානයේදී ළමාරක්ෂක අරමුදල මඟින් ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යාධාර ලබාදීම, පාසල් අධ්‍යාපන ලබන දරුවන් සඳහා පාපැදි ලබාදීම ඇතුළු දරුවන්ගේ පෝෂණ තත්ත්වය නඟාසිටුවීම වැනි සුභසාධන කටයුතු සිදු කරමින් පවතී.



පළාතේ අඩු ආදායම්ලාභී
පවුල්වල දරුවන් සඳහා



පෝෂණ පළාතේ අඩු ආදායම්ලාභී
පවුල්වල දරුවන්ගේ පෝෂණ තත්ත්වය
නඟාසිටුවීමට පෝෂණ මළු බෙදා දීම.

## පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල බෙදා දීම.

පළාතේ පිහිටුවා ඇති පරිවාස කාර්යාල මඟින් හඳුනාගත් අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම සෑම වසරකම පාහේ අඛණ්ඩව සිදු කරයි. පරිවාස නිලධාරීන් විසින් සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂාවන්හි දී හඳුනාගත් දරුවන් 450 ක පමණ පිරිසකට මෙලෙස අධ්‍යාපන ආධාර ලබාදීම සිදුකරනු ලබයි.









අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා
අත්‍යාවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම

## පෙර පාසල් දරුවන්ගේ බාහිර ක්‍රියා කාරකම් වර්ධනය









දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඇති සුපිපි පෙර පාසලේ දරු දැරියන්ගේ බාහිර ක්‍රියාකාරකම් , සමාජ හා පුද්ගල සංවර්ධනය, මුදල්/ භාණ්ඩ වර්ග හඳුනා ගැනීම හා ගණුදෙණු කරන ආකාරය පිළිබඳ දැනුම ලබා දීම අරමුණු කර

ගනිමින් කොමසාරිස්වරයා , මාණ්ඩලික නිලධාරීන් හා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වෙයෙන් සුපිපි පෙර පාසලේදී සිහිති පොළක් හා කලා කුසලතාවන් ඔප්නැන්වීමේ අරමුණින් වර්ෂාවසානයේ විවිධ ප්‍රසංගයක් පවත්වන ලදී. තවද විවිධ හේතු කාරණා නිසා දෙමාපිය රැකවරණය අහිමි වූ නමුත්, භාරය හා ආරක්ෂාව අවැසි දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂිකව පවත්වනු ලබන සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය අවුරුදු චාරිත්‍ර වලට මුල්තැන දෙමින් මෙවරද ළමා නිවාස තුළ පැවැත්වීමට කටයුතු කරන ලදි. දරු දැරියන්ට සිංහල හා හින්දු අලුත් අවුරුද්ද පිළිබඳ දැනුම අවබෝධය ලැබෙන පරිදි අවුරුදු චාරිත්‍ර ඉටු කිරීමට හා අවුරුදු ක්‍රීඩාවල යෙදීමට අවස්ථාව ලබා දෙමින් දෙමාපිය රැකවරණය අහිමි වූ දරුවන්ට දෙපාර්තමේන්තුවක් ලෙස දෙමාපිය පාර්ශවය නියෝජනය කරමින් හෙළ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා දීමට






සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය- හිගුරක්ගොඩ හා යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානය

## දරුවන් සමාජගත කිරීම

- ✓ නිවාස ගත දරුවන් සමාජ ගත කිරීම යටතේ කඩ කාමරයක් ඉදි කිරීම හා එයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම -කැකිරාව
- ✓ නිවාසගත දරුවන් සමාජගත කිරීම යටතේ ජල පහසුකම් ලබාදීම හා ආදායම් උත්පාන මාර්ගයක් වශයෙන් කිරිගවයෙකු ලබා දීම - කැබිතිගොල්ලෑව.






| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් | 2023 වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි) | වැය කළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය(%) |
|---|---|---|---|---|
| ක්ෂේමසුරක්ෂා සුරක්ෂා ළමා රැකවරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ගේට්ටුව අලුත්වැඩියා කිරීම | 20 | 0.25 | 0.25 | 100% |
| අවන්තිදේවි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ මුරකුටියේ දොර ජනෙල් සැකසීම | 50 | 0.68 | 0.66 | 100% |
| පිරිමි රැඳවුමේ ළමුන් භාවිතා කරනු ලබන වැසිකිළියේ පිටත බිත්තිය අළුත්වැඩියා කිරීම | 30 | 0.23 | 0.15 | 100% |
| පරිවාස දෙපාර්තමේන්තු පළමු මහලේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා | 50 | 0.76 | 0.75 | 100% |
| දෙපාර්තමේන්තු ආයතන අංශයේ පාටිශන් අළුත්වැඩියා කිරීම | 50 | 0.06 | 0.09 | 100% |
| පිරිමි රැඳවුම් ආසන්නයේ ඇති වාහන නැවතුමේ වැසිකිළි වලවල් වසා දැමීම හා පරිවාස දෙපාර්තමේන්තුව පරිශ්‍රයේ ඇති සාද නිවසේ ගලි පද්ධතිය අලුත්වැඩියා කිරීම | 20 | 0.47 | 0.45 | 100% |
| අනුරාධපුර පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරි නිල කාමරයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 10 | 0.23 | 0.22 | 100% |
| හිඟුරක්ගොඩ පරිවාස කාර්යාලයේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම | 150 | 0.99 | 0.91 | 100% |
| දෙපාර්තමේන්තු රථ ගාල සඳහා කොන්ක්‍රීට් ගල් ඇතිරීම හා ප්‍රධාන ගේට්ටුව අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 100 | 0.77 | 0.77 | 100% |
| කහටගස්දිගිලිය පරිවාස කාර්යාලයේ වැට අළුත්වැඩියා කිරීම | 50 | 0.23 | 0.23 | 100% |
| අභය ළමා නිවාසය සෙල්ලම් මිදුලේ වහලයේ වැහි පීලි අළුත්වැඩියා කිරීම | 50 | 0.21 | 0.21 | 100% |
| මඩාටුගම සහතික කළ පාසලෙහි අළුත්වැඩියා කිරීම | 50 | 2.02 | 2.02 | 100% |
| දෙපාර්තමේන්තු කාර්යාලයේ පරිගණක ජාලගත කිරීම සඳහා විදුලි පද්ධතිය සැකසීම | 70 | 0.69 | 0.61 | 100% |
| අනුරාධපුර පරිවාස කාර්යාලයේ භූමිය සැකසීම හා කානුවක් ඉදි කිරීම | 150 | 0.37 | 0.34 | 100% |
| තඹුත්තේගම පරිවාස කාර්යාල වැසිකිළි වහල අලුත්වැඩියා කිරීම හා මිදුල කොනක්‍රීට් ගල් ඇතිරීම | 100 | 0.73 | 0.72 | 100% |
| අවන්තිදේවි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ තීන්ත ආලේප කිරීම | 50 | 0.25 | 0.25 | 100% |
| සාලියපුර යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානයේ සිවිලිම හා වහලය අලුත්වැඩියා කිරීම | 30 | 0.59 | 0.58 | 100% |



ක්ෂේමසුරක්ෂා ළමා රැකවරණ මධ්‍යස්ථානය - සාලියපුර



අවන්තිදේවි ළමා සංවර්ධන



මඩාටුගම සහතික කළ පාසල



තඹුත්තේගම පරිවාස කාර්යාලය අලුත්වැඩියා කිරීම



දෙපාර්තමේන්තු රථගාල කොන්ක්‍රීට් ගල් ඇතිරීම



අභය ළමා නිවාසයේ වැහිපීලි අලුත්වැඩියා කිරීම



දෙපාර්තමේන්තුවේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම



දෙපාර්තමේන්තුවේ පළමු මහලේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම

## සමාජ ආරක්ෂණය වෙනුවෙන් ඉටු කිරීමට අපේක්ෂිත ඉදිරි අරමුණු

- පළාත තුළ සිටින සියළු දරුවන් කායිකව මෙන්ම මානසිකව නිරෝගී දරුවන් බවට පත් කිරීම අපේක්ෂාවෙන් වාර්තා වන ළමා අපයෝජන සිදුවීම අවම කිරීම,දරුවන් නිවාසගත වීම අවම කිරීම,පළාතේ දරුවන්ගේ මන්ද පෝෂණය අවම කිරීම,පළාතේ දරුවන් අතරින් වාර්තාවන මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම,ආයතනගත දරුවන් නිවාසගත කිරීමේ ප්‍රතිශතය,වාර්තාවන අඩු වයස් විවාහ හා ගැබ් ගැනීම අවම කිරීම,පළාත තුළ මව්වරු විදෙස්ගත වීම වැලැක්වීම,පළාත තුළ නියමිත ප්‍රමිතියෙන් යුක්ත ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම

- සුරක්ෂිත සමාජයක් බිහි කිරීමේ අපේක්ෂාවෙන් දරුවන් රැඳවුම් නිවසවලට යොමු වීම අවම කිරීම,පවුල් ආරවුල් විසඳීම තුලින් පවුල් ඒකකය ශක්තිමත් කිරීම,සුරක්ෂිත නිවාස හිමි දරුවන් සංඛ්‍යාව (නිවාස අනාරක්ෂිත දරුවන් අතරින් ලබා දුන් ප්‍රතිශතය),දරුවන් අතර සිදුවන තාක්ෂණික අවභාවිතය නිසා වාර්තා වන සිදුවීම් අවම කිරීම.

- පළාතේ දරුවන් අධ්‍යාපනයෙන් පරිපූර්ණ දරුවන් බවට පත් කිරීමේ අපේක්ෂාවෙන් නිවාසගත දරුවන් පාසල් හැර යාමේ ප්‍රතිශතය අවම කිරීමට කටයුතු කිරීම හා නිවාසගත දරුවන්ගේ අධ්‍යාපන මට්ටමේ ප්‍රතිශතය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම හා නිවාසගත දරුවන් වෘත්තීය සුදුසුකම් තුලින් රැකියාවකට යොමු කිරීම

## මුල් ළමාවිය සංවර්ධනය

සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම සඳහා උතුරු මැද පළාතේ සෑම ග්‍රාම සේවා වසමකම පෙර පාසැල් එකක් හෝ ආරම්භකර පවත්වාගෙන යාම , අධිකාරිය විසින් සකස් කර ඇති විෂයය නිර්දේශයක් යටතේ සියළුම පෙරපාසැල් විසින් එකම විෂය නිර්දේශයක් යටතේ අධ්‍යයන කටයුතු සිදු කිරීම,පෙර පාසැල් සහතික පත්‍ර / ඩිප්ලෝමා පාඨමාලා පවත්වා සියළුම පෙර පාසැල් ගුරුවරියන් සඳහා පෙර පාසැල් සම්බන්ධ සහතිකයක් ලබාදීමට කටයුතු කිරීම,දෙමාපියන් දැනුවත් කිරීම් වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක වීම මත මුල් ළමාවිය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම වැනි කටයුතු සිදුකර ඇත.

## අභියෝග හා ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු

- අධිකාරිය සඳහා ඉඩපහසුකම් සහිත කාර්යාලයක් නොමැතිවීම,
- කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ දැනුමේ සීමාකම,

- ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම්වලට ප්‍රමාණවත් තාක්ෂණික උපාංග නොමැති වීම

- දත්ත යාවත්කාලීන කෙරෙන කඩිනම් හා විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම අභියෝගයක් විය.

- නෛතික රාමුවක රැකවරණය,

- උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වාර්ෂිකව ප්‍රතිපාදන සැලසීම,

- අධිකාරියට අනුයුක්ත නිලධාරී මණ්ඩලයක් සිටීම,

- කාර්යාලයේ ප්‍රමාණවත් භෞතික සම්පත් තිබීම,

- විෂය නිර්දේශයක් තිබීම. ශක්තිමත් අන්තර්පුද්ගල සම්බන්ධතා,ප්‍රමාණවත් දත්ත හා තොරතුරු පැවතීම යන ඉලක්ක සපුරා ගනිමින් සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම. ඉදිරියේදී ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු අතර වේ.

- වැඩිහිටි නිවාස, ආබාධිත ළමා රැදවුම් නිවාසවල ප්‍රමිතිය ඉහළ නැංවීමට ප්‍රමිතිකරණ දර්ශක සකස් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කිරීම.

- බහුවිධ ආබාධිත සහිතවූවන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අනුමැතිය ප්‍රතිපාදන හා යෙදවුම් ලබාගැනීම.

- ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානය හා ඔළුකරද ආයතනය ස්වයං රැකියා උත්පාදන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කිරීම.

- සාලියපුර වැඩිහිටි නිවාසය හා බුල්නෑව වැඩිහිටි නිවාසය තුළ හරිත කෘෂිකර්මය ප්‍රචලිත කිරීම.

- වයස අවුරුදු 35-60 අතර ආබාධිත හෝ රැකවරණය අහිමි පුද්ගලයින් හට රැකවරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අවශ්‍ය අනුමැතිය, ප්‍රතිපාදන හා යෙදවුම් ලබා ගැනීම

- සැදෑ සමය තෘප්තිමත්ව ගත කිරීමට අවශ්‍ය පරිසරයක් සහිත ධනය වියදම් කර අවශ්‍ය පහසුකම් භුක්ති විඳීමට හැකිවන පරිදි වැඩිහිටි නිවාසයක් පිහිටුවීම කාලීන අවශ්‍යතාවයක් වන බැවින් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය, ප්‍රතිපාදන හා යෙදවුම් ලබා ගැනීම.

## 2.16 වෙනත් පළාත් සභා ව්‍යවසායකයන්

### Other Entrepreneurs



උතුරු මැද පළාත තුල පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කටයුතු කරනු ලබන පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෘත්තිය කුසලතා හා ආකල්ප සංවර්ධනය තුළින් ශ්‍රම බලකාය සවිබල ගැන්වීමේ දැක්ම යටතේ පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීම, මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරිම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනය බවට පත්වීම හා ඒ තුළින් ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීම,නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායකවීම යන අරමුණු මුල් කරනිමින් ක්‍රියාත්මක වේ.






## 2.16.1 වර්ෂය තුල අත්කරගත් මූල්‍ය ප්‍රගතිය

වසර ගණනාවක සිට සාමාන්‍ය පරිදි ආයතනය මඟින් සිදු කරනු ලැබූ මුද්‍රණ රාජකාරි, යන්ත්‍ර කුලීයට දීම,වාහන සේවා හා අලුත් වැඩියා කටයුතු ,ආරක්ෂක ඒකකය යන අංශ මඟින් ඉතා සාර්ථක ප්‍රගතියක් 2022 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුල අත්කරගෙන ඇත.

| අනු අංකය | විස්තරය | 2022 | 2023 |
|---|---|---|---|
| 01 | මුද්‍රණ ආදායම | 71,511,608.50 | 185,511,304.27 |
| 02 | වාහන අලුත්වැඩියා ආදායම | 34,987,808.18 | 42,564,508.71 |
| 03 | යන්ත්‍ර කුලී ආදායම | 1,765,150.00 | 1,022,825.00 |
| 04 | වාහන සේවා ආදායම | 17,990,936.00 | 22,755,273.21 |
| 05 | ආරක්ෂක ඒකකයේ ආදායම | 54,292,314.04 | 112,189,444.50 |

* (මූලාශ්‍ර 2022 වර්ෂයේ හා 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා)




## 2.16.2 වර්ෂය තුල අත්කරගගත් භෞතික ප්‍රගතිය

**මුද්‍රණ අංශය-** උතුරු මැද පළාත තුල පවත්නා රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි සියලුම වර්ගයේ මුද්‍රණ කටයුතු භාර ගැනීම හා ඒවාට අවශ්‍ය අමුද්‍රව්‍ය ඉල්ලුම් කිරිම, ඇස්තමේන්තු සකස් කිරිම, සේවා දායකයාගේ අවශ්‍යතාවය පිරිදි මුද්‍රණ කටයුතු නිර්මාණය කිරිම වර්ණ විසංයෝජනය සිදු කිරිම, අදාල කාර්යයන් සඳහා පිරිවැය වාර්තා සකස් කිරිම හා ඒ ඒ වැඩපත් සඳහා බිල් පත් යැවීම හා මුදල් ලැබීම් සටහන් කර ගැනීම සිදු කරනු ලබයි. රටේ පවතින දැඩි ආර්ථික අර්බුදය හමුවේ උතුරු මැද පළාත තුල අධ්‍යාපනය ලබන දූවා දරුවන්ගේ අනාගතය උදෙසා සහන මිලට අභ්‍යාස පොත් ලබා දීමට

DeCMA නමින් පොත්හලක් පවත්වාගෙන යාමද සිදු කරන ලදී.

එමෙන් ම මෙවර ද උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ මධ්‍ය වාර පරික්ෂණය මෙන්ම අවසන් වාර විභාග ප්‍රශ්නපත්‍ර වලට අමතරව අ.පො.ස සා.පෙළ සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය ප්‍රශ්න පත්‍ර මුද්‍රණයද මෙමඟින් සිදු කරන ලදී.

**යාන්ත්‍රික අංශය-** සේවා හා ටයර් සේවා අංශය යාන්ත්‍රික අංශය ලෙස නම් කර ඇති අතර, මෙම අංශය යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය හා මෙහෙය වීම යටතේ පාලනය වේ. මෙහි දී පළාතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හි වාහන අලුත් වැඩියා කටයතු, වාහන සේවා කටයුතු හා ටයර් ටියුබ් සැපයීම වැනි කාර්යයන් සිදු කරනු ලැබේ. ඒ අනුව අදාල සේවා දායකයාගේ අපේක්ෂාව පරිදි අදාල සේවාවන් නියමිත ප්‍රමිතියකට අනුව සිදු කරමින් ආයතනයේ ඉදිරි පැවැත්ම සඳහා දායකත්වය සපයයි.

**ආරක්ෂක අංශය -** ආරක්ෂක කළමනාකරුගේ අධීක්ෂණය යටතේ මෙය ක්‍රියාත්මක වන අතර 2017 වසරේ ආරම්භකර පවත්වාගෙන යන ලද ඒකකයක් වේ. දැනට සේවකයන් 134ක් පමණ සේවයේ නිරතවන අතර මෙ අනුරාධපුර පොළොන්නරුව යන ප්‍රදේශයන් දෙකහි රාජ්‍ය ආයතනයන් සඳහා ආරක්ෂක සේවාවන් සපයනු ලැබේ. එමෙන්ම විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් රජරට විශ්ව විද්‍යාලය තුළද ආරක්ෂක සේවාවන් සපයනු ලැබේ.



### අභියෝග

තරඟකාරී ආර්ථික ක්‍රියාවලියක් හමුවේ උතුරු මැද පළාතේ වාහන අලුත්වැඩියා හා ටයර් සේවා ලබා දෙන පුද්ගලික ආයතන හා පළාත තුල ඇති පොත්හල් වලින් තර්ජන පැමිණිය අතර එම තර්ජන මැඩ පවත්වා ගනිමින් 2023 වර්ෂයේද සාර්ථක ලෙස ආයතිනක කටයුතු පවත්වාගෙන යාමට අප විසින් සමත් විය.

එම තර්ජන හමුවේ රටේ පවත්නා වාතාවරණය හේතුවෙන් මුද්‍රණ අංශයේ දෛනික රාජකාරි කටයුතු කරගෙන යෑමට අවශ්‍ය බොහෝමයක් අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ පෑමට සිදු වීම ද තවත් එක් අභායෝගයක් බවට පත් විය.

### අනාගත අරමුණු

නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් යාන්ත්‍රික, සේවා අංශය වැඩි දියුණු කර ගැනීම හා එමඟින් ඉලක්කගත ආදායම වැඩි දියුණු කර ගැනීම.

මුද්‍රණාලය සඳහා ද නව්‍ය තාක්ෂණය උපයෝගී කර ගනිමින් මුද්‍රණ කටයුතු වඩා වේගවත් හා ගුණාත්මක කර ගැනීම.



## 2.17 විශේෂ ජයග්‍රහණ

Special Achievements






ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය අංශයේ හොඳම වාර්ෂික වාර්තාව තේරීමේ තරගාවලියේදී, 2022 වර්ෂයේ දිවයිනේ සියලුම පළාත් සභා අතරින් විශිෂ්ඨතම වාර්ෂික වාර්තාවට හිමි අනුශූරතාවය උතුරු මැද පළාත් සභාවට **2023.12.25** දින දිනාගත් අවස්ථාව.

අන්තර් පළාත් ජාතික අත්යන්ත්‍ර රෙදි පිළි තරඟයේදී 06වන ස්ථානය ලබා ගැනිමට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි විය.එම ජයග්‍රහණ හිමි වූයේ පහත පරිදිය.

| | |
|---|---|
| දෙවන ස්ථාන | 03 |
| තෙවන ස්ථාන | 01 |
| කුසලතා | 01 |

මෙයට අමතරව හස්ත කර්මාන්ත අංශයේ විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ලබා ගැනිමට මෙවර මෙම දෙපාර්තමේන්තුවට හැකි විය.

| | |
|---|---|
| රජත සම්මාන | 01 |
| ප්‍රථම ස්ථාන | 05 |
| දෙවන ස්ථාන | 04 |

සමස්ථ ලංකා විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලිය

- රන් පදක්කම් දෙකක්
- රිදී පදක්කම් එකක්

ගණිත ඔලිම්පියාඩ් තරඟාවලිය,

සමස්ථ ලංකා ජයග්‍රහණ 09ක්

සමස්ථ ලංකා ගණිත දැනුම මිණුම තරඟාවලියේ සිවුවන ස්ථානය



ඉංග්‍රීසි විෂය සඳහා ජයග්‍රහණ 11ක්

සමාජ විද්‍යාව සඳහා ජාතික මට්ටමේ ජයග්‍රහණ 06

සිංහල භාෂාව විෂයය සඳහා ජාතික මට්ටමේ තරඟ ජයග්‍රහණ 18ක්

(ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර),
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

2024.05.

# 03

පරිච්ඡේදය

# වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

## 3.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
උතුරු මැද පළාත් සභාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන් | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | **7,059,228,992** | **5,063,759,034** |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 1 | 5,124,620,903 | 3,137,131,557 |
| ලැබිය යුතු ආදායම් | 2 | 206,371,837 | 75,397,260 |
| ලැබිය යුතු ප්‍රදාන/ රේඛීය අමාත්‍යංශ අරමුදල් | 3 | - | - |
| කලින් ගෙවීම් | 4 | 8,593,728 | 10,658,434 |
| වෙනත් ජංගම වත්කම් | 5 | 1,719,642,524 | 1,840,571,783 |
| **ජංගම නොවන වත්කම්** | | **28,793,022,019** | **26,921,104,906** |
| යටිතල, පිරියත හා උපකරණ | 6 | 5,546,251,674 | 4,451,481,647 |
| ඉඩම් සහ ගොඩනැගිලි | 7 | 23,246,770,345 | 22,469,623,259 |
| **අස්පෘශ්‍ය වත්කම්** | 8 | **12,006,843** | **12,006,843** |
| **මුළු වත්කම්** | | **35,864,257,855** | **31,996,870,784** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | **669,081,479** | **802,375,402** |
| ගෙවිය යුතු දෑ | 9 | 92,237,934 | 267,143,576 |
| තැන්පත් ගිණුම් (රඳවා ගත් තැන්පතු) | 10 | 499,644,087 | 501,261,083 |
| වැන්දඹු අනත්දරු අරමුදල | 11 | 77,199,459 | 33,970,743 |
| **ජංගම නොවන බැරකම්** | | **449,135,486** | **198,093,983** |
| ගෙවිය යුතු අරමුදල් | 12 | 396,162,719 | 150,266,718 |
| ක්ෂය සංචිත අරමුදල | 13 | 52,972,767 | 47,827,265 |
| **මුළු බැරකම්** | | **1,118,216,965** | **1,000,469,385** |
| **ශුද්ධ වත්කම්** | | **34,746,040,890** | **30,996,401,399** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| පළාත් සභා අරමුදලේ ආරම්භක ශේෂය | | 31,838,255,432 | 30,093,982,264 |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම සඳහා ලද ප්‍රදාන | | 1,169,882,626 | 1,038,346,093 |
| කාලච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌණතාවය) | | 1,737,902,832 | (135,926,957) |
| **2023.12.31 දිනට පළාත් සභා අරමුදලේ ශේෂය** | | **34,746,040,890** | **30,996,401,399** |

පිටු අංක..**01**..සිට..**05**..දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ පිටු අංක.**06**..සිට.**34**.දක්වා ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම් සටහන් හා උපලේඛනද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ආර්.පී.කමිත්‍රා | යූ.එස්.අරුණරවී | ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර |
| අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්), | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්), | ප්‍රධාන ලේකම්, |
| උතුරු මැද පළාත. | උතුරු මැද පළාත. | උතුරු මැද පළාත. |
| දිනය : 2024.03 18 | දිනය : 2024.03 18 | දිනය : 2024.03.18 |
| ආර්.පී. කමිත්‍රා | යූ.එස්. අරුණරවී | ආර්.එම්.ඩබ්.එස්. සමරදිවාකර |
| අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) | ප්‍රධාන ලේකම් |
| පළාත් භාණ්ඩාගාරය | පළාත් භාණ්ඩාගාරය | උතුරු මැද පළාත |
| උතුරු මැද පළාත | උතුරු මැද පළාත | |
| | අනුරාධපුර. | |

මූල්‍ය ප්‍රකාශන - 2023 උතුරු මැද පළාත් සභාව පිටු අංක | 1

## 3.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
උතුරු මැද පළාත් සභාව
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

| | සටහන් | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|---|
| **අයභාරය** | | | |
| **බදු ආදායම** | | 1,818,620,082 | 1,483,567,966 |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 14 | 1,818,620,082 | 1,483,567,966 |
| **බදු නොවන ආදායම** | | 1,758,090,635 | 1,270,775,872 |
| ගාස්තු, දඩ සහ බලපත්‍ර | 15 | 1,758,090,635 | 1,270,775,872 |
| **අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගේ හුවමාරු කිරීම** | 16 | 26,748,937,839 | 24,068,194,317 |
| **රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් ප්‍ර** | 17 | 1,820,381,623 | 688,263,678 |
| **වෙනත් අයභාර** | 18 | 6,500,000 | 8,648,290 |
| **මුළු අයභාරය** | | **32,152,530,179** | **27,519,450,123** |
| | | | |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 19 | 21,400,650,670 | 21,894,986,445 |
| ගමන් වියදම් | 20 | 224,557,295 | 190,430,796 |
| සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය | 21 | 1,044,615,599 | 816,342,039 |
| නඩත්තු වියදම් | 22 | 1,615,239,080 | 1,311,245,295 |
| ගිවිසුම් සේවා | 23 | 1,035,919,134 | 697,027,826 |
| මාරු කිරීම් | 24 | 4,923,238,781 | 2,581,264,556 |
| සහනාධාර | 25 | 2,847,148 | 925,060 |
| පුහුණු හා ධාරිතා සංවර්ධනය | 26 | 121,572,148 | 155,435,158 |
| වෙනත් වියදම් | 27 | - | - |
| වත්කම් ඉවත් කිරීම | 28 | 45,987,492 | 7,719,906 |
| **මුළු වියදම්** | | **30,414,627,347** | **27,655,377,081** |
| | | | |
| ආශ්‍රිතයන්හි අතිරික්තයෙන් අදාළ කොටස | | | |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌණතාවය)** | | **1,737,902,832** | **(135,926,957)** |

*මූලාශ්‍රය - 2023 මූල්‍ය ප්‍රකාශනය .උමැ.ප

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

උතුරු මැද පළාත් සභාව

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

(රු.)

| විස්තරය | සටහන | | පළාත් සභා අරමුදල |
|---|---|---|---|
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | | **30,996,401,399** |
| පෙර වර්ෂයට අදාල ගැලපීම් | | | |
| **එකතු කිරීම්** | | | |
| පසුව හඳුනාගත් වත්කම් | D1 | 783,776,859 | |
| ලැබිය යුතු ආදායම් | D2 | 68,254,589 | 852,031,448 |
| **අඩු කිරීම්** | | | |
| ඉදිරියට කළ වියදම් | D3 | 377,415 | |
| වාහන | D4 | 9,800,000 | 10,177,415 |
| **2023.01.01 දිනට සංශෝධිත ශේෂය** | | | **31,838,255,432** |
| 2023 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධයෙහි වෙනස්වීම | | | |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම සඳහා ලද ප්‍රදාන | | | 1,169,882,626 |
| කාලච්ඡේදය සඳහා (ඌණතාවය)/අතිරික්තය | | | 1,737,902,832 |
| **2023.12.31 දිනට පළාත් සභා අරමුදලේ ශේෂය** | | | **34,746,040,890** |

*මූලාශ්‍රය - 2023 මූල්‍ය ප්‍රකාශනය .උමැ.ප

# 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**

**උතුරු මැද පළාත් සභාව**

**2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - සෘජු ක්‍රමය**

| | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම | 1,818,620,082 | 1,483,567,966 |
| පොළී | 263,040,418 | 166,527,515 |
| ගාස්තු, අධිභාර ,දඩ මුදල් හා බලපත්‍ර | 1,022,731,723 | 746,478,079 |
| වෙනත් ලැබීම් | 113,883,253 | 117,613,128 |
| රජයේ ප්‍රධාන - පුනරාවර්තන | 24,990,793,680 | 23,144,893,320 |
| මෙහෙයුම වලින් සැපයුනු මුළු මුදල (අ) | **28,209,069,156** | **25,659,080,008** |
| **අඩුකළා - මුදල් වැයකරන ලද්දේ** | | |
| පුද්ගලික පඩිනඩි | 20,493,180,313 | 20,802,328,002 |
| සහනාධාර සහ මාරු කිරීම් | 4,934,867,638 | 2,795,758,984 |
| මෙහෙයුම් වියදම් සහ වෙනත් ගෙවීම් | 1,145,296,900 | 1,676,668,306 |
| මෙහෙයුම සඳහා වැය කරන මුළු මුදල (ආ) | **26,573,344,851** | **25,274,755,293** |
| | | |
| **මෙහෙයුම ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ-ආ)** | **1,635,724,305** | **384,324,715** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ප්‍රවාහයන්** | | |
| රජයේ ප්‍රදාන - මූලධන | 4,994,319,425 | 2,410,544,222 |
| සුන්බුන් විකුණුම් | 9,316,151 | 1,947,624 |
| ආයෝජන පොලී | 184,657,739 | 48,836,329 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් සැපයුනු මුළු මුදල (ඈ) | **5,188,293,314** | **2,461,328,175** |
| **අඩුකළා: මුදල් වැයකරන ලද්දේ** | | |
| කෙටි කාලීන ආයෝජනවල යෙදවීම් | 184,657,739 | 48,836,329 |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිළදී ගැනීම් හා වෙනත් ආයෝජන වියදම් | 4,128,397,683 | 2,685,354,968 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල (ඉ) | **4,313,055,422** | **2,734,191,297** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහයන් (ඊ) = (ඈ - ඉ)** | **875,237,892** | **(272,863,123)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ +ඊ)** | **2,510,962,197** | **111,461,592** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| රණවිරු සුභසාධක අරමුදල | 184,985 | 175,582 |
| පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමට ගෙවීම් | 121,444,190 | 204,961,572 |
| පළාත් දෙපාර්තමේන්තු වලට අත්තිකාරම් - අග්‍රිම | 302,158 | 80,000 |
| ක්ෂය සංචිත අරමුදල | 5,145,502 | 9,963,065 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුළු මුදල (ඌ) | **127,076,835** | **215,180,219** |
| **අඩුකළා : මුදල් වැයකරන ලද්දේ** | | |
| රණවිරු සුභසාධක අරමුදල | 200,000 | 200,000 |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම් | 832,573,339 | 932,059,621 |
| අනුමත අත්තිකාරම් ගිණුමට ගෙවීම් | 514,932 | 7,922,400 |
| පොදු තැන්පත් ගිණුම | 1,616,996 | 42,142,771 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුළු මුදල (එ) | **834,905,267** | **982,324,792** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ) = ( ඌ - එ) | (707,828,432) | (767,144,574) |
| | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය (ඔ) = (උ+ඒ) | 1,803,133,765 | (655,682,982) |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | 1,310,926,805 | 1,966,609,787 |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **3,114,060,571** | **1,310,926,805** |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රුපියල්

| සටහන් - 01 – දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | 2023 | 2022 |
|---|---|---|
| මුදල් සහ මුදල් හා සමාන දෑ (01+02+03) | 5,124,620,903 | 3,137,131,557 |
| **01. මුදල් හා බැංකු ශේෂය** | **3,114,060,571** | **1,310,926,805** |
| ලංකා බැංකුව අනුරාධපුර ජංගම ගිණුම් අංක- 1472190 | 2,826,400,312 | 1,208,631,373 |
| මහජන බැංකුව අනුරාධපුර ජංගම ගිණුම් අංක-00810019172447 | 287,537,479 | 102,157,637 |
| ලංකා බැංකුව අනුරාධපුර ජංගම ගිණුම් අංක-1472491 | 122,780 | 137,795 |
| **02. පළාත් දෙපාර්තමේන්තු වල නිරවුල් නොකළ අග්‍රිම ශේෂය** | **27,478,709** | **27,780,867** |
| 610-ප්‍රධාන අමාත්‍යාංශය | 26,405,861 | 26,405,861 |
| 620-පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 1,072,848 | 1,072,848 |
| 650- පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | - | 302,158 |
| **03. කෙටිකාලීන ආයෝජන** | **1,983,081,623** | **1,798,423,885** |
| ස්ථාවර තැන්පතු මත ආයෝජන(ගිණුම් අංකය/බැංකුව/ශාඛාව) | | |
| 89947799-ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව,අනුරාධපුර. | 499,333,384 | 409,871,082 |
| 008-60-01-00032407-0 මහජන බැංකුව, අනුරාධපුර. | 483,748,239 | 388,552,802 |
| 88961024-ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව,අනුරාධපුර. | 500,000,000 | 500,000,000 |
| 89899984-ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව,අනුරාධපුර. | - | 500,000,000 |
| 008-60-01-00032520-2 මහජන බැංකුව, අනුරාධපුර. | 500,000,000 | - |

| සටහන 02 – දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් | 2023 | 2022 |
|---|---|---|
| **දේශීය භාණ්ඩ හා සේවා මත බදු සහ බදු නොවන ආදායම** | **206,371,837** | **75,397,260** |
| ආයෝජන පොළී | 206,371,837 | 75,397,260 |

උපලේඛණ (01)

රුපියල්

| සටහන් 03 - දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රදාන/ රේඛීය අමාත්‍යාංශ අරමුදල් | 2023 | 2022 |
|---|---|---|
| ලැබිය යුතු ප්‍රදාන/ රේඛීය අමාත්‍යාංශ අරමුදල් | - | - |
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | - | - |
| කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | - | - |
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | - | - |

උපලේඛණ (05)

රුපියල්

| සටහන් 04 - දෙසැම්බර් 31 දිනට කලින් ගෙවීම් | 2023 | 2022 |
|---|---|---|
| **දෙසැම්බර් 31 දිනට කලින් ගෙවීම්** | **8,593,728** | **10,658,434** |
| ආහාරපාන සහ නිල ඇඳුම් වියදම් | - | 1,261,325 |
| වෙනත් සැපයීම් සේවා | - | 191,809 |
| වාහන නඩත්තු වියදම් | - | - |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | - | 37,092 |
| තැපල් හා සන්නිවේදන වියදම් | 20,000 | 915,936 |
| බදු කුලී, පළාත් පාලන ආයතන බදු වියදම් | 302,832 | 304,797 |
| වෙනත් ගිවිසුම් සේවා වියදම් | 8,270,896 | 7,947,475 |
| යටිතල පහසුකම් වත්කම් නඩත්තු වියදම් | - | - |

උපලේඛණ(03)

රුපියල්

| සටහන - 05 - දෙසැම්බර් 31 දිනට වෙනත් ජංගම වත්කම් | 2023 | 2022 |
|---|---|---|
| වෙනත් ජංගම වත්කම්(01+02+03) | 1,719,642,524 | 1,840,571,783 |
| **01.පළාත් රාජ්‍ය නිළධාරීන්ට අත්තිකාරම්** | **1,700,982,109** | **1,822,426,299** |
| 5005- පළාත් භාණ්ඩාගාරය-IPLT-NPC | - | - |
| 5008- පළාත් භාණ්ඩාගාරය-IPLT-CPS | (2,665,335) | (811,588) |
| 60001-ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | 2,422,951 | 3,066,910 |
| 60101-පළාත් සභා ලේකම් කාර්යාලය | 4,640,032 | 4,561,095 |
| 60201- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 5,263,314 | 5,133,298 |
| 60301-පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව | 1,109,700 | 1,318,620 |
| 61001-ප්‍රධාන අමාත්‍යාංශය | 15,494,481 | 15,257,921 |
| 61101-පළාත් පාලන දෙපාර්තමේන්තුව | 68,253,518 | 80,062,453 |
| 61201-පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 928,482,101 | 1,064,922,295 |
| 61211-පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 101,930,309 | 105,492,321 |
| 61301- පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 3,019,095 | 3,226,279 |
| 62001- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 6,517,406 | 6,972,736 |
| 62101- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 33,351,593 | 31,479,133 |
| 62201-පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 31,657,569 | 35,034,844 |
| 63001-පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 7,642,008 | 8,016,982 |
| 63101- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 216,021,557 | 174,781,231 |
| 63201-පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 41,875,594 | 41,476,912 |
| 63301-පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 14,431,628 | 14,479,560 |
| 63401-පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 22,400,247 | 21,720,087 |
| 64001-පළාත් ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යාංශය | 7,693,177 | 6,646,027 |
| 64101- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 14,663,162 | 15,711,084 |
| 64201-පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 16,336,530 | 19,048,552 |
| 64301- පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 12,752,935 | 10,457,266 |
| 65001- පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | 10,130,612 | 9,357,933 |
| 65101- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 14,060,225 | 14,876,246 |
| 65201- පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 14,121,733 | 14,497,625 |
| 65301-පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 10,391,139 | 11,377,573 |
| 66001- ප්‍රධාන ලේකම් කාර්යාලය | 47,639,469 | 48,095,122 |
| 66101-පළාත් භාණ්ඩාගාරය | 5,493,085 | 5,442,976 |
| 66201-පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 7,197,578 | 7,893,443 |
| 66301-පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 24,141,383 | 27,618,560 |
| 66401- පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 6,676,952 | 7,051,679 |
| 66501- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 7,836,361 | 8,161,126 |
| **02.අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ණය** | **18,660,415** | **18,145,483** |
| රජරට එෆ්.එම්.අත්තිකාරම් | - | - |
| කෘෂි සංවර්ධන අත්තිකාරම් | - | (514,932) |
| සත්ව සංවර්ධන අත්තිකාරම් | - | - |
| ජේෂ කර්මාන්ත කටයුතු අත්තිකාරම් | 19,533,315 | 19,533,315 |
| වඩු පාසල් අත්තිකාරම් කටයුතු | (872,900) | (872,900) |
| තාර මිලට ගැනුම් අත්තිකාරම් | - | - |
| තත්ව පාලන අත්තිකාරම් ගිණුම - වාරිමාර්ග | - | - |
| තත්ව පාලන අත්තිකාරම් ගිණුම -ඉංජිනේරු | - | - |

**සටහන - 06 - යටිතල, පිරියත හා උපකරණ** රුපියල්

| විස්තරය | 2023.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | | | | අඩු කිරීම් | | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පසුව හඳුනාගත් වත්කම් | වර්ෂයේ වියදම් | ආධාර ලැබීම් | ඔධ්‍යම රජයෙන් සහ වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/විශේෂ ව්‍යාපෘති මඟින් ලැබීම් | අපහරණය කිරීම | වෙනත් ආයතන වෙත ලබා දීම් | |
| | (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8)=(1+2+3+4+5-6-7) |
| වාහන | 1,846,555,659 | 756,465,600 | - | 6,500,000 | | 31,621,142 | 9,800,000 | 2,568,100,117 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 2,288,024,260 | 117,150 | 326,819,129 | - | - | 2,697,099 | 1,586,400 | 2,610,677,040 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 307,101,728 | 27,194,109 | 33,461,532 | - | | 282,852 | | 367,474,517 |
| **එකතුව** | **4,441,681,647** | **783,776,859** | **360,280,660** | **6,500,000** | **-** | **34,601,092** | **11,386,400** | **5,546,251,674** |

**උපලේඛණ (07)**

## සටහන - 07 - ඉඩම් හා ගොඩනැගිලි

රුපියල්

| විස්තරය | 2023.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | | | | අඩු කිරීම් | | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පසුව හඳුනාගත් වත්කම් | නිම කළ වැඩ | ආධාර ලැබීම් | ඕධ්‍යම රජයෙන් සහ වෙනත් අමාත්‍යංශ/දෙපාර්තමේන්තු/විශේෂ ව්‍යාපෘති මඟින් ලැබීම් | අපහරණය කිරීම | වෙනත් ආයතන වෙත ලබා දීම් | |
| | (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8)=(1+2+3+4+5-6-7) |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6,888,803,394 | - | 1,334,138 | | | | | 6,890,137,532 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 13,976,142,606 | - | | | | | | 13,976,142,606 |
| එකතුව | **20,864,946,000** | - | **1,334,138** | - | - | - | - | **20,866,280,137** |

උපලේඛණ (07)

## සටහන - 07.1 - නොනිමි වැඩ

රුපියල්

| විස්තරය | 2023.01.01 දිනට ආරම්භක ශේෂය | වර්ෂයට අදාල වියදම් | නිම කළ වැඩ | | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | පසුගිය වර්ෂයෙන් හඳුනාගත් | මෙම වර්ෂයෙන් හඳුනාගත් | |
| | (1) | (2) | (3) | (4) | (5)=(1+2-3-4) |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,604,677,259 | 777,147,086 | 1,334,138 | - | 2,380,490,208 |
| එකතුව | **1,604,677,259** | **777,147,086** | **1,334,138** | - | **2,380,490,208** |

## සටහන - 08 - අස්පෘශ්‍ය වත්කම්

| | 2023 | 2022 |
|---|---|---|
| **2023.12.31 දිනට ශේෂය** | **12,006,843** | **12,006,843** |
| වර්ෂ ආරම්භයේ ශේෂය | 12,006,843 | 12,006,843 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | - |

## සටහන - 09 – දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දෑ

| | 2023 | 2022 |
|---|---|---|
| **දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දෑ** | **92,237,934** | **267,143,576** |
| වැටුප් හා වේතන වියදම් | 456,120 | 7,032,865 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් වියදම් | 2,844,883 | 23,198,784 |
| වෙනත් දීමනා වියදම් | 12,167,791 | 55,310,206 |
| දේශීය ගමන් වියදම් | 1,116,845 | 3,124,568 |
| විදේශීය ගමන් වියදම් | - | 58,708 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වියදම් | 144,211 | 895 |
| ඉන්ධන වියදම් | 4,313,043 | 1,916,626 |
| ආහාරපාන හා නිළ ඇඳුම් වියදම් | 1,630,741 | 2,711,978 |
| වෛද්‍ය සැපයීම් වියදම් | 10,326,141 | 13,159,254 |
| වෙනත් සැපයීම් වියදම් | 374,421 | 3,124,126 |
| වාහන නඩත්තු වියදම් | 1,572,130 | 15,242,202 |
| යාන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 325,575 | 578,465 |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | - | 22,500 |
| වෙනත් නඩත්තු වියදම් | - | 30,000 |
| තැපැල් හා සන්නිවේදන වියදම් | 21,941,011 | 4,089,595 |
| විදුලිය හා ජලය වියදම් | 16,840,441 | 10,410,197 |
| බදු කුලී, ප.පා.ආයතන බදු වියදම් | 63,468 | 474,659 |
| වෙනත් සැපයීම් වියදම් | 5,851,155 | 13,671,266 |
| සුභසාධක වැඩසටහන් වියදම් | 40,297 | - |
| රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම වියදම් | - | 1,770,574 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වියදම් | 1,326,465 | 11,720,973 |
| යටිතල පහසුකම් වත්කම් අලුත්වැඩියා කිරීම වියදම් | 7,402,115 | 52,705,350 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | 32,454,880 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | 27,500 | - |
| යටිතල පහසුකම් වත්කම් | 2,340,057 | 1,291,670 |
| සංවර්ධන සහනාධාර | 17,950 | 8,278 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | - | 6,735,279 |
| සංවර්ධන සහයයන් සඳහා වියදම් | 1,115,574 | 6,299,678 |

උපලේඛණ(04)

රුපියල්

| සටහන - 10 – තැන්පතු ගිණුම් | 2023 | 2022 |
|---|---|---|
| | **499,644,087** | **543,403,854** |
| 600 - ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | - | - |
| 601 - පළාත් සභාව සහ සභා ලේකම් කාර්යාලය | - | - |
| 602- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | 20,000 |
| 603- සමූපකාර සේවක කොමිෂන් සභාව | 20,898 | |
| 610-ප්‍රධාන අමාත්‍යාංශය | 127,050,152 | 155,725,515 |
| 611-පළාත් පාලන දෙපාර්තමේන්තුව | 12,387,660 | 23,910,595 |
| 612- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 35,525,618 | 35,918,783 |
| 613- පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 229,031 | - |
| 620-පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 1,350,988 | 187,827 |
| 621- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 16,712,010 | 8,301,915 |
| 622-පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 1,421,391 | 2,468,687 |
| 630-පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | - | - |
| 631- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 183,722,218 | 137,225,841 |
| 632-පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 7,026,817 | 8,569,130 |
| 633-පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 3,016,107 | 4,776,043 |
| 634-පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 4,271,683 | 6,493,651 |
| 640-පළාත් ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යාංශය | - | 318,000 |
| 641- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 15,572,669 | 13,924,666 |
| 642-පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 726,211 | 2,635,860 |
| 643-පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | - | 299,092 |
| 650-පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | 3,662,786 | 22,086,088 |
| 651-පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 34,580,872 | 15,967,230 |
| 652-පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | - | 218,676 |
| 653-පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 31,831 | 17,032 |
| 660-ප්‍රධාන ලේකම් කාර්යාලය | 14,788,382 | 14,773,092 |
| 661-පළාත් භාණ්ඩාගාරය | 33,096,851 | 44,236,741 |
| 663-පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 4,207,731 | 3,169,621 |
| 665- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 242,182 | 17,000 |

| සටහන - 11 - වැන්දඹු හා අනත්දරු අරමුදල | 2023 | 2022 |
|---|---|---|
| **වැන්දඹු හා අනත්දරු දායක මුදල්** | **77,199,459** | **72,785,858** |
| වර්ෂ ආරම්භයේ ශේෂය | 33,970,743 | 72,785,858 |
| වර්ෂය තුල එකතු කිරීම් | 875,802,055 | 893,244,506 |
| වර්ෂය තුල ප්‍රේෂණය කිරීම් | (832,573,339) | (932,059,621) |

රුපියල්

| සටහන - 12 ගෙවිය යුතු අරමුදල් | 2023 | 2022 |
|---|---|---|
| **වෙනත් වගකීම්** | **396,162,719** | **422,273,821** |
| රණවිරු සුභසාධන අරමුදල ජංගම ගිණුම | 122,780 | 137,795 |
| ලෝක බැංකු අරමුදල් | 271,181,740 | 69,436,826 |
| විශේෂ ප්‍රදාන | - | 77,725,069 |
| වෙනත් ප්‍රදාන - රේඛීය අමාත්‍යාංශ සහ වෙනත් දෙපාර්තමේන්තු | 124,858,199 | 2,967,027 |

**උපලේඛණ(02) සහ (05)**

රුපියල්

| සටහන - 13 ක්ෂය සංචිත අරමුදල | 2023 | 2022 |
|---|---|---|
| **ක්ෂය සංචිත අරමුදල** | **52,972,767** | **47,827,265** |
| වර්ෂ ආරම්භයේ ශේෂය | 47,827,265 | 37,864,200 |
| වර්ෂය තුල එකතු කිරීම් | 5,145,502 | 9,963,065 |

රුපියල්

| සටහන - 14 බදු ආදායම - දේශීය භාණ්ඩ හා සේවා මත බදු | | | | |
|---|---|---|---|---|
| ආදායම් විස්තරය | 2022.12.31 ලැබිය යුතු ආදායම් | 2023 වර්ෂය තුල ලැබීම් | 2023.12.31 දිනට ලැබිය යුතු ආදායම් | 2023 වර්ෂයට අදාල ආදායම් |
| මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | - | 64,644,897 | - | 64,644,897 |
| මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම | - | 44,913,390 | - | 44,913,390 |
| මුද්දර ආදායම් | - | 546,170,058 | - | 546,170,058 |
| දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | - | 264,755,846 | - | 264,755,846 |
| අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | - | 6,162,817 | - | 6,162,817 |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | - | 306,652 | - | 306,652 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | 1,516,815 | - | 1,516,815 |
| මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | - | 888,857,387 | - | 888,857,387 |
| වෙනත් බලපත්‍ර ගාස්තු | - | 1,720 | - | 1,720 |
| උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු | - | 1,290,500 | | 1,290,500 |
| **මුළු බදු ආදායම** | **-** | **1,818,620,082** | **-** | **1,818,620,082** |

රුපියල්

| සටහන - 15 බදු නොවන ආදායම - ගාස්තු, දඩ සහ බලපත්‍ර | | | | |
|---|---|---|---|---|
| ආදායම් විස්තරය | 2022.12.31 ලැබිය යුතු ආදායම් | 2023 වර්ෂය තුල ලැබීම් | 2023.12.31 දිනට ලැබිය යුතු ආදායම් | 2023 වර්ෂයට අදාල ආදායම් |
| නිවාස කුලී | - | 36,482,414 | - | 36,482,414 |
| ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු | - | 299,239,209 | - | 299,239,209 |
| රජයේ නිලධාරීන්ගේ ණය හා අත්තිකාරම් පොලී | - | 65,258,950 | - | 65,258,950 |
| ආයෝජන පොලී | 143,651,849 | 447,698,157 | 206,371,837 | 510,418,145 |
| වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ආදායම් | - | - | - | - |
| විභාග ගාස්තු | - | 5,512,100 | - | 5,512,100 |
| වෛද්‍ය ආඥා පනත යටතේ අයකරන ගාස්තු | - | 800,860 | - | 800,860 |
| ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද | - | 2,189,306 | - | 2,189,306 |
| ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | 3,328,719 | - | 3,328,719 |
| ඛණිජ සම්පත් මත බදු | - | 11,599,530 | - | 11,599,530 |
| විවිධ ලැබීම් | - | 113,883,253 | - | 113,883,253 |
| උසාවි දඩ | - | 619,569,647 | - | 619,569,647 |
| මෝටර් වාහන මත දඩ | - | 80,492,353 | - | 80,492,353 |
| ප්‍රයෝජනයට ගත නොහැකි ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් | - | 9,316,151 | - | 9,316,151 |
| **බදු නොවන ආදායම් එකතුව** | **143,651,849** | **1,695,370,648** | **206,371,837** | **1,758,090,635** |
| | | | | |
| **එකතුව** | **143,651,849** | **3,513,990,729** | **206,371,837** | **3,576,710,717** |

| සටහන - 16 අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගේ හුවමාරු කිරීම් | 2023 | 2022 |
|---|---|---|
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | |
| **සාමූහික ප්‍රදාන** | **24,990,793,680** | **23,144,893,320** |
| රජයේ ප්‍රදාන - මූලධන | | |
| පළාත් සභා සංවර්ධන ප්‍රදාන (උපමාන පාදක ප්‍රදාන) | 171,500,000 | 106,400,000 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 990,150,000 | 613,500,000 |
| ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව | 1,643,255,087 | 868,120,656 |
| ශ්‍රී ලංකා රජය/ආසියානු සංවර්ධන බැංකු අරමුදල් | - | - |
| විශේෂ ප්‍රදාන | 77,725,069 | 352,152,863 |
| **එකතුව - රජයේ ප්‍රදාන - මූලධන** | **2,882,630,155** | **1,940,173,519** |
| (-)ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා ලද ප්‍රදාන | (1,124,485,997) | (1,016,872,523) |
| **එකතුව - ආයෝජනය සඳහා රජයේ ප්‍රදාන** | **1,758,144,159** | **923,300,997** |
| **අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගේ හුවමාරු කිරීම්** | **26,748,937,839** | **24,068,194,317** |

උපලේඛණ (02)

රුපියල්

| සටහන -17 රේඛීය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබූ ප්‍රදාන | 2023 | 2022 |
|---|---|---|
| **රේඛීය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබූ ප්‍රදාන** | **1,817,567,372** | **684,444,621** |
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය | 21,514,340 | 21,477,430 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | - | 412,832 |
| කෘෂිකර්ම අමාත්‍යංශය | 1,098,299,288 | 274,673,281 |
| පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය | 529,951,283 | 290,870,000 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 48,583,717 | 77,280,375 |
| බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යංශය | - | 17,480,000 |
| පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 326,117 | 1,686,247 |
| ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය | - | 3,238,026 |
| වාරිමාර්ග අමාත්‍යංශය | 164,289,257 | 15,500,000 |
| ක්‍රිඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | - | 3,300,000 |
| (-)ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා ලද ප්‍රදාන | (45,396,630) | (21,473,570) |
| **වෙනත්** | **2,814,251** | **3,819,057** |
| ක්‍රිඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 500,000 | - |
| විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2,174,751 | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව | 139,500 | - |
| දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය-උ.මැ.ප | - | 3,819,057 |
| 01. එකතුව | **1,820,381,623** | **688,263,678** |
| 02. බදු ප්‍රදාන | - | - |
| 01 + 02 වෙනත් අයභාර | **1,820,381,623** | **688,263,678** |

උපලේඛණ (05)

රුපියල්

| සටහන -18 වෙනත් අයභාර | 2023 | 2022 |
|---|---|---|
| **වත්කම් ආධාර / පරිත්‍යාග ලැබීම්** | | |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | | 336,250 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 1,650,000 |
| වාහන | 6,500,000 | |
| **මධ්‍යම රජය/රේඛීය අමාත්‍යංශ/විශේෂ ව්‍යාපෘති මඟින් ලද වත්කම්** | - | - |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | | 6,662,040 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - |
| **එකතුව** | **6,500,000** | **8,648,290** |

රුපියල්

| සටහන -19 වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 2023 | 2022 |
|---|---|---|
| වැටුප් හා වේතන | 14,155,505,412.43 | 14,497,760,848 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,861,396,872.98 | 1,867,192,414 |
| වෙනත් දීමනා | 5,383,748,384.81 | 5,530,033,183 |
| **එකතුව** | **21,400,650,670.22** | **21,894,986,445** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 20 ගමන් වියදම් | 2023 | 2022 |
|---|---|---|
| දේශීය ගමන් වියදම් | 223,975,960 | 189,084,600 |
| විදේශීය ගමන් වියදම් | 581,335 | 1,346,196 |
| **එකතුව** | **224,557,295** | **190,430,796** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 21 සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය | 2023 | 2022 |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වියදම් | 137,908,845 | 103,941,903 |
| ඉන්ධන වියදම් | 434,503,343 | 355,018,087 |
| ආහාර පාන හා නිළ ඇඳුම් | 225,054,347 | 164,657,807 |
| වෛද්‍ය සැපයීම් වියදම් | 186,712,963 | 132,747,865 |
| වෙනත් සැපයීම් වියදම් | 57,620,050 | 59,079,095 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපාංග/යෙදවුම් වියදම් | 2,816,052 | 897,281 |
| **එකතුව** | **1,044,615,599** | **816,342,039** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 22 නඩත්තු වියදම් | 2023 | 2022 |
|---|---|---|
| වාහන නඩත්තු වියදම් | 217,743,291 | 161,373,497 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු විදම් | 43,336,122 | 27,409,376 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් | 226,263,518 | 224,826,738 |
| වෙනත් නඩත්තු වියදම් | 145,414,226 | 343,309,182 |
| ගුණාත්මක යෙදවුම් | 75,200,000 | 80,000,000 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වියදම් | 551,397,293 | 322,376,379 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීමේ වියදම් | 23,182,343 | 7,497,416 |
| වාහන අලුත්වැඩියා කිරීමේ වියදම් | 403,256 | 1,983,449 |
| වෙනත් මූලධන වත්කම් වැඩිදියුණු කිරීමේ වියදම් | - | - |
| යටිතල පහසුකම් වත්කම් අලුත්වැඩියා කිරීමේ වියදම් | 258,281,648 | 128,336,303 |
| ඉඩම් වැඩි දියුණු කිරීම | 14,934,052 | - |
| වෙනත් මූලධන වියදම් | 12,278,466 | 9,507,947 |
| යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 46,804,865 | 4,625,010 |
| **එකතුව** | **1,615,239,080** | **1,311,245,295** |

උපලේඛණ (06)

*මූලාශ්‍රය - 2023 මූල්‍ය ප්‍රකාශනය .උ.මැ.ප

රුපියල්

| සටහන - 23 ගිවිසුම් සේවා | 2023 | 2022 |
|---|---|---|
| ප්‍රවාහන වියදම් | 22,445,263 | 32,473,082 |
| තැපැල් හා සන්නිවේදන වියදම් | 105,380,642 | 72,360,043 |
| විදුලිය හා ජලය වියදම් | 325,970,246 | 146,658,309 |
| බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වියදම් | 5,488,718 | 6,600,423 |
| වෙනත් ගිවිසුම් සේවා සඳහා වියදම් | 576,634,266 | 438,935,969 |
| **එකතුව** | **1,035,919,134** | **697,027,826** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 24 මාරුකිරීම් | 2023 | 2022 |
|---|---|---|
| සුභ සාධක වැඩසටහන් සඳහා වියදම් | 1,569,799,608 | 323,016,305 |
| රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් සඳහා වියදම් | 1,172,033,698 | 1,278,746,857 |
| සංවර්ධන සහනාධාර සඳහා වියදම් | 266,963,938 | 269,725,001 |
| රාජ්‍ය සේවකයින් සඳහා දේපල ණය පොලී සඳහා වියදම් | 46,715,676 | 51,844,428 |
| වෙනත් මාරු කිරීම් සඳහා වියදම් | - | - |
| ප්‍රදාන ලබා දීම් සඳහා වියදම් | 19,567,031 | 17,844,279 |
| රාජ්‍ය ආයතන වලට මාරු කිරීම් සඳහා වියදම් | 1,675,292,502 | 678,132,476 |
| සංවර්ධන සභායන් සඳහා වියදම් | 172,866,328 | (38,044,790) |
| **එකතුව** | **4,923,238,781** | **2,581,264,556** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 25 සහනාධාර | 2023 | 2022 |
|---|---|---|
| පාඩු හා කපාහැරීම් වියදම් | 2,847,148 | 925,060 |
| **එකතුව** | **2,847,148** | **925,060** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 26 පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2023 | 2022 |
|---|---|---|
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධන වියදම් | 121,572,148 | 155,435,158 |
| **එකතුව** | **121,572,148** | **155,435,158** |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 27 වෙනත් වියදම් | 2023 | 2022 |
|---|---|---|
| පළාත් සංවර්ධන යෙදවුම් වියදම් | - | - |
| වෙනත් වියදම් | - | - |
| එකතුව | - | - |

උපලේඛණ (06)

රුපියල්

| සටහන - 28 වත්කම් ඉවත් කිරීම | 2023 | 2022 |
|---|---|---|
| **වත්කම් අපහරණය කිරීම** | | |
| වාහන | 41,421,142 | - |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 4,283,499 | 7,667,406 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 282,852 | 52,500 |
| එකතුව | **45,987,492** | **7,719,906** |

*මූලාශ්‍රය - 2023 මූල්‍ය ප්‍රකාශනය .උමැ.ප

<u>මූල්‍ය ප්‍රකාශනයන්ට අදාල හෙලිදරව් කිරීම්</u>

**D1 -** වත්කම් කළමණාකරණ මෘදුකාංගය මඟින් පසුව හඳුනාගත් රු.**783,776,859.00** ක් වටිනා වත්කම් ගිණුම්ගත කිරීම.

**D2 -** **2022** මූල්‍ය ප්‍රකාශනවල **2023.12.31** දිනට ලැබිය යුතු ආයෝජන පොළී අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීම.

**D3 -** **2022** මූල්‍ය ප්‍රකාශනවල **2023.12.31** දිනට ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාළව ඉදිරියට කල වියදම් රු.**377,415.00** වැඩියෙන් සටහන් කිරීම නිවැරදි කිරීම.

**D4 -** ප්‍රධාන අමාත්‍යාංශයට හා ප්‍රධාන ලේකම් කාර්යාලට අදාළව දෙවරක් ඇතුලත් කර තිබු වාහන හතරක වටිනාකම ආරම්භක ශේෂයට ගැලපීම හා **2022** වර්ෂයේ වාහන ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම.

*මූලාශ්‍රය - 2023 මූල්‍ය ප්‍රකාශනය .උමැ.ප

## 3.5 ආදායම් සමාලෝචනය



ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 36 වන වගන්තියෙන් පළාත් සභා වලට පැවරී ඇති ආදායම් සහ 1990 අංක 13 දරන බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳ මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව සහ 2003 අංක 03 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවට අයකල හැකි බදු හා බදු නොවන ආදායම් ද, 2023 වර්ෂය තුලදී මධ්‍යම රජයේ ඇස්තමේන්තුවෙන් වෙන්වන ප්‍රතිපාදනයට අදාලව පුනරාවර්තන සහ මූලධන සඳහා රජයේ ප්‍රතිපාදනයන්ගෙන් ලැබෙන මුදල් ද, රේඛීය අමාත්‍යාංශ මඟින් ලැබීම් හා වෙනත් අයභාර වලින් ලැබීම්ද, පරිත්‍යාග වශයෙන් වත්කම් ලෙස පළාත් සභාව වෙත ලැබීම් ද යන සියල්ල පළාත් සභා අයභාරය ලෙස ගිණුම්ගත කර ඇත.

### 3.5.1 පළාත් සභා අයභාරය



## පළාත් සභා අයභාරය -2023

2023 වර්ෂයට අදාලව උතුරු මැද පළාත් සභාවේ මුළු අයභාරය රු.මිලියන 32,152.53 ක් වන අතර,එය

- දේශීය භාණ්ඩ හා සේවා මත පනවා ඇති බදු ආදායම රු.මිලියන 1,818.62 කින් ද,
- ගාස්තු දඩ හා බලපත්‍ර සඳහා වූ බදු නොවන ආදායම රු.මිලියන 1,758.09 කින් ද,
- අනෙකුත් රාජ්‍ය අස්ථිත්වයන්ගේ හුවමාරු කිරීම් යටතේ රු.මිලියන 26,748.93 කින්ද,
- රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් ප්‍රදාන යටතේ ආදායම රු.මිලියන 1,820.38 කින් ද,
- වෙනත් අයභාර යටතේ වූ රු.මිලියන 6.5 කින්ද සමන්විත වේ.

එය 2022 වර්ෂයේ මුළු අයභාර වූ රුපියල් මිලියන 27,519.45 සාපේක්ෂව ගත්කළ රු.මිලියන 4,633.08 ක වැඩිවීමකි.




2023 වර්ෂයේ දී රටේ පැවති ආර්ථික අර්බුදයට පිළියම් සෙවීමක් වශයෙන් 2023 වර්ෂයේ සිදු කරන ලද බදු සංශෝධනයන් නිසා බදු ව්‍යුහය සැලකිය යුතු ලෙස වෙනස් වූ අතර දඩ හා ගාස්තු අයකිරීම් ඉහල දැමීම මත පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම ඉහල ගොස් ඇත.



## 3.5.2 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | | |
| සටහන 1- | **නිෂ්පාදන වියදම් මත බදු** | | | | |
| **1002-05-04** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම | 62,000 | 62,000 | 44,913 | 72 % |
| **1002-07-00** | මුද්දර ආදායම් | 563,000 | 563,000 | 546,170 | 97 % |
| **1002-12-00** | ජාතිය ගොඩනැගීමේ බද්ද | - | - | 1,517 | |
| **1003-07-09** | වෙනත් බලපත්‍ර ගාස්තු | - | - | 2 | |
| | බදු ආදායම් එකතුව | **625,000** | **625,000** | **592,602** | **95 %** |
| සටහන 2- | **බදු නොවන ආදායම්** | | | | |
| **2002-01-01** | නිවාස කුලී | 37,000 | 37,000 | 36,482 | 99% |
| **2002-02-02** | රජයේ නිලධාරින්ගේ ණය හා අත්තිකාරම් පොලී | 75,000 | 75,000 | 65,259 | 87 % |
| **2002-02-03** | ආයෝජන පොලී | 200,000 | 200,000 | 447,698 | 224 % |
| **2003-02-29** | විවිධ ලැබීම් | 20,000 | 20,000 | 113,883 | 569 % |
| **2006-02-00** | ප්‍රයෝජනයට ගත නොහැකි ප්‍රග්ධන භාණ්ඩ විකුණුම් | 2,500 | 2,500 | 9,316 | 373 % |
| | බදු නොවන ආදායම් එකතුව | **334,500** | **334,500** | **672,639** | **201%** |
| | මුළු ආදායම | **959,500** | **959,500** | **1,265,241** | **132 %** |

## පසුගිය වසර 05 ක ආදායම් විචල්‍යයන්

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| සටහන - 1 | නිෂ්පාදන වියදම් මත බදු | | | | | |
| 1002-05-04 | මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම | 92,550,601 | 84,647,262 | 64,902,862 | 26,045,878 | 44,913,390 |
| 1002-07-00 | මුද්දර ආදායම් | 469,931,172 | 416,834,310 | 469,966,995 | 465,805,701 | 546,170,058 |
| 1002-12-00 | ජාතිය ගොඩනැඟීමේ බද්ද | 1,625,876,244 | 136,317,605 | 9,521,752 | 8,562,977 | 1,516,815 |
| 1003-07-09 | වෙනත් බලපත්‍ර ගාස්තු | 650 | 2,400 | 1,050 | 1,750 | 1,720 |
| **බදු ආදායම් එකතුව** | | **2,188,358,667** | **637,801,577** | **544,392,659** | **500,425,306** | **592,601,983** |
| සටහන - 2 | බදු නොවන ආදායම් | | | | | |
| 2002-01-01 | නිවාස කුලී | 26,752,771 | 35,550,849 | 36,660,713 | 34,284,733 | 36,660,170 |
| 2002-02-02 | රජයේ නිලධාරීන්ගේ ණය හා අත්තිකාරම් පොලී | 73,453,214 | 65,657,904 | 75,354,921 | 81,293,944 | 67,133,877 |
| 2002-02-03 | ආයෝජන පොලී | 71,357,486 | 202,039,802 | 132,140,452 | 215,363,844 | 447,698,157 |
| 2003-02-29 | විවිධ ලැබීම් | 2,049,605 | 2,010,010 | 92,216,806 | 117,613,128 | 121,848,041 |
| 2006-02-00 | ප්‍රයෝජනයට ගත නොහැකි ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් | 2,870,061 | 2,997,078 | 3,591,511 | 1,947,624 | 9,316,151 |
| **මුළු ආදායම** | | **2,364,841,804** | **946,057,220** | **884,357,062** | **950,918,579** | **1,275,258,379** |

## බදු ආදායම

දේශීය භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදු මඟින් සමාලෝචිත වර්ෂය තුල රු.1,818,620,082ක වූ ආදායමක් ලබා ගෙන ඇති අතර, එය පූර්ව වර්ෂයේ සමස්ථ බදු ආදායම වන රු 1,483,567,966.23 හා සැසඳීමේදී රු. මිලියන 335.05 ක වර්ධනයකි.

**දේශීය භාණ්ඩ හා සේවා මත බදු ආදායම**

| ආදායම් විස්තරය | 2023 | 2022 | වෙනස් වීම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 64,644,897 | 73,229,027.01 | (11.27) |
| මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම | 44,913,390 | 26,045,877.55 | 72.44 |
| මුද්දර ආදායම් | 546,170,058 | 465,805,700.94 | 17.25 |
| දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | 264,755,846 | 208,376,786.06 | 27.06 |
| අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 6,162,817 | 4,927,450.00 | 25.07 |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | 306,652 | 127,886.00 | 139.79 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 1,516,815 | 8,561,976.63 | (82.28) |
| මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | 888,857,387 | 695,664,512.04 | 27.77 |
| වෙනත් බලපත්‍ර ගාස්තු | 1,720 | 1,750.00 | (1.71) |
| උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු | 1,290,500 | 827,000.00 | 56.05 |
| **මුළු බදු ආදායම** | **1,818,620,082** | **1,483,567,966.23** | **22.58** |

* මූලාශ්‍රය-2023 මූල්‍ය ප්‍රකාශය-උ.මැ.ප



සමාලෝචිත වර්ෂයේ බදු ආදායම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී,

- ✓ මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම
- ✓ මුද්දර ආදායම්
- ✓ දේපළ පැවරීම මත මුද්දර ගාස්තු
- ✓ අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු
- ✓ ව්‍යාපාර පිරිවැටුම් බදු
- ✓ මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු
- ✓ උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

සඳහා ලද ආදායම ඉහළ ගොස් ඇති අතර,

- ➢ මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු පැවරීම
- ➢ ජාතිය ගොඩ නැගීමේ බදු
- ➢ වෙනත් බලපත්‍ර ගාස්තු

පහළ වර්ධන ආදායමක් පෙන්නුම් කර ඇත.

මෙහිදී ව්‍යාපාර පිරිවැටුම් බදු සඳහා ලද ආදායම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 100% කට වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති අතර, මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම සඳහා ලද බදු ආදායම හා උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සඳහා ලද බදු ආදායම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 50% කට වැඩි ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇත.

තවද ජාතිය ගොඩ නැගීමේ බදු පනත මඟින් ලද ආදායම පළාත් සභා වලට නොලැබී යාම හේතුවෙන් ඊට අදාල ආදායමද 82% වැඩි මට්ටමකින් පහළ ගොස් ඇත.




තවද පසුගිය වසර කිහිපය තුල හිමිකරගත් දේශීය භාණ්ඩ හා සේවා මත අයවන බදු ආදායම සමඟ සමාලෝචි වර්ෂය සැසඳීමේදී, ආදායම් මට්ටම සාපේක්ෂව ඉහළ අගයක් පෙන්නුම් කරනු ලබයි. මෙහිදී වසර දෙකකට ආසන්න කාලයක් තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ 2021 දී බිඳ වැටී තිබූ ආර්ථික මට්ටම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පැවතීමත්, රටෙහි පවතින බදු ප්‍රතිපත්තියේ සිදුවූ තීරණාත්මක වෙනස්වීම් මෙන්ම රටේ ආර්ථිකය සහ බදු පරිපාලනය විසින් ගනු ලැබූ පියවරයන්හි කාර්යක්ෂමතාවයට හේතු සාධක වී ඇත.

## බදු නොවන ආදායම

ගාස්තු, දඩ සහ බලපත්‍ර මඟින් අයවන බදු නොවන ආදායම මඟින් සමාලෝචිත වර්ෂය තුල රු.1,758,090,635 ක වූ ආදායමක් ලබා ගෙන ඇති අතර, එය පූර්ව වර්ෂයේ සමස්ථ බදු නොවන ආදායම වන රු 1,270,775,872.39 හා සැසඳීමේදී රු. මිලියන 487.31 ක වර්ධනයකි.

| බදු නොවන ආදායම - ගාස්තු, දඩ සහ බලපත්‍ර | | | |
|---|---|---|---|
| ආදායම් විස්තරය | 2023 | 2022 | වෙනස් වීමේ ප්‍රතිශතය % |
| නිවාස කුලී | 36,482,414 | 34,284,733 | 6.41 |
| ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු | 299,239,209 | 221,599,700 | 35.04 |
| රජයේ නිලධාරීන්ගේ ණය හා අත්තිකාරම් පොලී | 65,258,950 | 81,293,944 | -19.72 |
| ආයෝජන පොලී | 510,418,145 | 289,158,364 | 76.52 |
| විභාග ගාස්තු | 5,512,100 | 35,100 | 15603.99 |
| වෛද්‍ය ආඥා පනත යටතේ අයකරන ගාස්තු | 800,860 | 685,650 | 16.80 |
| ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද | 2,189,306 | 1,530,554 | 43.04 |
| ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු | 3,328,719 | 1,621,195 | 105.33 |
| ඛණිජ සම්පත් මත බදු | 11,599,530 | 9,163,522 | 26.58 |
| විවිධ ලැබීම් | 113,883,253 | 117,613,128 | -3.17 |
| උසාවි දඩ | 619,569,647 | 450,458,735 | 37.54 |
| මෝටර් වාහන මත දඩ | 80,492,353 | 61,383,623 | 31.13 |
| ප්‍රයෝජනයට ගත නොහැකි ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් | 9,316,151 | 1,947,624 | 378.33 |
| **බදු නොවන ආදායම් එකතුව** | **1,758,090,635** | **1,270,775,872** | **38.35** |

*මූලාශ්‍රය -2023 මූල්‍ය ප්‍රකාශය. උ.මැ.ප

සමස්ථයක් වශයෙන් ගත්කළ සමාලෝචිත වර්ෂය තුල ලද බදු නොවන ආදායම 38.35% අගයකින් ඉහළ ගොස් ඇති අතර, මෙහිදි විභාග ගාස්තු වෙනුවෙන් ලද ආදායම, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු මත ලද ආදායම, ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විකුණුම් මඟින් ලද ආදායම පෙර වර්ෂය හා සැසඳීමේදී 100% වැඩි ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇති අතර, ආයෝජන මත ලද පොළී ආදායම 50% වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇත.




තවද 2021 වර්ෂයේදී රු.මිලියන 54.33 අඩු වූ බදු නොවන ආදායම, 2022 වර්ෂයේදී 32.46% කින්ද, 2023 වර්ෂයේදී 38.35% ලෙස ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර, රාජ්‍ය අංශයේ විවිධ ක්ෂේත්‍රයන් තුල පවතින පුරප්පාඩු සඳහා සීමිත, කුසලතා, මෙන්ම විවෘත පදනම මත නිලධාරීන් බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කිරීම හේතුවෙන් විභාග ගාස්තු ආදායම වැඩිවීමද, රාජ්‍ය බැංකු මඟින් ස්ථාවර තැන්පතු සඳහා ඉහළ පොළියක් ගෙවීම නිසා ආයෝජන ආදායම් වැඩිවීමද, පළාත් ඉඩම් දෙපාර්තමේන්තු හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් හිඟ ඉඩම් බදු අයකිරීමට කටයුතු කිරීමද, පරිපාලනය විසින් ගනු ලැබූ යම් පියවරයන් හි කාර්යක්ෂමතාවයද මීට හේතු සාධක වී ඇත.

.



## 3.6 ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය



**ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ප්‍රකාරව, වියදමේ ස්වභාවය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන තුල වියදම් නිරූපණය කර ඇති අතර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් සත්‍ය වශයෙන් දරන ලද වියදමට, අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ගෙවිය යුතු වියදම් සහ කලින් කරන ලද ගෙවීම් ගැලපීම් කර වර්ෂයට අදාල වියදම ඉදිරිපත් කර ඇත.**

### 3.6.1 වියදම් සමාලෝචනය

රජයේ සමස්ථ වියදම එහි ස්වභාවය අනුව පුනරාවර්තන හා මූලධන ලෙස වර්ග වන අතර, කාර්යය අනුව පළාත් සභා පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ඉඩම් පරිපාලනය හා සංවර්ධනය, වාරිමාර්ග, කෘෂිකර්ම සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය, කර්මාන්ත සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, සමුපකාර සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, සෞඛ්‍ය . අධ්‍යාපනය, ක්‍රීඩා, සංස්කෘතික සංවර්ධනය, සමාජ ආරක්ෂණය, ලෙස වර්ග වේ. එසේ නමුත් එම වියදම මූල්‍ය ප්‍රකාශන තුල නිරූපණය නොවේ.




2023 වර්ෂය තුල පළාත් සභාවේ සමස්ථ වියදම රු. 31,679,285,954 වන අතර, එය රු.මිලියන 4,128.39 වූ මූලධන වියදමකින් හා රු. මිලයන 27,550.88 වූ පුනරාවර්තන වියදමකින් සමන්විත වේ. එනම් සමස්ත වියදමින් 13.% මූලධන වියදම් සඳහාද , 87% ප්‍රමාණයක් පුනරාවර්තන වියදම් සඳහාද වැය වී ඇත.

පෙර වර්ෂයේ සමස්ථ වියදම රු.මිලියන 28,968.93, සමාලෝචිත වර්ෂයේ සමස්ථ වියදම වන රු .මිලියන 31,679.28, සමඟ සැසදීමේදී රු.මිලයන 2,710.35 න් වර්ධනය වී ඇත.

සමස්ථ වියදමින් වැඩි ප්‍රතිශතයක් පුනරාවර්තන වියදම් සඳහා වැය වී ඇති අතර, එයින් 78% ආසන්න අගයක් වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ සඳහා වැය වේ. මුලධන වියදම් මඟින් , රාජ්‍ය ආයතන වලට මාරු කිරීම් හා සංවර්ධන සහයන් සඳහා යොමු කර ඇත.






## 3.6.2 ප්‍රතිපාදන උපයෝජනය කිරීම

**2023.12.31 දිනට ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

| වැඩ සටහන | | 2023 වර්ෂයට අදාලව මූලධන වියදම | | | 2023 වර්ෂයට අදාලව පුනරාවර්තන | | | තත්‍ය වියදමෙහි එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | තත්‍ය වියදම | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | තත්‍ය වියදම | |
| 3 | පළාත් සභා පරිපාලනය | 483,250,000.00 | 1,027,952,500.00 | 645,309,218.62 | 2,839,570,400 | 2,667,202,006 | 2,251,828,386 | 2,897,137,604 |
| 8 | මූල්‍ය කළමනාකරණය | 922,000,000 | 71,432,569 | 2,291,950 | 970,250,000 | 1,583,650,954 | 414,790,138 | 417,082,088 |
| 9 | මානව සම්පත් කළමනාකරණ | 2,000,000 | 2,830,386 | 438,095 | 53,350,000 | 50,280,500 | 32,390,076 | 32,828,171 |
| 40 | ඉඩම් පරිපාලනය සහ සංවර්ධ | 7,500,000 | 7,500,000 | 479,000 | 91,465,000 | 88,064,200 | 84,586,045 | 85,065,045 |
| 43 | වාරිමාර්ග | 249,500,000 | 417,500,000 | 221,279,677 | 350,200,000 | 330,296,000 | 115,842,239 | 337,121,916 |
| 44 | කෘෂිකර්ම සංවර්ධනය | 152,500,000 | 1,256,727,856 | 1,194,617,304 | 278,234,000 | 264,156,560 | 207,099,273 | 1,401,716,578 |
| 45 | පශු සම්පත් සංවර්ධනය | 98,000,000 | 151,858,975 | 69,612,083 | 265,026,000 | 250,102,440 | 227,078,313 | 296,690,396 |
| 51 | කර්මාන්ත සංවර්ධනය | 32,500,000 | 49,980,000 | 19,941,123 | 110,825,000 | 106,859,204 | 94,554,877 | 114,496,000 |
| 52 | ප්‍රාදේශීය සංවර්ධනය | 571,000,000 | 572,047,775 | 51,051,301 | 657,800,000 | 624,074,000 | 274,387,966 | 325,439,267 |
| 53 | සමුපකාර සංවර්ධනය | 7,500,000 | 7,500,000 | 606,450 | 106,170,000 | 103,232,899 | 95,044,921 | 95,651,371 |
| 60 | ප්‍රජා සංවර්ධනය | 65,500,000 | 65,500,000 | 997,961 | 63,480,000 | 60,810,400 | 57,217,165 | 58,215,126 |
| **70** | **රෝහල් සේවාවන්** | **1,048,884,675** | **1,288,989,621** | **1,014,194,619** | **4,496,560,000** | **4,483,967,649** | **4,475,296,645** | **5,489,491,264** |
| **71** | **මහජන සෞඛ්‍ය සේවාවන්** | **331,515,325** | **270,402,048** | **214,673,791** | **1,388,450,000** | **1,379,869,995** | **1,370,778,331** | **1,585,452,122** |
| **72** | **පොදු සෞඛ්‍ය සේවාවන්** | **267,600,000** | **188,383,947** | **125,089,427** | **520,770,000** | **502,840,756** | **501,342,156** | **626,431,583** |
| **73** | **දේශීය වෛද්‍ය සේවාවන්** | **70,000,000** | **71,510,278** | **33,568,287** | **562,970,000** | **543,226,400** | **524,012,443** | **557,580,730** |
| 80 | ප්‍රාථමික අධ්‍යාපනය | 87,700,000 | 104,882,116 | 96,373,792 | 7,036,600,000 | 6,794,100,348 | 6,187,087,186 | 6,283,460,978 |
| 81 | ද්විතීයික අධ්‍යාපනය | 526,250,000 | 593,045,104 | 404,339,330 | 9,793,898,600 | 9,757,904,117 | 9,664,439,800 | 10,068,779,129 |
| 87 | අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්ව දියුණු කිරීම | 13,500,000 | 13,500,000 | 11,074,583 | 43,835,000 | 48,065,900 | 44,805,858 | 55,880,441 |
| 88 | අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා | 51,300,000 | 51,300,000 | 3,034,402 | 102,580,000 | 103,338,450 | 86,154,482 | 89,188,885 |
| 90 | ක්‍රීඩා | 19,500,000 | 19,500,000 | 1,497,595 | 123,905,000 | 117,497,460 | 99,655,015 | 101,152,610 |
| 91 | සංස්කෘතික සංවර්ධනය | 15,500,000 | 15,500,000 | 8,157,022 | 38,726,000 | 36,921,440 | 29,212,212 | 37,369,234 |
| 95 | සමාජ ආරක්ෂණය | 103,000,000 | 106,664,453 | 9,770,671 | 839,335,000 | 837,538,322 | 713,284,743 | 723,055,414 |
| එකතුව | | **5,126,000,000** | **6,354,507,628** | **4,128,397,683** | **30,734,000,000** | **30,734,000,000** | **27,550,888,270** | **31,679,285,954** |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා | | 2023.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත වුවද වත්කම් ලෙස වාර්තා නොවූ ශේෂය (මෘදුකාංගයට ඇතුලත් නොවූ ශේෂය) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම්, වත්කම් කළමනාකරණ මෘදුකාංගය හරහා වර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| | | වැය විෂයට ගිණුම් ගත වූ ශේෂය | වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුළත් කළ ශේෂය | | |
| **2101** | වාහන | - | - | | |
| **2102** | ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ | 338,728,144.00 | 339,834,089.78 | - | 100% |
| **2103** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 30,989,618.00 | 36,208,189.00 | - | 100% |
| **2104** | ගොඩනැගිලි හා ඉදිකිරීම | 808,335,308.00 | 1,334,138.00 | 8070011700.00 | 0.16% |
| **2105** | ඉඩම් අත්පත් කර ගැනීම් | - | - | - | - |

## 3.8 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | NCPC/A/NCP/03/FA2023/ 2024/16 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024 මැයි දින |

ආණ්ඩුකාරවර,

උතුරු මැද පළාත.

උතුරු මැද පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 01. ලේකම් - මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

02. ලේකම් - ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

03. ප්‍රධාන ලේකම් - උතුරු මැද පළාත.

04. ලේකම් - මුදල් කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } NCPC/A/NCP/03/FA2023/2024/16
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 මැයි 29 දින

ආණ්ඩුකාරවර,

උතුරු මැද පළාත.

උතුරු මැද පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු මැද පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ගිණුම් අනුව නොනිමි වැඩ වටිනාකම රු.5,959,447,473 ක් වුවත්, පළාත් සභා අරමුදල් ගිණුමේ සටහන 7.1 ප්‍රකාරව එම අගය රු.2,380,490,208 ක් වූයෙන් රු. 3,578,957,265 ක නොනිමි වැඩ අඩුවෙන් පළාත් සභා අරමුදල් ගිණුමේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ වටිනාකම ලෙස දැක්වෙන රු.5,959,447,473 ක වටිනාකම තුළ අඩංගු එකතු වටිනාකම රු.178,507,592 ක ඉදිකිරීම් ව්‍යාපෘති 40 ක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ඒ ඒ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත භාරදී තිබූ නමුත් නොනිමි වැඩ ගිණුම්වලින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම්වලට මාරුකර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම අඩුවෙන් දැක්විණි.

(ඇ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොළී රු.206,371,837 ක් දක්වා තිබුණද, විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව එය රු.207,816,902 ක් වූයෙන් රු.1,445,065 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) උතුරු මැද පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් පාලන ආයතන වෙත 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රේෂණය කළ යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ පිළිවෙලින් රු.19,542,031 ක් සහ රු.227,811,612 ක් 2023 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභා අවසන් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

2

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන කළමනාකාරීත්වය සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

* ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

* අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
* භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
* මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 අනුකූල නොවීම

#### 1.6.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2021 පෙබරවාරි 26 දිනැති හා අංක 393(1) රාජ්‍ය මුදල් | රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු හෝටල්වල පැවැත්වීමට ඉඩ නොදෙන ලෙස දන්වා තිබුණද, ඊට පටහැනිව උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැඩමුළු 02 ක් හෝටල්වල පවත්වා තිබුණු |

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| | චක්‍රලේඛය | අතර, ඒ සඳහා රු.1,248,850 ක වියදමක් දරා තිබුණි. |
| (ආ) | 2018 මැයි 24 දිනැති අංක 07/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්‍රාම වැටුප් ලිපිගොනුව නිවැරදිව සකස් කර අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන දින හෝ ඊට පසු සතියක් ඇතුළත අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුභවතුන් 371 කගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු එපරිදි නියමිත කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 13.2 වගන්තිය | මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝගකරන බලධාරියකු විසින් ඒ ඒ සිදුවීමේ ස්වාභාවය සැලකිල්ලට ගනිමින් අවස්ථාවෝචිතව එම විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිමකළ යුතු ද යන්න විමර්ශනය සඳහා පත්කරන නිලධාරියාට දැන්විය යුතු වුවද, පළාත් සභාවේ අමාත්‍යංශයක හා දෙපාර්තමේන්තු 07 ක පැවැත්වෙන මූලික විමර්ශන 117 ක් සඳහා නිශ්චිත කාලයක් ලබාදී නොතිබීම හේතුවෙන් එම මූලික විමර්ශන කටයුතු ආරම්භකර මාස 06ත් වර්ෂ 08 ත් අතර කාලයක් ගතවී ඇතත් ඒවා අවසන් කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 572 | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ගෙවීමේදී රඳවාගත් එකතුව රු.100,685,039 ක් වූ අතරඇවුම් මුදල් වසර 02 ක් ඉක්මවා තිබියදී, එම මුදලින් අදාළ ඉදිකිරීම්වල අඩුපාඩු පවතිනම් යථාවත් කර ගැනීම හෝ එම තැන්පත් රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ඉ) | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 | දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල වූ අග්‍රිම ශේෂයන් ඊලඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ 02 ක් විසින් නිරවුල් නොකළ වසර 10 - 16 ත් අතර කාලයක සිට පැවත එන අග්‍රිම ශේෂයන්ගේ එකතුව රු.27,478,709 ක් විය . |

5

| | | |
|---|---|---|
| (ඊ) | පළාත් මූල්‍ය රීති 433.1 | පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ගිවිසුම් ගත වූ කොන්ත්‍රාත්කරුවන් ව්‍යාජ කාර්යසාධන ඇපකර හා ව්‍යාජ අත්තිකාරම් ඇපකර ඉදිරිපත්කර කාර්යසාධන අත්තිකාරම් ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම හේතුවෙන් රු.2,452,328 ක අත්තිකාරම් ආපසු අයකර ගැනීමට නොහැකි වී ඇති අතර, එම ව්‍යාජ බැඳුම්කර ඉදිරිපත්කර තිබූ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (උ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කාර්යය පටිපාටිය | ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති පළාත් රාජ්‍ය සේවාවේ ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව එක් සේවා ස්ථානයක වසර 5 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කළ යුතු වුවත්, ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් 52,ක් කළමනාකරණ සේවයේ නිලධාරීන් 24 ක් සහ සංවර්ධන නිලධාරීන් 14 ක් ලෙස නිලධාරීන් 90 දෙනෙකු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 02. ආදායම් කළමනාකරණය

-----------------------------

### 2.1 ආදායම් සංකේත අංක 2003.02.30 - ඛණිජ සම්පත් මත බදු

------------------------------------------------------------------

(අ) 2003 අංක 03 දරන මුදල් (පරිපූර්ණ විධිවිධාන) ප්‍රඥප්තියේ iv වන පරිච්ඡේදයේ II(i) වගන්තිය පරිදි උතුරු මැද පළාත තුළ පිහිටි ඉඩමකින් ඛණිජ ද්‍රව්‍ය කැණීම් කර ලබාගන්නා තැනැත්තන් විසින් ගෙවිය යුතු ඛණිජ බදු අයකර ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සතුව 2022 සහ 2023 වර්ෂවලදී සක්‍රිය බදු ලිපිගොනු 90 ක් පමණක් පැවති අතර, ඛණිජ ද්‍රව්‍ය කැණීම් පිළිබඳ බලපත්‍ර ලබාදීමේ අයිතිය ඇති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2022 සහ 2023 වර්ෂ සඳහා උතුරු මැද පළාතේ කලුගල් කැණීම් වෙනුවෙන් ඛණිජ කැණීම් බලපත්‍ර 813 ක් නිකුත්කර තිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සක්‍රිය ඛණිජ බදු ලිපිගොනු 78 ක් අතුරින් සියයට 25 ක නියැදියක් පරීක්ෂණයට භාජනය කළ අතර, එම ගොනුවලින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය රාජ්‍ය භාගය අයකළ කියුබ් ප්‍රමාණයෙන් සියයට 20 කට අඩු ප්‍රමාණයක් සඳහා පමණක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඛණිජ බදු අයකර තිබුණි.

6

(ඇ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2022 සහ 2023 වර්ෂවල වැලි කැණීම් සඳහා බලපත්‍ර 159 ක් නිකුත්කර තිබූ අතර, වැලි කැණීම් සඳහා බලපත්‍ර ලබාගත් එක් සමාගමක් පමණක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැලි කැණීම් වෙනුවෙන් බණිජ බදු ගෙවා තිබුණි. ඒ අනුව වැලි කැණීම් සඳහා 2022 සහ 2023 වර්ෂවල බලපත්‍ර ලබාගත් බලපත්‍රලාභීන් 158 දෙනෙකුගෙන් එම කාලයට අදාළව රු.8,324,612 ක් බණිජ බදු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2 ආදායම් සංකේත අංක 2002.01.03 - ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24 ට අදාළව දීර්ඝ කාලීන බලපත්‍ර හිමියන් 2,474 කගේ දීර්ඝ කාලීන ඉඩම් බලපත්‍ර ගාස්තු රු.398,069,896 ක් හිඟව පැවති අතර බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් 2022 සහ 2023 වර්ෂවලදී නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ පුද්ගලයින් 18 දෙනෙකු සඳහා පමණි. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව නිරීක්ෂණය විය.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,737,902,832 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.135,926,957 ක් විමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,873,829,789 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.2,680,743,522 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 ආදායම් හා වියදම් විචලනය

| ආදායම් | 2023 | 2022 | විචලනය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | (රු.) | (රු) | (රු.) |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1,818.6 | 1,483.6 | 335.0 |
| බදු නොවන ආදායම් | 1,758.1 | 1,270.8 | 487.3 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 1,758.2 | 923.3 | 834.9 |
| - පුනරාවර්ථන | 24,990.7 | 23,144.9 | 1,845.8 |

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| වෙනත් ලැබීම් | 1,826.9 | 696.9 | 1,130.0 |
| | ---------- | --------- | ---------- |
| එකතුව | 32,152.5 | 27,519.5 | 4,633.0 |
| | ======= | ====== | ===== |
| **වියදම්** | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 21,400.6 | 21,895.0 | (494.4) |
| අනෙකුත් වියදම් | 9,014.0 | 5,760.5 | 3,253.5 |
| | ---------- | ---------- | ---------- |
| උප එකතුව | 30,414.6 | 27,655.5 | 2,759.1 |
| | ======= | ====== | ======== |
| අතිරික්තය (ඌනතාවය) | 1,737.9 | (136.0) | |

04. **ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම්**

4.1 **ප්‍රඥප්ති ගිණුම්**

**4.1.1 පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

(අ) මරදන්කඩවල විධායක ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ ඉදිකර තිබූ යාන්ත්‍රික අංගනයේ කටයුතු ආරම්භ නොකර නවතා දැමීම හේතුවෙන් ඉදිකිරීම් හා උපකරණ මිලදී ගැනීමට දරන ලද රු.6,041,838 ක වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2023 මාර්තු 29 දිනැති හා SFC/2023/E/01 අංක දරන සේවා නියුක්ති ආදායමින් බදු අය කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයේ වගු අංක 07 අනුව අධිකාරියේ නිලධාරීන් 07 දෙනෙකුට අදාළ රු.487,198 ක ද්විතික සේවා නියුක්තිය මත අයකළ යුතු බද්ද (APIT) අයකරගෙන තිබූ බවට සාක්ෂි නොතිබුණි.

**4.1.2 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය**

(අ) ඒජන්සිය ස්ථාපිත කරන ලද 1990 අංක 11 දරන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය අනුව එහි අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යවරයා විසින්

8

ස්වහිමතානුකූලව පත් කරන ලද පුද්ගලයින් 03 දෙනෙකුගෙන් සමන්විත වූ නමුත් ඒ සඳහා පළාත් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු හා පළාත් භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ඇතුළත්ව නොතිබුණි.

(ආ) ඒජන්සියේ වාහන අලුත්වැඩියා අංශය විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයේ රු.45,555,467 ක අමතර කොටස් මිලදීගෙන තිබුණේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව විය.

(ඇ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6:1 ප්‍රකාරව යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වුවත් ඒජන්සියේ නිල නිවාස 05 ක පදිංචිකරුවන් වර්ෂ 05 සිට වර්ෂ 16 දක්වා කාලයක් එම නිවාසවල පදිංචි වී සිටීමෙන් නිවාස අවශ්‍යතාවය ඇති අනෙකුත් සේවකයන් සඳහා නිල නිවාස ලබා දීමට නොහැකි වී තිබුණි.

4.1.3 **මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

(අ) අධිකාරියට අයත් බස් නැවතුම්පොළවල් 03 ක වැසිකිලි බදු දීමේ ගිවිසුම් ප්‍රකාරව බදු කරුවන් විසින් දැරිය යුතු ජල බිල්පත්, විදුලි බිල්පත් හා පිරිසිදු කිරීමේ ගාස්තු ලෙස රු.209,282 ක් අධිකාරිය දරා තිබූ නමුත් ඒවා බදුකරුවන්ගෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් බස් නැවතුම්පොළ 02 ක කඩ කාමර 45 කින් රු.5,523,116 ක හිඟ බදු මුදල් අයකර ගැනීමට කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) බස් නැවතුම්පොළ 03 ක පවතින කඩ කාමර 55 ක් බදුකරුවන් විසින් අධිකාරියට හිමිවන මාසික බදු කුලියට වඩා සියයට 300 සිට සියයට 2,300 දක්වා වූ ඉහළ බදු කුලියකට වෙනත් පාර්ශවයකට අතුරු බදු දීමට කටයුතු කර ඇතත් අධිකාරිය විසින් එම බදු හිමියන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) කැකිරාව බස්නැවතුම්පොලේ බදු දී ඇති කඩ කාමර 11 කට අදාළ බදු ගිවිසුම් සහිත ලිපි ගොනු අස්ථාන ගත වී තිබුණි. අනෙකුත් බදු ගිවිසුම් සහිත බදු ලිපි ගොනුද විධිමත්ව සම්පූර්ණ කර ආරක්ෂිතව තබා ගැනීමට සුදුසු අභ්‍යන්තර පාලන වැඩපිළිවෙළක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) කැකිරාව බස්නැවතුම්පොලෙහි කඩ කාමර 12 ක මාසික බදු කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023 ජුනි මාසයේ තක්සේරු කර ලබාදී ඇතත්, එම තක්සේරු වටිනාකම මත මාසික බදු කුලිය අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට මසකට රු.129,000 බැගින් එම කඩ කාමර 12 න් රු.774,000 ක ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.1.4 කර්මාන්ත සංවර්ධන අධිකාරිය

(අ) අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා දිගුකාලීන දැක්මක් සහ ඉලක්ක සහිත ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් 2023 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

(ආ) සුළු පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩසටහන් යටතේ අධිකාරිය පසුගිය වර්ෂවලදී ලබාදී තිබුණු ණයවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟ කාලය අවු 03 ක් ඉක්ම වූ ණයලාභීන් 213 දෙනෙකුගෙන් රු.15,419,352 ක ශේෂයයක් අයවීමට පැවතුණි.

4.2 අරමුදල් ගිණුම්

4.2.1 සමූපකාර සංවර්ධන අරමුදල

(අ) සමූපකාර සංවර්ධන අරමුදල පිහිට වූ 2009 වර්ෂයේ සිට මේ දක්වාම එහි මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුමට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට මාස 06 ක කාලයක් ඉක්ම වූ නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ රු.87,450 ක් වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) සමූපකාර සංවර්ධන අරමුදලට අදාළව 1997 සිට 2022 දක්වා කාලය තුළ තැන්පත් කළ වටිනාකම රු.1,468,669 ක් වූ චෙක් පත් 71 ක් උපලබ්ධි වී නොතිබුණි.

4.2.2 උතුරුමැද පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

(අ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වසර දෙකකට අයත් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් අදාළ කාලය තුළ ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද රු.27,223,075 ක් ගෙවිය යුතුව තිබුණි.

(ආ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.11,360,000 ක් වූ සමාජික මුදලින් සියයට 76.5 ක් වූ රු.8,691,600 ක් තවදුරටත් අරමුදලට ලැබිය යුතුව පැවතුණි.

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ගිණුමට අදාළව 2011 සිට 2021 දක්වා කාලය තුළ තැන්පත් කළ වටිනාකම රු.1,888,739 ක් වූ චෙක්පත් 82 ක් උපලබ්ධි වී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කර වසර 04 සිට වසර 08 දක්වා වූ කාලයක් ඉක්ම වූ එහෙත් බැංකුවට ඉදිරිපත් නොවූ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ගිණුමට අදාළව රු.149,488 ක චෙක්පත් 13 ක් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 වාණිජ අත්තිකාරම් ගිණුම්**

(අ) අංක 64202 දරන පේෂ කර්ම වාණිජ අත්තිකාරම් කටයුත්තට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට වසර 03 කට වඩා පැරණි රු.107,950 ක ණය ශේෂයක් අය නොවී පැවතුණි.

(ආ) අංක 64203 දරන වඩු පාසල් වාණිජ අත්තිකාරම් කටයුත්තට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට වසර 03 කට වැඩි කල් පසු වූ ණය රු.1,962,826 ක අය නොවී පැවතුණි.

**5. මෙහෙයුම් සමාලෝචනය**

**5.1 කාර්යය සාධනය**

**5.1.1 රජයේ ප්‍රදාන**

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,946,000,000 | 426,089,879 | 1,519,910,121 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන | 343,000,000 | 91,495,486 | 251,504,514 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 461,962,880 | 428,329,945 | 33,632,935 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 1,452,473,946 | 1,214,925,140 | 237,548,806 |

11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 962.8ක ඇස්තමේන්තු වටිනාකම වූ යෝජනා 338 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි වේ.

| | විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද යෝජනා වැඩ ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 180 | 30 | 210 | 519.9 |
| (ආ) | 50% කට වඩා වැඩියෙන් නිමකළ | 52 | 18 | 70 | 179.5 |
| (ඇ) | 50% කට වඩා අඩුවෙන් නිමකළ | 34 | 1 | 35 | 88.4 |
| (ඈ) | ආරම්භ කර නොතිබුණු | 23 | - | 23 | 175.0 |
| | | 289 | 49 | 338 | 962.8 |

### 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2009 අංක 05 දරන සමුපකාර ප්‍රඥප්තියේ 58 (3) වගන්තිය ප්‍රකාරව බේරුම්කරුවන්ගේ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින් සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිරිපත් කර තිබුණු අභියාචනා 61 න්, අභියාචනා 07 ක් පමණක් නිම කර තිබුණු අතර අභියාචනා 54 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අභියාචනා සම්බන්ධයෙන් අභියාචනාකරුවන් විසින් රු.1,703,482 ක මුදල් තැන්පත් කර තිබුණි.

(ආ) උතුරු මැද පළාත තුළ ලියාපදිංචි සමුපකාර සමිති 723 කින් සමුපකාර සමිති 373 ක් අක්‍රිය තත්ත්වයේ පැවති අතර අක්‍රිය සමුපකාර සමිති සම්බන්ධයෙන් 2009 අංක 05 දරන උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

12

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) 2009 අංක 05 දරන උතුරු මැද පළාත් සමූපකාර ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රකාරව සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම තම සමිතියේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසාන වී මාස 03 ක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙක් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 62 ක ගිණුම් 105 ක් 2024 පෙබරවාරි 29 දින වන විටත් විගණනය සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පවතින කඩ කාමර හා වෙළඳ කුටි 27 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා පැරණි රු.1,760,861 ක හිඟ කඩකුලී ශේෂයක් අය නොවී පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට කඩ කාමර 10 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණි.

(ඉ) රජයේ ඉඩම් නේවාසික සහ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනමට ලබා දීමේදී පවතින අකාර්යක්ෂමතාවය හා ප්‍රමාදය හේතුවෙන් පළාත් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. මේ සම්බන්ධයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයකට අනුව තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවූ ලිපි ගොනු 621 ක්, මැනුම් වාර්තා ලබා ගැනීමට මැනුම්පති වෙත යැවූ ලිපිගොනු 4 ක් හා අවසන් අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යැවූ ලිපිගොනු 568 ක් ලෙස ලිපිගොනු 1193 ක් සඳහා අනුමැතිය ලැබීම වසර 2 සිට වසර 20 දක්වා ප්‍රමාද වී තිබුණි.

(ඊ) පූර්ව වකුගඩු රෝග පරීක්ෂාවන්ට අදාළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ දත්ත සැකසුම් මෘදුකාංග (LIS) පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා එකතු වූ වටිනාකම රු.3,000,000 ක් වූ Laptop පරිගණක 12 ක්, මුද්‍රණ යන්ත්‍ර 12 ක් සහ ඊට අදාළ උපාංග සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 12 ක් වෙත ලබා දී වසර 05 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, එම දත්ත සැකසුම් පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත ගාස්තුව අනුව එක් කෘත්‍රිම සිංචන සේවාවක් සඳහා රු.350 ක් බැගින් ගාස්තු අයකළ හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී නියැදි පරීක්ෂණයට භාජනය කරන ලද පශු වෛද්‍ය කොට්ඨාශ 06 ක අවස්ථාවන් 2,187 කදී එක් කෘත්‍රිම සිංචනයන් සඳහා රු.500 සිට රු.1,000 දක්වා අයකිරීම නිසා රු.857,550 ක් වැඩිපුර ගොවීන්ගෙන් අයකර තිබුණි.

(ඌ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තු අලෙවි සංකීර්ණය සතු කඩ කාමර හා අලෙවි කුටි 11 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ත් වසර 05 ත් අතර කාලයක් වසා දමා තිබුණි.

13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණු වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂවලින් වටිනාකම රු.1,094,657 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත වී තිබූ අතර, රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් අනුරාධපුර දුම්රියපලේ දුම්රිය ගැල්තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් නිදහස් කර ගැනීමකින් තොරව රඳවා තැබීමට ඉඩ හැර තිබුණි. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතුණි. වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව පැවතුණි. මෙම ත්‍රිපෝෂ තොග නියමිත කාලය තුළ දුම්රිය ගැල්වලින් ඉවත් කර නොගැනීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ වියපැහැදම් සබැඳි දර්ශක (DLI) අංක 08 අනුව වයස අවුරුදු 35-45 ත් අතර මුළු කාන්තා ජනගහනය ආවරණය වන පරිදි ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ සිදු කළ යුතු වුවත්, 2022 වර්ෂයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 15 ක සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව වයස අවුරුදු 35-45 ත් අතර වූ මුළු ජනගහනයෙන් ගැබ්ගෙල පිළිකා පරීක්ෂා කර තිබූ ප්‍රතිශතයේ පරාසය සියයට 05-36 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ වියපැහැදැම් සබැඳි දර්ශක (DLI) අංක ඉතා පහළ මට්ටමක පැවතීම තුළ ව්‍යාපෘතියේ ඉලක්කගත අරමුණු සම්පූර්ණ වී නොතිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් රුධිර සාම්පල් පරීක්ෂා කිරීම සඳහා මිලදී ගෙන තිබූ රු.2,315,250 ක් වටිනා Serum Crcatinine Pack 42 ක් කල් ඉකුත්වීමට ආසන්න වීම මත 2020 අප්‍රේල් 29 දින සැපයුම් ආයතන වෙත ආපසු යවා තිබුණි. විගණිත දින වූ 2024 මාර්තු 07 දින වන විට වසර 05 කට ආසන්න කාලයක් ගත වී ඇතත් එම රසායනික උපකාරක ද්‍රව්‍ය වෙනුවෙන් සැපයුම් ආයතන වෙත ගෙවූ මුදල හෝ නව Serum Crcatinine Pack 42 ක ප්‍රමාණයක් ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබිණි.

(ඈ) අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ හාහිර රෝගී අංශ ප්‍රතිකාර සඳහා විකල්ප ඖෂධ නොමැති අත්‍යවශ්‍ය නිමි ඖෂධ ප්‍රමාණවත් පරිදි මිලදී නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විකල්ප නොමැති අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග 05 ක් සමාලෝචිත වර්ෂය තුළ දින 05 සිට දින 14 දක්වා කාලයක් පමණක් රෝගීන් වෙත එම ඖෂධ නිකුත් කර තිබූ අතර එක් ඖෂධයක් කිසිඳු දිනයකදී නිකුත් කර නොතිබුණි. 2023 වර්ෂයේ ඖෂධ මිලදී ගැනීම සඳහා රු.මිලියන 90 ක් වෙන්කළ තිබූ නමුත් ඉන් නිමි ඖෂධ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණේ රු.මිලියන 43 ක් පමණි.

14

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වපසරිය අක්කර 30.55 ක් වූ ඔසු උයන් 13 සංවර්ධනය නොකිරීම නිසා වාර්ෂිකව වියළි ඖෂධ අවශ්‍යතාවයෙන් 95% ක් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිල දී ගෙන තිබුණි.

(ඊ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල් 816 න් 2023 වර්ෂයේ දී කොට්ඨාශ හා කලාප කාර්යාල මගින් පාසල් 520 ක් අධීක්ෂණය කර තිබුණු අතර එයින් සියයට 31 ක් වූ පාසල් 165 ක ගුණාත්මක දර්ශක අගය එහි තිබිය යුතු ප්‍රසස්ථ මට්ටම වූ සියයට 60 ට වඩා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(උ) සමූපකාර රෙජිස්ට්‍රාර්වරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සමූපකාර සමිති 22 ක ගිණුම් 25 ක් 2024 පෙබරවාරි 29 දින වන විටත් විගණනයත් ආරම්භ කර නොතිබුණු අතර සමිති 49 ක ගිණුම් 57 ක විගණන කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

### 5.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී මාර්ග නඩත්තු කටයුතු සඳහා මිලදී ගෙන ඇති රු.5,782,812 ක වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය වැඩ බිම් ආශ්‍රිතව වර්ෂ 01 – 03 ත් අතර කාල පරාසයක් අනාරක්ෂිත ලෙස ගබඩා කර තිබූ අතර ඉන් රු.274,403 වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය අස්ථාන ගතවී තිබූ අතර රු.1,758,951 වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වෙමින් පැවතුණි.

### 5.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

රජයේ නියාමනයට යටත් නොවන කිසිඳු සහන ගාස්තු ක්‍රමයක් නොමැතිව ක්‍රියාත්මක වන හොරිවිල වෙද ගෙදර වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන 2021 යටතේ රු.5,193,756 ක් වියදම් දරා තිබූ අතර, එම ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රතිපාදන ලබාදීම කුමන පදනමකින් සිදු කරන ලද්දේද යන්න පැහැදිලි නොවුණි.

### 5.6 අරමුදල් ඌන උපයෝජනය

පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අවශ්‍ය වන පාරිභෝජ්‍ය සහ ක්ෂය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලබා දෙනු ලබන ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන මුදල්, සිසුන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට යොදා නොගෙන බැංකු ගිණුම්වල රඳවා ගෙන තිබුණු අතර 2022 වර්ෂයේ කලාප අධ්‍යාපන කාර්යාල 05 කට අයත් පාසැල් 27 ක් සඳහා ලබා දී තිබුණු රු.1,054,487 ක ප්‍රතිපාදනද, 2023 වර්ෂයේ කලාප අධ්‍යාපන කාර්යාල 07 කට අයත් පාසැල් 86 ක් ප්‍රාථමික අංශ සඳහා ලබා දී තිබුණු රු.3,403,450 ක ප්‍රතිපාදනද ඉතිරිව පැවතුණි.

15

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5.7 හඳුනාගන්නා ලද පාඩු

සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ගොවීන් වෙත බෙදා හැරීමට බීජ වර්ග මිල දී ගැනීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රෝපණ බීජ ලියාපදිංචි සහතිකය නොමැති ආයතනයක් මඟින් රු.2,435,000 ක මුං ඇට බීජ කිලෝ ග්‍රෑම් 1,250 ක් සහ රු.2,640,000 ක් වටිනා බී එනු බීජ කිලෝ ග්‍රෑම් 80 ක් මිලදී ගෙන බෙදා හැර තිබූ අතර ගොවීන් වෙත බෙදා දෙන අවස්ථාව වන විට එම ලොකු ලූනු බීජ කල් ඉකුත් වීමට ආසන්න දිනවල පැවති අතර මුං ඇට බීජ ගුල්ලන් විසින් විනාශ කර තිබූ බවද නිරීක්ෂණය විය.

5.8 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

(අ) ළහම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ ප්‍රධාන අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ ගිවිසුම්ගත වටිනාකම රු.35.536,852 ක් වූ ව්‍යාපෘති 02 ක ඉදි කිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් අතරමඟ නවතා දමා අතහැර ගොස් ඇති අතර ඒ වන විට ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ කාර්යයසාධන සුරක්ෂණයේ කාලය ඉකුත් වී තිබීම හේතුවෙන් රු.1,777,000 ක වටිනාකමැති කාර්යයසාධන සුරක්ෂණ 02 ක් අදාළ මූල්‍ය ආයතනවලට ඉදිරිපත් කර මුදල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2017 වර්ෂය තුළදී පලුගස්දමන මහා විද්‍යාලය සඳහා ශ්‍රවනාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකම රු.542,019,300 ක් වූ මුදලකට ඉදිකිරීම් සමාගමක් සමග ගිවිසුම් ගත වී රු.100,000,000 ක් අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ලබාදී තිබූ නමුත් ආරම්භක අවස්ථාවේදීම ඉදිකිරීම් නවතා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කළ රු.100,000,000 ක අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත්වී ඇති අතර ලබාදුන් අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ඇ) පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 15 දින අවසන්කර භාරදී තිබූ අතර එම ඉදිකිරීම්වල පැවති අඩුපාඩු නොසලකා රු.16,745,178 ක අවසන් බිල්පත් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රඳවාගෙන තිබූ රු.6,655,599 ක රැඳවුම් මුදල්, වාණිජ බැංකු ඇපකරයක් මත නිදහස්කර තිබූ නමුත් ව්‍යාපෘතියේ පැවති අඩුපාඩු අතරුදවුම් කාලය තුළද නිවැරදිකර නොතිබුණු අතර අදාළ බැංකු ඇපකරයේ කාලයද ඉකුත්වීම හේතුවෙන් එම මුදලින් අඩුපාඩු නිවැරදිකර ගැනීමටද අපොහොසත් වී තිබුණි.

(ඈ) සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන ලද කමත් ඉදිකිරීමේ උප ව්‍යාපෘති යටතේ වටිනාකම රු.16,731,899 කට ගිවිසුම් ගතවූ කොන්ත්‍රාත්කරුවන් අදාළ

16

කාර්යය ඉටු කිරීම පැහැර හැර තිබූ අතර කොන්ත්‍රාකරුවන් 03 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 03 ක එකතු වටිනාකම රු.3,575,068 ක් ආපසු අයකරගත නොහැකිව තිබුණි. එම කොන්ත්‍රාත් වෙනුවෙන් ලබාගත් රු.3,575,068ක අත්තිකාරම් බැඳුම්කර සහ රු.462,281ක කාර්යසාධන බැඳුම්කර කාලය ඉකුත් වීමට පෙර මුදල් කරගෙන ප්‍රසම්පාදන අස්ථිත්වයට සිදුවූ පාඩුව පියවාගෙන නොතිබුණි.

(ඉ) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී, ඊට අවශ්‍ය පස් හා බොරළු ප්‍රවාහනය සඳහා අදාළ වැඩබිම සහ පස් ලබා ගන්නා ස්ථාන ලෙස ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබූ දුර ප්‍රමාණයන් ගෙවීම් කිරීමේදී වැඩි කර දක්වා අමතර වැඩ ලෙස ගෙවීම් කිරීම නිසා නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද වැව් 02 ක සඳහා රු.612,620 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ වැව් හා අනෙකුත් ඉදිකිරීම් 04 කට අදාළව ගෙවීම් කිරීමේදී විවිධ හේතූන් මත ඉටු නොකළ වැඩ කොටස් සඳහා රු.1,330,082 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රු.මිලියන 05 ට අඩු සහ කොන්ත්‍රාත් කාලය මාස 03 ට අඩු ඉදිකිරීමේ කොන්ත්‍රාත් සඳහා මිල විචලනයන් ගෙවීමට ඉඩ නොදිය යුතු වුවද ගිවිසුම්ගත වටිනාකම රු.4,705,162 ක් වූ කොන්ත්‍රාත් කාලය මාස 03 ට අඩු හොරිවිල වෙද ගෙදර නේවාසිකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.835,581 ක මිල විචලනයන් ගෙවා තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ඉටු නොකළ වැඩ වෙනුවෙන් සාවද්‍ය මිනුම් වාර්තා පදනම් කරගෙන රු.403,629 ක් වැඩිපුර ගෙවා තිබුණි.

5.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

-----------------------------

වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්මේ සහ ඉදිකිරීම් ස්ථානවල පවතින ඉදිකිරීම්වලට බාධාවන දැවමය වටිනාකම සහිත ගස් විධිමත් අනුමැතියක් සහිතව දැව සංස්ථාවට භාර දිය යුතු වුවත් වැව් 04 ක් ප්‍රතිසංස්කරණයේදී එසේ ඉවත්කළ වටිනා ගස් 168 ක් විධිමත් පරිදි දැව සංස්ථාව වෙත ලබාදුන් බවට හෝ ඒවා නීත්‍යානුකූලව භාවිත කළ හැකි වෙනත් කාර්යයන් සඳහා යොදාගත් බවට සාක්ෂි නොතිබුණි.

5.10. අත්හැර දැමූ ව්‍යාපෘති

-------------------------

ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.140,596,776 ක් වැය කර අඩක් ඉදි කරන ලද ව්‍යාපෘති 20 ක් වැඩ අවසන් කර නොමැති

17

වීමෙන් එම ව්‍යාපෘති සඳහා දරන ලද එකතුව රු.140,596,776 ක වියදම නිෂ්කාර්ය බව නිරීක්ෂණය විය. එකී ඉදිකිරීම කොන්ත්‍රාත් 06 කට අදාළ තවදුරටත් අයවිය යුතු අත්තිකාරම්වල වටිනාකම රු.36,881,569 ක් විය.

## 5.11 අපේක්ෂිත නිමවුම (Out Put) ලබා නොගැනීම

---

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද විද්‍යුත් පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම 45 න් ඉදිකිරීම් ගොඩනැගිලි 26 කම ඉදිකිරීම් අතහැර දමා තිබුණි. අතරමඟ නවතා දැමූ එම ව්‍යාපෘති වෙනුවෙන් රු.21,951,953 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ 2021 වර්ෂය තුළ රු.6,791,213 ක් වියදම් දරා සත්ත්ව ගොවිපල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර තිබු නමුත්, පළාත තුළ පිහිටි ගොවිපල 40,000 ක් අතරින් සියයට 17 ක පමණ ප්‍රමාණයක තොරතුරු රැස්කර පද්ධතියට ඇතුළත් කර තිබුණි. ඉතිරි දත්ත තොරතුරු පද්ධතියට ඇතුළත් කර සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.598,013,000 ක මුදලකට ගිවිසුම් ගත වූ සමාගම ව්‍යාපෘතිය අඩක් නිමකර රු.369,171,165 ක ගෙවීම් ලබාගෙන ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.119,602,600 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී තිබුණි. ව්‍යාපෘතිය ඉදිකිරීම නවතා වසර 06 ක් ඉක්මවා ගතවී ඇතත් ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් අයකරගත යුතුව පැවති රු.45,171,484 ක් විය. අත්තිකාරම් සඳහා ලබාගත් අත්තිකාරම් සුරක්ෂණ බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කර භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මේ දක්වා දැරූ රු.369,171,165 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද 12 වන අතුරු බිල්පතින් වැඩ බිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් රු.11,611,385 ක් ගෙවා තිබූ නමුත්, 2023 දෙසැම්බර් 15 දිනවන විට එවැනි වටිනාකමට අදාළ ද්‍රව්‍ය වැඩබිම තුළ නොතිබුණි.

## 5.12 අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම

---

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රු.83,197,267 ක් වියදම් දරා ඉදිකර සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කළ විද්‍යුත් පුස්තකාල ගොඩනැගිලි 16 ක් අනුමත කාර්යයට භාවිතා නොකොට වෙනත් කටයුතු සඳහා ලබාදී තිබුණි.

(ආ) උතුරු මැද පළාත් සභාව සඳහා ඒකාබද්ධ තිරසර සංවර්ධන සැලස්මක් සකස් කිරීම වෙනුවෙන් 2023 සැප්තැම්බර් මස පැවති වැඩමුළුව සඳහා රු.1,719,038 ක් වියදම් දරා ඇතත්, 2023 දෙසැම්බර් 31 දින වන විටත් තිරසර සංවර්ධන ඒකාබද්ධ සැලැස්මේ අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් වැඩමුළුවෙහි අරමුණ ඉටුවී නොතිබුණි.

(ඇ) ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන විභාග වලට පෙනී සිටි උතුරු මැද පළාතේ දරුවන්ගේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. අ.පො.ස සා.පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය දක්වා 06 වන ස්ථානයේ පැවති උතුරු මැද පළාත 2021 හා 2022 වර්ෂයේදී 09 වන ස්ථානයට පත් වී තිබුණි.

ii. අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂයේදී 08 වන ස්ථානයේ පැවති උතුරුමැද පළාත 2021 සහ 2022 වර්ෂ වනවිට 09 වන ස්ථානයට පත්වී තිබුණි.

iii. 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 100 කට වඩා ලබා ගැනීම අනෙකුත් පළාත් වල ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීමේදී උතුරු මැද පළාතට පිළිවෙලින් 5, 6, 6 වන ස්ථාන හිමි වී තිබුණි. එලෙස 100 ට වැඩි ලකුණු ලබාගත් ළමුන්ගේ ප්‍රතිශතය වසර 03 ක දීම සියයට 50 සීමාවට ළඟා වී නොතිබුණි.

(ඈ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් තිරප්පනේ සත්ත්ව ගොවිපල තුළ ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා 2022 සහ 2023 වර්ෂයන්හි රු.13,281,751 ක වියදමක් දරා තිබූ නමුත් එම ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට පොහොර කිලෝ ග්‍රෑම් 2,745 ක් අලෙවිකර රු.83,400 ක් පමණක් උපයා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ඵලදායිතාවය ඉතාම අවම මට්ටමක විය.

(ඉ) රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රු. මිලියන 43 ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ අතර එම මුදලින් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත 2021 වර්ෂයේදී ලබාදී තිබුණු රු. මිලියන 33 ක ණය මුදලින් 2024 පෙබරවාරි 26 දින වන විට රු.මිලියන 27.65 ක් ආපසු අයකරගෙන නොතිබුණි. එම සමිතියෙන් අයවිය යුතු ණය මුදල් අයනොවීම හේතුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය ලබාදීමේ කටයුතු නවතා ඉතිරි මුදල් රු.මිලියන 15.35 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් උක්ත වැඩසටහනේ අරමුණ වූ "විවෘත වෙළඳපොල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම සහ සහල් මිල පාලනය" යන අරමුණු ඉටු වී නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මග පෙන්වීම මත පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තෝරා ගත් රෝහල්වල බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ

19

තාක්ෂණික ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේදී ප්‍රාදේශීය රෝහල් 02ක් වෙත වටිනාකම රු.5,574,780 ක් වූ පරිගණක උපාංග ද, 2018 වර්ෂයේදී තවත් මූලික රෝහල් 03 ක් එකතුවෙන් වටිනාකම රු.3,107,897 ක් වූ පරිගණක උපාංග ලෙස එකතු වටිනාකම රු.8,682,677 ක උපකරණ වසර 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

### 5.13 වාහන උපයෝජනය

(අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය අනුව උතුරු මැද පළාත් සභාවට අයත් වාහන 19 ක් සහ යතුරුපැදි 10 ක් අස්ථානගතවී තිබුණි.

(ආ) අනුරාධපුරය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ භාවිතා කරන ත්‍රිරෝද රථ 02 ක් පෞද්ගලික ආයතන නමින්ද, පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ භාවිතා කරන වාහන 01 ක් පුද්ගලයෙකුගේ නමින්ද ලියාපදිංචි කර තිබුණි.

(ඇ) උතුරු මැද පළාත් සභාවට අයත් වාහන 06 ක් වෙන්දේසිකර අලෙවි කිරීම මඟින් අපහරණය කර ඇතත්, තවදුරටත් ලියාපදිංචි අයිතිය පළාත් සභාවෙන් ඉවත්කර අදාළ ගැනුම්කරුවන් වෙත පවරා දී නොතිබුණි.

(ඈ) උතුරු මැද පළාත් සභාව සතු භාවිතයෙන් ඉවත්කර දීර්ඝ කාලයක් තිස්සේ අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසිකර ඉවත් කිරීමට කටයුතු නොකර තවදුරටත් වාහන 52ක් සහ යතුරු පැදි 26 ක් පළාත් සභාවේ පරිපාලන පරිශ්‍රය තුළ සහ අදාළ අනෙකුත් කාර්යාල පරිශ්‍ර තුළ ගාල්කර තිබුණි.

### 5.14 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

(අ) පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් ඉදිකිරීම්කර පළාත් පාලන ආයතන 08 ක් වෙත භාරදී තිබූ වටිනාකම රු.166,150,323 ක් වූ ආදායම් උත්පාදන ව්‍යාපෘති 09 ක් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා නොකොට ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින වටිනාකම රු.2,833,013 ක් වූ කැකිරාව ඔළුකරද විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථානය 2020 පෙබරවාරි 08 දින සිට විගණිත දින වූ 2024 පෙබරවාරි 10 දින වනතුරුත් භාවිතයට ගෙන නොතිබුණි.

20

(ඇ) පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ යටතේ රැකවරණය ලබන ආබාධිත ළමුන් පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති තක්සේරු වටිනාකම රුපියල් මිලියන 06 ක් ඉක්ම වූ ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානය වසර 08 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති සෙලෙස්තිමඩුව වඩු පුහුණු පාසලේ නේවාසිකාගාරය 2021 වර්ෂයේදී රු.2,941,275 ක වැය දරා ඉදිකර තිබූ අතර, එම වර්ෂයේ සිට මේ දක්වා කිසිවෙකුත් නේවාසික පහසුකම් ලබාගෙන නොමැති වීමෙන් එය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඉ) 2021 වර්ෂයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු. 6,550,843 ක් වැයකර ඉදිකිරීම නිමකර අදාළ සමූපකාර සමිති වෙත භාරදුන් සමූපකාර සමිති 05 කට අයත් ගොඩනැගිලි 05 ක් විගණිත දින වන 2023.02.14 විටද වර්ෂ 02 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීමට ඉඩහැර තිබුණි.

(ඊ) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ උතුරු මැද පළාත තුළ සක්‍රියව ක්‍රියාත්මක වන තිරසර ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන 26 ක් සතුව පැවති ජුකි මැෂින් 26 ක්ද, සාමාන්‍ය මැෂින් 74 ක්ද, සිග් සැග් මැෂින් 21 ක් හා ඕලොග් මැෂින් 17 ක් 2023.12.31 දින වන විට අක්‍රියව පැවතුණි.

## 5.15 කාර්ය මණ්ඩල පරිපාලනය

### 5.15.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආයතන

| සේවක කාණ්ඩය | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | ඌන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ | 484 | 306 | 178 |
| ii. | තෘතීයික | 239 | 116 | 123 |
| iii. | ද්විතික | 2676 | 1747 | 929 |
| iv. | ප්‍රාථමික | 2739 | 1619 | 1120 |
| | | 6138 | 3788 | 2350 |

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ තක්සේරුකරු සහ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරු විධායක ශ්‍රේණියේ III/II ලෙස ඇතුළත්වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තනතුර අනුමතකර තිබියදී ඊට පටහැනිව තක්සේරුකරු සහ ජ්‍යෙෂ්ඨ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

තක්සේරුකරු තනතුරු II/I ලෙස ඇතුළත්කර පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාව අනුමතකර ක්‍රියාත්මක කිරීම හේතුවෙන් තක්සේරුකරු තනතුරේ නිලධාරීන් 04 දෙනෙකු වෙත 2015 අප්‍රේල් සිට 2022 සැප්තැම්බර් දක්වා රු.2,639,652 ක් වැඩිපුර වැටුප් හා දීමනා ගෙවා තිබුණි

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සමූපාකාර දෙපාර්තමේන්තුවේ සමූපකාර කටයුතුවලට සෘජුවම දායකවන සමූපකාර සංවර්ධන නිලධාරීන් 31 ක පුරප්පාඩු පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ අනුමත තාක්ෂණික නිළධාරීන් 68 දෙනෙකු පසුගිය වසර 02 පුරාම පුරප්පාඩුව පැවතුණි.

(ඈ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුට එරෙහිව ලැබී තිබූ නියෝජනයක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ IIකොටසේ XLVIII පරිච්ඡේදයේ 13 ඡේදය ප්‍රකාරව එම නිලධාරියාට අදාළ විනය බලධාරියා වූ පළාත් ප්‍රධාන ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

**5.15.2 අධ්‍යාපනය සම්බන්ධව ගුරුවරු අතිරික්තය හා ඌනතාවය, අනුයුක්ත කිරීම් පිළිබඳ නිරීක්ෂණ**

පාසල් කාර්ය මණ්ඩලය

| සේවක කාණ්ඩය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. විදුහල්පති | 1060 | 847 | 213 | - |
| ii. ගුරුභවතුන් | 16,503 | 14,561 | 1942 | - |
| iii. සංවර්ධන නිලධාරී | 796 | 1576 | - | 780 |
| iv. කළමනාකරණ සහකාර | 53 | 4 | 49 | - |
| v. සුළු සේවක | 1402 | 1410 | - | 08 |
| | 19814 | 18398 | 2204 | 788 |

(අ) කළමනාකරණ සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය මගින් පාසල් සඳහා සංවර්ධන නිලධාරීන් 796 ක් අනුමත කර තිබුණු නමුත්, 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 780 ක් ගුරුවරුන් ලෙස සේවයේ යොදවා ගෙන ඒ සඳහා රු.565,127,114 ක් වැටුප් ගෙවා තිබුණි.

22

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප අධ්‍යාපන කාර්යාලවල සිංහල මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 3578 ක් හා අතිරික්තතා 403 ක් ද, දෙමළ මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 641 ක් හා අතිරික්තතා 128 ක්ද, ඉංග්‍රීසි මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 39 ක් හා අතිරික්තතා 08 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි.

(ඇ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නියමිත කාලය තුළ උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීමට නිශ්චිත වැඩපිළිවෙලක් සකසා නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට කලාප අධ්‍යාපන කාර්යාලයන්ට අයත් පාසල්වල සේවය කරන ගුරුභවතුන් 2,280 කගේ හිඟ වැටුප් රු.120,556,983 ක් හා ගුරුභවතුන් 96 කගේ හිඟ දීමනා රු.6,575,288 ක් ගෙවිය යුතුව පැවතිණි.

(ඈ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල්වල විවිධ විෂයයන් සඳහා ගුරුභවතුන් ගේ පුරප්පාඩු පැවතියදී ගුරුභවතුන් 34 දෙනෙකු මාස 06 සිට වසර 27 ක් දක්වා කාලයක් වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර එම මුදාහල ගුරුභවතුන් 30 ක් සඳහා මුදාහල දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා අදාළ නිලධාරීන් සේවයට වාර්තා කිරීම් පැමිණීම් හා පිටවීම් වාර්තා, නිවාඩු වාර්තා සහ මුදාහල ආයතනය වලින් ලබාගත් දීමනා පිළිබඳ වාර්තා තහවුරු කර ගැනීමකින් තොරව කලාප අධ්‍යාපන කාර්යාල විසින් වැටුප් හා දීමනා වශයෙන් රු.85,838,643 ක් ගෙවා තිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 උප වගන්තිය ප්‍රකාරව පරිවාසය පිට සිටින නිලධරයෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, උතුරු මැද පළාත තුළ පිහිටි පාසැල් වල 1990 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ගුරු සේවයට පත්වීම් ලැබී තිබුණු ගුරුභවතුන් 137 කගේ සේවය ස්ථිර කිරීමට 2023 දෙසැම්බර් 31 වන විටද කටයුතු කර නොතිබුණි.

(ඊ) උතුරු මැද පළාත තුළ පාසැල් 258 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත නොකර ගුරු සේවයට අයත් ගුරුවරුන්ට විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට වැඩ බලන තනතුරු ලබා දී තිබුණු නමුත්, පාසල් 397 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නියෝජ්‍ය විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කරන බව නිරීක්ෂණය විය.

23

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5.15.3 සෞඛ්‍ය කාර්යය මණ්ඩලය

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරි | 44 | 18 | 26 |
| අනෙකුත් වෛද්‍ය නිලධාරි | 609 | 552 | 57 |
| ලියාපදිංචි වෛද්‍ය නිලධාරි | 23 | 19 | 04 |
| පරිපූරක වෛද්‍ය සේවයේ නියතු නිලධාරීන් | 146 | 122 | 24 |
| අතුරු වෛද්‍ය සේවයේ නිලධාරීන් | 1162 | 877 | 285 |
| හෙද නිලධාරි | 854 | 832 | 22 |
| තාක්ෂණ සේවයේ නියුතු නිලධාරීන් | 84 | 34 | 50 |
| සෞඛ්‍ය කාර්යය සහයක (කණිෂ්ඨ) | 489 | 450 | 39 |
| සෞඛ්‍ය කාර්යය සහයක (සාමාන්‍ය) | 434 | 380 | 54 |
| උපස්ථායක | 450 | 304 | 146 |
| වෙනත් | 362 | 180 | 182 |
| | 4657 | 3768 | 889 |

විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 26 ක් සහ අනෙකුත් වෛද්‍ය නිලධාරීන් 57 ක් සහ අතුරු වෛද්‍ය සේවයට අයත් නිලධාරීන් 285 ක සෞඛ්‍ය වෛද්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතුණි.

5.16 ප්‍රසම්පාදනය

(අ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සෙවිලි තහඩු මිලදී ගැනීමට පැවති ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද සුදුසුකම් ලත් ආයතනය අදාළ සෙවිලි තහඩු නිෂ්පාදන ආයතන වූ අතර එම ආයතනයේ අවම මිල වූ රු.2,116,687 ක මිල ප්‍රතික්ෂේප කර එම නිෂ්පාදන ආයතනයේ නියෝජිත වෙළඳ ආයතනයක් ඉදිරිපත් කළ ඊළඟ මිල වූ රු.2,503,202 කට ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් රු.386,515 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) භාණ්ඩ, වැඩ හෝ සේවා කොන්ත්‍රාත්වලදී අදාළ කාර්යයන් නිම කර භාරදීමට පෙර අත්තිකාරම් ලබා දෙන්නේ නම් අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගෙන මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 30 ක් අත්තිකාරම් ගෙවිය හැකි වුවද පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන 14 ක මාර්ගගත ගෙවීම් සඳහා පරිගණක මෘදුකාංගය සකස් කර ස්ථාපිත කිරීම සඳහා වූ

24

ව්‍යාපෘතියට එවැනි සුරක්ෂණයක් රහිතව වටිනාකම රු. 16,186,800 කින් සියයට 50 ක් වූ රු.8,093,400 ක අත්තිකාරම මුදලක් වයඹ සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රෝද පුටු මිලදී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම් ලත් අවම මිල සහිත ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු ලියකියවිලිවල පිරිවිතර ඇතුළත් ලේඛන ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වූ යම් පාර්ශවයක් විසින් ඉවත්කර එම ලංසුකරු, ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් ඉවත් කර ඊට වඩා රු.256,100 ක වැඩි මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට ටෙන්ඩරය පිරිනමා තිබුණි.

## 5.17 පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

පළාත් පාලන ආයතනවල මූල්‍යමය ශක්තීන් ගොඩනැගීම, පළාත් පාලන ආයතනයක් තුළ නව ව්‍යාපෘති හඳුනාගැනීම, ඇගයීම තක්සේරු කිරීම හා ක්‍රියාත්මක කරවීම උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත්, පළාත් පාලන ආයතනවල සිදුවී තිබූ පහත සඳහන් අකාර්යක්ෂමතාවය හා දුර්වලතාවයන් මගහරවාගෙන කටයුතු කිරීමට අවශ්‍ය සහය හා මග පෙන්වීම පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි ලබාදී නොමැති බැව් නිරීක්ෂණය කෙරේ.

(අ) පළාත් පාලන ආයතන 10 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.136,488,142 ක හිඟ වරිපනම් අයකරගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතන 17 කට අයත් බදු දී ඇති කඩ කාමර වෙනුවෙන් අයවිය යුතු රු.140,831,929 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකර ගෙන නොතිබුණි.

(ඇ) පළාත් පාලන ආයතන 08 ක තම බල ප්‍රදේශයන්හි දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබෙන ප්‍රදේශවලින් වරිපනම් බදු පැනවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන ආයතන 09 කට අයත් වාහන කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.8,796,926 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි.

(ඉ) පළාත් පාලන ආයතන 12 කට අයත් දේපල බදුදීම වෙනුවෙන් ලැබිය යුතු රු.22,241,798 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි.

(ඊ) පළාත් පාලන ආයතන 05 ක් විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘති වෙනුවෙන් අයවිය යුතු රු.10,660,615 ක ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි.

(උ). පළාත් පාලන ආයතන 08 ක් විසින් පවත්වාගෙන යන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඌ) ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් බලප්‍රදේශයේ ගව මස් සැපයීම වෙනුවෙන් අවසර ලබාදෙන ලද කරකොළවැව ගෝඝාතකාගාරය සඳහා පරිසර බලපත්‍රයක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර තිබුණු නමුත්, එම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව ඝාතනය කරන සතුන්ගේ ලේ සහිත ජලය, හිස් සහ ඉතිරි කොටස් විවෘත භූමිය වෙත ඍජුව බැහැර කරන බව නිරීක්ෂණය විය.

(එ) තලාව ප්‍රාදේශීය සභාවට අයත් කැබ්රථයක් 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනයවී අතර වසර 03 කට අධික කාලයක් ගතවී තිබුණු නමුත්, මෙම රථය අලුත්වැඩියා කිරීමට සහ රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. අනතුරට අදාළ අලුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනයේ ඇස්තමේන්තු මුදල රු.4,458,993 ක් විය.

(ඒ) 2014 වර්ෂයේ ජනවාරි සිට 2018 වර්ෂයේ ජූලි දක්වා කාලපරිච්ඡේදයේදී අනුරාධපුර මහා නගර සභාවේ සිදුවී තිබූ රු.40,852,191 ක වැටුප් වංචාව පිළිබඳ වගකිවයුත්තන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) පොළොන්නරුව මහා නගර සභාවේ නව පොදු වෙළඳසැල් සංකීර්ණයේ කඩකාමර 57 කට අදාළව 2023 දෙසැම්බර් 31 වන විට රු.15,964,890 ක එක්වන් මුදල් (Key mony), රු.53,253,254 ක හිඟ බදු කුලී සහ විදුලිය සැපයීම වෙනුවෙන් රු.4,495,595 ක හිඟ විදුලි ගාස්තුවක් ගිවිසුම්ගත පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.2 නොවිසිදී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාව වෙත 2021 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත්කර තිබූ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ 03 ක් සඳහා ප්‍රධාන ලේකම් විසින් එවා ඇති පිළිතුරු අනුව මූලික විමර්ශන හා විධිමත් පරීක්ෂණ සිදුකරන බවට පිළිතුරු ලබා දී තිබූ නමුත් මේ සම්බන්ධයෙන් විමර්ශන සිදුකර තිබූ බවට හා ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන තිබූ බවට සාක්ෂි නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

27

04

පරිච්ඡේදය

# කාර්යසාධන දර්ශක

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

# පළාත් සභා පරිපාලනය

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| පළාත් සභා ප්‍රතිපාදන අනුව මූල්‍ය පරිහරණය සිදු කිරීම | ✓ | | |
| අදාල චක්‍රලේඛණ වලට අනුව වැටුප් හා දීමනා ලබා දීම | ✓ | | |
| පළාත් සභාවට වෙන් කර ඇති සම්පත් අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම | ✓ | | |
| වාහන නිසි පරිදි නඩත්තුව හා පාලනය | ✓ | | |
| ආයතනික කටයුතු පහසු කිරීම | ✓ | | |
| සිත් ඇද ගන්නා සුළු උද්‍යානයක් පවත්වා ගැනීම. | ✓ | | |
| ගුණාත්මක හා ඵලදායි රැස්වීම් පැවැත්වීම | ✓ | | |
| පළාත් සභා ප්‍රතිපාදන අනුව විනිවිද භාවයෙන් යුතු මූල්‍ය පරිහරණය සිදු කිරීම | ✓ | | |

| ආයතනයේ කාර්ය සාධන | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස | | |
|---|---|---|---|
| | 100% -90% | 75%-89% | 50%-74% |
| අනුග්‍රහ පදනම යටතේ වාහන ආනයන සහ බලපත්‍ර සඳහා අනුමැතිය ලබා දීම හා අනුමත කරන ලද වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව | | ✓ | |
| විදේශ නිවාඩු / ශිෂ්‍යත්ව සඳහා අනුමැතිය ලබාදීම.<br>අනුමත කරන ලද විදේශ නිවාඩු-රාජකාරි<br>පෞද්ගලික<br>සංශෝධන ඉල්ලීම් සංඛ්‍යාව | | ✓ | |
| ප්‍රායෝගික පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම අනුමත කිරීම හා ප්‍රායෝගික පුහුණුව සඳහා අවස්ථාව ලබාදුන් සිසුන් සංඛ්‍යාව | ✓ | | |
| දෙවන භාෂා දිරි දීමනා - [ඉංග්‍රීසි , දෙමළ අනුමත කරන ලද භාෂා දීමනා ඉල්ලීම් සංඛ්‍යාව | | | ✓ |
| රාජකාරියේ යෙදී සිටියදී සිදුවූ අනතුරු සම්බන්ධ වන්දි ගෙවීම<br>•වන්දි මුදල් ගෙවීම් හිමිකර ගත් අය සංඛ්‍යාව<br>•ගෙවීම් කරන ලද වන්දි මුදල් වටිනාකම | ✓<br>2,119,415.00 | | |
| තොරතුරු පනතට අදාළව ලබාදෙන ලද තොරතුරු ඉල්ලීම් ප්‍රමාණය | ✓ | | |

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| වසර තුල ලබාදෙන ලද පත්වීම් ගණන | ✓ | | |
| වසර තුල සිදුකරන ලද ස්ථිර කිරීම් ගණන | ✓ | | |
| වසර තුල සිදුකරන ලද උසස්වීම් ගණන | ✓ | | |
| වසර තුල සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ගණන | ✓ | | |
| වසර තුල පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය | ✓ | | |
| වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | ✓ | | |
| අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංශෝධන ප්‍රමාණය | ✓ | | |
| පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | ✓ | | |

| | | | |
|---|---|---|---|
| වසර තුල තොරතුරු ලබාදී ඇති තොරතුරු ඉල්ලීම් ගණන | ✓ | | |
| වසර තුල ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු ඉල්ලීම් ගණන | | | ✓ |
| වසර තුල ලැබෙන මානව හිමිකම් පැමිණිලි ගණන | ✓ | | |
| වසර තුල ලැබෙන නඩු ගණන | ✓ | | |

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (ඉංජිනේරු ) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| නවීකරණය කරන ලද කාර්යාල සංඛ්‍යාව | | √ | |
| නවීකරණය කරන ලද නිල නිවාස සංඛ්‍යාව | | | ✓ |
| මිල දී ගත් කාර්යාල උපකරණ හා භාණ්ඩ | ✓ | | |
| සකස් කරන ලද මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තා ප්‍රමාණය | | ✓ | |
| නිමකළ වාස්තු විද්‍යාත්මක සැලසුම් සංඛ්‍යාව | ✓ | | |
| නිමකල ව්‍යුහගත විදුලි හා ගොඩනැඟිලි සැලසුම් සංඛ්‍යාව | ✓ | | |
| අවසන් කළ ඇස්තමේන්තු සංඛ්‍යාව | ✓ | | |
| පිරිනමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | | | ✓ |
| ඉදිකිරීම් අවසන්කල ව්‍යාපෘති සංඛ්‍යාව | | ✓ | |
| නිකුත් කරන ලද තත්ත්වපාලන වාර්තා සංඛ්‍යාව | ✓ | | |
| උපදේශාත්මක සේවා සැපයු ව්‍යාපෘති සංඛ්‍යාව | ✓ | | |
| පුහුණුව ලබා දුන් ආධුනික සිසුන්/ නිලධාරින් ගණන | | | ✓ |
| නිකුත් කරන ලද විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුමය වාර්තා ගණන | | ✓ | |

පළාත් පාලනයේ අනෙකුත් ආයතනවල ඉංජිනේරුමය කටයුතු සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා උපදේශනාත්මක සේවාවන් සැපයීම ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කාර්යය වන අතර, එම එක් එක් ආයතනයන් මඟින් වාර්ෂිකව ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය උපදේශනාත්මක සේවාව අප මෙමගින් ක්‍රියාත්මක කරනු ලබයි. එබැවින් එක් එක් වර්ෂයේ ලැබෙන ඉල්ලීම් ප්‍රමාණයට අනුකූලව කාර්ය සාධනය රඳා පවතී.දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ප්‍රතිපාදන මඟින් ධාරිතා සංවර්ධනමය කටයුතු පමණක් සිදුකරයි.

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| අනුමත කරන ලද වාර්ෂික සංවර්ධන සැලැස්ම | ✓ | | |
| පවත්වන ලද අමාත්‍යාංශ මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | | ✓ | |
| සකස් කරන ලද කාර්යසාධන වාර්තාව | ✓ | | |
| සකස් කරන ලද වාර්ෂික ප්‍රගති වාර්තාව | ✓ | | |
| සකස් කරන ලද සිතියම් ගණන (GIS භාවිතයෙන්) | | | |
| I. මාර්ගත සිතියම් | ✓ | | |
| II. භූමි පරිහරණ සිතියම් | | | ✓ |
| III. ප්‍රකාශයට පත් කරන ලද වාර්තා ගණන | | | |
| වෙබ් අඩවි නවීකරණය (Modification) | ✓ | | |

වාර්ෂිකව සකසනු ලබන වාර්ෂික පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, වාර්ෂික වාර්තාව සකස් කිරීම, වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම හා ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම අදාල කාලයට අනුරූපව සම්පූර්ණ කරන ලදි. එම කාර්යයන් සියල්ලෙහිම ප්‍රගතිය 100%කි. පළාත් සැලසුම් දෙපාර්තමේන්තුවේ භූගෝලිය තාක්ෂණ ඒකකය (GIS) මගින් 2023 වර්ෂයෙහි සැලසුම් කරන ලද කාර්යය වන පළාත් මාර්ග සිතියම් ගත කිරීම සම්පූර්ණයෙන් අවසන් කරන ලද අතර, 2023 වර්ෂය තුල සැලසුම් කරන ලද භූමි පරිමාණ සිතියම් 05ක් නිර්මාණය කර අවසන් කරන ලදි. 2023 වර්ෂය තුල සංඛ්‍යා ලේඛණ අංශය මගින් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරන ලද සංඛ්‍යා ලේඛන අත්පොත සකස් කරන ලදි. පළාත් වෙබ් අඩවිය යාවත්කාලින කිරීම සම්බන්ධයෙන් වන කටයුතු නිසි කාලයට අනුව සිදුකර ඇති අතර එහි ප්‍රගතිය 94%කි.

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම) | වර්ෂය තුළ සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50%- 74% |
| පුහුණු වැඩසටහන් 56 ක් පැවැත්වීමට සැලසුම් කළ නමුත් පුහුණු වැඩසටහන් 38 ක් පමණක් පැවැත්විණි. | - | - | ✓ |

පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ වෙනුවෙන් සක්‍රීයව සහයෝගය ලබා දෙන්නා වූ ආයතනයක් වන බැවින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුහුණු වැඩසටහන් 56 ක් පැවැත්වීමට සැලසුම් කළ අතර ආර්ථික අර්බුදය හා ඒ ආශ්‍රිතව පැන නැගුණු සමාජ හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කරගත නොහැකි වුවද, පුහුණු වැඩසටහන් 38 ක් තුළින් පුහුණුලාභීන් 1765 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇත.

## මූල්‍ය කළමනාකරණය

| ආයතනයේ කාර්යසාධන දර්ශක<br>කාර්යසාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 89-75% | 74%-50% |
| පළාත තුල සියලුම ආයතනයන්හි ක්‍රමවත් අයවැය පාලනයක් සඳහා සහය වීම. | ✓ | | |
| සියලු ආයතන සම්බන්ධීකරණයක් ඇති කිරිම. | ✓ | | |
| ආයතන වලට යොමුවන විගණන විමසුම් ප්‍රමාණය 20% කින් අවම කිරිම. | | ✓ | |

| | | | |
|---|---|---|---|
| ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අභියාචනා දුක්ගැනිවිලි 40% කින් අවම කිරිම. | ✓ | | |
| පළාත් සභා සතු සියලු වත්කම්, ලේඛන ගත කිරිම. | | | ✓ |
| පළාත් සභාව යටතේ ඇති ආයතන වලින් 80 %ක් ඊලඟ වර්ෂයේ මාර්තු මස වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරීම. | | | ✓ |
| සියලු ආදායම් ශීර්ෂවල ඇස්තමේන්තුගත ආදායමෙන් 80 %ක මට්ටමක්වත් අවම ලෙස එකතු කර ගැනීම | | | ✓ |
| ආදායම් ගිණුම් හා සම්බන්ධ විගණන විමසුම් 20% කින් අඩු කර ගැනීම. | | | ✓ |
| පළාත් සභාව වෙතින් ප්‍රාදේශිය සභා වෙත ප්‍රේෂණය වන ආදායම් ඉල්ලීම්, ලැබි මසක් ඇතුලත ඔවුන් වෙත ලබා දීම | ✓ | | |
| පළාතේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ගිණුම් සියල්ල නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම | ✓ | | |
| ගිණුම්වල නොසැසදීම් 10% ගිණුම් ,දක්වා අවම කිරිම. | ✓ | | |
| අයවැය ඇස්තමේන්තු කලට වේලාවට පිළියෙල කිරිම. | ✓ | | |
| මූල්‍ය ප්‍රකාශන සඳහා විගණන විමසුම් 30% කින් අඩු කිරිම. | | | ✓ |
| මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරිම. | ✓ | | |

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම. | ✓ | | |
| විගණන හා කළමනාකරණ කමිටු රුැස්වීම් පැවැත්වීම. | ✓ | | |
| පෙත්සම් හා විශේෂ පරීක්ෂණ කටයුතු සිදු කිරීම. | ✓ | | |

2023 වර්ෂය තුල වාර්ෂික විගණන සැළැස්ම අනුව විගණන හා විමර්ශන වාර්තා 244 ක් නිකුත් කර ඇත. එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ පරීක්ෂණ 21 ක්, පාසැල් පෝෂණ ආහාර වැඩසටහන් පරීක්ෂණ 10 ක් හා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පෙත්සම් මත විශේෂිත විමර්ශන කටයුතු 33 ක් සිදු කරන ලදි. විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 24 ම පැවැත්වීම තුළින් අපේක්ෂිත ඉලක්කයම ළගා කර ගැනීමට 2023 වර්ෂයේ දී හැකිවිය පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී විගණන වාර්තා නිකුත් කිරීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

පැවැත්වීම හා පෙත්සම් මත විශේෂ විමර්ශන සිදු කිරීමේ ඉහළ වර්ධනයක් සිදු වී ඇත.

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (පළාත් ආදායම් දෙපාර්තමේන්තුව) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| පළාත් සභාවේ ආදායමෙන් රැස් කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | ✓ | - | - |
| 2022.12.31 දක්වා රැස් කළ තොරතුරු වලින් ඉපැයූ ආදායම් ප්‍රමාණය | ✓ | - | - |
| පළාත් සභාවේ අය වැයට කරන ලද දායකත්වය | ✓ | - | - |

2023 වර්ෂය වන විට කාර්ය මණ්ඩලයේ බදු නිලධාරී තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතියද, රු. 667,400,000.00 වූ ඇස්තමේන්තු මුදල ඉක්මවා රු.970,519,194.35 ක සත්‍ය ආදායමක් රැස්කිරීමට සමත් විය . ඒ අනුව ආදායම් රැස්කිරීමේ සමස්ථ ප්‍රගතිය 145.41% කි. මුදල් ප්‍රකාශය අනුව 2023 වර්ෂයේ උතුරු මැද පළාත් සභාවේ මුළු ආදායම රු.මි.2580 කි ඉන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව රැස්කළයුතු ආදායම වූයේ රු.මි.667.40ක් වුවත් සත්‍ය ආදායම රු.මි.970.51 ක් රැස් කිරීමට සමත් විය. ඒ අනුව රැස්කරන ලද ආදායම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස 145.41% කි. එමෙන්ම 2023 වර්ෂයේ රැස්කරන ලද තොරතුරු වලින් රැස්කිරීමට අපේක්ෂිත ආදායම (පෙරබදු) වූයේ රු. මි. 30 කි. එම වර්ෂයේ තොරතුරු මත රැස්කරන ලද බදු හා ගාස්තු ආදායම වූයේ රු.මි. 45.52කි. ඒ අනුව සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස 151.73 % කි.

## කෘෂි කාර්මික සංවර්ධනය

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| මහජන පැමිණිලි | ✓ | | |
| ආයතනයේ කාර්යක්ෂමතාව | ✓ | | |
| ත්‍රෛමාසික කාර්ය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීම. | ✓ | | |
| විගණන විමසුම් හා ඊට යවන පිළිතුරු. | ✓ | | |
| ගිණුම් කටයුතු | ✓ | | |
| යාවත්කාලීන කරන ලද හා නඩත්තු කළ ලිපිගොනු සහ ලේඛන වල මාසික ප්‍රගතිය | ✓ | | |
| මිරිදිය මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
| පළාතේ හදුනාත් ජලාශ සදහා 50% ප්‍රතිලාභී දායකත්වය මත මත්ස්‍ය ඇඟිල්ලන් 3, 829,770ක් මුදාහැරීම. | ✓ | | |
| 50 % දායකත්වය මත කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 08 සංවර්ධනය කිරීම. | | ✓ | |
| ධීවර කාර්මිකයින් 200 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම. | ✓ | | |

| විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
|---|---|---|---|
| විසිතුරු මත්ස්‍ය වගාවේ නිරත ව්‍යවසායකයන් 75 ක් සඳහා 50% දායකත්වය මත විසිතුරු උපකරණ ලබාදීම. | | ✓ | |
| **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය** | | | |
| කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි | | ✓ | |
| කෘෂිකර්මය සඳහා ජලය සැපයීම. | | ✓ | |
| ව්‍යාපෘති කළමනාකරණය. | ✓ | | |

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1.නිෂ්පාදනය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | | ✓ | |
| 2. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක කව්පි බීජ ප්‍රමාණය (Kg) | | ✓ | |
| 3. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක උඳු බීජ ප්‍රමාණය (Kg) | | ✓ | |
| 4. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක මුං බීජ ප්‍රමාණය (Kg) | | ✓ | |
| 5. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක ලොකු ළූණු බීජ ප්‍රමාණය (Kg) | | ✓ | |
| 6. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක රටකජු බීජ ප්‍රමානය (Kg) | | ✓ | |
| 7. නිෂ්පාදනය කරන ලද අතිරේක බෝග ප්‍රමානය (Kg) | | | |
| උඳු | | ✓ | |
| කව්පි | | ✓ | |
| රටකජු | | ✓ | |
| මුං | | ✓ | |
| 8.වී වගාවේ ඵලදායි යාය වැඩසටහනේ අක්කර 01 සඳහා ලබාගන්නා ලද සාමාන්‍ය අස්වැන්න | ✓ | | |
| 9.පළතුරු වගා ව්‍යාප්ත කිරිම හා නිෂ්පාදනය ඉහල නැංවීම (අක්කර) | | ✓ | |
| 10.පිහිටුවනු ලැබූ තරුණ ගොවි සමාජ ගණන | ✓ | | |
| 11.ගැප් (GAP) සහතික ලබාදුන් ගොවිපොල් සංඛ්‍යාව | ✓ | | |
| 12.සංවර්ධනය කරනු ලැබූ ගෙවතු වගා සංඛ්‍යාව | ✓ | | |
| 13.වගාළිං යටතේ සංවර්ධනය කල ගොවිපල සංඛ්‍යාව | ✓ | | |

විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 13.5 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ මිරිදිය මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය ව්‍යාපෘතිය මගින් පළාතේ හඳුනාගත් ජලාශ සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත මත්ස්‍ය ඇඟිල්ලන් 3,829, 770ක් මුදාහැරීම හා 50 % ප්‍රතිලාභ දායකත්වය මත කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 08 ක් සංවිධානය කිරීම සිදු කර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 12,499,960.25 කි. මීට අමතරව ධීවර කාර්මිකයින් 200 ක් සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය මත ධීවර ආම්පන්න ලබාදීම ද මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කර ඇති අතර ඒ සඳහා මිලියන 4 ක ප්‍රතිපාදන යොදාගෙන ඇත. ඒ යටතේ ඔරු 45 සහ ධීවර දැල් 391 බෙදා දීම සිදුකර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම

රුපියල් 3,977,366.77 කි. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ මත්ස්‍ය අස්වැන්නද, ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි. විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 04 ක ප්‍රතිපාදන යොදා ගනිමින් විසිතුරු මත්ස්‍ය වගාවේ නිරත ව්‍යවසායකයන් 75 ක් සඳහා 50% ප්‍රතිලාභ දායකත්වය මත විසිතුරු උපකරණ ලබාදීම සිදු කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ වටදැල් 350 , සෙවනදැල් 75 සහ කුරුළු දැල් 100 ක් ප්‍රතිලාභීන් අතර බෙදා දීම සිදු කර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 2,910,215 කි. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.ලෝක බැංකු හා ශ්‍රී ලංකා රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ රුපියල් මිලියන 1,092,800,000 ක් උපයෝජනය කරමින් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධනය කිරීම , කෘෂිකර්මය සඳහා ජලය සැපයීම හා ව්‍යාපෘති කලමනාකරණය ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මික කටයුතු වල ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා කටයුතු සලසා දී ඇත.

## පශු සම්පත් සංවර්ධනය

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50% -74% |
| 1.කිරි නිෂ්පාදනය | ✓ | | |
| 2.බිත්තර නිෂ්පාදනය | | ✓ | |
| 3.මස් නිෂ්පාදනය | ✓ | | |

ජාතික කිරි අවශ්‍යතාවයෙන් තවමත් නිෂ්පාදනය සිදුකරනු ලබන්නේ 40% අඩු ප්‍රමාණයක්වන බැවින්, ඉදිරි දශකය තුල රටට අවශ්‍ය දියර කිරි නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා පියවර ගෙන ඇත. ප්‍රදේශයට සුදුසු ගව වර්ග හඳුන්වාදීම, කෘතිම සිංචන සේවා ප්‍රවර්ධනය හා අධිගිත ගව ශුක්‍ර ආනයනය, කිරි එකතු කිරීමේ ක්‍රම වේදය පුළුල් කිරීම, පිරිසිදු කිරි නිෂ්පාදනය හා කිරි නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා ගුණාත්මයෙන් යුතු තෘණ වර්ග වගාකිරීම හා තෘණ සංරක්ෂණය වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, කුඩා පරිමාණ කිරි ගොවිපල ඇති කිරීම හා ඒ සඳහා පහසුකම් සැළසීම සිදුකර ඇත. මස් සහ බිත්තර කර්මාන්තය නගා සිටුවීම සඳහා එළු ගොවිපල, සූකර ගොවිපල සංවර්ධන වැඩ සටහන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කර ඇත. කුකුළු පාලනය ප්‍රචලිත කිරීම සඳහා නිදැළි

කුකුළු පාලනය ගොවින් වෙත ප්‍රචලිත කර ඇති අතර ප්‍රදේශයේ ගොවිජනතාවට අවශ්‍ය කුකුළු පැටවි සැපයිම සඳහා තිරප්පනේ සත්ත්ව ගොවිපලේ ස්ථාපනය කර ඇති බිත්තර රක්වනාගාරයක් වැඩි දියුණු කර ඇත. එයට අමතරව විකල්ප කුකුළු පාලනය ගොවින් වෙත ප්‍රචලිත කිරිම සඳහා තිරප්පනේ සත්ත්ව ගොවිපලේ තාරා ඒකකය හා වටු ඒකකය ස්ථාපිත කර ඇත.

## සංස්කෘතික සංවර්ධනය

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| නේපත්‍යාගාර සඳහා පුටු හා කණ්ණාඩි / මේස සවිකිරීම | ✓ | | |
| වේදිකා පසු ආවරණය සකස් කිරිම | ✓ | | |
| උතුරු මැද කළා උළෙල | ✓ | | |

2023 වර්ෂයේ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රු: මි. 1.5 ක් වෙන් වු අතර එමඟින් සුරපුර රංග පීඨයේ සංවර්ධන කටයුතු කිරීම සිදු කරන ලද අතර, 2023 වර්ෂයේ කළා උළෙල සඳහා ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත වෙන් නොවුවද සංස්කෘතික කටයුතු සඳහා ප්‍රධාන අමාත්‍යාංශයෙන් වෙන් වු ප්‍රතිපාදන මඟින් ඉටුකරන ලදී.

## ප්‍රාදේශීය සංවර්ධනය

| ආයතනයේ කාර්ය සාධක දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| සංවර්ධනය කරනු ලබන මාර්ග ප්‍රතිශතයක් ලෙස | | | 15% |
| සංවර්ධනය කරනු ලැබූ හා අළුතින් ඉදිකරන ලද ප්‍රජා ජල පද්ධතීන් ප්‍රතිශතයක් ලෙස | | | 25% |
| සංවර්ධනය කරනු ලැබූ හා අළුතින් ඉදිකරනු ලැබූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන හා සෞඛ්‍ය සායන සඳහා සහභාගීවන ප්‍රතිලාභීන් ප්‍රතිශතයක් ලෙස | | | - |
| පුස්තකාල, ක්‍රීඩාපිටි, විහාරස්ථාන සංවර්ධන පහසුකම් හා වෙනත් පොදු පහසුකම් සපයන ස්ථානයන් සම්බන්ධයෙන් සපයන ලද සේවාව ප්‍රතිශතයක් ලෙස | | | - |

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| වැඩිදියුණු කරන ලද මාර්ග දුර | | | ✓ |

| ආයතනයේ කාර්යසාධන දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1. අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම | ✓ | - | - |
| 2. අනුරාධුපුර පැරණි බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම | ✓ | - | - |
| 3. පරිපාලන ගොඩනැගිල්ලේ කාමර දෙකක් පාටිෂන්කර වෙන් කිරීම | ✓ | - | - |
| 4. කැකිරාව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතියේ ගලිවල සකස් කිරීම. | ✓ | - | - |
| 5. මගී ආවරණ අලුතෙන් ඉදි කිරීම (අනුග්‍රාහක දායකත්වයෙන්) | ✓ | | |

ප්‍රාග්ධන ඌනතාවය හේතුවෙන් 2023 වර්ෂය සඳහා උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන වෙන් නොවූවද ආයතනයේ උපයාගන්නා ලද ප්‍රතිපාදන මගින් 2023 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට යෝජනා කර අනුමත කරගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඒවා තුලින් මගී ජනතාවට උපරිම ආකාරයෙන් ගුණාත්මක හා කාර්යක්ෂම පොදු මගී ප්‍රවාහන සේවාවක් ලබාදීමට අපේක්ෂා කරන අතර, තත්කාලීනව මතුවන ප්‍රායෝගික ගැටළු මත පදනම්ව ඉදිරියේදී එම ව්‍යාපෘතීන් නැවත වෙනස්කම් සහිතව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට ද අපේක්ෂා කරමු.

## අධ්‍යාපන සේවා

| ආයතනයේ කාර්යය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% -74% |
| 01. පාසල් මාර්ගෝපදේශනය | | | |
| කණ්ඩායම් මාර්ගෝපදේශ සැලැස්ම කලාප හා පළාත් මට්ටමින් සැකසීම | ✓ | | |
| කණ්ඩායම් මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම (කොට්ඨාස/ කලාප/පළාත්) | | ✓ | |
| කණ්ඩායම් මාර්ගෝපදේශ වාර්තා සැකසීම හා වාර්තා පාසල් වෙත ලබා දීම | ✓ | | |

| 02. ප්‍රාථමික අධ්‍යාපනය - ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | | | |
|---|---|---|---|
| ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | ✓ | | |
| 4,5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ | ✓ | | |
| සිසු සාධනය ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් පාදක සිසු වැඩසටහන් | ✓ | | |
| නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | ✓ | | |
| ප්‍රගති සමාලෝචනය | ✓ | | |
| විෂයයට අදාල ඉගෙනුම් මෙවලම් ලබා දීම (3,4,5 ශ්‍රේණි සඳහා) | ✓ | | |
| 03. මානව සම්පත් සංවර්ධනය (යහපාලනය හා සේවා) | | | |
| නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු. | | | ✓ |
| 01. ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක සැකසීම | | | |
| ඉගෙනුම් සහාය / අධ්‍යාපන සංවර්ධන කටයුතු නියාමනය මෙහෙයවීම සඳහා අත්‍යාවශ්‍ය මෙවලම් සකස් කිරීම, මුද්‍රණය හා පාසල් /කලාප වෙත ලබා දීම. | | ✓ | |
| අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන රැස්වීම්. | | | ✓ |
| 02. 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| සිසු ධාරිතා සංවර්ධන වැඩසටහන් (වැඩසටහන් ) | ✓ | | |
| ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් (වැඩසටහන් ) | ✓ | | |
| 03. ගුරු සිසු ඇගයීම | | | |
| ගුරු සිසු ඇගයීම් උත්සවය පැවැත්වීම - පළාත් උත්සවය ( 2022-2023 වර්ෂයේ ජාතික විභාග ප්‍රතිඵලවලින් /විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින්/ විවිධ විෂයයන්හි සමස්ත ලංකා මට්ටමේ තරඟවලින් විශිෂ්ට කුසලතා දැක්වූ දරුවන් , ඒ් සඳහා මග පෙන්වූ ගුරුවරු හා විදුහල්පතිවරුන් ) | ✓ | | |
| 04. ද්විතියික අධ්‍යාපනය - ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | | | |
| විවිධ විෂයයන් සඳහා ඒ ඒ විෂයන්හි දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වා දීම/ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ගුරු පුහුණු (වැඩසටහන් ) | | ✓ | |
| විෂයය මට්ටමේ සිසු ප්‍රතිපෝෂණ වැඩසටහන් (11 ශ්‍රේණිය ඉලක්ක කරගත් වැඩසටහන් ) | ✓ | | |
| විෂයය මට්ටමේ සිසු පුහුණු ප්‍රායෝගික කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම ( වැඩසටහන්) | ✓ | | |
| විවිධ විෂයයන්හි කොට්ඨාස/කලාප/පළාත් තරඟ පැවැත්වීම හා ජාතික තරග සඳහා ඉදිරිපත් වීම (වැඩසටහන් ) | ✓ | | |
| 01. ක්‍රීඩා සංවර්ධනය | | | |
| කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තෝරා ගත් ක්‍රීඩා සංවර්ධනය සඳහා සිසු සංචිත පිහිටුවීම, සිසු පුහුණු කඳවුරු හා කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තරඟ පැවැත්වීම සඳහා (වැඩසටහන් ) | ✓ | | |

| | | | |
|---|---|---|---|
| සිසු පුහුණු කඳවුරු හා කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තරඟ පැවැත්වීම සඳහා (වැඩසටහන් ) | ✓ | | |
| ජාතික ,ජාත්‍යන්තර තරග සඳහා සිසුන් යොමු කිරීම | ✓ | | |
| ක්‍රීඩා විෂයය ගුරුභවතුන්/ ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණු කිරීම | | | 45% |
| නිළධාරීන් / ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම | | | 45% |
| 02. සැලසුම් හා පර්යේෂණ | | | |
| අධ්‍යාපන සංවර්ධන සැලසුම් | ✓ | | |
| පර්යේෂණ පිළිබඳව නිලධාරීන් හා ගුරුභවතුන් දැනුවත් කිරීම | | | 20% |
| 03. සිසු සාධන මට්ටම ඉහළ දැමීම | | | |
| වාර විභාග පැවැත්වීම | ✓ | | |
| අනාවරණ පරීක්ෂණ පැවැත්වීම | ✓ | | |
| 04. පාසල්වල ප්‍රාථමික හා ද්විතියික අංශවල සෞඛ්‍ය ප්‍රවර්ධනය | | | |
| නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු | ✓ | | |
| සෞඛ්‍ය කඳවුරු | ✓ | | |
| පෝෂණ වැඩසටහන් | | ✓ | |
| මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | | | ✓ |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | ✓ | | |
| 05. පාසල් නභා සිටුවීමේ වැඩසටහන බලවත්ත කිරීම | | | |
| පාසල් විධායක කමිටු, කළමනාකරණ කමිටු හා නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | ✓ | | |
| විදුහල්පතිවරු දැනුවත් කිරීම | | ✓ | |
| පාසල් කාර්ය මණ්ඩල දැනුවත් කිරීම | ✓ | | |
| දෙමව්පියන් දැනුවත් කිරීම | ✓ | | |
| 06. පළාත්, ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සිසුන් ඉදිරිපත් කිරීම | | | |
| පළාත් තරඟ විවිධ විෂයයන් යටතේ පැවැත්වීම හා ජයග්‍රාහකයින් ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා පුහුණු කිරීම. | ✓ | | |
| 07. විශේෂ අධ්‍යාපන ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | | | |
| විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | ✓ | |
| විශේෂ අධ්‍යාපන දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා සහතික කිරීම | | ✓ | |
| ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | | ✓ | |
| 08. නොවිධිමත් අධ්‍යාපනය | | | |
| අනිවාර්යය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම | ✓ | | |
| පාසල් හැරයන්නන් සඳහා දිගු කාලීන හා කෙටි කාලීන වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම | | ✓ | |
| නොවිධිමත් අධ්‍යාපන නිළධාරීන්ට හා පාඨමාලා උපදේශකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | ✓ | | |
| | 09. සැලසුම් | | |
| අලුත්වැඩියා කරන ලද පාසල් ගොඩනැගිලි සංඛ්‍යාව | ✓ | | |
| අලුත්වැඩියා කරන ලද ගුරු නිවාස සංඛ්‍යාව | ✓ | | |
| අලුත්වැඩියා කරන ලද පළාත්, කලාප හා කොට්ඨාස ගොඩනැගිලි සංඛ්‍යාව | ✓ | | |
| සකසන ලද වාර්ෂික සැලැස්ම, මධ්‍යකාලීන සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම. | ✓ | | |
| ගණනය කරන ලද පළාත් සහා පාසල් සඳහා අනුමත ගුරු සංඛ්‍යාව, ගුරු ඌණතා හා අතිරික්තතා. | ✓ | | |
| ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන හා පාසල් පාදක ඉගෙනුම් සංවර්ධන ප්‍රදාන, බෙදා දුන් පාසල් සංඛ්‍යාව | ✓ | | |

| | | | |
|---|---|---|---|
| භෞතික සම්පත් සංවර්ධනය | ✓ | | |
| අධ්‍යාපන කලාප මට්ටමින් එක්රැස් කරන ලද පාසල්වල හා කලාපවල දත්ත | ✓ | | |
| අනුමත කර පාසල්වලට ඉදිරිපත් කරන ලද පාසල්වල අයවැය ඇස්තමේන්තු සංඛ්‍යාව | ✓ | | |
| විවාරවත් කිරීමට ලක් කරන ලද පාසල් සංඛ්‍යාව() | ✓ | | |
| සකස් කරන ලද කාර්යය සාධන වාර්තාව | ✓ | | |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාළව අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා සකසන ලද සම්පත් පැතිකඩ | ✓ | | |
| යාවත්කාලීන කරන ලද දත්ත කලමනාකරණ ඒකකය | ✓ | | |
| | 10. ආයතන | | |
| අනධ්‍යන කාර්ය මණ්ඩල සේවය ස්ථිර කිරීම | ✓ | | |
| කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම | ✓ | | |
| අනධ්‍යන් කාර්ය මණ්ඩලයේ හා විදුහල්පති සේවයේ කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම | ✓ | | |
| අනධ්‍යන කාර්ය මණ්ඩලයේ හා විදුහල්පති සේවයේ උසස් කිරීම් | ✓ | | |
| ගුරු සේවයේ සේවය ස්ථිර කිරීම | ✓ | | |
| ගුරු සේවයේ උසස් කිරීම | ✓ | | |
| ගුරු ස්ථාන මාරු කිරීම - අන්තර් කලාප | | | ✓ |
| ගුරු සේවයේ තාවකාලික අනුයුක්ත | | | ✓ |
| ගුරු ස්ථාන මාරු කිරීම - අන්තර් පළාත් | | | ✓ |
| සියළුම සේවාවන්ගේ සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | ✓ | | |
| වාහන අළුත්වැඩියා කිරීම | ✓ | | |
| වාහන රක්ෂණය කිරීම | ✓ | | |
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| **සමුපකාර සේවක කොමිෂන් සභාව** | | | | | |
| විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය ඉහළ නැංවීම. | විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය. | සමුපකාර සමිති වල විධායක මට්ටමේ තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සම අවස්ථාව ලබා දීම. | | | √ |
| **කර්මාන්ත සංවර්ධන අධිකාරිය** | | | | | |
| කාන්තාවන් සහ ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සඳහා කාන්තාවන් 45 දෙනෙකු සඳහා ණය පහසුකම් ලබාදීම | සුළුපරිමාණ කර්මාන්ත වල යෙදෙන කාන්තා ව්‍යවසායකයන් සඳහා 8% ක සහ 12% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය සේවකයින් දෙදෙනෙකුගේ ඇප මත උපරිමය රුපියල් ලක්ෂ දෙකකට යටත්ව ණය ලබාදීම | කාන්තා ව්‍යවසායකයන් 45 දෙනෙකු සඳහා රු.4,475,000/- ක ණය පහසුකම් ලබාදීම | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 CLEAN WATER AND SANITATION | **සැමට පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගත හැකි බව සහතික කිරීම** | | | | |
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |
| **2030 වන විට සියළුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම** | රොන්මඩ ඉවත් කිරීම මගින් වැවෙහි ධාරිතාවය වැඩි කිරීම. | රොන්මඩ ඉවත් කිරීම මගින් වැව් 22 ක ධාරිතාවය වැඩි කරන ලදී. | | | √ |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | | | | | |
| **සංවර්ධනය කරුණු ලැබූ හා අලුතින් ඉදිකරන ලද ප්‍රජා ජල පද්ධතීන් ප්‍රවර්ධනය කිරීම** | පළාත් පාලන බල ප්‍රදේශවල හඳුනා ගන්නා ලද ජල පහසුකම් අවශ්‍ය ස්ථාන සඳහා නළ ළිං, ජල පෙරහන් හා ජලය බෙදා හැරීමේ මධ්‍යස්ථාන 3ක නඩත්තු කටයුතු සිදු කිරීම | ජල පෙරනයක් සවි කිරීම | | | √ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | **පූර්ණ රැකියා නියුක්තිය** | | | | | |
| ගෝලිය අරමුණට ළගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | | |
| | | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| **සමුපකාර සේවක කොමිෂන් සභාව** | | | | | | |
| ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය අඩු මට්ටමකට ගෙන ඒම. | ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | සමුපකාර සමිති වල සේවක පිරිස නිර්මාණශීලි භාවය වැඩිදියුණු කර සමුපකාර ක්ෂේත්‍රය ඉහළ නැංවීම. | | | | √ |
| **පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව** | | | | | | |
| නර්තන හා සංගීත ශිල්පීන් පුහුණු කිරීම | රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායම පුහුණු කිරීම | රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන් 25 දෙනකු හා රාජ්‍ය සංගීත කණ්ඩායමේ ශිල්පීන් 12 දෙනෙකු දෛනිකව පුහුණු කිරීම | | | | √ |
| **සමුපකාර අමාත්‍යාංශය** | | | | | | |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම (2.0) | අවශ්‍යතා හඳුනා ගැනීම<br>ii.මිල ගණන් කැඳවීම.<br>iii.ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කිරීම.<br>iv.තාක්ෂණ වාර්තා ලබා ගැනීම<br>v.ඇණවුම් භාරදීම.<br>vi.බිල්පත් පියවීම | 1.පරිගණක 02 ක් මිළ දී ගැනීම<br>2.මුද්‍රන යන්ත්‍ර 02 ක් මිළ දී ගැනීම | | | | √ |
| **නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය** | | | | | | |
| පෝෂිත පරිපූර්ණ හා තිරසාර ආර්ථික වර්ධනයට පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනයට පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම,හා ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදනය ඇති කිරීම. | නවීන යන්ත්‍ර මිළදී ගැනිම හා ආයතනය තුළින් රැකියා අවස්ථා ලබාදීම. | | | | √ |
| **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** | | | | | | |
| **විභාග හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම** | පවත්වන විභාග ගණන<br>සම්මුඛ පරීක්ෂණ ගණන | වසර තුල ලබාදෙන ලද පත්වීම් ගණන | | | | |
| **ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද ස්ථිර කිරීම් ගණන | | | | |
| **ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද උසස්වීම් ගණන | | | | √ |
| **ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ගණන | | | | √ |
| **අයදුම්පත් කැඳවා විභාග පැවැත්වීම** | • කැඳවන අයදුම්පත් ගණන<br>සකස් කරන ප්‍රශ්න පත්‍ර | වසර තුල පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් | | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගණන | ප්‍රමාණය | | | |
| **කෙටුම්පත් සකස් කර ආයතන සමග සාකච්ඡා කර අනුමැතියට ඉදිරිපත් කිරීම** | • සකස් කරන කෙටුම්පත් ගණන<br>ආයතන සමග සාකච්ඡා කරන වාර ගණන | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | | | √ |
| **කෙටුම්පත් සකස් කර ආයතන සමග සාකච්ඡා කර අනුමැතියට ඉදිරිපත් කිරීම** | • සකස් කරන කෙටුම්පත් ගණන<br>ආයතන සමග සාකච්ඡා කරන වාර ගණන | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංශෝධන ප්‍රමාණය | | | √ |
| **ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | | | √ |
| **අදාළ ආකෘති පත්‍රවලට අනුව පිළිතුරු සැපයීම** | සකස් කරන ආකෘති පත්‍ර ගණන | පිළිතුරු සපයා ඇති තොරතුරු ඉල්ලීම් ගණන | √ | | |
| **අදාළ ආකෘති පත්‍රයට අනුව පිළිතුරු සැපයීම** | සකස් කරන ආකෘති පත්‍ර ගණන | ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු ඉල්ලීම් ගණන | | | √ |
| **අදාළ ලිපි ගොනු අධ්‍යනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • අධ්‍යනය කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | මානව හිමිකම් පැමිණිලි ගණන | | | √ |
| **අදාළ ලිපි ගොනු අධ්‍යනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම** | • අධ්‍යනය කරන ලිපිගොනු ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | නඩු ගණන | | | √ |
| **ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම, මාරු මණ්ඩල පිහිටුවීම** | • ස්ථාන මාරු අයදුම්පත් ගණන<br>සකස් කරන සභා සටහන් ගණන | ස්ථාන මාරු වීම් ගණන | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | පූර්ණ හා තිරසාර කාර්මීකරණය හා නව නිපැයුම් ප්‍රවර්ධනය | | | | |
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| **පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව** | | | | | |
| නව කාර්යාල සහ නිල නිවාස පද්ධතියක් පවත්වාගෙන යාම. | උප කාර්යාල නඩත්තු කිරීම හා නවීකරණය කිරීම | උප කාර්යාල අළුත්වැඩියා කිරීම, නිල නිවාස පද්ධතිය නවීකරණය කිරීම හා කාර්යාල උපකරණ මිලදී ගැනීම. | | | √ |
| **පළාත් පාලන දෙපාර්තමේන්තුව** | | | | | |
| ග්‍රාමීය වශයෙන් දුෂ්කර ප්‍රදේශ වල ගමන් කිරීමට අපහසු සහ දැඩි ලෙස අබලන්වූ මාර්ග හඳුනාගෙන අදාළ ප්‍රදේශයේ සම්පත් උපරිම ප්‍රයෝජනයට | ග්‍රාමීය මාර්ග තාර, කුට්ටිගල්, කොන්ක්‍රීට් හා බොරළු දමා සංවර්ධනය කිරීම, හා මාර්ග අවට කාණු පද්ධතිය | ග්‍රාමීය මාර්ග මීටර් 500ක් බොරළු ඇතිරීම | | | √ |
| | | ග්‍රාමීය මාර්ග මීටර් 250ක් කුට්ටිගල් ඇල්ලීම | | | √ |
| | | ග්‍රාමීය මාර්ග කි.මීටර් 3ක් | | √ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගනිමින් වැඩිදියුණු කිරීම | සංවර්ධනය කිරීම සිදු කර ඇත | බොරළු ඇතිරීම | | | |
| | | ග්‍රාමීය මාර්ග මීටර් 75ක් කුට්ටිගල් ඇල්ලීම | | √ | |
| මාර්ග සංවර්ධන අධිකාරිය | | | | | |
| ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ගුණාත්මක නිමාවක් සහිත ප්‍රශස්ථ පිරිවැයකින් යුත් මාර්ග ඉදි කිරීම | විධිමත් ජලා ප්‍රවාහන පද්ධතියක් සහිතව මැකඩම් ක්‍රමයට මාර්ග පුළුල් කර සැකසීම | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 REDUCED INEQUALITIES | රටවල් ඇතුලත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම | | | | |
| ගෝලිය අරමුණට ළගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | | | | |
| බදු හා ගාස්තු රැස් කිරීම සංවර්ධනය | වෙළඳපලවටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹවීම හා වටිනාකම් පිළිබඳව තක්සේරුකරුවන්ගේ මතය ලබා ගැනීමටදැනුවත් කිරීම. | නිළධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | √ |
| අනෙකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සංවර්ධනය | ආදායම් එකතු කිරීම පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | නිළධාරීන් පුහුණු කර,පරිගණක ක්‍රමවේදයේ පැවති අඩුපාඩු සකස් කර යාවත්කාලීන කිරීම. | | | √ |
| පළාත්සහා අරමුදලට දක්වන දායකත්වය වර්ධනය කිරීම | දේපළ සඳහා මතය ලබාදීම තුළින් වෙළඳපල වටිනාකමට ඔප්පු ලිවීම, රාජ්‍ය ආයතන මගින් තොරතුරු ලබා ගැනීම හා ඒ අනුව බදු අය කිරීම,. සුරාබදු හා අධිකරණ දඩ ලැබීම් පිළිබද විමර්ෂණය කිරීම තුළින් එම | 1.දේපළ සඳහා මතය ලබා දීම කඩිනම් කිරීම.<br>2.රැස් කළ තොරතුරු අනුව නව ලිපිගොනු විවෘත කිරීම හා ඒ අනුව බදු අය කිරීම.<br>3. I. NC 100 රිසිට්පත් විගණනය කිරීම.<br>II.ලැබිය යුතු සුරා බදු ආදායම පිළිබඳව තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් කැඳවීම. | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආදායම් රැස් කිරීම විධිමත් කිරීම. | | | | |
| **සමාජ සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| 2030 වන විට ආබාධිත බව ජන වර්ගය, ජාතිය ආගම් හෝ තත්වයන් පිළිබඳ සියළු දෙනාගේ සමාජ ආර්ථික හා දේශපාලනික අන්තර්කර්ණය සවිබල ගැනීවීම සහ ප්‍රවර්ධනය කිරීම | මුල්‍යාධාර ලබාදිම<br><br>ආබාධිත උපකරණ ආධාර ලබාදීම<br><br>දැනුම,කුසළතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | රු/මි. 369.98ක් විවිධ මුල්‍යාධාර ලබාදිම සඳහා වැයකිරීම<br><br>ආබාධිත පුද්ගලයින් 1045ක් සඳහා අක්ෂි කාච හා උපකරණ ආධාර ලබාදීම<br><br>දැනුම,කුසළතාහාආකල්පසංවර්ධනවැඩසටහන් පැවැත්වීම | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම | | | | | |
| ගෝලිය අරමුණට ළගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| **පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව** | | | | | |
| රෝහල් හා ආරෝග්‍ය ශාලා, පාසැල් ගොඩනැඟිලි ඉදිකිරිම | ස්වාභාවික විපත්වලින් ආරක්ෂාවන පරිදි තත්ත්වයෙන් උසස් ආරක්ෂාකාරී ගොඩනැඟිලි ඉදිකිරීමට සැලසුම් කිරීම. | දෙපාර්තමේන්තු රාජකාරී විමධ්‍යගත කර කඩිනමින් අවශ්‍ය සේවා සැපයීම. | | | √ |
| **මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය** | | | | | |
| මගී පහසුකම් සංවර්ධනය කිරීම,<br><br>බස්නැවතුම්පළ සංවර්ධනය කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,<br><br>බස් හිමිකරුවන්ගේ සහ සේවකයින්ගේ ආකල්ප වර්ධනය කිරීම | ඉහළයන මගී අවශ්‍යතාවයට සාපේක්ෂව බස් මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම.<br><br>බස්නැවතුම්පළ සංවර්ධනය කිරීම.<br><br>බස්නැවතුම්පළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.(කාපට් ඇතිරීම සහ වැසිකිළි පහසුකම් ) | අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම<br><br>අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම<br><br>පරිපාලන ගොඩනැගිල්ලේ කාමර දෙකක් පාටේෂන්කර වෙන් කිරීම.<br><br>කැකිරාව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතියේ ගලිවල | | | √<br><br>√<br><br>√<br><br>√ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මගී ප්‍රවාහනයේ යෙදෙන බස්රථවල බස්රථහිමියන්/ රියැදුරු,කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම.<br><br>අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ආයතන ධාරිතා සංවර්ධනය කිරීම. | සකස් කිරීම<br><br>මගී ආවරණ අලුතෙන් ඉදි කිරීම (අනුග්‍රාහක දායකත්වයෙන්) | | | √ |
| **මාර්ග සංවර්ධන අධිකාරිය** | | | | | |
| විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ග වල ආරක්ෂාව ඉහළ නැංවීම | පදික මාරු ඇතුළු අනෙකුත් වැදගත් මාර්ග සලකුණු කිරීම් සිදු කිරීම | | | | √ |
| **ප්‍රධාන අමාත්‍යාංශය** | | | | | |
| පරිසර හිතකාමීව සහ සංස්කෘතික හිතකාමීව සංචාරක කර්මාන්තය ගොඩනැගීම | පළාතේ සංචාරක ආකර්ශණය ශක්තිමත් කිරීම | සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වීඩියෝ දර්ශන නිර්මාණය කිරීම | | | √ |
| පළාතේ ජනතාවගේ සහ දරුවන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය | සාරධර්ම වලින් පිරිපුන් සමාජයක් ගොඩනැගීම | පළාතේ විහාරස්ථානවල ආගමික උත්සව සිදුකිරීම | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION | **පරිභෝජන හා නිශ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම** | | | | |
| ගෝලීය අරමුණට ළගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | **එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම්** | **එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය** | **එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය** | | |
| | | | **0.%-49%** | **50%-74%** | **75%-100%** |
| **අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව** | | | | | |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක පරික්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම. | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා 219 නිකුත් කිරීම. | විගණන වාර්තා 244 ක් නිකුත් කිරීම. | | | √ |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් නියෝජනය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 24 ක් පැවැත්වීම | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 24 ක් පැවැත්වීම. | | | √ |
| ගරු ආණ්ඩුකාරතුමාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ/ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු 22 සිදු කිරීම | පෙත්සම් හා විශේෂ පරීක්ෂණ කටයුතු 54 ක් සිදු කිරීම. | | | √ |

| 13 CLIMATE ACTION | දේශගුණික විපර්යාස හා එහි බලපෑම අවම කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම | | | | |
|---|---|---|---|---|---|
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |
| කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදා වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති 82ක් ප්‍රතිසංස්කරණය කරන ලදී | | | √ |

| 15 LIFE ON LAND | **ගොඩබිම පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම, පළිසකර කිරීම හා ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම** | | | | |
|---|---|---|---|---|---|
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |
| 2030 වන විට කාන්තාකරණය, නියගය සහ ගංවතුර නිසා බලපෑමට ලක් වූ ඉඩම් සහ පස නැවත යථා තත්වයට පත්කිරීම | අත්හැර දමන ලද වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම. | අත්හැර දමන ලද වාරි පද්ධතීන් ප්‍රතිසංස්කරණය කරන ලදී. | | | √ |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | | | | | |
| භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන් විශේෂ වනාන්තර කදු හා වියලි බිම් අන්තර් ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරිම . | • පළාතට ආවේනිකවූ රිටිගල වැනි විශේෂ පාරිසරික කලාප නිරීක්ෂය හා වැදගත්කම හඳුනා ගැනීම.<br>• එහි වැදගත්කම , පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම<br>• රිටිගල නිරීක්ෂන අදහස් එක්තැන් කල රිටිගල කෘතිය දොරට වැඩුම<br>• පාර්ශව ආයතන දැනුවත් කීරිම සඳහා රිටිගල ග්‍රන්ථය බෙදාදීම | • රිටිගල පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ ලබා ගැනීමේ චාරිකාව.<br>• රිටිගල යෑමට පෙර කාර්ය මණ්ඩලයේ නිර්මාණ ලබා ගැනීම.<br>• රිටිගල මැයෙන් ග්‍රන්ථයකට අවශ්‍ය ලිපි ලේඛන ලබා ගැනීම.<br>• ග්‍රන්ථයක් ලෙස එළි දැක්වීම.<br>• අදාළ පාර්ශවකරුවන් ඉල්ලුම් කරන ලද ආයතන හා නිලධාරීන් වෙත ග්‍රන්ථයේ පිටපත් ලබා දීම. | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2030 වන විට සියළුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමණාකරණය කිරිම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම,විනාශයට පත්වූ වනාන්තර යථාතත්වයට පත්කිරිම සහ ජගත් මට්ටමින් වන රෝපනය හා නැවත වන වගාව වර්ධනය කිරිම | උතුරු මැද පළාතේ ප්‍රජාව සතුව පවතින පාරිසරික දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් හා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.<br><br>උදැසන රැස්වීම දැනුම බෙදාදීමේ වැඩසටහනක් ලෙස භාවිතා කිරීම | | | | √ |
| 2030 වන විට කාන්තාරීකරණය තුරන් කිරිම, කාන්තාරීකරණය,නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් සහ පස නැවත යතාතත්වයට පත් කිරිම තහවුරු කිරිම. | පසුගිය වර්ෂවල ඇති කරන ලද වන වගා ව්‍යාපෘති වල හා ස්වාභාවික උයන් වල වර්තමාන තත්වය පසුවිරම් කිරීම හා එහි වගකීම් ලබා දී ඇති පාර්ශව හා සම්බන්ධීකරණයෙන් එම ව්‍යාපෘති වල සඵලතාව පවත්වා ගැනීම. | | | | √ |
| **සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය** | | | | | |
| වනාන්තර කළමණාකරනය කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම. | තිරසර ලෙස වනාන්තර කළමණාකරණය සඳහා සියළුම මුලාශ්‍රවලින් සියළු මට්ටම් වලට කැපී පෙනෙන ලෙස සම්පත් භාවිතය. | ආයතනය සතු භූමි ප්‍රමාණය සැලකිල්ලට ගෙන ප්‍රදේශයට අවශ්‍ය හා ගැළපෙන ලෙස ගස් සිටුවීද. | √ | | |
| **මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය** | | | | | |
| පැළ සිටුවීමේ ව්‍යාපෘතිය | සියළු පෙර පාසල් ආශිතව පැළ සිටුවීම | සියළු පෙර පාසල් ආශිතව පැළ සිටුවීම | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා සියලු දෙනාම ඇතුලත් වූ සමාජයක් පුවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම හා ඵලදායී වගකීමක් සහිත පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම** | | | | |
| ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| නියෝජනය කරන සමාජ ස්ථරය තුලින් ඇති විය හැකි සියලු අහිතකර තත්ත්වයන් හඳුනා ගැනීම, විසඳුම් ලබා දීම, වැලැක්වීමට පියවර ගැනීම, නීතියේ රැකවරණය ලබා දීම, අදාල පාර්ෂව සඳහා ආයතන රැකවරණය ලබා දෙමින් | හඳුනාගත් අහිතකර තත්වයන් සඳහා විසඳුම් ලබා දීම, නීතියේ රැකවරණය ලබා දීම. දරුවන් ආයතනගත කිරීම, හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම. | හඳුනාගත් අහිතකර තත්වයන් සඳහා ලබා දුන් විසඳුම් සංඛ්‍යාව - 1311, නීතියේ රැකවරණය ලබා ගත් ළමුන් සංඛ්‍යාව - 1143, ආයතනගත කළ දරුවන් සංඛ්‍යාව - 540. | | √ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයතනික මට්ටමින් ලබාදිය හැකි සියලු සේවාවන් ඵලදායී ලෙස ඉටු කිරීම. | | | | | |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | | | | | |
| 16.6<br>සියළු මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිද භාවයෙන් යුත් ආයතන පිහිටුවීම | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුණරාවර්තන වියදම් දැරීම<br><br>දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් දැරීම | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුණරාවර්තන වියදම් වශයෙන් රු/මි.526.69 ක් වැය කිරිම<br><br>දෙපාර්තමේන්තුවේප්‍රාග්ධන වියදම් වශයෙන් රු/මි 0.79 | | | √<br><br>√ |

| | ධරණීය සංවර්ධනය ක්‍රියාත්මක කිරීම | | | | |
|---|---|---|---|---|---|
| ගෝලිය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශකය අනුව 2023 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
| | | | 0.%-49% | 50%-74% | 75%-100% |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | | | | |
| රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම | බදුකරුවන්ගෙන් නියමිත කාල වකවානුව තුල බදු අයකර ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීනවී නොමැති බදු ගොනු හඳුනාගැනීම හා යාවත්කාලීන කිරීම ,බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | | √ |
| පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | | | | | |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක පරික්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම. | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා 219 නිකුත් කිරීම. | විගණන වාර්තා 244 ක් නිකුත් කිරීම | | | √ |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් නියෝජනය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් 24 ක් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් 24 ක් පැවැත්වීම | | | √ |
| ගරු ආණ්ඩුකාරතුමාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ/ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු 22 සිදු කිරීම. | පෙත්සම් හා විශේෂ පරීක්ෂණ කටයුතු 54 ක් සිදු කිරිම | | | √ |
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | | | | | |
| 17.3.2.1. විදේශීය ආයෝජන | ප්‍රගති සමාලෝචන | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | | ✓ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ප්‍රාදේශීය වශයෙන් ගලා යාම පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන.<br><br>17.3.2.2 පළාත තුළ ක්‍රියාත්මක වන විදේශීය ආයෝජන ව්‍යාපෘති ගණන.<br><br>17.3.2.3 විදේශීය ආයෝජන ව්‍යාපෘති මගින් ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමට ගලා ගිය මුදල රු.මි. | | විදේශීය ආයෝජන ව්‍යාපෘති මෙහෙයවීම | | ✓ | |
| 17.8.1.1පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කරන වාර ගණන<br><br>17.8.1.2. භූගෝලීය තොරතුරු තාක්ෂණය (GIS) භාවිතයෙන් සකස් කරන ලද සිතියම් ප්‍රමාණය<br><br>17.8.1.4.සංවර්ධන සැලසුම්කරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) භාවිතය පිළිබඳව පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරන ලද වාර ගණන | | පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br><br>භූගෝලීය තොරතුරු තාක්ෂණය (GIS) භාවිතයෙන් සකස් කරන ලද සිතියම් සැකසීම | ✓<br><br>✓<br><br>✓ | | |
| 17.14.1.1. තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව හඳුන්වා දීමේ වැඩසටහන්.<br><br>17.14.1.2. පළාත් මට්ටමින් සකස් කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක.<br><br>17.14.1.3. තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරා ළඟාවීම පිළිබඳ විමර්ශනය කරන ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | | පළාතට ගැලපෙන ඉලක්ක සැකසීම<br><br>ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | ✓ | ✓ | |
| 17.18.1.2. තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරගත් දිගු කාලීන සැලැස්ම (2020-2030) | | දිගු කාලීන සැලැස්මක් සකස් කිරීම | | ✓ | |
| 17.19.1.1. තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක කරා ළඟාවීම මැනීම. සඳහා සකස් කරන ලද අංග සම්පූර්ණ දත්ත පද්ධතිය (Decision Support System) | | දත්ත පද්ධතියක් සකස් කිරීම | | ✓ | |

## 5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

උතුරු මැද පළාත්සභාව තුල පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කිරීමේදී අප සතු ශක්තීන් හා අවස්ථා උපයෝගී කරගනිමින් ලබා ගත් ජයග්‍රහණ මෙන්ම දුර්වලතා, තර්ජන හා අභියෝග වලට මුහුණු දීමට සිදුවිය. ඒ අනුව,

➤ **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වලට අදාලව, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු කර ඇත.**

**සියලුම ආකාරයේ කුසගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම , සෑම වයසකදීම සියලු දෙනාටම සෞඛ්‍ය සම්පන්න හා යහපත් ජීවිතයක් ප්‍රවර්ධනය කිරීම** යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- ➤ මත්ස්‍ය නිෂ්පාදිතයේ සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් අත්කර ගැනීමට කටයුතු කිරීම (2018 පැවති 24,540Mt මත්ස්‍ය ප්‍රමාණය 31,604 Mt දක්වා වැඩි කර ගැනීම),
- ➤ බීජ වී නිෂ්පාදනය හා ගොවීන් අතර හුවමාරු කරගැනිම වර්ධනය කර ගැනීම,
- ➤ අතිරේක ආහාර බෝග නිෂ්පාදනයේදි වැඩි අස්වනු ආදර්ශන යාය වැඩසටහන් මෙන්ම බීජ නිෂ්පාදන වැඩසටහනද අධිසනත්ව වගා වැඩසටහන්ද සාර්ථක සිදු කිරීම,
- ➤ කෘෂිව්‍යවසායකත්වය දියුණු කිරිමේ අරමුණින් කෘෂි නිෂ්පාදන ගම්මාන බිහිකිරිම හා කෘෂි සමුපකාර සමිති බිහිකිරීමට හැකිවීම,
- ➤ නව ව්‍යවසායකයින් බිහිකිරිමට හැකිවීම,
- ➤ කිරි නිෂ්පාදන හා මස් නිෂ්පාදන සංවර්ධනය අපේක්ෂිත මට්ටමට ළඟා වීම.

➤ **උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යංශයේ හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වලට අදාලව, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු කර ඇත.**

සියලු ආකාරයේ දිළිදු බව සියලු තැන්හිම දුරු කිරීම, සියලුම ආකාරයේ කුසගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම, සෑම වයසකදීම සියලු දෙනාටම සෞඛ්‍ය සම්පන්න හා යහපත් ජීවිතයක් ප්‍රවර්ධනය කිරීම, පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම , රටවල් ඇතුලත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම, ගොඩබිම පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම, පළිසකර කිරීම හා ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම, තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා සියලු දෙනාම ඇතුලත් වු සමාජයක් ප්‍රවර්ධනය කිරීම,

සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම හා ඵලදායී වගකීමක් සහිත පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- මාසික හා මාසික නොවන මූල්‍යාධාර ලබා දීම,
- ක්ෂයරෝග ආධාර හා ස්වයං රැකියා ආධාර ලබාදීම,
- සෞඛ්‍ය වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය වැඩිදියුණු කිරීම,
- ප්‍රතිලාභීන් 415ක් සඳහා අක්ෂි කාච ලබාදීමට හැකිවීම,

උතුරු මැද පළාතේ සුවිශේෂී පාරිසරික කලාපයක් වන රිටිගල රක්ෂිතයෙහි වැදගත්කම ගම්‍ය වන ලෙස එක් එක් නිරීක්ෂකයන්ගේ අදහස්වල එකතුවක් ලෙස රිටිගල ග්‍රන්ථය එළිදැක්වීම වැනි කටයුතු ඉතාමත් සාර්ථකව ඉටු කර ඇත.

**➤ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමූපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වලට අදාලව, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු කර ඇත.**

සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම , සියලුම ආකාරයේ කුසගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම, පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම, පූර්ණ රැකියා නියුක්තිය, නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- විදෙස් ගත වන තරුණ තරුණියින් සඳහා භාෂා පුහුණුව ලබා දීම,
- සුළුපරිමාණ කර්මාන්තකරුවන් සඳහා ණය ලබාදීමට හැකි වීම,
- ණය ලබාදීමේ සීමාව ඉහළ නැංවීමට සමත් වීම,
- විගණන ප්‍රමිත භාවිතය පිළිබඳ කුසලතා වර්ධන පුහුණු වැඩමුළුව සඳහා නිලධාරීන් සම්බන්ධ කිරීමට හැකිවීම තුලින් විගණන ප්‍රමිත භාවිතය පිළිබඳ දැණුම ඇති නිලධාරීන් බිහිවීම,
- සමූපකාර කෝප් සිටි සංඛ්‍යාව හා ග්‍රාමීය බැංකු සංඛ්‍යාව වැඩිකර ගැනීමට හැකි වීම.

**➤ ප්‍රධාන අමාත්‍යාංශය ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වලට අදාලව, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු කර ඇත.**

පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම, පූර්ණ රැකියා නියුක්තිය, පූර්ණ හා තිරසාර කාර්මීකරණය හා නව නිපැයුම් ප්‍රවර්ධනය , නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම, ගොඩබිම පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම, පළිසකර කිරීම හා ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම, තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා සියලු දෙනාම ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, **සියලු දෙනාටම** යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම හා ඵලදායී වගකීමක් සහිත පූර්ණ ආයතන සියලු මට්ටම්

සඳහා ඇති කිරීම යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- පාසල් මට්ටමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් පාසල්වල ක්‍රියාත්මක කිරීම,
- ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කිරීම,
- පරිසරය සංරක්ෂණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- නර්තන ශිල්පීන් හා සංගීත ශිල්පීන් 37 කට පමණ පුහුණු අවස්ථා ලබා දීම,

➢ **පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වලට අදාලව, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු කර ඇත.**

සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම, සියලුම ආකාරයේ කුසගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම , ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම, පූර්ණ හා තිරසාර කාර්මීකරණය හා නව නිපැයුම් ප්‍රවර්ධනය, නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම, දේශගුණික විපර්යාස හා එහි බලපෑම අවම කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම , ගොඩබිම පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම, පිළිසකර කිරීම හා ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම, ධරණීය සංවර්ධනය ක්‍රියාත්මක කිරීම යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය ජල සුරක්ෂිතතාවය වැඩි කිරීම,
- වියළි කලාපයේ කුඩා වැව් සංවර්ධනය කිරීම,
- රෝපණ ටීවී ලෙස සමාජ මාධ්‍ය නාලිකාවක් ආරම්භ කරන ලද අතර ඒ තුළින් විවිධ වැඩසටහන් ප්‍රදර්ශනය කිරීමේ හැකියාව,
- බෝසත් පාරමිතා නමින් වූ වැඩසටහන ක්‍රියාත්මක කිරීම,
- අනුරාධපුර සාලියපුර වැඩිහිටි නිවාසයේ නේවාසික වැඩිහිටි පිරිස් ඇගයීමේ වැඩසටහන,
- ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් ඉඩම් කච්චේරි 435 ක් පැවැත්වීම,

➢ **ප්‍රධාන ලේකම් කාර්යාලය හා අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්, පහත සඳහන් පරිදි තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟා වී ඇත.**

සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම, පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම, පූර්ණ රැකියා නියුක්තිය , පූර්ණ හා තිරසාර කාර්මීකරණය හා නව නිපැයුම් ප්‍රවර්ධනය , රටවල් ඇතුලත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම, නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම ,පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය

සහතික කිරීම, ධරණීය සංවර්ධනය ක්‍රියාත්මක කිරීම යන ගෝලීය තිරසර අරමුණු ඔස්සේ කටයුතු කරනු ලබන අතර, එහිදී,

- පළාත් වෙබ් අඩවිය යාවත් කිරීමේ වැඩසටහන,
- තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරා ළඟා වීම පිළිබද ප්‍රගති වාර්තා සකස් කිරීම 45%ක ප්‍රගතියක් ළඟා වීමට හැකිවිය,
- පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම,
- කෘෂිකාර්මික නිෂ්පාදන ඵලදායිතාවය සහ දේශීය නිෂ්පාදකයින් සඳහා වෙළඳපොළ විවෘත කිරීම,
- පාසල් අධ්‍යාපනය වර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍යතාවය පරිදි නව ගොඩනැගිලි ඉදි කිරීම, පරිගණක යන්ත්‍ර සහ අධ්‍යාපන උපකරණ බෙදා දීම. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ග්‍රාමීය මාර්ග, පාලම් ඉදි කිරීම,
- ස්වාභාවික විපත්වලින් ආරක්ෂා වන පරිදි තත්ත්වයෙන් උසස් ආරක්ෂාකාරී ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම් කිරීම සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයා ඇත.
- අඩු ආදයම් ලාභීන්ගේ ආර්ථික තත්වය වර්ධනයට අදාලව මත්ස්‍ය ප්‍රවර්ධනය
- පොදු ස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය,
- පුහුණු වැඩසටහන් 38 ක් තුළින් පුහුණුලාභීන් 1765 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇත.
- සහල් සැකසුම් මධ්‍යස්ථාන නවීකරණය කිරීම තුළින් ප්‍රාදේශයේ අඩු ආදයම්ලාභී ජනතාව සඳහා රැකියා අවස්ථා ලබාදීම හා ඔවුන්ගේ ආර්ථික තත්වය ඉහළ නැංවීමට දායක වීම.

**තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කිරීමේදී පහත සඳහන් පරිදි ශක්තීන්, දුර්වලතා මෙන්ම අවස්ථාවන් හා අභියෝගයන් වූ කරුණු පහත පරිදි දැක්විය හැකිය.**

**ශක්තීන් හා අවස්ථාවන් ලෙස**

- මනා මඟපෙන්වීමක් සහිත උපදේශනාත්මක නායකත්වයන්,
- සේවයට කැපවූ කාර්යය මණ්ඩලය,
- පළාත සතුව පවතින ස්වභාවික සම්පත මෙන්ම මානව සම්පත,
- රජයෙන් ලැබීමට නියමිත ප්‍රධාන, ලෙස සාමූහික ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, විදේශීව සහයෝගීතා ව්‍යාපෘති වලට අදාල ලැබීම්
- ආදායම් ලැබීම්,
- අත්තිකාරම් ගිණුම් යටතේ අපේක්ෂිත ලැබීම

**දුර්වලතාවයන් /තර්ජන/අභියෝග**

➢ පුහුණු ශ්‍රමිකයන් අවම වීම.

➢ රටේ පැවති අර්ථික අර්බුදකාරී තත්වය හමුවේ ප්‍රතිපාදන ලබා දීම සීමා වීම,

➢ විශේෂ දක්ෂතා වලින් හා ශිල්පීය ඥානය සහිත නිලධාරින් විදේශගත වීම,

➢ පවතින දේශගුණික තත්ත්වය

➢ අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම් කිරීම

06

පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය



උතුරු මැද පළාත් සභාවේ පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත ආයතන යටතේ නිලධාරීන් 26,979 සේවයේ නියුතුව සිටින අතර ඒ යටතේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 26,860 දෙනෙකු ද, අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් 119 දෙනෙකු ද සේවයේ නියුතුව සිටී.

### 2023.03.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය

| ආයතනය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය තුල සිටින සත්‍ය කාර්ය මණ්ඩලය | | | පුරප්පාඩු | අතිරික්ත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර කාර්ය මණ්ඩලය | අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | එකතුව | | |
| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | 29,274 | 25,065 | 86 | **25,151** | 4,123 | 1,016 |
| පළාත් පාලන ආයතන | 2,239 | 1,457 | 19 | **1,476** | 763 | 509 |
| ව්‍යවස්ථාපිත ආයතන | 411 | 338 | 14 | **352** | 59 | 55 |
| මුළු එකතුව | **31,924** | **26,860** | **119** | **26,979** | **4,945** | **1,580** |

* මූලාශ්‍රය- 2024 මුදල් ප්‍රකාශය -උ.මැ.ප

## සේවය/තනතුරු අනුව කාර්ය මණ්ඩල සාරාංශය - පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

| අනු අංක | සේවය / තනතුර | 2023.03.31 දිනට | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | | | පුරප්පාඩු | අතිරික්ත සේවක සංඛ්‍යාව |
| | | | අනුමත සත්‍ය සේවක සංඛ්‍යාව | අනියම්/ තාවකාලික සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමින් සිටින සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 =4+5+6 | 8 =3-7 | 9 |
| 1 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 49 | 27 | | | 27 | 22 | 1 |
| 2 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය පරිපාලන සේවය | 3 | - | | | - | 3 | - |
| 3 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 164 | 134 | | | 134 | 30 | - |
| 4 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 198 | 74 | | | 74 | 124 | - |
| 5 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 35 | 29 | | | 29 | 6 | - |
| 6 | ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවය | 10 | 3 | | | 3 | 7 | - |
| 7 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 657 | 583 | | | 583 | 74 | 77 |
| 8 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 39 | 28 | | | 28 | 11 | - |
| 9 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 29 | 4 | | | 4 | 25 | - |
| 10 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 67 | 46 | | | 46 | 21 | - |
| 11 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 6 | 1 | | | 1 | 5 | - |
| 12 | ශ්‍රී ලංකා හෙද සේවය | 823 | 761 | | | 761 | 62 | 1 |
| 13 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 14 | 11 | | | 11 | 3 | - |
| 14 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 4 | 1 | | | 1 | 3 | - |
| 15 | ශ්‍රී ලංකා ගුරු සේවය | 16,503 | 15,044 | | | 15,044 | 1,459 | - |
| 16 | සහකාර/ නියෝජ්‍ය පළාත් පාලන කොමසාරි | 1 | | | | - | 1 | - |
| 17 | ආයුර්වේද හෙද සේවය | 28 | 6 | | 3 | 9 | 19 | - |
| | මහජන සෞඛ්‍ය හෙද නිලධාරී | 31 | 29 | | | 29 | 2 | - |
| 18 | සහකාර / ලියාපදිංචි වෛද්‍ය නිලධාරී | 19 | 19 | | | 19 | - | - |
| 19 | පාරම්පරික ආයුර්වේද වෛද්‍ය නිලධාරී | 12 | | | 12 | 12 | - | - |
| 20 | සංවර්ධන නිලධාරී සේවය | 1,551 | 1,408 | | | 1,408 | 143 | 820 |
| 21 | කාර්යාල කාර්ය සහයක | 210 | 178 | | | 178 | 32 | 35 |
| 22 | කම්කරු | 271 | 228 | | | 228 | 43 | 1 |
| 23 | කාර්යාල කම්කරු | 9 | 6 | 1 | | 7 | 2 | - |
| 24 | මුරකරු | 820 | 743 | | | 743 | 77 | 6 |
| 25 | සනීපාරක්ෂක කම්කරු | 80 | 67 | 2 | | 69 | 11 | 3 |
| 26 | උද්‍යාන කම්කරු | 5 | 2 | 2 | | 4 | 1 | - |
| 27 | බංගලා භාරකරු | 9 | 4 | 2 | 1 | 7 | 2 | - |
| 28 | සම්බන්ධීකරණ ලේකම් | 1 | | | | - | 1 | - |
| 29 | ගොවිපල කම්කරු | 10 | 5 | | | 5 | 5 | - |
| 30 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 152 | 130 | | 1 | 131 | 21 | - |
| 31 | පවුල් සෞඛ්‍ය සේවිකා | 713 | 532 | | 8 | 540 | 173 | - |
| 32 | පරිපූරක වෛද්‍ය සේවය | 294 | 217 | | 6 | 223 | 71 | 1 |
| 33 | රියදුරු | 374 | 254 | 3 | | 257 | 117 | 3 |
| 34 | තොරතුරු තාක්ෂණ සන්නිවේදන නිලධාරී | 3 | 1 | | | 1 | 2 | - |
| 35 | තොරතුරු තාක්ෂණ සන්නිවේදන සහයක | 7 | 1 | | | 1 | 6 | - |
| 36 | පරිපාලන නිලධාරී | 42 | 41 | | | 41 | 1 | - |
| 37 | කළමනාකරණ සේවා නිලධාරී | 864 | 712 | | | 712 | 152 | - |
| 38 | පළාත් ආදායම් සේවය | 31 | 18 | | | 18 | 13 | - |
| 39 | අතුරු වෛද්‍ය සේවය | 147 | 123 | | | 123 | 24 | - |
| 40 | විදුහල්පති | 788 | 496 | | | 496 | 292 | - |
| 41 | නියෝජ්‍ය විදුහල්පති | 272 | 158 | | | 158 | 114 | - |
| 42 | කෘෂිකර්ම උපදේශක | 147 | 100 | | | 100 | 47 | - |

| අනු අංක | සේවය / තනතුර | 2023.03.31 දිනට | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | | | පුරප්පාඩු | අතිරික්ත සේවක සංඛ්‍යාව |
| | | | අනුමත සත්‍ය සේවක සංඛ්‍යාව | අනියම්/ තාවකාලික සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමින් සිටින සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | |
| 43 | ජනපද නිලධාරි | 32 | 21 | | 3 | 24 | 8 | - |
| 44 | සැලසුම් ශිල්පී | 16 | 7 | | | 7 | 9 | - |
| 45 | සත්ව සංවර්ධන උපදේශක | 96 | 63 | | | 63 | 33 | - |
| 46 | තාක්ෂණ නිලධාරි (සිවිල්) | 104 | 61 | | 1 | 62 | 42 | - |
| 47 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 93 | 39 | | 1 | 40 | 53 | - |
| 48 | අරක්කැමි | 33 | 11 | 2 | | 13 | 20 | - |
| 49 | භාෂා පරිවර්තක | 8 | 1 | | | 1 | 7 | - |
| 50 | රසායනාගාර කම්කරු | | | | | - | - | 1 |
| 51 | පුස්තකාල සහයක | | | | | - | - | 1 |
| 52 | වැඩ පරීක්ෂක | | | | | - | - | 1 |
| 53 | අරක්කැමි සහයක | 3 | 1 | | | 1 | 2 | - |
| 54 | උපස්ථායක | 545 | 384 | | | 384 | 161 | - |
| 55 | පාසල් කාර්ය සහයක | 672 | 672 | | | 672 | - | 60 |
| 56 | නීති නිලධාරි | 4 | 3 | | | 3 | 1 | - |
| 57 | තාක්ෂණ සහයක | 89 | 72 | | | 72 | 17 | - |
| 58 | සෞඛ්‍ය කාර්ය සහයක | 953 | 839 | 32 | | 871 | 82 | - |
| 59 | සම්භාහක | 33 | 2 | | | 2 | 31 | - |
| 60 | ප්‍රජා සංවර්ධන නිලධාරි | 10 | 4 | | | 4 | 6 | - |
| 61 | සමූපකාර සංවර්ධන නිලධාරි | 100 | 68 | | | 68 | 32 | - |
| 62 | විමර්ශණ නිලධාරි | 17 | 8 | | | 8 | 9 | - |
| 63 | සමාජ සේවා නිලධාරි | 37 | 27 | | | 27 | 10 | - |
| 64 | පරිවාස නිලධාරි | 33 | 32 | | | 32 | 1 | - |
| 65 | ග්‍රාම සංවර්ධන නිලධාරි | 31 | 12 | | | 12 | 19 | - |
| 66 | වෝඩ්න් | 5 | | | | - | 5 | - |
| 67 | සහකාර වෝඩ්න් | 5 | 1 | | | 1 | 4 | - |
| 68 | ක්‍රීඩා නිලධාරි | 37 | 35 | | | 35 | 2 | - |
| 69 | ජීව වෛද්‍ය ඉංජිනේරු | 1 | 1 | | | 1 | - | - |
| 70 | ප්‍රමාණ සමීක්ෂක | 1 | 1 | | | 1 | - | - |
| 71 | සංඛ්‍යාලේඛණඥ | 1 | - | | | - | 1 | - |
| 72 | සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි | 3 | 2 | | | 2 | 1 | - |
| 73 | මනෝචිකිත්සක සමාජ නිලධාරි | 5 | - | | | - | 5 | - |
| 74 | මනෝ වෛද්‍ය උපදේශක | 2 | - | | | - | 2 | - |
| 75 | සහකාර නිවාසාචාර්ය | 2 | - | | | - | 2 | - |
| 76 | සහකාර මේට්‍රන් | 4 | - | | | - | 4 | - |
| 77 | ආයුර්වේද ඖෂධවේදී | 16 | 12 | | | 12 | 4 | - |
| 78 | කැමරාශිල්පී | 1 | 1 | | | 1 | - | - |
| 79 | ක්‍රීඩා පුහුණුකරු | 20 | 13 | | | 13 | 7 | - |
| 80 | පරිගණක දත්ත ක්‍රියාකරු | 1 | 1 | | | 1 | - | 1 |
| 81 | වෘත්තීය පුහුණු සම්බන්ධීකාරක | 1 | - | | | - | 1 | - |
| 82 | උපදේශන නිලධාරි | 6 | - | | | - | 6 | - |
| 83 | සංස්කෘතික නිලධාරි | 3 | 3 | | | 3 | - | - |
| 84 | මේට්‍රන් | 4 | 3 | | | 3 | 1 | - |
| 85 | සංවර්ධන සහකාර | 3 | 3 | | | 3 | - | 1 |
| 86 | ආහාර නිරීක්ෂක | 3 | 1 | | | 1 | 2 | - |
| 87 | ධීවර ව්‍යාපෘති නිලධාරි | 1 | - | | | - | 1 | - |
| 88 | නිවාසාචාර්ය | 2 | - | | | - | 2 | - |
| 89 | නිවාස මාතා | 25 | 16 | | | 16 | 9 | - |
| 90 | නිවාස භාරකරු | 4 | 2 | | | 2 | 2 | - |

| අනු අංක | සේවය / තනතුර | 2023.03.31 දිනට | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | | | පුරප්පාඩු | අතිරික්ත සේවක සංඛ්‍යාව |
| | | | අනුමත සත්‍ය සේවක සංඛ්‍යාව | අනියම්/ තාවකාලික සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමින් සිටින සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | |
| 91 | කර්මාන්ත ව්‍යාප්ති නිලධාරි | 7 | 4 | | | 4 | 3 | - |
| 92 | උපදේශක - වඩු කාර්මික | 12 | 8 | | | 8 | 4 | - |
| 93 | මැහුම් උපදේශිකා | 53 | 33 | | | 33 | 20 | - |
| 94 | අභ්‍යන්තර විගණන නිලධාරි | 25 | 22 | | | 22 | 3 | - |
| 95 | රසායනාගාර සහයක | 85 | 83 | | | 83 | 2 | - |
| 96 | ආලෝකකරණ සහයක | 1 | - | | | - | 1 | - |
| 97 | වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී | 1 | - | | | - | 1 | - |
| 98 | වෛද්‍ය වාර්තාකරණ සහයක | 8 | 3 | | | 3 | 5 | - |
| 99 | වෛද්‍ය සැපයුම් සහයක | 4 | 1 | | | 1 | 3 | - |
| 100 | NEEDLE WORK DEMONSTRATOR | 31 | 28 | | | 28 | 3 | - |
| 101 | මෝස්තර නිර්මාණ ශිල්පී | 1 | - | | | - | 1 | - |
| 102 | සැලසුම් සහ වැඩසටහන් සහකාර | 2 | 2 | | | 2 | - | 3 |
| 103 | පෙර පාසල් ගුරු | 1 | 1 | | | 1 | - | - |
| 104 | සාත්තු සේවක | 16 | 10 | | | 10 | 6 | - |
| 105 | T.V. ඒකක ක්‍රියාකරු | 1 | 1 | | | 1 | - | - |
| 106 | එන්නත්කරු -ක්ෂේත්‍ර සහයක | 10 | 3 | | | 3 | 7 | - |
| 107 | වෘත්තීය උපදේශක | 7 | 5 | | | 5 | 2 | - |
| 108 | වාට්ටු ලිපිකරු | 11 | 1 | | | 1 | 10 | - |
| 109 | ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික ශිල්පී | 1 | 1 | | | 1 | - | - |
| 110 | ආයුර්වේද ඖෂධහල් භාරකරු | 47 | 41 | | | 41 | 6 | - |
| 111 | මී මැසි පාලක | 2 | - | | | - | 2 | - |
| 112 | බංගලා භාරකරු සහයක | 1 | 1 | | | 1 | - | - |
| 113 | මධ්‍යස්ථාන භාරකරු | 39 | 34 | 3 | | 37 | 2 | - |
| 114 | වඩු කාර්මික | 2 | - | | | - | 2 | - |
| 115 | සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 1 | - | | | - | 1 | - |
| 116 | සිනමා ප්‍රක්ෂේපන යන්ත්‍ර ක්‍රියාකරු | 3 | 2 | | | 2 | 1 | - |
| 117 | බෙහෙත් ශාලා කම්කරු | 7 | 5 | | | 5 | 2 | - |
| 118 | බෙහෙත් ශාලා සහයක | 39 | 35 | 3 | | 38 | 1 | - |
| 119 | විද්‍යුත් කාර්මික ශිල්පී | 1 | 1 | | | 1 | - | - |
| 120 | විදුලි කාර්මික | 4 | 1 | | | 1 | 3 | - |
| 121 | විද්‍යුත් වෛද්‍ය කාර්මික ශිල්පී | 3 | 1 | | | 1 | 2 | - |
| 122 | රෝහල් ඕවර්සියර් | 16 | 1 | | | 1 | 15 | - |
| 123 | රසායනාගාර සේවක | 8 | 7 | | | 7 | 1 | - |
| 124 | ජීවිතාරක්ෂක | 2 | 1 | | | 1 | 1 | - |
| 125 | යන්ත්‍ර ක්‍රියාකරු | 3 | 2 | | | 2 | 1 | - |
| 126 | පෙදරේරු | 2 | - | | | - | 2 | - |
| 127 | මෝටර් කාර්මික | 1 | - | | | - | 1 | - |
| 128 | ඕවර්සියර් | 18 | 3 | | | 3 | 15 | - |
| 129 | ජල නල කාර්මික/පොම්ප ක්‍රියාකරු | 4 | - | | | - | 4 | - |
| 130 | වාර්ථා සටහන්කරු | 2 | 1 | | | 1 | 1 | - |

| අනු අංක | සේවය / තනතුර | 2023.03.31 දිනට | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | | | පුරප්පාඩු | අතිරික්ත සේවක සංඛ්‍යාව |
| | | | අනුමත සත්‍ය සේවක සංඛ්‍යාව | අනියම්/ තාවකාලික සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමින් සිටින සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | |
| 131 | අලවි සහයක | 2 | 2 | | | 2 | - | - |
| 132 | පාසල් කම්කරු | 5 | 2 | | | 2 | 3 | - |
| 133 | මැහුම්කරු | 5 | - | | | - | 5 | - |
| 134 | ඉසින යන්ත්‍ර ක්‍රියාකරු | 164 | 46 | | | 46 | 118 | - |
| 135 | පට්ටි මධ්‍යස්ථාන භාරකරු | 2 | 2 | | | 2 | - | - |
| 136 | මැනුම් ක්ෂේත්‍ර සහයක | 9 | 6 | | | 6 | 3 | - |
| 137 | පිහිණුම් තටාක සහයක | 2 | 1 | | | 1 | 1 | - |
| 138 | තාක්ෂණ ශිල්පී - යාන්ත්‍රික | 2 | - | | | - | 2 | - |
| 139 | දුරකථන ක්‍රියාකරු | 18 | 5 | | | 5 | 13 | - |
| 140 | ටිකට් ලිපිකරු | 13 | 11 | | | 11 | 2 | - |
| 141 | සංචාරක තොරතුරු මධ්‍යස්ථාන භාරකරු | 1 | - | | | - | 1 | - |
| 142 | ජල පොම්ප ක්‍රියාකරු | 1 | - | | | - | 1 | - |
| 143 | පැස්සුම්කරු | 1 | - | | | - | 1 | - |
| 144 | Diet Steward | 5 | 1 | | | 1 | 4 | - |
| 145 | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | 3 | 1 | | | 1 | 2 | - |
| 146 | සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) | 1 | - | | | - | 1 | - |
| 147 | සහකාර ඉඩම් කොමසාරිස් | 1 | - | | | - | 1 | - |
| | මුළු එකතුව | 29,274 | 25,065 | 50 | 36 | 25,151 | 4,123 | 1,016 |

කාර්ය මණ්ඩල සාරාංශය

ව්‍යවස්ථාපිත ආයතන

| අනු අංකය | ව්‍යවස්ථාපිත ආයතනයේ නම | 2023.03.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය (2023.03.31 දිනට) | | | | පුරප්පාඩු | ව්‍යවස්ථාපිත අරමුදලින් වැටුප් ලබන අතිරික්ත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඒකාබද්ධ අරමුදලින් වැටුප් ලබන අනුමත කාර්ය මණ්ඩලය | ව්‍යවස්ථාපිත අරමුදලින් වැටුප් ලබන අනුමත කාර්ය මණ්ඩලය | අනියම්/ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | එකතුව | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 = 4+5+6 | 8 = 3-7 | 9 |
| 1 | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 58 | 52 | | - | 52 | 6 | 25 |
| 2 | පුස්තකාල සේවා මණ්ඩලය | 9 | 5 | | - | 5 | 4 | - |
| 3 | පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය | 40 | 25 | | 2 | 27 | 13 | 2 |
| 4 | කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 12 | 2 | | 1 | 3 | 9 | 6 |
| 5 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | 121 | 102 | | 11 | 113 | 8 | 12 |
| 6 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 171 | 152 | | - | 152 | 19 | 10 |
| | මුළු එකතුව | 411 | 338 | - | 14 | 352 | 59 | 55 |

කාර්ය මණ්ඩල සාරාංශය
පළාත් පාලන ආයතන

| අනු අංකය | පළාත් පාලන ආයතනයේ නම | 2023.03.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය (2023.03.31 දිනට) | | | පුරප්පාඩු | අතිරික්ත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|
| | | | අනුමත කාර්ය මණ්ඩලය තුළ සිටින කාර්ය මණ්ඩලය | අනියම්/ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | එකතුව (දේශපාලන අධිකාරිය හැර) | | |
| 1 | 2 | 4 | 5 | 6 | 7 = 5+6 | 8 = 4-7 | 9 |
| 1 | අනුරාධපුර මහ නගර සභාව | 596 | 343 | 16 | 359 | 237 | 165 |
| 2 | මැදවච්චිය ප්‍රාදේශිය සභාව | 52 | 39 | | 39 | 13 | 8 |
| 3 | රඹෑව ප්‍රාදේශිය සභාව | 46 | 32 | | 32 | 14 | 7 |
| 4 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශිය සභාව | 39 | 18 | | 18 | 21 | 7 |
| 5 | පදවිය ප්‍රාදේශිය සභාව | 39 | 17 | | 17 | 22 | 9 |
| 6 | කහටගස්දිගිලිය ප්‍රාදේශිය සභාව | 58 | 38 | | 38 | 20 | 11 |
| 7 | හොරොව්පොතාන ප්‍රාදේශිය සභාව | 46 | 29 | | 29 | 17 | 5 |
| 8 | ගලෙන්බිඳුණු වැව ප්‍රාදේශිය සභාව | 48 | 33 | | 33 | 15 | 20 |
| 9 | තලාව ප්‍රාදේශිය සභාව | 77 | 54 | | 54 | 23 | 28 |
| 10 | නැ.නු.ප. ප්‍රාදේශිය සභාව | 46 | 29 | | 29 | 17 | 16 |
| 11 | ම.නු.ප. ප්‍රාදේශිය සභාව | 54 | 34 | | 34 | 20 | 18 |
| 12 | නොච්චියාගම ප්‍රාදේශිය සභාව | 61 | 50 | 3 | 53 | 8 | 13 |
| 13 | රාජාංගනය ප්‍රාදේශිය සභාව | 34 | 24 | | 24 | 10 | 8 |
| 14 | ගල්නෑව ප්‍රාදේශිය සභාව | 42 | 28 | | 28 | 14 | 7 |
| 15 | ඉපලෝගම ප්‍රාදේශිය සභාව | 58 | 50 | | 50 | 8 | 10 |
| 16 | මිහින්තලය ප්‍රාදේශිය සභාව | 40 | 28 | | 28 | 12 | 4 |
| 17 | තිරප්පනේ ප්‍රාදේශිය සභාව | 37 | 27 | | 27 | 10 | 10 |
| 18 | කැකිරාව ප්‍රාදේශිය සභාව | 102 | 69 | | 69 | 33 | 23 |
| 19 | පලාගල ප්‍රාදේශිය සභාව | 36 | 24 | | 24 | 12 | 4 |
| 20 | පොළොන්නරුව මහ නගර සභාව | 257 | 179 | | 179 | 78 | 36 |
| 21 | ඇලහැර ප්‍රාදේශිය සභාව | 50 | 29 | | 29 | 21 | 13 |
| 22 | හිඟුරක්ගොඩ ප්‍රාදේශිය සභාව | 109 | 75 | | 75 | 34 | 22 |
| 23 | මැදිරිගිරිය ප්‍රාදේශිය සභාව | 57 | 40 | | 40 | 17 | 6 |
| 24 | ලංකාපුර ප්‍රාදේශිය සභාව | 66 | 44 | | 44 | 22 | 12 |
| 25 | වැලිකන්ද ප්‍රාදේශිය සභාව | 40 | 30 | | 30 | 10 | 9 |
| 26 | දිඹුලාගල ප්‍රාදේශිය සභාව | 71 | 48 | | 48 | 23 | 36 |
| 27 | පොළොන්නරුව ප්‍රාදේශිය සභාව | 78 | 46 | | 46 | 32 | 2 |
| | **මුළු එකතුව** | **2,239** | **1,457** | **19** | **1,476** | **763** | **509** |

## 6.2 උතුරු මැද පළාත් සභාවේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

ආයතනයක අරමුණු හා අභිමතාර්ථ ජය ගැනීමට තම දායකත්වය තනිව හා සාමූහිකව ආයතනයට ලබා දෙන මානව සම්පත, කළමණාකරණය කිරීමේ උපක්‍රමික හා තර්කානුකූල ප්‍රවේශය මානව සම්පත් කළමණාකරණය යනුවෙන් හඳුන්වයි.

### පළාත් සභා පරිපාලනය

- උතුරු මැද පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 05දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම මත පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට යාමේදී අධීක්ෂණයේ හා නිරීක්ෂණයේ ගැටළු, සැලසුම්කරණයේ ගැටළු මෙන්ම සේවයේ නියුතු නිලධාරින් සඳහා අධික ලෙස රාජකාරි පැවරීම, රියදුරු තනතුරු වල පවතින පුරප්පාඩු නිසා ක්ෂේත්‍ර රාජකාරි සඳහා පැන නගින ගැටළු, ප්‍රාථමික සේවයේ නිලධාරින්ගේ පවතින පුරප්පාඩු නිසා එම රාජකාරි වල පවතින ගැටළු වැනි විවිධ ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවී ඇත. එමෙන්ම පළාත් සභා පරිශ්‍රය හා උද්‍යානය පිරිසිදු කිරීම් කටයුතු වලදී පළාත් සභා කාර්යාල ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් යොදවා ඔවුන්ගේ ශ්‍රමය ඵලදායි ලෙස යොදා ගැනීමද සිදු කර ඇත.
- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පළාතේ ආදායම ඉහළ නංවාලීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරයි. එහිදී නව බදු ගෙවන්නන් හඳුනාගැනීම, බදු ගෙවන්නා වෙනුවෙන් වාර්තා නිකුත් කර ගෙන්වා ගැනීම, යනාදි වශයෙන් ආයතනය තුල විශාල කාර්ය භාරයක් බදු නිලධාරියෙකු විසින් ඉටු කරනු ලබයි. ඒ අනුව ආයතනය තුල මේ වන විට පුරප්පාඩු වී පවතින බදු නිලධාරී තනතුරු 13 හේතුවෙන් එම රාජකාරිවල විනිවිදභාවයට හා කාර්යක්ෂමතාවයට බලපෑමක් ඇති වන අතර, එය ආයතනයේ කාර්ය සාධනය උදෙසාද සෘජු බලපෑමක් ඇති කරයි.
- තිරසාර පැවැත්මක් ඇති ඉදිකිරීම් පද්ධතියක් ඇති කිරීම උදෙසා තාක්ෂණ කාර්ය මණ්ඩල ශක්තිමත් කිරීම හා දීර්ඝ කාලීන ප්‍රශස්ත ප්‍රමිතියක් ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණ ශක්‍යතාව ලබා ගැනීම හා පද්ධතීන් දියුණු කිරීම යන අරමුණින් කටයුතු කරනු ලබන පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11ක, තෘතියික මට්ටමේ නිලධාරීන් 04ක, ද්විතියික මට්ටමේ නිලධාරීන් 33ක හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 09ක් ලෙස පුරප්පාඩු 57 පවතී. එබැවින් දැනට සේවයේ නියුතු පිරිස් සඳහා වැඩ අතිරික්තව පවතින බැවින් සේවදායක ඵලදායිතාවය වැඩිකිරීම, සේවාදායක සංවර්ධනය හා රැකියා ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ආදීය සඳහා මෙය මහත් බාධාවක්ව පවතී.
- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය සඳහාද දැනට පවතිනුයේ 2013 වර්ෂයේදී අනුමත කර ඇති කාර්ය මණ්ඩලයක් වන අතර ආයතනය නව පරිශ්‍රයට ගෙන ඒමත් සමග මෙම ස්ථානයේ වපසරිය හා විශාලත්වය අනුව දැනට අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවේ. සහකාර ලේකම් (පුහුණු) යන විධායක මට්ටමේ තනතුර ද

පුරප්පාඩුව පවතින අතර, අනුමත සංවර්ධන නිලධාරි 12 න් 04ක් ද. කළමනාකරණ සේවා නිලධාරින් 06න් 04ක්ද , රියදුරු තනතුරු 04 න් 02ක්ද , කම්කරු තනතුරු 05න් 01ක්ද ආදී වශයෙන් අනුමත කාර්ය මණ්ඩල තනතුරු 37 න් 12ක් (32.43%) ක් පුරප්පාඩුව පවතී. මෙම තත්ත්වය කාර්යභාරය පුළුල් කිරීමට හා සැලසුම් කරන ලද කාර්ය ඉටු කිරිම කෙරෙහි සෘජු බලපෑමක් ඇති කර තිබේ.

- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 29ක් වුවද සිටින කාර්යය මණ්ඩලය 24ක් විය. ජ්‍යෙෂ්ඨ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවැතියද කාර්ය සාධනය සඳහා යම් බලපෑමක් සිදු කර ඇති නමුත්, එම තත්ත්වය හැකිතාක් දුරට කළමනාකරණය කරමින් සේවාලාභීන් සඳහා ප්‍රශස්ථ සේවාවක් ඉටු කරන ලදි.

## මූල්‍ය සංවර්ධනය

- පළාත් භාණ්ඩාගරය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 32 ක් වුව ද සත්‍ය සේවක සංඛ්‍යාව 25 ක් වේ. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022. 14/2022(1) හා 14/2022(11) චක්‍රලේඛ අනුව විදේශ නිවාඩු ලැබූ නිලධාරීන් හේතුවෙන් හා ස්ථානමාරු වී ගිය නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික නිලධාරීන් නොපැමිණීම හේතුවෙන් නිලධාරීන් 03 දෙනෙකුගේ පුරප්පාඩු පැවතියද ආයතනයේ සමස්ථ කාර්ය සාධනය ළඟා කර ගැනීමේ දී පවත්නා සීමිත මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායීව අත්‍යාවශ්‍ය අංශයන් කෙරේ උපයෝජනය කිරීම තුලින් ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගන්නා ලදී.

- තවද, අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හැරුණු විට කිසිදු මාණ්ඩලික නිලධාරියෙකු නොමැති නිසා ආයතනයේ අධීක්ෂණ කටයුතු වලදී ගැටලුකාරී තත්ත්වයන් පැන නැගී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක නිවාඩු ලබාගන්නා අවස්ථාවන් වලදී රාජකාරී ආවරණය කිරීමට මාණ්ඩලික නිලධාරියෙකු නොමැති අතර ආයතනයට අනුමතව ඇති ගණකාධිකාරී සේවය II ශ්‍රේණියේ නිලධාරියාගේ පුරප්පාඩුව සඳහා නිලධාරියෙකුගේ අවශ්‍යතාවයක් පවතී. අභ්‍යන්තර විගණන නිලධාරීන් 25 ක් අනුමත නමුත් දැනට සේවය කරනු ලබන්නේ නිලධාරීන් 22 පමණි. එම නිලධාරීන් අතුරින් මෙම වසර තුළ එක් නිලධාරියෙකු විදේශීය නිවාඩු ලබා ගත් අතර, තවත් එක් නිලධාරියෙකු දේශීය නිවාඩු ලබා ගන්නා ලදී. එබැවින් ඉදිරි වර්ෂ වල ආයතනයේ ඉලක්ක සපුරා ගැනීමේදී නිලධාරීන් 20 දෙනෙකු පමණක් සිටින බැවින්, තරමක් අභියෝගාත්මකව කටයුතු කිරීමට සිදුවනු ඇත. දෙපාර්තමේන්තුවේ ස්ථිර රියදුරු තනතුරු 02 ක් අනුමතව ඇති නමුත් ආයතනය සතු වාහන තුන සඳහා ධාවනයට යොදවා ඇත්තේ එක් ස්ථිර රියදුරෙකු පමණි. එම රියදුරු මහතාද මෙම වසරේ ජූනි මස විශ්‍රාම ලබා ගත් අතර, ඒ වෙනුවට වෙනත් රියදුරෙකු ජූලි මස මෙම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා පැමිණියේය. ඊට අමතරව බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ අනුයුක්ත කළ රියදුරෙකුගේ සේවය ලබා ගන්නා අතර, එම නිලධාරියා ද ස්ථිර කර ගනිමින් රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරි වසරේ දී බලාපොරොත්තු වේ.

## කෘෂිකාර්මික සංවර්ධනය

කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ ජොෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික කාර්ය මණ්ඩලවල හිඟයක් පවතින අතර, එහිදී අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමමේ නිලධාරීන් යටතේ සහකාර ලේකම් (පාලන) හා සහකාර ලේකම් (මුදල්) නිලධාරි පුරප්පාඩු පවතින අතර, එය ආයතනයේ පරිපාලනමය කටයුතු සිදු කිරීමේදී බලපානු ලබයි. එමෙන්ම ද්විතික කාර්ය මණ්ඩලයට අයත් කළමනාකරණ සේවා නිළධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ආයතනික කටයුතු ඵලදායි අයුරින් සිදු කිරිම ගැටලුවක් වී ඇත. තවද, සංවර්ධන නිළධාරී පුරප්පාඩු හේතුවෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම, ක්ෂේත්‍ර අධීක්ෂණය, ප්‍රතිලාභීන් හා ආයතනය අතර සම්බන්ධීකරණ ක්‍රියාවලියට බාධා ඇති වීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වේ. ප්‍රාථමික කාර්යය මණ්ඩලය යටතේ ක්ෂේත්‍ර හා කාර්යාල කටයුතු සඳහා වාහන යෙදවීමේදී ප්‍රමාණවත් අයුරින් රියදුරු සේවක මහතුන් නොමැති වීමේ ගැටලුව ඇතිවන අතර මෙම කාරණා හේතුවෙන් ඉලක්ක හා අරමුණු කෙරෙහි ලඟා වීමට බාධා ඇතිවේ.

- එමෙන්ම ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිළධාරින් 24 හා කෘෂිකර්ම උපදේශක 47 ගේ පුරප්පාඩු පැවතීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන කෘෂි ව්‍යාප්ත කටයුතු සඳහාද සෘජුවම බලපා ඇත. දිවයින තුල කෘෂිකර්මාන්තයට කැමැත්තක් දක්වන පාර්ශවයන්ට මෙන්ම කෘෂිකර්මාන්තයේ නියුතු ගොවින්ගේ පුහුණු අවශ්‍යතා ඉටුකරනු ලබන, මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ පුහුණු නිළධාරින් ලෙස සේවය කරන කෘෂිකර්ම සේවයේ නිළධාරින්ගේ හිඟකම නිසාද දෙපාර්තමේන්තුවේ අරමුණු කරා ළඟාවීමට බාධා ඇතිවී ඇත.

## පශු සම්පත් සංවර්ධනය

- සේවක හිඟය දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක කරා ලඟා වීම සඳහා තදින්ම බලපානු ලබයි. ඒ කෙසේද යත්, නිලධාරින් නිසි පරිදි ක්ෂේත්‍රයේ යෙදවීමට නොහැකි වීම, පශු වෛද්‍ය සේවාව නිසි පරිදි නිසි වේලාවට ලබාදීමට නොහැකි විම, තොරතුරු රැස්කිරිම, වාර්තා තබා ගැනිම, විශ්ලේෂණය, ඉදිරිපත් කිරිම නියමිත දිනට සිදු කිරිමට නොහැකිවිම යන කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවයට බලපෑම් ඇතිකරයි.

## ඉඩම් පරිපාලනය හා සංවර්ධනය

රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත ,රජයේ ඉඩම් ආඥා පනත ,ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීම, අධීක්ෂණය , සංවර්ධනය හා සංරක්ෂණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24හි සිදුකරනු ලබන අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඉඩම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත. එසේ වුවද දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ සහකාර ඉඩම් කොමසාරිස්, මිනින්දෝරු, සංවර්ධන නිලධාරීන්, හා ඉඩම් නිලධාරීන්, රියදුරු, කා.කා.ස හා මැනුම් සහායක යන තනතුරු ඇතුලත් වන පරිදි 2023.12.31 දිනට පුරප්පාඩු 21 ක් පැවතිනි. මෙවැනි සේවක පුරප්පාඩු පැවතිම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරී වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා

බාධාවක් වී ඇත. එසේ වුවත් විධිමත් කළමනාකරණයකින් යුතුව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිලධාරීන් විශේෂ උනන්දුවකින් හා කැපවීමෙන් කටයුතු කරමින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා කටයුතු ඉටු කරනු ලබයි.

## වාරිමාර්ග සංවර්ධනය

- වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ සිදුවන රාජකාරි කටයුතු වලදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩුව, අධීක්ෂණ කටයුතු වලදී බාධාවක් වන අතර, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම වාරිමාර්ග, නිවාස, කාන්තා, වැනි විෂය ක්ෂේත්‍ර වල කටයුතු කිරීමේදී බාධාවක් ලෙස දැක්විය හැක. වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල පිළිබඳ සලකා බැලීමේදී ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය තුළ අනුමත කර ඇති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන නොමැති අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III/II ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව හා තත්‍ය කාර්ය මණ්ඩලය තුළ III/II ශ්‍රේණියේ ඉංජිනේරුවරුන් සංඛ්‍යාව 07 දෙනෙකු වුවද, ඉන් එක් නිලධාරියෙකු ව්‍යාපෘතියක් සඳහා නිදහස් කොට ඇත. තවද, එක් නිලධාරියෙකු වරලත් ඉංජිනේරු තත්ත්වය ලබා ගැනීමේ සැළසුම් පුහුණුව සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ක්‍රම හා සැලසුම් කාර්යාලයට අනුයුක්ත කර ඇත. එක් නිලධාරියෙකු රා.ප.ච. 14/2022 අනුව විදෙස් නිවාඩු ලබා විදේශගත වී ඇත. ඒ අනුව දැනට සේවයේ නිරත වන්නේ නිලධාරීන් 04 දෙනෙකු පමණක් වුවත් එම නිලධාරීන්ගෙන් දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ආවරණය කර ගනී. තවද අනුමත ගණකාධිකාරි තනතුර සඳහා දැනට නිලධාරියෙකු බඳවාගෙන නොමැති අතර,පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරයා දෙපාර්තමේන්තුවේද ගණකාධිකාරි තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බැවින්, දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට එයින් බාධාවක් සිදු වී නොමැත. තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ රියදුරු තනතුරු 06ක් අනුමත නමුත් දැනට රියදුරන් 07 දෙනෙකු සේවයේ නිරත වේ. ඉන් දෙදෙනෙක් පළාත් සභා ලේකම් කාර්යාලයෙන් හා පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇත. එබැවින් එක් පුරප්පාඩුවක් පවතී. තවද මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරි බොහොමයක් ක්ෂේත්‍රගත රාජකාරි බැවින් දෙපාර්තමේන්තුව සතුව වාහන 09 සඳහා දැනට සිටින රියදුරන් 07 දෙනා යොදා ගනිමින් දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු කරගෙන යයි. (නව රියදුරු තනතුරු 03ක් අනුමත කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත). කා.කා.ස. හා කම්කරු තනතුරු 12ක් අනුමතව ඇති අතර, 11 දෙනෙකු සේවයේ නිරත වේ. ඉන් එක් අයෙකු වාරිමාර්ග අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇත.එබැවින් පුරප්පාඩු 02 ක් පවතී.

## ප්‍රජා සංවර්ධනය

- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරු 29 ක් සහ සංවර්ධන නිලධාරී තනතුරු 15ක් ඇත. මෙයින් ග්‍රාම සංවර්ධන නිලධාරීන් 10 දෙනෙක් පමණක් සේවයේ යෙදී සිටින අතර ඉතිරි තනතුරු 19ක් පුරප්පාඩු වී ඇත.සංවර්ධන නිලධාරී තනතුරු 15 ම සම්පූර්ණ වී ඇති අතර ග්‍රාම සංවර්ධන නිලධාරී

තනතුරුවල පුරප්පාඩු සඳහා එම නිලධාරීන් 15 දෙනාම ක්ෂේත්‍රයේ යොදවාගෙන ඇත. එබැවින් දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු ඉටුකිරීමේ දී සංවර්ධන නිලධාරින් හිඟ වීම මහත් බාධාවක් වී ඇත.

## ක්‍රීඩා සංවර්ධනය

පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුවී පවතින තනතුරු පිළිබඳව සමාලෝචනය කිරීමේදී එම තත්ත්වය ආයතනික කාර්ය සාධනයේදී සැලකිය යුතු පසුබෑමකට හේතු වන බව පෙනේ. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ජොෂ්ඨ මට්ටමේ නිත්‍ය තනතුරක් වන අතර 2023/03/28 දින එම නිත්‍ය තනතුරේ සිටි ක්‍රීඩා අධ්‍යක්ෂවරයා ස්ථාන මාරු ලබා ගොස් ඇත. එබැවින් එම තනතුරේ රාජකාරි වැඩ බලන අධ්‍යක්ෂවරයෙක් මගින් ඉටු කර ගැනීමට කටයුතු ඉටු කර ගැනීමට සිදු වී ඇත.එමෙන්ම සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) තනතුර පුරප්පාඩුව පැවතීම තුළ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියේදී ආයතන අධ්‍යක්ෂවරයාහට ලැබිය යුතු තාක්ෂණික සහය නොමැති වීම ක්‍රීඩා තරඟ පැවැත්වීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා නිලධාරීන් සමග සම්බන්ධීකරණය වීම සහ පහසුකම් සැපයීම, යටිතල පහසුකම් සංවර්ධනය, යන ආයතනයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමේදී බාධාවක්ව පවතී. මේ හේතුවෙන් වැඩ බලන අධ්‍යක්ෂවරයාට සීමිත කාලයක් තුළ ඉතා විශාල වපසරියක් යටතේ රාජකාරිවල යෙදීමට සිදු වී ඇත. ක්ෂේත්‍ර සේවා සැපයීම ක්‍රීඩා සංවර්ධනය හා ව්‍යාප්තිය යන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමෙහිලා අත්‍යවශ්‍ය වුවද එම කාර්යේදී මූලික කාර්යභාරයක් පැවරෙන ක්‍රීඩා පුහුණුකරු තනතුරු 07ක් 2023 වසරේදී බඳවා ගැනීමට හැකි වීම හේතුවෙන් වසර ගණනක් පුරා පැවති එම ක්ෂේත්‍රයේ රාජකාරි අවශ්‍යතා විධිමත් පරිදි ඉටු කිරීමට හැකි වී ඇත.එහෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් සඳහා ක්‍රීඩා නිලධාරීන් සක්‍රීය සේවයේ යෙදී සිටින්නේ 24 දෙනෙකු පමණි. සම්පූර්ණ අවශ්‍යතාව 33ක් වන අතර ක්‍රීඩා නිලධාරීන් 09ක් පුරප්පාඩුව පවතී. මෙම තත්ත්වය ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා තරඟ කටයුතු, පුහුණු කිරීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම, ක්‍රීඩා සමාජ පිහිටුවීම සහ පවත්වා ගැනීම වැනි අත්‍යවශය කටයුතු පවත්වා ගැනීමේදී බාධාවක්ව පවති. විධිමත් ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තටාකයක් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතුව පැවතියද එහි සේවාවන් සැපයීමට අදාල තනතුරු පුරප්පාඩුව පැවතීම නිසා භෞතික සම්පත් නිසි ඵලදායිතාවෙන් යුතුව ආයතනික කාර්යසාධනය උදෙසා භාවිත කිරීම අපහසු වී ඇත. ද්විතියික මට්ටමේ නිලධාරීන්ගේ හිඟය වර්තමානයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පවතින විශාල ගැටළුවකි. එනම්, 2023 වසරේදී එක් සංවර්ධන නිලධාරියකු සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර කළමනාකරණ සේවා නිලධාරිණියක් ස්ථාන මාරු කිරීමෙන් පසු ඒ වෙනුවට අනුප්‍රාප්තිකයෙක් ලැබී නොමැත. ඒ අනුව ද්විතියික මට්ටමේ පුරප්පාඩු 02ක් සහිතව 2023 වසරේදී දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීමට සිදු විය. 2024 වර්ෂයේ මුල් කාර්තුවේදී තවත් කළමනාකරණ සේවා නිලධාරිණියක් ඉල්ලා අස් වීම සඳහා ඉල්ලුම් කර ඇත. ඒ අනුව 2024 මුදල් වර්ෂයේදි ද්විතියික මට්ටමේ නිලධාරී හිඟය 03 දක්වා ඉහළ යාමේ අවධානමක් පවතී.පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලිය වඩාත් සංකීර්ණ වන්නේ වසරේ මුල් කාර්තු 03ම ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා

තරඟ කාල සටහන අනුව පියවරෙන් පියවර තරඟ පවත්වා අවසන් කිරීමේ කටයුත්තේ වැදගත් හා සංකීර්ණ රාජකාරි සමූහයක් ඉටු කිරීමට කාර්යාලීය කාර්ය මණ්ඩලයට සිදු වන බැවිනි.මේ අනුව කාර්යාලයේ සාමාන්‍ය රාජකාරි ඉටු කරන නිලධාරියෙකුට වසරේ මුල් කාර්තු 03ම තමන්ගේ විෂයට අදාල තරඟ සඳහා එදිනෙදා ඉටු කල යුතු කාර්ය සමූහයක් පැවරේ. දෙපාර්තමේන්තුවේ නිලධාරි හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට විෂය කිහිපයක වගකීම් පැවරෙන අතර එම විෂය කිහිපයටම අදාලව තරඟ සමයේ ඉටු කළ යුතු වගකීම්ද පැවරෙන බැවින් ද්වීතියික මට්ටමේ නිලධාරීන්ගේ හිඟය දෙපාර්තමේන්තුවේ රාජකාරි පවත්වා ගැනීමටද සෘජුවම සෘණාත්මක බලපෑමක් එල්ල කරනු ලැබේ. එයට අමතරව රාජකාරි ඉටු කිරීමේදී විශාල පීඩනයක් කාර්ය මණ්ඩලය වෙත එල්ල වීම ආයතනික මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන අවශ්‍යතාවන් කෙරෙහි ගැටළුකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතු වී ඇත.

## කර්මාන්ත සංවර්ධනය

- කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා පේෂ උපදේශිකා සහ වඩු උපදේශක තනතුරුවල පුරප්පාඩු පැවතිම හේතුවෙන් එම නිලධාරින් වැඩ බැලිම සඳහා ද පත් කර ඇති අතර එම පේෂකර්ම මධ්‍යස්ථාන සහ වඩු පුහුණු මධ්‍යස්ථාන දුර බැහැරව පිහිටා තිබිම හේතුවෙන් එක් ආයතනයක නිලධාරියෙකු තවත් ආයතනයක වැඩ ආවරණය කිරිම සඳහා යෙදවිම අපහසු කාර්යයක් වි ඇත. මෙයට අමතරව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩු 03 ක් පැවතිම හේතුවෙන් පොළොන්නරුවේ උප කාර්යාලයේ රාජකාරි අධීක්ෂණය කිරිමේ කටයුතු ඉතා අපහසු වි ඇත. එමෙන්ම කර්මාන්ත සංවර්ධන අධිකාරිය සඳහා අනුමත සංවර්ධන නිලධාරින් තනතුරු 5 ක් කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන තනතුරු 2 ක් දැනටමත් පුරප්පාඩුව පවති සංවර්ධන නිලධාරි තනතුරු වලින් අපේක්ෂිත කාර්යය භාර්ය ක්ෂේත්‍ර නිලධාරින් දෙදෙනෙකුගෙන් මෙන්ම අලෙවි ප්‍රවර්ධන සහකාර තනතුරු දෙකකින් ආවරණය කරගෙන යනු ලැබේ. මෙම නිලධාරින් ක්ෂේත්‍ර කටයුතු මුළුමනින්ම දායක වන අතර, ආයතනික කටයුතු වලටද යම් ආකාරයකින් දායක වේ. මෙම සංවර්ධන කටයුතු කාර්යක්ෂ හා අපේක්ෂිත මට්ටමින් ළඟා කර ගැනීම සඳහා බලපා තිබේ.

## සෞඛ්‍ය සේවා

- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අදාලව නිලධාරීන් 5094 ක සංඛ්‍යාවක් අනුමත වන අතර, එයින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 94ක්, තෘතියික නිලධාරීන් 23ක් හා ප්‍රාථමික නිලධාරීන් 415 ලෙස නිලධාරීන් 954 සඳහා පුරප්පාඩු පවතී. මෙම මානව සම්පත් හිඟය තාක්ෂණික නොවන කාණ්ඩයේ පැවතීම හේතුවෙන් සේවක අභිප්‍රේරණය, සේවා කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා ඔවුන්ගේ පරිපාලන කටයුතු, කළමනාකරණ කටයුතු, කාර්යාල කටයුතු ඉටු කිරීමේදී පරිපාලන කටයුතු සඳහා බාධා ඇතිව තිබේ. එබැවින් සංවිධානයේ අරමුණු ඉටු කිරීම සඳහා ඊට සුදුසු පුහුණු තාක්ෂණික හා තාක්ෂණික නොවන කාර්ය මණ්ඩල නැතහොත් මානව සම්පත් හිඟය බලපා ඇත.
- තවද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අදාලව නිලධාරීන් 635 ක සංඛ්‍යාවක් අනුමත වන අතර, එයින් ජ්‍යෙෂ්ඨ

නිලධාරීන් 33ක්, තෘතියික නිලධාරීන් 1ක් හා ද්විතියික නිලධාරීන් 97 ක් හා ප්‍රාථමික නිලධාරීන් 58 ලෙස නිලධාරීන් 189 සඳහා අප දෙපාර්තමේන්තුවට පුරප්පාඩු පවතී. මෙම අවශ්‍යතාව සපුරා ගැනීමට වසර ගණනක සිට මේ දක්වා අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරමින් සිටි.

- එමෙන්ම අමාත්‍යාංශය මට්ටමින්ද ජ්‍යෙෂ්ඨ මට්මමේ තනතුරු 07ක් , ද්විතියික මට්මමේ තනතුරු 09 ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක්ද වශයෙන් පුරප්පාඩු 13 ක් පවතින නමුත්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව දැනට නව බඳවාගැනීම් සිදු නොකරන බැවින් සිටින කාර්ය මණ්ඩලය මගින් කළමනාකරණය කරගනිමින් අමාත්‍යාංශය සතු මානව සම්පත උපාය මාර්ගිකව අභිප්‍රේරණය කරමින් අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කරයි. එසේ වුවද රෝහල් හා අනෙකුත් ආයතන මනා කළමනාකාරීත්වයෙන් යුතුව පවතින මානව සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින් කටයුතු ගැටළුවකින් තොරව කර ගෙන යාමට උත්සාහ දරන නමුත් මහජනතාව වෙත වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීමට හිඟ මානව සම්පත පූර්ණය කිරීම කාලීනව ඉතා අවශ්‍ය කාරණයක් බවට පත්ව ඇත.

### සමාජ ආරක්ෂණය

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළව සමාජ සේවා නිලධාරීන් බඳවා ගැනීම 2019 වර්ෂයේ දී ප්‍රථම වරට සිදු කරන ලද අතර ඒ හේතුවෙන් ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් මේ වනවිට දෙපාර්තමේන්තුව තුළ නොමැති විය. එබැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වීම තුළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට යම් අපහසුතාවයක් ඇත. සමාජ සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා සංවර්ධන නිලධාරීන් යෙදවීමට කටයුතු කර ඇති අතර ද්විතීක මට්ටමේ පැවැති පුරප්පාඩු 29 න් වැඩි සංඛ්‍යාවක් සංවර්ධන නිලධාරීන් වන නමුත් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටි සංවර්ධන නිලධාරීන් සමාජ සේවා නිලධාරී තනතුරට පත්වීම මත එම සංඛ්‍යාවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් යටපත් කර අවශ්‍ය තනතුරු ඇති කර ගැනීමට සැලසුම් කර ඇත. සාත්තු සේවක, උපස්ථායක, අරක්කැමි හා මුරකරු වැනි තනතුරුවල පැවති පුරප්පාඩු වැඩිහිටි නිවාසවල කාර්ය සාධනයට ඍජුවම බලපෑම් ඇති කළ බව මෙහිලා සඳහන් කළ යුතු අතර දෙපාර්තමේන්තුව සතු වැඩිහිටි නිවාසවල රැකවරණය ලබන වැඩිහිටි නේවාසිකයින්ගේ සංඛ්‍යාව 312 ක් පමණ වේ. මෙහිදී පෙන්වා දිය යුතු විශේෂ කාරණයක් වන්නේ මාසිකව රු.10,000/- ක් බැගින් ගෙවීම් කර විශ්‍රාමික වැඩිහිටියන් නේවාසිකව සිටින බුල්නෑව වැඩිහිටි නිවාසය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීමයි. ඒ සඳහා තනතුරු අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. එබැවින් දැනට මෙම ආයතන ක්‍රියාත්මක කරන්නේද සාලියපුර වැඩිහිටි නිවාසයට අනුමත තනතුරුවල සේවය කරන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකු අනුයුක්ත කිරීමෙනි. එබැවින් දැනට පවතින තනතුරු පුරප්පාඩු හේතුවෙන් සාලියපුර හා බුල්නෑව වැඩිහිටි නිවාසයේ කාර්ය සාධනයට අහිතකර බලපෑම් සිදු වී ඇති බව තවදුරටත් සඳහන් කළ යුතුය. කෙසේ වෙතත් ආයතන තවදුරටත් මනා

කාර්යක්ෂමතාවයකින් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු පිළිබඳව නැවත වරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානය සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

එමෙන්ම පරිවාස හා ළමාරක්ෂන සේවා දෙපාර්තමේන්තුවද තෘතීක කාර්ය මණ්ඩලය කෙසේ හෝ කළමනාකරණය කරගනිමින් ආයතන කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කළද, දැනට පවතින ප්‍රාථමික කාර්ය මණ්ඩලය කළමනාකරණ කර ගැනීමට නොහැකි වීම තුළ විශාල අර්බුදයන්ට මුහුණ දීමට සිදුව ඇත. එයට හේතුව වන්නේ සීමිත තෘතීක කාර්ය මණ්ඩලයක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල කාර්යන් ඉටු කිරීමයි. සේවක සංඛ්‍යාවේ පවතින හිඟතාවය හේතු කොටගෙන දරුවන් වෙනුවෙන් ඉටු කිරීමට ඇති එදිනෙදා කටයුතු (අධිකරණයට රැගෙනයාම, රෝහලට රැගෙන යාම, පාසලට රැගෙන යාම ආදී කටයුතු වලදී) ප්‍රමාණය වැඩිවීම මත නිලධාරියාට අදාළ සේවා චක්‍රයට වඩා වැඩි පැය ගණනක් දරුවන් සඳහා යෙදවීම මත ඇතිවන මානසික පීඩනය දරුවන්ගේ කටයුතු නිසි අයුරින් ඉටු කිරීමට බාධාවක් වී ඇත.

එසේම දරුවන් කෙරෙහි දිය යුතු අවධානය ප්‍රමාණවත් නොවීම තුළ දරුවාගේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි වැදගත් දේ පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කිරීමට නොහැකි වී ඇත. දරුවාගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳව කාරණා වලදී ද එය එසේමය.

එසේම අවශ්‍යතාවය මත නියමිත තනතුරේ සේවකයන් වෙනුවට වෙනත් තනතුරක සේවකයන් වෙනත් කාර්යයන් ඉටු කිරීම සඳහා යෙදවීමේදී හා වෙනත් භාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගැනීමේ දී දරුවන් සඳහා නිසි සේවාවක් සැපයීමට නොහැකි වීම හා නිසි වගකීමක් නොමැති වීම මත ඇතිවන ගැටළුද වේ. එවැනි කටයුතු දරුවන්ගේ ආරක්ෂාවට ද යම් අවස්ථාවල දී තර්ජනයක් බවට පත්ව ඇත. එසේම තම විෂයට අදාළ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු අවස්ථා සඳහා යොමුවීමට හා වැඩිදුර අධ්‍යාපනයට යොමු වීමට කාර්යමණ්ඩල හිඟකම හේතු කොටගෙන කාලය නොලැබීම ද ඔවුන්ගෙන් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා බාධාවක් වී ඇත.

දරුවන් වෙනුවෙන් ඉටු කරන කාර්යයන් වලදී නිසි සුදුසුකම් ලත් ප්‍රමාණවත් පිරිසක් යෙදවීම දරුවන් වෙනුවෙන් ඉටු කරන කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන බැවින්, ඉදිරි වර්ෂවලදී ඒ සඳහා අවධානය යොමු කරමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඇත. මෙම තනතුරු බඳවා ගැනීමේ කටයුතු සඳහා අදාල අංශ මේ වන විට දැනුවත් කර ඇත. කෙසේ වුවද එම කටයුත්ත කාර්යක්ෂමතාවයකින් සිදුවීම, දෙපාර්තමේන්තුවට අදාළ අරමුණු අභිමතාර්ථ ඉටුකර ගැනීමට විශාල පිටිවහලක් වනු ඇත.

## ප්‍රාදේශීය සංවර්ධනය

- පළාත් පාලන දෙපර්තමේන්තුවට අදාලව ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 01 අයෙකුගේ ද , තෘතියික මට්ටමමේ නිලධාරීන් 06 දෙනෙකුගේ ද, ද්විතීයික මට්ටමේ නිලධාරීන් 24 දෙනෙකුගේද පුරප්පාඩු පවතින අතර, එම හේතුව මත ප්‍රාදේශීය සභාවල පවතින ද්වීතියික මට්ටමේ පුරප්පාඩු තනතුරුවල රාජකාරි ප්‍රාථමික මට්ටමේ සේවකයන්ට සිදු කිරීමට සිදුව ඇති හෙයින් කාර්යක්ෂමතාව පවත්වාගෙන යාමට අපහසු වේ තවද ප්‍රාථමික මට්ටමේ සේවකයින් අළුතින්ම පුහුණු කිරීමට භාජනය කළ යුතු නිසා

ඒ සඳහාද කාලය, මුදල්, ශ්‍රමය ආදිය වැය කිරීමටද සිදුවීම ආයතනික අරමුණු, කාර්යසාධනයන් ළඟා කර ගැනීමට ගැටළුකාරී වී ඇත. එමෙන්ම ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා දායක වනු ලබන අනෙකුත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්ටද මෙම මානව සම්පත් හිඟය අරමුණු කරා ළඟා වීමේදී ප්‍රබල බාධාවක් වී පවතී.

## අධ්‍යාපන සේවා සංවර්ධනය

කලාප අධ්‍යාපන කාර්යාල 08 යටතේ අධ්‍යාපන කොට්ඨාස 30ක්ද, පාසල් 810 පාලනය වනු ලබයි. මෙහිදී අධ්‍යාපන පරිපාලන සේවා නිළධාරි හිඟය, ගුරු හිඟය, ගුරු උපදේශක සේවයේ නිලධාරීන්ගේ හිඟකම ප්‍රධාන වශයෙන්ම පවතින අතර දෙපාර්තමේන්තුව තුලද ජ්‍යෝෂ්ඨ මට්ටමේ නිලධාරීන් 6 දෙනෙකු. ද්විතියික මට්ටමේ නිලධාරීන් 13 දෙනෙකු වශයෙන් පුරප්පාඩු පවතී. එහිදී එක් නිලධාරියෙකුට පැවරී ඇති රාජකාරි ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් සේවක තෘප්තිමත්භාවය හීනවීම, අපේක්ෂිත නිමැවුම් ප්‍රමාණය අපේක්ෂිත කාලරාමුව තුල සිදු කිරීමට නොහැකි වීම,කාර්යක්ෂමතාව අඩුවීම, නිමැවුම්වල ප්‍රමිතිය අඩුවීම,ඵලදායිතාවය අඩුවීම වැනි ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණු දීමට සිදුවී ඇත.

## ආදායම් උපයන ව්‍යවස්ථාපිත ආයතන

ආදායම් උපයනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාකරනු ලබන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ යාන්ත්‍රික, සේවා හා මුද්‍රණ අංශයන්ගේ කාර්යයන් පුළුල් වීමත් සමඟම සේවකයන් ප්‍රමාණවත් නොවීම නිසා පළපුරුදු සේවක හිඟය සඳහා මුහුණ දීමට සිදු විය. ඒ හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟාවීමේ යම් අපහසුතාවයකට මුහුණ දීමට ද සිදුවිය. පළපුරුද්ද සහිත කාර්මික නිලධාරීන්ගේ ඌණතාවය හේතුවෙන් නව බඳවා ගැනීම් කිහිපයක් සිදු කළ අතර ඔවුන් බඳවාගත්තද, රඳවා තබා ගැනීම සඳහා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුකූලව කටයුතු කළ යුතු බැවින් එහිදී යම් යම් අපහසුතාවයන්ටද මුහුණ දීමට සිදු වී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

ආයතනික අරමුණු හා උපාය මාර්ග ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස උපයෝජනය කිරීම පරමාර්ථ කොට ගෙන ආයතනයක් විසින් නිලධාරින් සඳහා පුහුණුවීම් ලබාදීම සිදුකරයි දැනුම, කුසලතා, ආකල්ප වලින් පරිපූර්ණ රාජ්‍ය නිලධාරියකුගෙන් මහජනයාට ලැබෙන සේවාව අතිමහත්ය.ජනතාවගෙන් වැටුප් ලබන රාජ්‍ය සේවකයා තුල එවැනි පරිපූර්ණත්වයක් ඇති කිරීම උදෙසා පුහුණුව වැදගත් අංගයක් වන අතර, නිලධාරීන් දැනුමෙන් සන්නද්ධ වී සිටීම හා දැනුම යාවත්කාලීන කර ගැනීමද මෙහිදී අත්‍යවශ්‍ය කරුණකි.

ඒ අනුව මෙම වර්ෂය කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මගින් හා අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු යටතේ පවත්වන ලද පුහුණු අවස්ථාවන් පහත පරිදි වේ.

### කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන්

| අනු අං ක | පුහුණු වැඩසටහනේ නම | ප්‍රමාණය (දින ගණන) | ප්‍රතිලාභීන් (සහභාගී වූ සංඛ්‍යාව) | මුළු වියදම | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 01 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව | 01 | 15 | 16,200.00 | දේශිය | වර්ෂය ආරම්භයේ නිලධාරින්ගේ දැනුම වර්ධනය කිරීම. |
| 02 | අවශ්‍යතා තක්සේරුව හා අයවැය ලේඛණ සකස් කිරීම | 02 | | 69,415.00 | දේශිය | අයවැය ලේඛණ නැවැරදිව සකස් කර නිසි වේලාවට මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම. |
| 03 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව | 01 | 22 | 12,020.00 | දේශිය | විභාග මෘදුකාංගය පිළිබද දැනුම ලබාදීම |
| 04 | පළාත් ආදායම් දෙපාර්තමේන්තු - බදු කාර්ය පරිපාටිය | 02 | 12 | 58,330.00 | දේශිය | පළාත් සභාවට හිමි ආදායම් කාර්යක්ෂම රැස්කිරීම |
| 05 | පළාත් ආදායම් දෙපාර්තමේන්තු - බදු නිතිය | 02 | 12 | 57,039.00 | දේශිය | පළාත් සභාවට හිමි ආදායම් කාර්යක්ෂම රැස්කිරීම |
| 06 | පළාත් ආදායම් පොර්තමේන්තුවේ- ගිණුම් පුහුණුව | 02 | 12 | 60,709.00 | දේශිය | පළාත් සභාවට හිමි ආදායම් කාර්යක්ෂම රැස්කිරීම |
| 07 | ප්‍රසම්පාදන පුහුණුව | 07 | 44 | 266,800.00 | දේශිය | ප්‍රසම්පාදන මර්ගෝපදේශයන්ට අනුව ආයතන වල ප්‍රසම්පාදන කටයුතු ඉටු කර ගැනීම තුලින් කාර්ය සාධනය ඉහල යාම |
| 08 | TMS | 01 | 37 | 35,260.00 | දේශිය | TMS පද්ධතිය පිළිබද දැනුම ලබාදී පුහුණුලාභින් පුහුණු වැඩසටහන් සඳහා යොමුකර වීම. |
| 09 | TOT | 05 | 35 | 174,096.00 | දේශිය | දැනුමෙන් සන්නද්ධ පුහුණුකරුවන් පළාතට දායාද |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | කිරීම තුළින් නිලධාරියාගේ මෙන්ම පළාතේද සංවර්ධනය. |
| 10 | දේපළ තක්සේරුව | 02 | 14 | 36,208.00 | දේශිය | දේපළ තක්සේරු කිරිමේ ප්‍රමිත, නෛතික පදනම, තක්සේරු කිරීමේ ක්‍රමවේද පිළිබඳ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර පළාත් සභාවට අයත් ආදායම් කාර්යක්ෂම රැස්කිරීම. |
| 11 | TMS | 01 | 56 | 35,800.00 | දේශිය | TMS පද්ධතිය පිළිබඳ දැනුම ලබාදී පුහුණුලාභින් පුහුණු වැඩසටහන් සඳහා යොමුකර වීම |
| 12 | දේපළ තක්සේරුව | 02 | 13 | 40,853.00 | දේශිය | දේපළ තක්සේරු කිරිමේ ප්‍රමිත, නෛතික පදනම, තක්සේරු කිරීමේ ක්‍රමවේද පිළිබඳ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර පළාත් සභාවට අයත් ආදායම් කාර්යක්ෂම |
| 13 | ප්‍රසම්පාදන පුහුණුව - පොළොන්නරුව | 10 | 49 | 434,708.00 | දේශිය | ප්‍රසම්පාදන මර්ගෝපදේශයන්ට අනුව ආයතන වල ප්‍රසම්පාදන කටයුතු ඉටු කර ගැනීම තුලින් කාර්ය සාධනය ඉහල යාම |
| 14 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 05 | 33 | 139,757.00 | දේශිය | |
| 15 | වත්කම් කළමනාකරන මෘදුකාංගය (AMS) | 01 | 41 | 51,840.00 | දේශිය | ආයතන වල වත්කම් පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලින කර පවත්වාගෙන යාම |
| 16 | වත්කම් කළමනාකරන මෘදුකාංගය (AMS) | 01 | 37 | 42,128.00 | දේශිය | ආයතන වල වත්කම් පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලින කර පවත්වා ගනිමින් ප්‍රශස්ථ ලෙස වත්කම් කළමනාකරණය. |
| 17 | CIGAS | 02 | 79 | 99,683.00 | දේශිය | ආයතනවල ගිණුම් කටයුතු නිවැරදිව හා කාර්යක්ෂම පවත්වාගෙන යාම. |
| 18 | බහු කාර්ය සංවර්ධනය නිලධාරි පුහුණුව | 03 | 73 | 114,883.00 | දේශිය | රාජය සේවකයා යනු කවරෙක්ද යන්න පිළිබඳ මනා වැටහීමකින් යුතු දැනුමෙන් සන්නද්ද නිලධාරියකු බිහිකිරීම. |
| 19 | ක්‍රිඩා දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා පරිගණක පුහුණුව | 02 | 30 | 41,441.00 | දේශිය | නිලධාරින් සඳහා පරිගණක පිළිබද දැනුම ලබාදි පරිගණක භාවිතය තුලින් කාර්යක්ෂම හා ඵලදායි ලෙස නවින තාක්ෂණය භාවිතය |
| 20 | පාඩු හා කපා හැරීම් | 01 | 45 | 31,544.00 | දේශිය | පාඩු හා අලාභ නිවැරදිව හදුනාගැනීම හා ඒ සඳහා ගතයුතු ක්‍රියමාර්ග පිළිබදව දැනුම ලාදීම. |
| 21 | බහු කාර්ය සංවර්ධනය නිලධාරි පුහුණුව | 03 | 65 | 123,684.00 | දේශිය | රාජය සේවකයා යනු කවරෙක්ද යන්න පිළිබද මනා වැටහීමකින් යුතු දැනුමෙන් සන්නද්ද නිලධාරියකු බිහිකිරීම |
| 22 | මුලික පරිගණක සාක්ෂරතාව | 04 | 44 | 84,063.00 | දේශිය | නිලධාරින් සඳහා පරිගණක පිළිබද දැනුම ලබාදි නිලධාරින්ගේ දාරිතා සංවර්ධනය |
| 23 | නිවාඩු විෂයභාර නිලධාරින්ගේ කාර්යභාරය | 01 | 60 | 84585.00 | දේශිය | නිලදාරින්ගේ පැමිණිම හා නිවැඩු පිළිබද ලේඛණ නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | දැනුම ලබාදීම. |
| 24 | මූලික ව්‍යාපෘති පුහුණුව | 01 | 30 | 43935.00 | දේශීය | ව්‍යාපෘති සැලසුම් කිරීම හා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම. |
| 25 | CIGAS - වත්කම් කළමනාකරණය | 02 | 34 | 41,544.00 | දේශීය | ආයතන වල වත්කම් පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කර පවත්වාගෙන යාම |
| 26 | පාඩු හා කපා හැරීම | 01 | 43 | 54,591.00 | දේශීය | පාඩු හා අලාභ නිවැරදිව හඳුනාගැනීම හා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම ලාදීම. |
| 27 | විශ්‍රාම දිවියට පෙර සූදානම | 01 | 30 | 45,490.00 | දේශීය | විශ්‍රාම ගැන්වීමට ආසන්න නිලධාරීන් වෙනුවෙන් සුවබර විශ්‍රාම දිවියක් සඳහා මඟපෙන්වීම. |
| 28 | වාහන ලිපි ගොනු නඩත්තුව | 02 | 34 | 63,086.00 | දේශීය | වාහන සම්බන්ද ලිපිගොණු යාවත්කාලීන කර නිවැරදිව පවත්වාගෙන යාම හා වාහන නඩත්තුව. |
| 29 | වෙබ් අඩවි නිර්මාණය | 02 | 45 | 57,965.00 | දේශීය | ආයතන වල වෙබ් අඩවි පවත්ගෙන යාම සඳහා අවභ්‍ය දැනුම ලබාදීම. |
| 30 | නව මාර්ගගත ගෙවීම්පත පිළිබඳ දැනුවත් කිරීම - අනුරාධපුර | 01 | 93 | 67,614.00 | දේශීය | පළාත් සභාවට අයත් ආදායම් රැස්කිරීම ප්‍රවර්ධනය |
| 31 | මූලික විමර්ෂණය | 01 | 47 | 43,206.00 | දේශීය | නිවැරදිව හා කාර්යක්ෂම මූලික විමර්ෂන පැවැත්වීම හා වාර්තා කඩිනමින් පිළියල කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම. |
| 32 | කාල කළමනාකරණය | 01 | 40 | 47,457.00 | දේශීය | නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම. |
| 33 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව-ක්ෂේත්‍ර නිලධාරීන්ගේ විනය | 04 | 43 | 168,110.75 | දේශීය | නිලධාරීන්ගේ හැසිරීම, ආචාරධර්ම හා වගකීම් පිළිබඳ දැනුම ලබාදී විනයගරුක රාජ්‍ය නිලධාරියකු බිහි කිරීම. |
| 34 | නව මාර්ගගත ගෙවීම්පත පිළිබඳ දැනුවත් කිරීම - පොළොන්නරුව | 01 | 93 | 70,041.00 | දේශීය | පළාත් සභාවට අයත් ආදායම් රැස්කිරීම ප්‍රවර්ධනය |
| 35 | පුහුණු සැලැස්ම සකස් කිරීම - දීප ව්‍යාප්ත නිලධාරීන් සඳහා | 01 | 27 | 27,366.00 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ පුහුණු අවශයතා හඳුනාගැනිම. |
| 36 | පුහුණු සැලැස්ම සකස් කිරීම - පරිපාලන හා සංවර්ධන නිලධාරීන් සඳහා | 01 | 112 | 76,248.50 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ පුහුණු අවශයතා හඳුනාගැනිම |
| 37 | දෙමළ භාෂා පැය 150 පුහුණුව | 25 | 158 | - | දේශීය | රජ්‍ය නිලධාරීන්ගේ දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා ගැනිම. |
| 38 | දෙමළ භාෂා පැය 150 පුහුණුව | 25 | 108 | - | දේශීය | රජ්‍ය නිලධාරීන්ගේ දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා ගැනිම. |
| **මුළු පිරිවැය** | | **130** | **1765** | 2,917,700.25 | | |

| වර්ෂය | පවත්වන ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් පැවැත්වූ දින ගණන | පුහුණුලාභීන් සංඛ්‍යාව | වැය වූ මුදල |
|---|---|---|---|---|
| 2023 | 38 | 130 | 1765 | 2,917,700.25 |
| 2022 | 28 | 129 | 1270 | 2,387,247.24 |
| 2021 | 22 | 56 | 1005 | 2,266,055.00 |
| 2020 | 56 | 141 | 5061 | 3,625,840.70 |










## කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන් වලට අමතරව අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සැලසුම් කර පවත්වන ලද පුහුණු වැඩසටහන්

- **කෘෂි හා පශු සම්පත් සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව (දින/මාස/අවු.) | සමස්ථ ආයෝජනය (Rs' 000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| GAP සහ අගයදාම පිළිබඳ ශාක නිරෝධායන සේවය නවීකරනය සඳහා වූ ආරාධිත වැඩටහන | 01 | 14 | | විදේශීය | විදේශීය | අපනයන වෙළඳපොළ සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා අගයදාම එක්කල නිෂ්පාදන පිළිබඳ දැනුම ලබාගැනීම. |
| ගෝලීය ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 21 | | විදේශීය | විදේශීය | ගෝලීය ආහාර සුරක්ෂිතතාවයේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | අවශ්‍යතාවය හා එයට කෙසේ මුහුන දියයුතුද යන්න පිලිබඳ දැනුම ලබාගැනීම. |
| ගොවි පුහුණුව | 8,482 | 1 | ප්‍රති පාද න රහිත ය | | දේශීය | සත්ත්ව පාලනය ප්‍රචලිත වීම |
| නිලධාරි පුහුණුව | 162 | 1 | ව්‍යා පෘති ය විසි න් දරණ ලදි. | | දේශීය | දැනුම යාවත්කාලින වීම |

- **ප්‍රාදේශීය සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (RS ’000) | | වැඩසට හනේ ස්වභාව ය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම * පළාත් පාලන දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පළාත් පාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | 45 | අවු. 01 | | 4,681 | දේශීය | පළාත් පාලන ආයතනයන්ගේ කාර්යයභාරය හා අදාළ ක්‍රියාවලි පිළිබඳ දැනුම |

- **ඉඩම් සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs’000) | | වැඩසටහ නේ ස්වභාවය (දේශීය/වි දේශීය) | නිමවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉඩම් තක්සේරු පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | වැඩසටහන් 1 දින 1 | 71,550 | | දේශීය | ඉඩම් තක්සේරුකරණය පිලිබඳ නිළධාරීන් දැනුවත් කර ඉඩම් හිමිකම්පත්‍ර ලබා දීම කඩිනම් කිරීම |

- **ප්‍රජා සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහ නේ කාල සීමාව (දින/ මාස/ | සමස්ත ආයෝජනය (Rs’000) | | වැඩසට හනේ ස්වභාව ය (දේශීය/ | නිමවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අවු.) | | | විදේශීය) | |
| සාත්තු සේවක වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම | 10 | මාස 06 | දේශීය | | දේශීය | සාත්තුසේවකවෘත් තීයදැනුම |
| වැඩිහිටි සත්කාර ක්ෂේත්‍ර යේ වැඩිහිටි පුහුණුව ලබා ගැනීම | 03 | මාස 01 | දේශීය | | දේශීය | වැඩිහිටිසත්කාරක් ෂේත්‍රයේ දැනුම |
| සත්තු සේවක පාඨමාලාව සඳහා ආධුනිකයින් යොමු කිරීම | 19 | මාස 05 | දේශීය | | දේශීය | සාත්තු සේවය පිළිබඳ දැනුම ලැබීම |
| ප්‍රායෝගික පුහුණුව සඳහා ආධුනිකයින් රාජ්‍ය ආයතනවලට යොමු කිරීම | 06 | මාස 06 | දේශීය | | දේශීය | ප්‍රායෝගිකපුහුණුව ලැබීම |
| ව්‍යාපාර උපදේශන යොදා ගෙන පුහුණු කිරීම | 02 | දින 03 | දේශීය | | දේශීය | ව්‍යාපාර පිළිබඳ දැනුම ලබා ගැනීම |
| සාත්තු සේවක පාඨමාලාවට ආධුනිකයින් යොමු කිරීම සම්බන්ධව පුහුණු කිරීම | 05 | මාස 03 | දේශීය | | දේශීය | සාත්තු සේවක පුහුණුව ලැබීම |
| සේවය පදනම් කරගත් පුහුණු වැඩසටහන් (ශාස්ත්‍රවේදී) | 01 | පැය 300 | | | දේශීය | |
| යෝග පුහුණු වැඩසටහන | 50 | | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වියදම් දරන ලදී. | | දේශීය | යහපත් සෞඛ්‍ය තත්වයක් ඇති කරලීම.* ඵලදායි කාර්යක්ෂම ඉහළ කාර්ය සාධනයක් ඇති කිරීම |
| ගිණුම් පුහුණු වැඩසටහන | 35 | 02 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් | | දේශීය | සමිති ගිණුම් නිවැරදි ලෙස යාවත්කාලීන කිරීමහා මූල්‍ය තත්වය ඉහළ නංවා ගැනීම |

- **සමුපකාර සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසට හනේ ස්වභාව ය (දේශීය/ විදේශීය) | නිමවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශී ය | | |
| F28 විශ්ලේෂණ වාර්තා වැඩමුළුව | 44 | දින 02 | 70,030.00 | | දේශීය | සමිති වල ලාභ/පාඩු හඳුනා ගැනීම |
| F28 මෙහෙයුම් වාර්තා විශ්ලේෂණය | 65 | දින 04 | 128,880.00 | | දේශීය | සමිති වල වත්කම් වගකීම් හඳුනා ගැනීම |
| නව ව්‍යාපාරික ප්‍රවණතා පිළිබඳ පුහුණු | 89 | දින 02 | 120,000.00 | | දේශීය | කාලීන ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම |
| සමුපකාර සමිති විසින් සමුපකාර කොමසාරිස් වෙත අනුමැතිය | 35 | දින 01 | 40,500.00 | | දේශීය | නිවරදි ගොනුවක් සමුපකාර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සඳහා එවන ලේඛන හඳුනා ගැනීම | | | | | | කොමසාරිස්වරයා වෙත ලබා ගැනීම. |
| සමුපකාර සමිතිවල පැමිණිල්ලේ නියෝජිත භූමිකාව | 60 | දින 02 | 134,864.00 | | දේශීය | සමුපකාර සමිති වල ඇති විවිධ ආරවුල් හා විනය පරීක්ෂණ මෙහෙය වීම සඳහා සමිති මට්ටමේ නිලධාරීන් සංචිතයක් ඇති කිරීම |
| ස.ණ.ස සමිති නිලධාරීන් සඳහා සමුපකාර නීතිය,ගිණුම්කරණය,සමිති නියාමනය පිලිබඳ පුහුණුව | 130 | දින 02 | 224,500.00 | | දේශීය | සමුපකාර නීතිය,ගිණුම්කරණය,සමුපකාර නීතිය පිලිබඳ දැනුම |
| පුහුණුව ලද මුළු සමුපකාර සේවකයන් සංඛ්‍යාව | 423 | | | | | |
| පද්දති විගණනය | 72 | දින 01 | 76,616.00 | | දේශීය | පරිගණක ආශ්‍රිතව සිදු කරන ගනුදෙනු විගණනය හදුනා ගැනීම |
| තීරකකරණය හා තීරක ප්‍රදාන බලගැන්වීම | 17 | දින 03 | 156,400.00 | | දේශීය | තීරකකරණය පිළිබඳ දැනුම |
| පුහුණුව ලද සමුපකාර සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව | 89 | | | | | |

- **සෞඛ්‍ය සේවා සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| සුරැකුම් සහයක පුහුණු වැඩසටහන - පළමු කණ්ඩායම | 99 | දින 45 | සමුපකාර අමාත්‍යංශය | | දේශීය | වෘත්තිය නිපුණත්වයෙන් හෙබි ජාත්‍යන්තර පිලිගැනීමකින් යුතු සුරකුම් සහයකයකු බිහිකිරීම. |
| සුරකුම් සහයක පුහුණු වැඩසටහනේ විභාග කටයුතු - පළමු කණ්ඩායම | 99 | දින 8 | විදේශ සේවා නියුක්ති කාර්යංශය | | | තෘතීක හා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය පුහුණුලාභින්ගේ සමත් ප්‍රතිශතය 100% කි. |
| සුරකුම් සහයක පුහුණු වැඩසටහනේ විභාග කටයුතු - දෙවන කණ්ඩායම | 53 | දින 11 | විදේශ සේවා නියුක්ති කාර්යංශය | | | තෘතීක හා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය පුහුණුලාභින්ගේ සමත් ප්‍රතිශතය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | 100% කි. |
| සුරැකම් සහයක පුහුණු වැඩසටහන - තෙවන කණ්ඩායම | 71 | දින 45 | සමුපකාර අමාත්‍යාංශය | සුරකම් සහයක පුහුණු වැඩසටහන දෙවන කණ්ඩායම | | දින 45 |
| ප්‍රජා සෞඛ්‍ය හෙද පුහුණු වැඩසටහන - සිසු හෙද කණ්ඩායම 2019 ක්ෂේත්‍ර නිරීක්ෂණය | 238 | මාස 1 1/2 | ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර | | දේශීය | ප්‍රජාව තුල මූලික සෞඛ්‍ය අවශ්‍යතා හඳුනාගැනීම, රෝග වළක්වා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ප්‍රජාව තුල සෞඛ්‍ය අධ්‍යාපනය ඉහල නැංවීම |
| මූලික රෝහල් , ප්‍රාදේශීය රෝහල් වල වෛද්‍ය උපකරණ හැසිරවීම බඩු වට්ටෝරු ලේඛණ පවත්වාගෙන යාම හා වෛද්‍ය උපකරණ දත්ත පද්ධතිය කළමනාකරණය කිරීම. | 150 | දින 1 | 82170.00 | | දේශීය | ආරක්ෂාකාරී හා නිවැරදි උපකරණ භාවිතය තුලින් උපකරණයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම හා වැරදි පරිහරණයකදී සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීම. |
| මුරකරුවන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩමුළුව | 90 | දින 1 | 81500.00 | | දේශීය | ආයතනික දේපල කාර්ය මණ්ඩල සහ වෙනත් පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී ක්ෂේත්‍ර පුහුණුව සඳහා පුහුණුකරුවන් පුහුණු කරවීමේ වැඩසටහන | 65 | දින 1 | 61500.00 | | දේශීය | දැනුම යාවත්කාලීන කිරීම. |
| සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී ක්ෂේත්‍ර පුහුණුව - සමාරම්භක උළෙල | 150 | දින 1 | 21000.00 | | දේශීය | |
| සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී ක්ෂේත්‍ර පුහුණුව | 100 | මාස 6 | ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර | | දේශීය | බිම් මට්ටමේ ප්‍රජා සෞඛ්‍ය නැංවීමට කටයුතු කිරීම. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව මා/දින) (.අවු /ස | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය දේශී) ය විදේ/ (ශීය | නිමවුම ලබා ගත් / දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු කිරීමේ දෙදින වැඩමුළුව | 60 | 02 | 173709.00 | | දේශීය | මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු නිලධාරීන් |
| හදිසි ආපදා කළමනාකරණ සේවා යටතේ ඌන පෝෂිත ළමුන් සඳහා අන්තර් පාර්ශවීය පෝෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම යටතේ සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 270 | 01 | 278790.00 | | දේශීය | මූල්‍ය කළමනාකරණය හා ළදරු පෝෂණය පිළිබඳ පුහුණු සංවර්ධන නිලධාරීන් |
| ප්‍රජා සජීවීකරණ තුළින් ප්‍රජාව තුළ යහපත් සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | 200 | 01 | 187380.00 | | දේශීය | සෞඛ්‍ය ප්‍රවර්ධන මූලධර්ම ප්‍රජාවේ පෝෂණය ඉහළ නැංවීම සඳහා යොදා ගැනීම . |
| මව් හවුල් ශක්තිමත් කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගතිය සාකච්ඡා කිරීම | 24 | 01 | 7155.00 | | දේශීය | ශක්තිමත් මව් හවුල් බිහි කිරීම |
| පුද්ගලික අංශයේ )FHB) මාතෘ සෞඛ්‍ය සේවා පිළිබඳ විද්‍යුත් තොරතුරු පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 15 | 01 | ප.සෞ.කා ප්‍රතිපාදන | | දේශීය | පුද්ගලික අංශයේ )FHB) මාතෘ සෞඛ්‍ය සේවා පිළිබඳ විද්‍යුත් තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම . |
| ජාතික පිළිකා මර්ධන වැඩසටහන වර්ෂික ප්‍රගති සමාලෝචන වැඩසටහන - උතුරු මැද පළාත | 35 | 01 | ජා.පි.ම.වැ ඩසටහන | | දේශීය | ප්‍රගතිය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ගැනීම |
| පෞද්ගලික වෛද්‍ය ආයතන මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 53 | 01 | 33980.00 | | දේශීය | පෞද්ගලික වෛද්‍ය ආයතන මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය වැඩි කිරීම |
| ප්‍රජා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පාසල් දිවා ආහාර වැඩසටහන සහ ගෙවත්තෙන් පන්ති කාරමරයට පෝෂණ වැඩසටහන පිළිබඳ වැඩමුළුව - අනුරාධපුර දිස්ත්‍රික්කය | 87 | 01 | 78205.00 | | දේශීය | පාසල් ළමුන්ගේ පෝෂණය නගා සිටුවීම |
| මූලික මාතෘ සංරක්ෂණය - සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා වූ අත්පොත - පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 32 | 01 | ප.සෞ.කා ප්‍රතිපාදන | | දේශීය | මූලික මාතෘ සංරක්ෂණය පිළිබඳ දැනුම යාවත් කාලීන |
| වාර්ෂික පෙරපාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසුම් සංවර්ධන වැඩසටහන් සමාලෝචනය - 2023 | 65 | 01 | සෞ.ප්‍ර.කා. ප්‍රතිපාදන | | දේශීය | ප්‍රගතිය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ගැනීම |
| ප්‍රජා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පාසල් දිවා ආහාර වැඩසටහන සහ ගෙවත්තෙන් පන්ති කාරමරයට පෝෂණ වැඩසටහන පිළිබඳ වැඩමුළුව - පොලොන්නරුව දිස්ත්‍රික්කය | 70 | 01 | 86715.00 | | දේශීය | පාසල් ළමුන්ගේ පෝෂණය නගා සිටුවීම |

- අධ්‍යාපන සේවා සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන්

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව (දින/ මාස/ අවුරුදු) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| *බාහිර අධික්ෂණයෙන් ප්‍රාථමික අංශයේ අරමුණු සක්ෂාත් කර ගැනීම පිළිබඳ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන. (පළාත්) | 345 | එක් දින | 0.21 | - | දේශීය | බාහිර අධීක්ෂණය පිළිබඳව දැණුවත වීම. |
| * ප්‍රාථමික අධ්‍යාපනයේ සංකල්ප හා ක්‍රමවේද පිළිබඳව සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරුකරණය පිළිබඳව විදුහල්පතිවරුන් හා අංශ ප්‍රධානින් දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් සංවිධානය කිරීම (GEMP). | 1352 | තෙදින | - | 0.37 | දේශීය | සංකල්ප, ක්‍රමවේද පිළිබඳව සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරුකරණය පිළිබඳව දැනුවත් වීම. |
| * ප්‍රාථමික ගුරුභවතුන්ගේ ගණිතය විෂයානුබද්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම / ප්‍රාථමික ඉගෙනුම් උපකරණ කට්ටල සකස් කිරීම (GEMP). | 1128 | තෙදින | - | 1.41 | දේශීය | ගණිතය විෂයානුබද්ධ ධාරිතා සංවර්ධනය. |
| * 2022 දී පවත්වන ලද ගුරු අනාවරණ පරීක්ෂණ ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව 2022 වර්ෂය තුළ පුහුණු වීමට අවස්ථාව නොලැබුණු පාසල් 410 ක ගණිත පත්වීම් ලද ගුරුවරුන් 500ක් සඳහා විෂය ආශ්‍රිත ගුරු පුහුණු ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම (GEMP). | 1219 | දෙදින | - | 0.83 | දේශීය | විෂය ආශ්‍රිත ගුරු පුහුණුව ලබා ගැනීම. |
| * භෞතික විද්‍යා ගුරු භවතුන් 30ක් සඳහා ඉලෙක්ට්‍රොනික් විද්‍යාව සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළුව. | 26 | දෙදින | 0.12 | - | දේශීය | ඉලෙක්ට්‍රොනික් විද්‍යාව සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබා ගැනීම. |
| * ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණ වැඩසටහන් - ගුරු සංවර්ධන වැඩසටහන් (ද්විතියික). | 1289 | දෙදින | 0.73 | - | දේශීය | ගුරු සංවර්ධනය, අධ්‍යාපනය හා කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම. |
| * සාමාන්‍ය ඉංග්‍රිසි විෂය උගන්වන ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන. | 6 | දෙදින | 0.04 | - | දේශීය | සාමාන්‍ය ඉංග්‍රිසි විෂය ආශ්‍රිත ධාරිතා සංවර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| * ඉංග්‍රීසි උගන්වන ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන. | 18 | දෙදින | 0.05 | - | දේශීය | ඉංග්‍රීසි ගුරු පුහුණුව |
| * විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන. | 120 | දෙදින | 0.04 | - | දේශීය | විෂයානුබද්ධ දැනුවත්භාවය වැඩි වීම. |
| * 2022 අ.පො.ස. (සා/පෙළ) විභාගය සඳහා පෙනීසිටි සිසුන්ගේ දෙමාපියන් 13 වසරක අධ්‍යාපන වැඩ සටහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. | 256 | එක්දින | 0.07 | - | දේශීය | වැඩ සටහන පිළිබඳව දෙමාපියන්ගේ දැනුවත්භාවය. |
| * අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව. | 23 | දෙදින | 0.7 | - | දේශීය | ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය. |
| * වෘත්තීය සංක්‍රමණ අවස්ථා සැලසුම් කිරීම සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන්ගේ විශේෂ අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව. | 46 | දෙදින | 0.2 | - | දේශීය | විශේෂ අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ දැනුවත්භාවය වැඩි වීම. |
| * පාඨමාලා උපදේශකවරුන් සඳහා වූ කුසලතා සංවර්ධන වැඩසටහන. | 40 | එක්දින | 0.04 | - | දේශීය | කුසලතා සංවර්ධනය ලබා දීම. |
| * කලාප මට්ටමින් උපදේශන ගුරුභවතුන්ගේ උපදේශන කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් (GEMP). | 650 | එක්දින | - | 0.57 | දේශීය | උපදේශන කුසලතා සංවර්ධනය ලබා දීම. |
| * සති පාසල වැඩසටහන පිළිබඳ නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුභවතුන් පුහුණු කිරීම (GEMP). | 261 | එක්දින | - | 0.32 | දේශීය | සති පාසල වැඩසටහන පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම. |
| * අ.පො.ස (උ.පෙළ) ගිණුම්කරණය දෙදින නේවාසික ගුරු පුහුනු වැඩසටහන. | 166 | දෙදින | 0.34 | - | දේශීය | පුහුණුව ලබාදීම. |
| * අධ්‍යාපනවේදී නවක උපාධිධාරී ගුරුවරුන් දිශාභිමුඛ කිරීමේ වැඩසටහන. | 84 | සතිය | 0.07 | - | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරීම. |
| * විදුහල්පතිවරු දැනුවත් කිරීම හා අනිවාර්ය අධ්‍යාපන කමිටු යාවත්කාලීන කිරීම. | 278 | දෙදින | 0.36 | | දේශීය | දැනුවත් කිරීම. |
| * iTESL මොඩියුල 1 සහ 2 සඳහා දින 3ක ගුරු පුහුණුව සහ ITALAS සවන්දීමේ කථන සංවර්ධනය සහ තෝරාගත් ගුරුවරුන් සඳහා දින 3 වැඩමුළුව (GEMP). | 406 | තෙදින | - | 0.92 | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරීම. |
| * (සිංහල / දෙමළ) අ.පො.ස (සා.පෙළ) වාණිජ ගුරුවරුන් සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම (SESIP). | 55 | දෙදින | - | 0.07 | දේශීය | ප්‍රශ්න පත්‍ර සැකසීම පිළිබඳ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| * අධ්‍යාපන සාමාන්‍ය සහතික සා/පෙළ වාණිජ විෂයයන් සම්බන්ධ ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා දෙදින ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම (SESIP). | 92 | දෙදින | - | 0.18 | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරීම. |
| * ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම . | 64 | දෙදින | 0.08 | - | දේශීය | ධාරිතා සංවර්ධනය කිරීම |
| * මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 80 | දෙදින | 0.60 | - | දේශීය | මානව සම්පත් සංවර්ධනය |
| * පාසල් මට්ටමින් පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සැලැස්ම සකස් කිරිම සඳහා පාදක තොරතුරු හඳුනා ගැනිම , විදුහල්පතිවරුන්ගේ වැඩසටහන භාර ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම (GEMP). | 565 | දෙදින | - | 0.37 | දේශීය | විදුහල්පතිවරුන්ගේ, වැඩසටහන භාර ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම. |
| * 2024 නිපුනතා රාමුව - විදුහල්පති වරුන් සඳහා පුහුණු වැඩසටහන | 132 | සති 01 | 1.17 | - | දේශීය | විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය |
| එකතුව | 8701 | | 4.82 | 5.04 | | |

- **සමාජ ආරක්ෂණයට අදාල පුහුණු වැඩසටහන්**

| වැඩ සටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| පරිවාස නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන | 34 | දින 01 | පරිවාස දෙපාර්තමේන්තුව මඟින් (රු.27,535/-) | දේශීය | පරිවාස නිලධාරින්ගේ ආකල්ප හා කාර්ය සාධනය වැඩි දියුණු වීම. |
| කිරිකැටුවැව සහතික කළ පාසල ආරම්භ කිරීම සඳහා අදාළ නිලධාරින් පුහුණු කිරීම | 18 | දින 03 | පරිවාස දෙපාර්තමේන්තුව මඟින් (රු.27,170/-) | දේශීය | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි,ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ නිලධාරීන් දැනුවත් වීම සහ නිලධාරීන්ගේ ආකල්ප වැඩි දියුණු වීම. |

- මුල්‍ය කළමනාකරණයට අදාල පුහුණු වැඩසටහන්

| වැඩසට හනේ නම | පුහුණු කරන ලද සේව ක සංඛ්‍යා ව | වැඩ සටහ නේ කාල සීමාව (දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසට හනේ ස්වභාව ය (දේශීය/ විදේශීය) | නිමවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| අවදානම් පාදක විගණන සැලැස්ම සකස් කිරීම | 25 | දින 01 | 80 | - | දේශීය | I.2024 වර්ෂයේ විගණන සැලැස්මට ඇතුළත් කළ යුතු වැඩසටහන් හඳුනා ගැනීම.<br>II. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) සමග සාකච්ඡා කර 2024 සැලැස්මට ඇතුළත් කළ යුතු විගණන ප්‍රවේශයන් හා පුහුණු වැසටහන් හඳුනා ගැනීම.<br>III. පළාත තුළ ඇති සියලු ආයතනවල අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, බර තැබීම හා ශ්‍රේණිගත කිරීම.<br>IV.දිනයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂය සඳහා අවශ්‍යතාවයන් අනුව සියලු දෙනාම එක්ව විගණන සැලැස්ම සකස් කර අවසන් කිරීම. |

## ආයතනික කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය

ආයතනික ක්‍රියාවලිය තුල නිවැරදි මානව සම්පත් උපයෝජනයේදී, සාමාජිකයන් සඵලදායීව අභිප්‍රේරණය වීම ඉතා වැදගත් කරුණකි. එහිදී දිනෙන් දින වෙනස්වන සමාජය හා තාක්ෂණය හමුවේ රාජ්‍ය සේවකයාද යාවත්කාලීන වූ දැනුමෙන් සන්නද්ධ විය යුතුය. එය සාර්ථක සේවාවක් සැපයීමට මෙන්ම පෞද්ගලික අභිවෘද්ධිය උදෙසාද වැදගත් වන කරුණකි. ඒ අනුව නිලධාරීන් සඳහා අත්‍යාවශ්‍ය වන්නා වූ පුහුණු අවශ්‍යතා ආයතිනක මට්ටමින් හඳුනාගනිමින් ඒ අනුව සැලසුම් සකස් කිරීම තුලින්,

- කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයිය හැකිවීම,
- රාජකාරි කටයුතු වල ගුණාත්මකභාවය, වගකීම මෙන්ම වගවීම ඉහළ නැංවීම,
- තොරතුරු පද්ධති යාවත් කාලීනව පවත්වාගෙන යාමට හැකි වීම,
- සෘජු මෙන්ම වක්‍ර මානව සම්බන්ධතා වැඩි දියුණු වීම,
- නුපුහුණු නවක සේවකයන් රාජකාරි පරිසරයට පුහුණු වීම,
- රාජකාරි මට්ටමින් පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට අවස්ථාව සැලසීම,
- ධනාත්මක ආකල්ප වර්ධන තුලින් තෘප්තිමත් සේවාවක් සැපයිය හැකි වීම,
- පුද්ගලයන් තුල පවතින නව අදහස් හා යෝජනා මගින් ආයතනික ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමට හැකි වීම,
- තම රාජකාරි කටයුතු පිළිබඳ පවත්නා දැනුම අනෙකුත් නිලධාරීන් සමඟ හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසීම,
- නව තාක්ෂණික දැනුම සියලු නිලධාරීන් සඳහා ලබා දිය හැකි වීම,
- නව තාක්ෂණය සමඟ කාර්යයන් වල නිරවද්‍ය තාවය වැඩි දියුණු වීම,
- කාර්යාල කටයුතු ක්‍රමානුකූල වීම මත විගණන විමසුම් ප්‍රමාණය අවම වීමත්,

යනාදි කරුණු ඉටු සිදුවන බැවින්, නිලධාරින් සඳහා පවත්වනු ලබන ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් ඉතාමත් වැදගත් වන බව මෙහිදී දැක්විය හැකිය.

# 07

පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

# අනුකූලතා වාර්තාව




| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | | | |
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | ✓ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | ✓ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | ✓ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | X | ගබඩා අත්තිකාරම් ගිණුම නොමැත | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | X | | |
| 1.6 | වෙනත් ගිණුම් | ✓ | | |
| | | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රි. 321)** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | ✓ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම (ප.ස 37 පෝරමය) | ✓ | | |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| | | | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (ප.මූ.රී. 83)** | | | |
| **3.1** | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | ✓ | | |
| **3.2** | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | ✓ | | |
| **3.3** | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදි බලතල පවරා දී තිබීම | ✓ | | |
| **3.4** | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | ✓ | | |
| **3.5** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම | ✓ | | |
| | | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| **4.1** | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| **4.2** | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| **4.3** | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | ✓ | | |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| | | | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම | ✓ | | |
| | | | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම | ✓ | | |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| | | | | |
| **7** | **විගණන හා කළමණාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම | ✓ | | |
| | | | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමනාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම | ✓ | | |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේ අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2023/07 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | ✓ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | ✓ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම ප.මු.රී 490 අනුව සිදු කිරීම | ✓ | | |
| 8.6 | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම | ✓ | | |
| | | | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | ✓ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | ✓ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | ✓ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම | ✓ | | |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | ✓ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | ✓ | | |
| | | | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | ✓ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **<u>ප්‍රතිපාදන උපයෝජනය</u>** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | ✓ | | |
| 11.2 | ප.මූ.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම් වලට එලඹීම | ✓ | | |
| | | | | |
| **12** | **<u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u>** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | ✓ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | ✓ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | ✓ | | |
| | | | | |
| **13** | **<u>පොදු තැන්පත් ගිණුම</u>** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම | ✓ | | |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම | ✓ | | |
| | | | | |
| **14** | **<u>අග්‍රිම ගිණුම</u>** | | | |
| 14.1 | ප.මූ.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම | ✓ | | |
| 14.2 | ප.මූ.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම | ✓ | | |
| 14.3 | ප.මූ.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | ✓ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | ✓ | | |
| | | | | |
| **15** | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | ප.මූ.රී.133 ට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්ථාවේම සෘජුවම ආදායමට බැර කර තිබීම | ✓ | | |
| 15.3 | ප.මු.රී. 116 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| | | | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම | ✓ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | ✓ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| | | | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම | ✓ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| | | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | ✓ | | |
| **19** | **<u>මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම</u>** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | ප්‍රතිපාදන සීමා වීම මත පුහුණු වැඩසටහන් අවලංගු කිරීම | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | ✓ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | ✓ | | |
| | | | | |
| **20** | **<u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම</u>** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | ✓ | | |